The observations, especially on a religion like Buddhism which was originated in the East, clearly displayed the extreme intricacy of performing religious translations. The results discovered that being a translator solely with linguistic powers was not enough to carry out a translation of this type. Thus, the subject knowledge and understanding of the discipline along with language proficiency were compulsory for a translator to attain completeness. It was observed that the challenges faced by the translators were ambiguity, cultural non-equivalence, lack of cognition at linguistic levels of language, misuse or incomprehension of terminology and lack of subject knowledge. Moreover, it was also discerned that the challenges threaten the completeness of the overall production. In addition, it was identified that employing omission as a technique has deteriorated the quality of the end product as it has eventually mutated the authenticity of the source text. Further to this, *Transference, Functional equivalence, Descriptive equivalence, Expansion, Omission and Notes* were identified as the most recurring strategies employed by the translators. Finally, it was confirmed through the data collected at the interviews of the field experts that achieving translatability of Buddhist content was difficult. Especially when it was translated back from a western language to an Eastern language which was beyond the convention was comparatively difficult and it involved a lot of effort and courage.

Conclusion and Recommendation

Achieving translatability of Buddhist content is a tedious task, especially when it contravenes the tradition and attempts to translate from English to the Sinhala language. Especially, when the contents authentically originated in the Eastern world and then translated to Western languages and translated back to another Eastern language, it is very crucial. Linguistic knowledge alone is not adequate to attain completeness of a translation. Hence, the subject knowledge plays a crucial role in the process. Omission though being employed as a translation strategy is not ideal in this context. Accordingly, attaining translatability in the religious content is not impossible, but certainly a tough task to carry out. If the correct methods and strategies are employed, religious content too will achieve the expected quality and completeness in the end product. Then it will provide the privilege to the target readership to entertain the target text in the same manner the source readership enjoyed the original.

Keywords: *Challenges, Paṭiccasamuppāda, Translatability, Translation Strategies, Religious Translation*

References

Shuttleworth, M., & Cowie, M. (1997). *Dictionary of Translation Studies*. St. Jerome Publishing**.**

Prominent Value of Mindfulness for Coping up with Job-related Stress of Employees who Work in the Finance Sector during the COVID-19

Ven. M. Wijithadhamma[1] and H.P.C.W. Pathirana[*2]

[1]Department of Pali and Buddhist Studies, University of Sri Jayewardenepura, Sri Lanka, [2]Psychology and Counselling Unit, Sri Lanka Foundation Institute, Sri Lanka

**wasantha0102@gmail.com*

Introduction

The COVID-19 virus has totally crushed and changed the lives of billions of people in the world. It has become a major epidemiological, economic, and global health crisis (Roychowdhury, 2020). Moreover, the pandemic has infected 232,075,351 individuals and claimed the lives of 4,752,988 people (World Health Organization, 2020). So far, COVID-19 has triggered one of the worst jobs crises since the great depression (https://www.oecd.org), and this crisis was an upsurge of stress in different ways for people who work in various occupations around the world. There has been a significant spike in demand for mindfulness programming since the start of the pandemic (Harrison, 2021). A number of researchers have indicated that introducing mindfulness meditation practice during this pandemic has the potential to complement treatment and is a low-cost beneficial method of providing support with anxiety for all. (Behan, 2020). Many scholarly articles for mindfulness research in the finance sector during COVID-19 have highlighted the benefits of mindfulness practices (Behan, 2020). COVID-19 changed the way people live and work before in Sri Lanka. With lockdown travel restrictions, minimum staff, distant work, and social distance becoming the new rules. In many organizations, these new ways of working raise challenges and distress. However, In the Sri Lankan context, there is yet less research on mindfulness based intervention for addressing the job-related stress during the COVID-19 epidemic. Hence, this paper focuses on mindfulness practice as a potential strategy to reduce the stress experienced by employees who worked in the finance sector during the pandemic.

Research Problem/s, Objective/s

The aim of this research is to find a solid mechanism to cope up with job stress and develop a tool based on mindfulness as a supportable solution in managing workplace stress during the pandemic situation of COVID-19. The short- term objectives of this study examine: 1) the physical, emotional, cognitive and behavioural effects of the stress of the pandemic situation that the employees are experiencing, 2) the ability to live in the present moment. The long-term objective is to study; 3) how mindfulness contributes to decreasing the symptoms of perceived stress of the employees.

Materials and Methods

The study attempts to discover whether 03 sessions of an online MBSR program could have optimistic effects on employes' job stress during the pandemic period. The primary data has been collected online from 146 employees who work in the finance sector in northern and southern provinces in Sri Lanka. Procedures of the Workplace Burnout Questionnaire- (WPBQ) which researchers developed was to be filled out before and after the mindfulness session. The WPBQ consists of 12 statements in which each item can be responded to with the best option on a five scale and these statements are divided into three subcategories; physical, emotional and cognitive/mental exhaustion. The employees' level of mindfulness is assessed using the trait mindful attention awareness scale (MAAS), a 15-item scale designed to assess a core characteristic of mindfulness by Brown and Ryan (Brown & Ryan, R.M., 2003). Quantitative data interpretation was done using the above mentioned questionnaires and interviews and informal discussions were used for quantitative data interpretation.

Results and Discussion

According to data, it displays that most employees are not prone to a high risk of stress. It was observed that only a few employees have shown severe levels of physical symptoms of stress, while the majority were at a satisfactory level as they did not show the severe level of stress symptoms. To get information about the mental stress level of the employees during the pandemic of COVID-19 period, the questionnaire includes; memory, concentration, clear thinking, decision making and problem-solving conditions of the participants. 131 out of 146 employees have stated "very often" to the questions of 'my memory is weak' and 'it is difficult to concentrate on complex or serious things'. When giving the answer to the statements of "I'm not doing things thinking clearly" and "my decision making and the way of problem-solving is weak", many employees responded as "rare" or "never". As a percentage, it was 76% and 62%. According to the data, many employees were experiencing emotional stress rather than physical and cognitive/mental stress. Bossi et al. showed that mindfulness-based online intervention increases well-being and decreases stress after the COVID-19 lockdown, especially in employees in organization (Bossi et al., 2022). According to the responses given in the questionnaire for measuring the mindfulness of the employees, there was a substantial uptake in the employees. Data disclosed that mindfulness has a significant core relationship with stress level. Moreover, we examined that increasing practice of mindfulness was negatively correlated with stress. In interviews, employees expressed that the extreme workload and duties which were assigned by the boss or superiors made many of them unhappy and disgusted. This directly led to increased emotional stress and it affected their mental state. Increasing mindfulness greatly contributed to decreasing the stress level of the employees, especially their mental stress. Studies have revealed that evidence-based therapies such as MBSR also show similar brain changes to those with traditional meditation practice (Gotink et al., 2016). Further, studies of persons who have meditated over the long-term display changes in areas of the brain concerned with stress and anxiety (Afonso, Kraft, Aratanha & Kozasa, 2020). However, this study showed that short-term meditation has positive effects on employees' job stress during the pandemic. However,, we need more follow-ups to clarify its real effectiveness. Therefore, further research must address the potential benefits, recommendations, and risks of mindfulness on job stress and compare differences and effectiveness of the state mindfulness and trait mindfulness to the job-related stress in a pandemic situation like COVID-19.

Conclusions and Recommendations

The study outcomes illustrate the importance and effectiveness of online MBSR programs to manage job stress among employees, especially during the COVID-19 and mindfulness can provide a supportive way to live with this constant change. As mindfulness is a low-cost beneficial method, we can recommend mindfulness training programs for stressed persons in workplaces and the online MBSR programmes already existing within services can be adapted for this.

Keywords: *COVID-19, Mindfulness, Job/Workplace Stress*

References

Behan, C., **(**14 May 2020). *The benefits of meditation and mindfulness practices during times of crisis such as COVID-19.* Published online by Cambridge University Press.

Brown, K. W., & Ryan, R. M. (2003). The benefits of being present: Mindfulness and its role in psychological well-being. *Journal of Personality and Social Psychology,* 84(4), 822-848. https://doi.org/10.1037/0022-3514.84.4.822.

Gotink, A. R., Meijboom, R., Vernooij, M.W., Smits, M., & Hunink, M.G.M. (October 2016). *8-week Mindfulness Based Stress Reduction induces brain changes similar to traditional long-term meditation practice – A systematic review.* https://doi.org/10.1016/j.bandc.2016.07.001.

Kabat-Zinn, J. (2005). Full catastrophe living: Using the wisdom of your body and mind to face stress, pain, and illness (15th anniversary ed.). Bantam Dell.

අපරාධ නිවාරණයෙහි ලා බෞද්ධ ප්‍රවේශය පිළිබඳ අධ්‍යයනයක්

හුන්නස්ගිරියේ පදුමරතන හිමි* සහ ආර්. කේ. එම්. ටී. ඉනිද්‍රාණී
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
**hpadumarathana@gmail.com*

හැඳින්වීම

මිනිසා විසින් කරනු ලබන කිසියම් චර්යාවක් අපරාධයක් යැයි නිර්වචනය කරනු ලබන්නේ කෘත්‍රිම ලෙස ඔහු විසින් ම නිර්මාණය කර ගන්නා ලද ආචාරධර්ම පද්ධතියකට සාපේක්ෂව ය. එහෙත් මිනිසාගේ සාමාන්‍ය ජන්ම ගති ස්වභාවයන්ට අනුව සැලකීමේ දී පැහැදිලි වන්නේ එකී තත්ත්වය ඔහුට උරුම සාමාන්‍ය හැසිරීමක් බවයි. ශිෂ්ටාචාරගත සත්ත්වයෙකු බවට පත් තැන් සිට මිනිසා තමා විසින් ම නිර්මාණය කරනු ලැබූ ආචාරධර්ම අභියස වහලෙකු බවට පත් වී ඇත. එහෙයින් ඔහුට ස්වකීය ජන්ම ගති ස්වභාවයන් පසෙකලා ස්වකීය වර්ගයා බලාපොරොත්තු වන කෘත්‍රිම ජීවන ක්‍රමයට අනුගත ව සමාජීය සත්ත්වයෙකු ලෙස ජීවත්වීමට සිදු වී ඇත. බුදුදහම මගින් මිනිසාගේ ජන්ම ගති ස්වභාවයන් මැනවින් වටහාගෙන ඇති අතර අපරාධ හා සම්බන්ධ බෞද්ධ විග්‍රහය මූලික වශයෙන් ගොඩනැගි ඇත්තේ මිනිසාගේ ජන්මගති ස්වභාවයන් සක්‍රියවීමට ඇති ඉඩ ප්‍රස්තා කල්වේලා ඇතිවම වළක්වාලීම අරමුණු කොට ගෙනය. 'සබ්බේ සත්තා උන්මන්තකා' යන දේශනාවට අනුව ඉන් ගම්‍ය වන්නේ මිනිසා නොමිනිසෙකු වීමේ ගුණය සියලු මිනිසුන් තුළ උරුමයක් ලෙස රෝපණය වී ඇති බවයි. නොමිනිස්කම් යනු සාමය, සමාදානය, සාධාරණය, දයාව, කරුණාව, අනුකම්පාව, පරිත්‍යාගශීලිත්වය, අන්‍යෝන්‍ය උපකාරය, අව්‍යාජත්වය, හොඳ-නරක වැනි මිනිස් වර්ගයාගේ යහපැවැත්මට අත්‍යවශ්‍යයෙන් ආරක්ෂා කර පවත්වාගෙන යා යුතු, ගුණධර්මවලින් වියුක්ත ව හුදෙක් ආත්මාභිලාසයෙන් ම කරනු ලබන හැසිරීමකි. මෙවැනි ගතිපැවතුම් ඇති තැනැත්තා සමාජය පෙළන අපරාධකාරයෙකි. එහෙයින් මෙවැනි පුද්ගලයන් සදාචාරශීලී යහපත් පුරවැසියෙකු බවට පත් කරගත යුතු වන අතර බෞද්ධ ඉගැන්වීම් තුළ ඒ සඳහා අවශ්‍ය මඟපෙන්වීම දක්නට ලැබේ. ගිහි සමාජ චර්යාව පාලනය කිරීම සඳහා බුදුදහමින් නිර්දේශිත සරල ප්‍රඥප්තිය පංචශීලයයි. පංචශීලයෙන් දැක්වෙන ප්‍රතිපත්ති පහ ආරක්ෂා කර ගැනීමට කවර හෝ සමාජයක වැසියන් සමත් වුවහොත් එහි අපරාධයකැ'යි වර්ග කරනු ලබන මනුෂ්‍ය චර්යාවන් කිසිවක් වාර්තා නොවනු ඇත. දෛනික ව සිදු වන අපරාධ පිළිබඳ සැලකීමේ දී ඒ සියල්ල පංචශීල ප්‍රතිපත්තියෙන් ආවරණය වන බල ප්‍රදේශය තුළ විසිරි ඇති බවයි. බෞද්ධ ඉගැන්වීමට අනුව මේ සියලු ව්‍යසනයන්ට මුල් වන ප්‍රධානතම හේතුව මිනිසා පංචශීල ප්‍රතිපත්තියෙන් විතැන් වී තම අභිමතය පරිදි පමණක් ආත්මාර්ථකාමී ප්‍රතිපදාවක පිහිටා කටයුතු කිරීමට පෙලඹීම යි.

සදාචාරශීලී යහපත් පුරවැසියෙකු ගොඩනගා ගැනීම සඳහා බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද සුත්‍ර ධර්ම රැසකි. මහාමංගල, පරාභව, සිගාලෝවාද, ව්‍යග්ඝපජ්ජ වැනි සුත්‍ර ඒ අතුරින් වැදගත් වේ. සිගාලෝවාද සුත්‍රයේ මව්පිය දුදරු සම්බන්ධතාව, ගුරුශිෂ්‍ය සම්බන්ධතාව, අඹුසැමි සම්බන්ධතාවය, ස්වාමි-සේවක සම්බන්ධතාව හා ගිහිපැවිදි සම්බන්ධතාව පිළිබඳ ව දීර්ඝ වශයෙන් විශ්ලේෂණය කර ඇත. මෙහි දී සමාජ තත්ත්වය, කාර්ය කොටස්, සමාජ සම්බන්ධතා, සමාජ ව්‍යුහය, සමාජ ඒකාග්‍රතාවය, සමාජ සංවිධානය, අපගමනය වැනි ඉතා වැදගත් සමාජවිද්‍යාත්මක සිද්ධාන්ත රැසක් පිළිබඳ ව ක්‍රි. පූ. 06 වැනි සියවස තරම් ඈත අවධියක දී ඉතා ගැඹුරින් විශ්ලේෂණය කර තිබීම විශේෂත්වයකි. සාපරාධී පෞරුෂත්වයකින් තොර යහපත් පුරවැසියෙකු නිර්මාණය කර ගැනීම එහි අවසන් ඉලක්කය විය. ඒ අනුව කිසියම් සමාජයක අපරාධ ඇතිවීමට පෙර එවැනි තත්ත්වයන් උද්ගත වීම වළක්වා ගැනීම කෙරෙහි විශේෂ උනන්දුවක් දක්වීම අපරාධ නිවාරණයෙහි ලා බෞද්ධ ඉගැන්වීමෙහි ඇති විශේෂත්වය බව අධ්‍යයනයෙන් අනාවරණය වේ.

පර්යේෂණ ගැටලුව, පර්යේෂණ අරමුණු

අපරාධ නිවාරණයෙහිලා බෞද්ධ ඉගැන්වීම්වල උපයෝගීත්වය කෙබඳු දැයි අධ්‍යයනය කිරීම

පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණයෙන් අපරාධ වැළැක්වීම සඳහා බෞද්ධාගමික ඉගැන්වීම්වලින් ලැබෙන්නා වූ දායකත්වය කොතෙක් ද යන්න පිළිබඳව අධ්‍යයනය කරයි. මෙය ප්‍රාථමික හා ද්විතියික මූලාශ්‍රය දත්ත පදනම් කරගෙන සිදුකරනු ලැබූ අතර එහි දී ඊට අදාළ පොත්පත්, ලිපි, සඟරා හා අන්තර්ජාලය උපයෝගි කරගනු ලැබිණි. අධ්‍යයනයේ දී සවිස්තරාත්මක ව ගුණාත්මක දත්ත විශ්ලේෂණයක් සිදු කරනු ලැබිණි.

ප්‍රතිඵල හා සාකච්ඡාව

මහාමංගල සුත්‍රයේ දී 'පුත්තදාරස්ස සංගහෝ' යනුවෙන් බුදුන්වහන්සේ පෙන්වා දෙනු ලබන්නේ පවුල නමැති සමූහය තුළ උපත ලබන දුදරුවන් රැක බලාගනිමින් නිවැරදි මඟ යොමු කිරීම හා සම්බන්ධයෙන් දෙමව්පියන් වෙත පැවරෙන වගකීම පිළිබඳවයි. එපමණක් නොව සිගාලෝවාද සුත්‍රයෙහි දෙමාපිය දුදරු සම්බන්ධතාව පිළිබඳ විග්‍රහයේ දී දෙමාපියන් විසින් ස්වකීය දරුවන් උදෙසා ක්‍රියා කළ යුතු ආකාරය මැනවින් පෙන්වා දී ඇත. දුදරුවන් පවින් වළක්වාලීම, යහපත් මාර්ගයෙහි යොමු කරවීම, ධර්මශාස්ත්‍රාදිය ඉගැන්වීම, නිසි වයසේ දී ආවාහවිවාහ කරදීම, සුදුසු කාලය එළැඹි විට වස්තුව පවරා දීම යනු දෙමාපියන් විසින් සිය දරුවන් වෙනුවෙන් ඉටු කළ යුතු යුතුකම් ය. මේවා

නොපිරිහෙළා ඉටුවුවහොත් සමාජශීලී යහපත් පුරවැසියෙකු බිහි වේ. එම සූත්‍රයෙහි ම ගුරු ශිෂ්‍ය සම්බන්ධතාව විග්‍රහ කර දක්වන බුදුන්වහන්සේ ගුරුවරයාගේ පාර්ශ්වයෙන් ඉටුවිය යුතු යුතුකම් 05 ක් පිළිබඳව ද වදාළහ. මනාකොට හික්මවීම, හොඳින් ශිල්පශාස්ත්‍ර උගැන්වීම, ශිෂ්‍යයා ඉගෙනුම ලබන පන්ති මට්ටමට සරිලන පරිදි උගැන්වීම, මිත්‍රාමාත්‍යාදීන්ට හඳුන්වාදීම, ශිෂ්‍යයා ආරක්ෂා කිරීම යනු එම යුතුකම්ය. සිගාලෝවාද සූත්‍රයෙහි බැහැර කළ යුතු මිතුරන් සිවු දෙනෙකු පිළිබඳ දේශනා කොට ඇත. එනම් අඤ්ඤදත්තුහර, වචීපරම, අනුප්පියභාණී හා අපායසහායක වශයෙනි. පවිටු මිතුරන් ඇසුර, රහමෙර පානය, නොකල්හි වීදි සංචාරය, දූ කෙළිය, ස්ත්‍රී ධුර්තතාව වැනි දුර්ගුණවලට ඇබ්බැහිවීමට හේතු වේ. ආශ්‍රය කළ යුතු කල්‍යාණ මිත්‍රයන් සිවු දෙනෙකු පිළිබඳව ද සිගාලෝවාද සූත්‍රයෙහි දැක්වේ. එනම් උපකාරක, සමාන සුඛදුක්ඛ, අත්තක්ඛායි හා අනුකම්පක වශයෙනි. දෙමාපිය, වැඩිහිටි ගුරුභවතුන්ගේ නිසි මග පෙන්වීම හා යහපත් මිත්‍ර ආශ්‍රය ලබන්නන් සත්පුරුෂයන් වන අතර ඔවුන්ගෙන් සමාජයට අපරාධයක් සිදුවීමට ඇති ප්‍රවණතාව ඉතා අඩු ය.

දීඝනිකායේ චක්කවත්තිසීහනාද සූත්‍රයෙහි බුදුරජාණන්වහන්සේ විෂම සමාජයක් නිර්මාණය වන ආකාරය හා අපරාධ හටගන්නා ආකාරය විවරණය කර දැක්වුහ. රටක පාලකයා සතර සංග්‍රහ වස්තුවෙන්, දස රාජධර්මයෙන් රාජ්‍ය පාලනය ගෙන යා යුතු බව බුද්ධ දේශනාවයි. පාලකයා මෙවැනි ප්‍රතිපත්ති ආරක්ෂා වන පරිදි රටක පාලනය මෙහෙය වන විට නිතැතින් ම යහපත් පාලනයක් හා සියල්ලෙන් සපිරි රටක් උරුම වේ. මෙයින් පැහැදිලි වන්නේ යහපත් සමාජයක් ගොඩනැගීමේ ක්‍රියාවලිය පාලක පක්ෂයෙන් මුලින් ම ආරම්භ විය යුතු බවයි. ගිහි සමාජය පමණක් නොව සංඝසමාජය ද ශික්ෂණය කිරීමේ අවශ්‍යතාව ද බුදුන්වහන්සේ හඳුනා ගත්හ. විමුක්තිය අරභයා සසුන්ගත වන කෙනෙකු චර්යාමය වශයෙන් සුවිශේෂ තත්ත්වයක් අපේක්ෂා කළ යුතු වන බැවින් බුදුන්වහන්සේ පැවිදි සමාජය ක්‍රමවත් කිරීම සඳහා විනය ප්‍රඥප්ති විශාල ප්‍රමාණයක් පනවා අත්තේ එබැවිනි.

නිගමන හා නිර්දේශ

බෞද්ධ ඉගැන්වීම් අනුව අපරාධ යනු පුද්ගලයා හා සමාජය අතර ගොඩනැගෙන පරතරයේ ප්‍රතිඵලයකි. බුදුදහම මගින් මෙම පරස්පරතාව මැනවින් තේරුම්ගෙන ඇත. නවීන අපරාධවිද්‍යාව මගින් මූලික වශයෙන් අපරාධ කළමනාකරණය කෙරෙහි අවධානය යොමු කරනු ලැබුව ද, ක්‍රි. පූ. 06 වන සියවස තරම් ඈත අවදියක දී බිහි වන බුදුදහම මගින් ඒ දෙස හෙළනු ලබන දෘෂ්ටිය ඊට වඩා බොහෝ සෙයින් ගැඹුරු ය. සියලු අපරාධවල වගවුත්තරකරුවා වන මිනිසාගේ ජන්ම ගති ස්වභාවයන් යටපත් කර ඔහුගේ ආත්මය සදාචාර ගති සිරිත්වලින් පෝෂණය කිරීම මගින් පමණක් එකී ඉලක්කය ජය ගත හැකි බව බුදුදහමේ ඉගැන්වීමයි. ඒ අනුව අපරාධවලින් මිදීමේ වඩාත් තර්කානුකූල හා සාර්ථක මඟ බුදුදහමින් පෙන්වා දී ඇත. ඒ අනුව පැහැදිලි වන්නේ අපරාධවලින් සමන්විත වත්මන් ලෝකයට බුදුදහම ඇසුරු කළ යුතු කාලය එළැඹී ඇති බවයි.

ප්‍රමුඛ පද : *අපරාධ, අපරාධ වළක්වාලීම, බෞද්ධාගමික ඉගැන්වීම්, ආචාරධර්ම පද්ධතිය, සදාචාරශීලී යහපත් පුරවැසියන් වීම*

ආශ්‍රිත ග්‍රන්ථ

අභයසුන්දර, පී. (2002). *බෞද්ධ සමාජ පාලනය හා අපරාධ විද්‍යාව.* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
ජයසිංහ, ඒ. කේ. ජී. (2013). *අපරාධවිද්‍යාව.* කඩුල්ල ප්‍රකාශන.
තේජෝරංසි හිමි, එච්. (1990). *අපරාධ පිළිබඳ බෞද්ධ මතය: සමාජවිද්‍යාත්මක විමර්ශනයකි.* ප්‍රගති කාර්මික පදනම.
දීඝනිකාය 02, (2005). බු.ජ.මු. බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
හෙට්ටිආරච්චි, ඩී. (2001). *බෞද්ධ සමාජවිද්‍යා ප්‍රවේශය.* දයාවංශ ජයකොඩි සහ සමාගම.

The Utility of the Mānsabhakṣaṇaparivarta in the Lankāvatārasūtra in Creating Equality in Society

D. M. A. K. C. Dissanayake* and Rev. S. Shanthasiri
Languages, Cultural Studies & Performing Arts, University of Sri Jayewardenepura, Sri Lanka
**amith21594@gmail.com*

Introduction

The Schism which was created after the Second Dhamma Sangāyanā was stabilized with the Fourth Dharma Sangāyanā held under the patronage of King Kanishka. The concept of Mahāyāna was further developed after composing the *Navadharmashastra*. The Lankāvatārasūtra is one of them. This Sūtra is considered the main Mahāyāna textbook in countries like China, Nepal and so forth. This Sūtra is a ten-chapter work. This book contains many teachings preached by the supreme Buddha on his visit to the kingdom of Ceylon for the benefit of the people, including King Rāvaṇa. It contains teachings such as great Kindness, great Wisdom, an unborn form of the World, and the concept of Māyā. The eighth chapter, The Mānsabhakṣaṇaparivarta, mentions the teachings of the Carnivore. At the invitation of the Mahāmati Bodhisattva, the Supreme Buddha preached on the subject of Eating meat. Equality is a word commonly used today. Even established by the United Nations Universal Declaration of Human Rights, Equality can be interpreted as treating all people equally. Accordingly, it means treating everyone equally, regardless of religion, ethnicity, or gender. As much as there is talk of equality, it can be seen that it is being violated today. There is a society where not only human beings but even animals are violating their rights. The flesh is the body parts of another animal. To obtain that flesh, another animal must be killed. This results in the loss of the right to life of those animals. The Māṁsabhakṣaṇaparivarta states that people should abstain from eating meat.One does not eat meat, and therefore does not buy meat. So there is no such thing as an animal killer. Here it is clear that carnivore is a factor that directly affects the preservation of equality. The purpose of this study is to examine the application of the facts mentioned in the Māṁsabhakṣaṇaparivarta on the prevention of meat- eating in today's society to bring about equality.

Research Problem/s, Objective/s

Are the facts about meat- eating in the Māṁsabhakṣaṇaparivarta of the Lankāvatārasūtra useful in creating equality? How can it be used to protect the rights of beings in today's society? The study was conducted based on these research problems. The main purpose of this research is to create a sense of equality for the people in society and the other animals. Other objectives are to minimize social misconduct and to spread the message of the right of all to live equally free from violence.

Materials and Methods

In this study, a mixed research methodology was adopted using both qualitative as well as quantitative research methods. In qualitative methodology, facts were analyzed under text and context analysis methods. Here the facts were collected using the literature source study method and field study methods. The Lankāvatārasūtra was used as the main and primary source and the English and Sinhala translations as the secondary source. Data were collected from twenty randomly selected individuals through interviews and quizzes under the field study method. Individuals who eat or do not eat meat were asked about the causes, and the data were collected and analyzed according to a data analysis methodology.

Results and Discussion

The following are some of the issues that are directly related to equality in the prevention of meat-eating mentioned in the Māṁsabhakṣaṇaparivarta. That is, the seeker of the truth, which is based primarily on grace, should abstain from eating meat and the animal that inherits a long pilgrimage has a different birth. Sometimes as a human being, another time, the same person can be born as an animal. In this way, according to one's kinship, there is hardly anyone who has not been in the company of a mother, father, and child or even as a pet. According to that, people in such relationships may have been born as different

kinds of beings at different birth for different reasons. Therefore, one should abstain from eating meat, considering that the meat may belong to any animal of this nature, whether it be a former parent, child, or pet. All animals must be treated like one's own son. Indirectly as a reference to avoid eating meat when an animal dies, it emits a very unpleasant odour. How can such disgusting body parts be eaten? Also, there are various diseases caused by eating meat and deterioration in the cultivation of spiritual virtues as food arouses suppressed emotions. For this reasons, it has been stated that one should not eat meat that has been killed for oneself, killed at one's own will, or in one's consciousness. As a result, one does not eat meat and therefore does not buy meat. So there is no such thing as an animal killer. Here it is clear that carnivore is a factor that directly affects the preservation of equality.

According to the information obtained from the questionnaire, 3% do not eat meat for various reasons. Only 33% of them abstained from eating meat out of compassion. Also, 20 people participated in the quiz given to avoid eating meat based on the facts mentioned in the Lankāvatārasūtra and 50% of them decided to abstain from eating meat based on these facts.




Figure 1. Result of Herbivore and Carnivore




Figure 2. Results of Avoid and Non-Avoid Meat Eating

Conclusion and Recommendations

This is clear from the facts mentioned in this Sūtra that many people can be saved from eating meat. It can bring equality to humans as well as other beings. Most people in a country are parents. Therefore, parents can be used first and foremost to achieve this equality. By showing that all animals can be born as their children or in some other form, they can be made non-violent and thereby create equality.

Keywords: *Carnivore, Herbivore, Equality, Lankāvatārasūtra, Correlation*

References

Nanjing, B. (Edition). (1918). *Lankāvatārasūtra*. Otani University Press.
Suzuki, D, T. (1930). *Studies in the Lankavatara Sutra*. Routledge and Kegan Paul LTD.
Suzuki, D, T. (Translation). (1966). *The Lankavatara Sutra*. Reprinted. Routledge and Kegan Paul LTD.

A Revision on the Concept of Mahāyāna Bodhisatva as Depicted in Nikāya Texts

Ven. H. Padumarathana Thero* and Ven. W. Dhammarathana Thero
Department of Pali and Buddhist Studies, University of Sri Jayewardenepura, Sri Lanka
**hpadumarathana@gmail.com*

Introduction

According to the Mahayanists, a Bodhisattva is anyone who, motivated by great compassion, has generated Bodhicitta, which is a spontaneous wish to attain Buddhahood for the benefit of all sentient beings. In early Buddhism, the Bodhisattva was primarily used to refer to Buddha's former life. The concept of Bodhisattva is one of the populous and emphasized themes in the Mahāyāna tradition. According to some Western scholars, Buddhism is a religion that is slightly different from that of different traditions and countries. By deeply studying on this matter, there is a huge confusion that seems to have been raised as a result of the name given to the same Buddha's teachings such as Mahāyāna Buddhism, especially praised by countries like China, Japan, Korea, and. Vietnam. Theravāda Buddhism is followed by the people of Sri Lanka, Myanmar, Thailand, and Cambodia. The reason why they say so may be due to the acceptance of Buddhism through listening to talks given by various masters from various Buddhist traditions or reading books on Buddhism published by various authors who are yet to examine how far the noble aim of the Buddha's teachings has been realized. Occasionally, researchers are holding a view that it is the Bodhisattva path, the ideal of Mahāyāna, to be followed to become the Buddha while Theravāda emphasizes Arahant, Sāvaka, and Pacceka Buddhahood as ways to be liberated. Therefore, these two traditions are often set in contradiction to each other and described as having different aspirations, teachings, and practices. One such misunderstood concept among the Mahāyāna and non-Mahāyāna traditions is the concept of Bodhisattva.

Research Problem/s, Objective/s

Are there any revisions on the Mahayana Bodhisattva concept in the Nikaya texts?

Materials and Methods

The methodology used in this research is library-based texts written by scholars in the field followed by discussions with specialists in the subject. The data were analyzed using an analytic approach.

Results and Discussion

While Bodhisattva is a Pali word, the Sanskrit term is Bodhisatva. It is a combination of two words; 'Bodhi' means awakening, enlightenment, and enlightened knowledge and 'Satva' means the 'one who is a sentient being'. It is used for the one whose essence is enlightenment. By the implication of 'Bodhisatva' however, is a seeker after enlightenment, a Buddha to be. Sometimes, it is considered as a term that is derived from "Buddhi" and "Satta", meaning "one who is you attached to or desire to gain enlightenment also. Occasionally, Mahāyānists highly respectively discuss the Bodhisatva path to display its highness, the Arahanthood of Theravāda. According to them, Arahants are selfish while Bodhisatva is altruistic. Furthermore, Bodhisatva is a true seeker, who intentionally postpones his enlightenment until all other beings attain Buddhahood. Once all attain Nibbāna, he will attain Buddhahood as the last one.

According to a Sri Lankan scholar namely Venerable Walpola Rahul, who studied Mahāyāna Buddhism for a long time, the idea of the Theravāda, which some scholars conveniently identify with Hīnayāna is to become an Arahant while that of the Mahayana is to become a Bodhisattva and finally to attain the state of a Buddha must be categorically stated that this is incorrect. Further, he added that "the more he studied Mahāyāna, the more he found that there is hardly any difference between Theravāda and Mahāyāna about the fundamental teachings like; the four Noble Truths, the Dependent Origination and Three Characteristics (Anicca, Dukkha, and Anatta) and Sīla, samādhi and paññā. Both traditions also accept the

same Buddha as their teacher. The Pali canon especially 'Ariyapariyesa sutta and Mahāsaccaka sutta of Majjhimanikāya contain the word 'Bodhisatva' referring to the life of the Gotama Buddha before his Buddhahood. Fundamentally, in these references, the Buddha himself claimed he was Bodhisatva saying "Monks, before my awakening and while I was yet merely the Bodhisatva not fully awakened." These citations cover the life of Buddha from the time of his renunciation up to the time of his enlightenment. Acharya abbhuta sutta of Majjhimanikāya also gives reference to the term 'Bodhisatva'. Therein this particular term is used to cover the life of the Goutama Buddha beginning from Tusitha heaven to Buddhahood. The scope of this term, Bodhisatva, also has thus been further used to cover the life of the Buddha Goutama beginning from the Buddha Dīpankara and ending up with his attainment of Buddhahood at the root of the Bodhi-tree at Gayā in ancient India. The Jātaka and Buddhavamsa of Khuddhakanikāya too refer to the life of Goutama Buddha and designated as Bodhisatva and his meeting with the Dīpankara Buddha who lived a long time ago.

Conclusion and Recommendations

In conclusion, since all forms of Buddhist traditions' master is the same Buddha namely Goutama, the aim of his preaching must be the same for the liberation from cosmic suffering, in the end. Due to geographical and cultural backgrounds, there might be slight differences that can be seen nowadays, but fundamental elements of Buddhism ought not to be changed. Although, on account of mere scholarly works, there are things that seem different from tradition to tradition nowadays, basic teachings are as they were taught by Buddha. One such element is the concept of Bodhisatva. The truth is that this concept of Mahāyāna can be seen in Nikāya texts and not limited to Mahāyāna Buddhism as mentioned above. Finally, even the explanation given on Bodhisatva by Mahāyānist is another way of accepting what Theravāda meant. That is to say in short, if the ultimate aim of the Bodhisatva path is to be free from cosmic suffering, doing for others or altruism is another way of doing for oneself to be liberated. At last, the truth is while Mahāyāna developed the concept of Bodhisatva with huge literature works, Theravāda did not feel to develop this particular concept besides trusting early Buddhism's evidence.

Keywords: *Mahāyānists, Bodhisatva, Buddhahood, Tantrayāna, Vajrayāna*

References

Aṃguttaranikāya. (1975). Pali Text Society, London.
Dighanikāya. (1975). Pali Text Society, London.
Majjhimanikāya. (1975). Pali Text Society, London.
Coomaraswamy, A. (1975). *Buddha and the Gospel of Buddhism.* University Books.
Rahula, W. (1996). *Bodhisattva Ideal in Buddhism*: *Gems of Buddhist Wisdom*, 461-471.

පාරිහාරික බුදු සමයේ ස්වරූපය; ශ්‍රී ලාංකේය බෞද්ධ සංස්කෘතිය ඇසුරින් විමර්ශනාත්මක අධ්‍යයනයක්

එස්. යූ. දිසානායක
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
dissanayakasandamali1996@gmail.com

හැඳින්වීම

බුදු දහම සමාජගත ආයතනයක් ලෙස ස්ථාපනයේ දී, මූලික දාර්ශනික සංකල්පවලට වඩා ප්‍රායෝගික අංශය වෙත වැඩි නැඹුරුතාවක් දක්වයි. එහි නිර්මල දහම හා ප්‍රතිපත්තිමය පූජාවන් ඇති අතර ශාන්ති කර්ම, උත්සව, පෙරහැර ආදී ඇදහිලි ක්‍රම අන්තර්ගත වේ. පාරිහාරික බුදුදහම මිනිස් ජීවිතයේ සියලු අංශ කෙරෙහි බලපානු ලබයි. අපගේ දෛනික ජීවිතය තුළ ශාරීරික, මානසික, සමාජීය, ශාස්ත්‍රීය, සුභ සාධන, දාර්ශනික, දෛව විද්‍යාත්මක, මූල්‍යමය, දේශපාලනික, නව විද්‍යාත්මක අංශයන්හි සියලු අවශ්‍යතා ඇතුළත් බෞද්ධ ඉගැන්වීම් ක්‍රියාවට නැංවීම පාරිහාරික බුදු සමය ලෙස හැඳින්විය හැකිය. මුල් බුදු සමයෙහි මූලික අපේක්ෂාව වූයේ පුද්ගලයා විමුක්ති සාධනයෙහි නිමග්න කරවීම හෙයින්, එහිදී වන්දනා මාන ආදියට මූලිකත්වයක් හිමි නොවන්නට ඇත. ජන විඥානයට බුදුදහම සමීපවීමත් සමඟ ව්‍යවහාරික අංශය සමාජය තුළ උද්දීපනය වන්නට විය. බුදු සමයෙන් ප්‍රභවය නොලත්, ආගන්තුක විශ්වාස, චාරිත්‍ර, පුද පූජාවලින් එය සමන්විත විය. බුද්ධ දේශනාවන්හි අසූහාරදහසක් ධර්මස්කන්ධය ඇතුළත්වේ යැයි විශ්වාස කළ ද අනාදිමත් කාලයක් පුරා පැවති මෙම ධර්ම මාර්ගය විවිධ සාධකවල ප්‍රතිඵලය වශයෙන් වෙනස්වීම් සිදු වී ඇති අතර, වර්තමානය වන විට එය ජනප්‍රිය ආගමක් බවට පත්ව ඇත. නුවණැත්තන් උදෙසා දේශිත බුදුදහමේ ගැඹුරු දහම් කොටස් සාමන්‍ය ජනතාවට අවබෝධ කිරීම අපහසු බැවින්, යම් යම් වෙනස්වීම්වලට භාජනය වෙමින් පොදු ජන සමාජයට අනුකූල ලෙස බුදුදහම සකස් වීමක් ලෙස පාරිහාරික බුදු සමය ඇති වූ බව හැඳින්විය හැකි ය.

පර්යේෂණ ගැටලුව, පර්යේෂණ අරමුණු

පාරිහාරික බුදු සමයේ ස්වරූපය, ශ්‍රී ලාංකේය සංස්කෘතිය ඇසුරින් විමර්ශනය කළ හැකි ද? යන්න අධ්‍යයනය කිරීම මෙහි පර්යේෂණ ගැටලුව වේ.

පර්යේෂණ අරමුණ වන්නේ, පාරිහාරික බුදු සමයෙහි ලක්ෂණ, සුවිශේෂතා අධ්‍යයනය කිරීමයි.

පර්යේෂණ ක්‍රමවේදය

ප්‍රාථමික මූලාශ්‍රය ලෙස මහාවංශය, දීපවංශය යන මූලාශ්‍රය භාවිත කළ අතර ද්විතීයික මූලාශ්‍රය රැසක් භාවිත කරන ලදි. සඟරා, කෝෂ ග්‍රන්ථ සහ අන්තර්ජාලය මගින් ලබාගන්නා දත්ත ගවේෂණය හා විශ්ලේෂණය කිරීමෙන් අදාළ ප්‍රස්තුතය පිළිබඳ අධ්‍යයනය කිරීම සිදු කළ අතර, ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය හරහා මෙහි පර්යේෂණ ක්‍රමවේදය සංවිධානගත විණි. ස්වයං සිද්ධි අධ්‍යයනය, සම්මුඛ සාකච්ඡා මෙන් ම ප්‍රශ්නාවලි ලබාදීමෙන් ප්‍රමාණාත්මක පර්යේෂණ ක්‍රමවේදය භාවිත කළ අතර මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය තවදුරටත් භාවිත කරන ලදි.

ප්‍රතිඵල හා සාකච්ඡාව

දෛනික ජීවිතයේ දී පුද්ගලයා මුහුණ පාන ගැටලුවලට බුදු දහමේ දාර්ශනික අංශයෙන් විසඳුම් නොවූ නිසා පාරිහාරික බුදු දහම කෙරෙහි ජනතාව බෙහෙවින් සමීප විය. බුදු දහම ව්‍යාප්ත වීමේ දී එය තත්කාලීන ආගමික, සංස්කෘතික, මූලධර්ම විශ්මය ජනක ලෙස අනුයෝජනය කරගනිමින් ඒවා නව මඟකට පරිවර්තනය කළ කේන්ද්‍රීය බලවේගය බවට පත් විය. බුදුදහම නැවුම් දාර්ශනික ප්‍රබෝධයක් ළංකර දුන්නා සේම, තත් සමාජයන්හි පැවති විවිධ පුද-පූජා, චාරිත්‍ර-වාරිත්‍ර, සිරිත්-විරිත්, විශ්වාස, සාර-ධර්ම හා ප්‍රතිමාන බුදුදහමට ඇතුළත් කරගැනීම ද සිදුවිය. මහින්දාගමනයත් සමඟ නිර්මල බුදුදහම මෙරටට ලැබුණ ද, ඊට පෙර ප්‍රාග් බෞද්ධ යුගයේ පැවති විශ්වාස සහ ඇදහිලි සම්පූර්ණ ලෙසින් ඉවත්ව ගියා යැයි කිව නොහැකිය. එවකට පැවති ඇතැම් විශ්වාස සහ පුද-පූජා බුදු සමයට එකතු වී ඇතැයි සිතිය හැකි අතර, ඇතැම් ජනප්‍රිය අංග බුදුදහමින් තවදුරටත් ශක්තිමත් වී ඇති බව පෙනෙයි. යක්ෂ, ප්‍රේත හා දේවතා සංකල්පය ඊට නිදසුන්ය. මේ සියලු දේ සංකලනයවීම තුළින් ශ්‍රී ලංකාවට ආවේණික ලෙස පාරිහාරික බුදුදහම විකාශය වන්නට විය. එහිදී ප්‍රාග් බෞද්ධ ආගමික විශ්වාසයන්හී එන නවත ම අර්ථකතන එක් කිරීමට මිහිඳු හිමි යොදාගත් ඥානාන්විත ක්‍රියා මාර්ගය අගය කළ හැකි ය. මිහිඳු මහරහතන් වහන්සේ වැඩම කිරීමට පෙර ලක්දිව විවිධ පුද පූජා, ඇදහිලි-විශ්වාස පැවතුණ ද, උන්වහන්සේගේ ආගමනයෙන් පසුව මුල් ඇදහීම්වල ආකෘතිය චින්තනය නවමු මඟකට යොමු කෙරිණි. වෘක්ෂ වන්දනය වෙනුවට බෝධි වන්දනය, පර්වත වන්දනය වෙනුවට ස්තූප වන්දනය ආදිය සිදු වූ අතර, දේව පූජාවන්ට බෝධි පූජා ආදිය පැවැත්වීම පාරිහාරික බුදු සමයෙන් ජනප්‍රිය විය. චිත්තරාජ, කාලවේල, වළඅමුබී වැනි යක්ෂයන්ගේ දේවාල වෙනුවට ජීවමාන බුදුරදුන් සිහිවීමට බුද්ධ ප්‍රතිමා සෑදූ අතර බුද්ධ පූජා පැවැත්වීම, ගිලන් පස පූජා, ශබ්ද පූජා ආදි තේවාවන් ආරම්භ කරන ලදි. උපසම්පදා පිංකම, කාන්තා පැවිද්ද, බෞද්ධ පෙරහැර ක්‍රමය, දළදා පෙරහැර ද ලාංකේය සංස්කෘතියට එකතු වූයේ පාරිහාරික බුදුසමයෙනි. පාරිහාරික බුදුසමයේ ස්වරූපය, ශ්‍රී ලාංකේය සංස්කෘතිය ඇසුරින් විමසන කළ පුද්ගලයාගේ උපතේ සිට මරණය දක්වා සෑම කාර්යයක් සඳහා ම බුදුදහම සම්බන්ධ වන බව දැකගත හැකි ය. මහින්දාගමනයෙන් පසු ශ්‍රී ලාංකේය ජනතාව සමාජ සාරධර්ම කෙරෙහි නැඹුරුවීම දැකගත හැකිවිය. ලාංකේය ජනතාව තෙරුවන් සරණ ගිය ජනතාවක් වීම, පංචශීලය නිත්‍යශීලය ලෙස සැලකීම, ලාංකේය සංස්කෘතිය විදහා දක්වන දාගැබ්, ආර්ථික තත්ත්වය පෙන්නුම් කරන වැව් ආශ්‍රයෙන් ලාංකීකයන්ගේ කලා කුශලතාව සහ තාක්ෂණ ඥානය විදහා දැක්විය හැක්කේ පාරිහාරික බුදු සමයේ ආභාසයෙනි. බෞද්ධ සමාජ ධර්ම අනුව හැඩ ගැසුණු ජනතාව

ත්‍රිවිධ රත්නය පිවිතයේ සෑම අවස්ථාවකට ම සම්බන්ධ කොට ඇත. එසේ සම්බන්ධ වූ බෞද්ධ චාරිත්‍රවල දැකිය හැකි පොදු ලක්ෂණ කිහිපයක් හඳුනාගත හැකි ය. ඖෂධ, ආහාර-පාන, මල්-පහන්, සුවඳදුම් චීවර ආදිය බුදුරාජාණන් වහන්සේට පිදීම, ගෞරවයෙන් වන්දනා කිරීම, ධර්ම දේශනා, මන්ත්‍ර සජ්ඣායනා කිරීම, ශාරීරික මුද්‍රා ප්‍රදර්ශනය කිරීම, පිරිත් නූල් බැඳීම හා සංකේත භාවිතය, යන්ත්‍ර පැළඳීම, උත්සව පැවැත්වීම, පින් අනුමෝදන් කිරීම ආදිය පාරිහාරික බුදු සමයෙන් ලාංකේය ජනතාවට උරුම වූ සුවිශේෂතා ය. මිනිසුන්ගේ සෑම අංශයක් සඳහා ම පාරිහාරික බුදු සමය බලපා ඇත. මව්කුස පිළිසිඳ ගැනීම, බිහිවීම, රන්කිරි කටගෑම, ඉඳුල් කටගෑම, හිසකෙස් කැපීම, අවාහ-විවාහ වීම පමණක් නොව විපත් ආදි සෑමවිට ම පාරිහාරික බුදු සමය උපයෝගී කොටගෙන ඇත. ලක්වැසියෝ දිවා කාලයේ ගොවිතැන් කළ අතර රාත්‍රී කාලයේ විහාරස්ථානවලට එක්වුහ. සියල්ලන් ම සමඟි සම්පන්නව බුද්ධ පූජා, බෝධී පූජා පවත්වා ඇත. පිරිත් දේශනය ද පාරිහාරික බුදුසමයෙන් ලාංකීකයන්ට තිළිණ වූවකි. පොදු ජනයාට ආරක්ෂාව හා ආශීර්වාද පිණිස තුනුරුවන් විෂයයෙහි පවතින්නකි. වර්තමානය වන විටත්, පිරිත අතිශය ජනප්‍රිය වී ඇත. සති පිරිත්, තුන්තිස් පෑ පිරිත්, වරු පිරිත්, වත් පිරිත්, සෙත් පිරිත් ආදී ලෙස උපතට පෙර අංගුලිමාල පිරිත දේශනා කරගැනීම අදටත් ජනප්‍රිය ව ඇත. පිරිත ප්‍රාණ වස්තූන් කෙරෙහි පමණක් නොව අප්‍රාණ වස්තු කෙරෙහි ද, ආරක්ෂාව සලසන බව බෞද්ධයන් විශ්වාස කරති. යාන-වාහනවල පිරිත් නූල් බඳින්නේ මෙහි ප්‍රතිඵලයක් වශයෙනි. මියගිය ඥාතීන්ට පිංදීම, පිං අනුමෝදන් කිරීම, අවමඟුල් උත්සවවලදී මතක වස්තු පූජා කිරීම, සමහර පළාත්වල ජීවදාන පූජා පැවැත්වීම ආදිය පාරිහාරික බුදු සමයෙන්, ශ්‍රී ලාංකේය සංස්කෘතියට තිළිණ වූවකි. සාකච්ඡාවේ ප්‍රතිඵල ලෙස පාරිහාරික බුදු සමය; ශ්‍රී ලාංකේය සංස්කෘතිය ඇසුරින් විමර්ශනය කරන කල පෙනී යන්නේ, මුල් බුදුසමයෙහි මූලික අපේක්ෂාව වූයේ පුද්ගලයා විමුක්ති සාධනයෙහි නිග්මන කරවීම හෙයින්, එහිදි වන්දනා මාන ආදියට මූලිකත්වයක් හිමි නොවන්නට ඇති බවත්, ජන විඥානයට බුදුදහම සමීපවීමත් සමඟ, ව්‍යවහාරික අංශය සමාජය තුළ උද්දීපනය වන්නට ඇති බවත්ය. ඇතැම්විට බුදු සමයෙන් ප්‍රභවය නොලත්, ආගන්තුක විශ්වාස, චාරිත්‍ර, පුද පූජාවලින් ද, පාරිහාරික බුදුසමය වර්තමානයේ දී සමන්විත වේ. අනාදිමත් කාලයක් පුරා පැවති මෙම ධර්ම මාර්ගය කාලයාගේ ඇවෑමෙන් විවිධ සාධකවල ප්‍රතිඵලයක් වශයෙන්, විවිධ වෙනස්කම් ඇති වී ඇති අතර, වර්තමානය වන විට එය ජනප්‍රිය ආගමක් බවට පත් ඇත. ප්‍රායෝගික ව ගත් කල බෝධි වන්දනය, ස්තූප වන්දනය, ප්‍රතිමා වන්දනය, ගිලන් පස පූජා, ශබ්ද පූජා, බෞද්ධ පෙරහැර, දළදා පෙරහැර ක්‍රමය, ආධ්‍යාත්මික ප්‍රගතිය, සාරධර්ම සංවර්ධනය, පිරිත් සජ්ඣායනය, පිරිත් නූල් බැඳීම, මියගිය ඥාතීන්ට පිංදීම, පිං අනුමෝදන් කිරීම, ආදිය පාරිහාරික බුදු සමයෙන් ශ්‍රී ලාංකේය සංස්කෘතියට තිළිණ වූ ප්‍රතිඵල ලෙස පෙන්වාදිය හැකි ය.

නිගමනය සහ නිර්දේශ

සමාජ ආයතනයක් ලෙස දියුණු වී ඇති බුදුදහම පාරිහාරික බුදුසමයි. පාරිහාරික බුදුසමයේ ස්වරූපය ලාංකේය සංස්කෘතිය ඇසුරින් විමසීමේ දී නිගමනය කළ හැකි වන්නේ, පුද්ගල අවශ්‍යතාව උදෙසා පාරිහාරික බුදුදහම යොදාගෙන ඇති බවයි. පුද්ගල පීවිතයට යම් සෙතක් ශාන්තියක්, මානසික තෘප්තියක් ලබා ගැනීම යනාදී කාරණා සඳහාත්, අපල-උපද්‍රව දුරු කරගැනීම සඳහාත් පුද පූජා පවත්වා ඇත. යම් ආගමක් ලෝකය තුළ ප්‍රචලිත වීම එම ආගමේ උන්නතියට හේතුවේ. බුදුදහම ශිෂ්‍යයෙන් ලෝකයේ පැතිර ගොස් ජාතික ආගම බවට පත්වීමේ රහස මිනිසුන්ගේ විශ්වාසයන් අවහිර නොකිරීම, ඔවුන් කැමති පරිදි ආගම-දහම පිළිපැදීමට නිදහස දීම, බුදුදහමට පටහැනි විශ්වාස වුවද, ඉවසීමෙන් සැලකීම ආදියයි. බෞද්ධ ඉතිහාසයේ දක්නට ලැබෙන සමස්ත ක්‍රියාවලිය බෞද්ධ මූලයන්ට හානි නොවන්නට ද, සිදු වී ඇති බව අවසාන වශයෙන් නිගමනය කළ හැකි ය. මේ ආකාරයට පාරිහාරික බුදුසමයේ ස්වරූපය; ශ්‍රී ලාංකේය බෞද්ධ සංස්කෘතිය ඇසුරින් නිදසුන් සහිත ව, අධ්‍යයනය කළ හැකි ය.

ප්‍රමුඛ පද: *පාරිහාරික, පූජා, බුදුදහම, සංස්කෘතිය, ශ්‍රී ලාංකේය*

ආශ්‍රිත ග්‍රන්ථ

අධිකාරම්, ඊ. ඩබ්ලිව්. (2013). *පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය*. බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
ආරියරත්න, ඊ. (2009). *පූජා චාරිත්‍ර සංහිතා*. සදර්ලන් ප්‍රින්ටින් හවුස් (පුද්) සමාගම.
ජයවර්ධන ඩබ්ලිව්. ඒ. (1964). *පුරාතන ලංකාව*. එම්. ඩී. ගුණසේන සමාගම.
ධම්මරතන හිමි, කේ. (2006). *ලක්දිව ප්‍රායෝගික බුදු සමය*. සරස්වතී ප්‍රකාශන.
ධම්මපාල හිමි, ජී. (2005). *ලක්දිව සිංහල බුද්ධාගම*, කඹුරුපිටිය.
Adikaram, E.W. (1944). *Early histroy of Buddhism in Ceylon*. Buddhust Cultural Centre.
Walpola, R. (1956). *Histroy of Buddhism in Ceylon*. Buddhust Cultural Centre.

ඡබ්බග්ගිය භික්ෂූන්ගේ අශ්‍රාමණික පැවතුම් හා විනයශික්ෂා: චුල්ලවග්ගපාළියේ බුද්දකවත්ථුක්ඛන්ධකය ඇසුරින් කෙරෙන විමසුමක්

එච්. පදුමරතන හිමි
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
hpadumarathana@sjp.ac.lk

හැඳින්වීම

ඡබ්බග්ගිය භික්ෂූන් බුද්ධකාලීන භික්ෂු සමාජයේ ජීවත් වූ අශ්‍රාමණික ගති පැවතුම්වලින් යුත් භික්ෂු පිරිසකි. ඔවුන් මුල් කරගෙන පැන වූ විනය ප්‍රඥප්තීන් හතළිස් එකක් පමණ චුල්ලවග්ගපාළි බුද්දකවත්ථුක්ඛන්ධකයෙහි විද්‍යමාන වේ. එහි ඇතුළත් ප්‍රඥප්තීන් අතුරින් සැලකිය යුතු ප්‍රමාණයක් පැනවීමෙහි ලා හේතු වී ඇත්තේ සවග මහණුන්ගේ අශ්‍රාමණික පැවතුම් ය.

පර්යේෂණ ගැටලුව, පර්යේෂණ අරමුණු

බුද්ධකාලීන භික්ෂු සමාජයේ ම එක්තරා නියෝජනයක් වූ ඡබ්බග්ගිය නම් භික්ෂූන්ගේ නානාවිධ විනය විරෝධී ක්‍රියාකාරකම් හා හැසිරීම් රටා භික්ෂු සමාජයට වැරදි පූර්වාදර්ශයන් සපයන්නක් බවට පත්විය. විනයශික්ෂා කෙරෙහි අවධානය නොතකා සිය මතයට අවැසි පරිදි කටයුතු කිරීම මෙම පිරිසෙහි අරමුණ විය. මෙය භික්ෂු සමාජයේ පරිහානියට ද හේතු විය. ඔවුන්ගේ එම අශ්‍රාමණික පැවතුම් විනයශික්ෂා පැනවීමෙහිලා හේතු වූයේ ද යන්න සාකච්ඡා කිරීම මෙහි පර්යේෂණ ගැටලුව වේ.

පර්යේෂණ ක්‍රමවේදය

ප්‍රාථමික මූලාශ්‍රය, ද්විතීයික මූලාශ්‍රය මඟින් ලබාගන්නා දත්ත විශ්ලේෂණය කිරීමෙන් අදාළ ප්‍රස්තුතය පිළිබඳ අධ්‍යයනය කිරීම. ප්‍රධාන වශයෙන් විනය පිටකය හා එහි අටුවාව ද, අවශ්‍යතාවන් අනුව ත්‍රිපිටකයේ සෙසු කොටස් හා මනෝ විද්‍යාත්මක කරුණු ද, උපයෝගී කරගනිමින් බෞද්ධ විනය නීතිරීති විමර්ශනයට ලක් කිරීමට අපේක්ෂා කෙරේ.

ප්‍රතිඵල හා සාකච්ඡාව

මුල් කාලීන බෞද්ධ භික්ෂු සමාජයේ පැවිද්ද ලද බොහෝ දෙනෙක් පැවිදි වීමට පෙර ඉතා උසස් අන්දමේ ගෘහස්ථ ජීවිත ගතකොට පසුව එහි ආදීනව පිළිබඳ දැන සසර කළකිරී විමුක්තිය සොයා ගොස් පැවිදි බිමට පත් වුවෝ වුහ. පැවිද්දේ වටිනාකම පිළිබඳව තේරුම් ගත් ඔවුහු අඩු බලාපොරොත්තු ඇති අපිස් ජීවිතකයකට හුරු වූ පිරිසක් වූහ. කාය චිත්ත විවේකයට තුඩු දෙන පරිසරයකින් හෙබි බෞද්ධ සංඝ සමාජය ඔවුන්ගේ පරමාර්ථ සාධනය සඳහා තෝතැන්නක් විය. සරල මූලික ප්‍රතිපත්ති හතරක් වූ නිස්සය ධර්ම බෞද්ධ භික්ෂු ජීවිතයෙහි පදනම විය. ඕවාද ප්‍රාතිමෝක්ෂයට අනුව පඨමාභිසම්බෝධි සමයෙහි භික්ෂුවට ශික්ෂා පද පැනවීමක් අවශ්‍ය නොවිණි. කුඩා වුව ද වරදෙහි බිය දකිමින් ඔවුහු ආචාර සම්පන්න ව විසූහ. පෙළ දහමෙහි දක්නට ලැබෙන ආකාරයට පඨමාභිසම්බෝධි සමයෙහි භික්ෂූන් වෙත පැවති පිරිපුන්, වඩනා ලද සිත්ගන්නා සුළු පෞරුෂය හා උසස් චරිත සංවර්ධනය විෂයයෙහි ද හේතු වූයේ ප්‍රකෘති සීලය යි. උන්වහන්සේලාගේ සංවරය හුදු බාහිර උපශාන්ත බවක් නොවූ අතර එය ඇතුළු හදින්ම උපන් විනයක් විය. උන්වහන්සේලා අතීතය ගැන සෝක නොකළහ. අනාගතය පිළිබඳ අසීමිත අපේක්ෂා නැත්තෝ වූහ. වර්තමානයෙන් ම යැපුනේ ප්‍රසන්න ව ප්‍රබෝධමත් ව විසූහ. සමගිව සතුටු සිතැති ව කයින්, වදනින් මෛත්‍රී සහගත වූහ. මෙය වූ කලී රාග විනය, දෝස විනය, මෝහ විනය වෙත යොමු වූ උසස් ම චරිත සංවර්ධනය යි. මේ අනුව පැහැදිලි වන්නේ පඨමාභිසම්බෝධි සමයෙහි භික්ෂු සමාජය භික්මවීමට ඕවාද ප්‍රාතිමෝක්ෂය මෙන් ම සාමඤ්ඤඵල වැනි සූත්‍රවල සඳහන් චුල්ලසීල මජ්ඣිමසීල හා මහාසීල යන කරුණු මෙහිලා ප්‍රමාණවත් වූ බව යි.

භික්ෂු ආකල්ප හා පරමාර්ථ විමුක්ති මාර්ගයෙන් පරිබාහිර ව ලෞකිකත්වයට නැඹුරු වූ පශ්චාත් කාලීන භික්ෂු සංස්ථාව තුළ ඇති වූ විවිධ අර්බුදකාරී තත්ත්වයන් පෙළ දහම විමසීමෙන් දත හැකි ය. ශික්ෂා පද පැනවීම සඳහා හේතු වූ කරුණු පහක් (ආඝවට්ඨානීය ධර්ම) පිළිබඳ මජ්ඣිම නිකාය භද්දාලි සූත්‍රය අනාවරණය කරයි. භික්ෂුවගේ පෞද්ගලික ආයති සංවරය සඳහා හේතු වන ශික්ෂා පද පැනවීමෙහි ලා අපේක්ෂිත අරමුණු පාරාජිකාපාළියෙහි මෙන්ම මහාවග්ග පාලියෙහි ද දැක් වේ. එම තොරතුරුවලට අනුව පඨමාභිසම්බෝධි සමයෙහි නිරර්බුද වූ භික්ෂු සංස්ථාවෙහි ඇති වූ අර්බුද විනය ප්‍රඥප්ති පැනවීමෙහි ලා හේතු වූ බව පෙනේ.

ප්‍රඥප්ති සීලය පිළිබඳ විමසීමේ දී චුල්ලවග්ගපාළියට ලැබෙනුයේ සුවිශේෂ ස්ථානයකි. ඒ අතුරින් අපගේ පර්යේෂණ කාර්යය සඳහා උපයුක්ත වූයේ බුද්දකවත්ථුක්ඛන්ධකය යි. පාරාජිකාපාළියෙහි බුදුන් වහන්සේ විසින් පනවනු ලැබූ ප්‍රඥප්තීන් හා අනුප්‍රඥප්තීන් දෙසියයක් පමණ එහි විද්‍යමාන වේ. ඒ අතුරින් ප්‍රඥප්තීන් හතළිස් එකක් ම ඡබ්බග්ගිය භික්ෂූන් අරභයා පනවන ලද ශික්ෂාවන් ය. ඒ අතුරින් කිහිපයක් පහත පරිදි දැක්විය හැකි ය.

- මහණෙනි මුතුවැල් ආදි ගෙල පළඳනා ද, ඉඟ පළඳනා ද, වළලු ද, හස්තාභරණ ඇඟිලි මුදු ආදිය ද නොදැරිය යුතු ය. යමෙකු දැරුයේ වී නම් දුකුලා ඇවැත් වේ.
- මහණෙනි රන්මුවා, රිදීමුවා, මිණිමුවා, වෙරළුමිණි මුවා, පළිඟු මුවා, විදුරු මුවා, ඊයම් මුවා, තඹ ලොහොමුවා පාත්‍ර නොදැරිය යුතු ය. යමෙක් දැරුයේ වී නම් ඔහුට දුකුලා ඇවැත් වන්නේ ය.

- මහණෙනි කැටපතෙන් හෝ දිය බඳුනෙන් හෝ මුහණ දෙස නොබැලිය යුතු. යමෙක් බැලුයේ වී නම් ඔහුට දුකුලා ඇවැත් වන්නේ ය.
- මහණෙනි කොස්සෙන් කෙහෙ නොපීරිය යුතු, පණායෙන් හිස නොපීරිය යුතු, අත් පණායෙන් හිස නොපීරිය යුතු, ඉටි තෙලෙන් හිස කෙහෙ මටසිලිටි නොකළ යුතු, දිය මුසු තෙලෙන් හිසකෙහෙ මටසිලිටි නොකළ යුතු, කළේ වී නම් ඔහුට දුකුලා ඇවැත් වන්නේ ය.

බුද්දක වත්ථුක්ඛන්ධකයට අනුව ඡබ්බග්ගිය භික්ෂූන් සුවිශේෂ චරිත ලක්ෂණවලින් හෙබි පිරිසකි. භික්ෂු ජීවිතයේ පරමාර්ථ පසෙක ලා ලෞකික සම්පත්තීන් කෙරෙහි දැඩි නැඹුරුවක් දක්වීම ඔවුන්ගේ චරිතයන්හි සුවිශේෂතාව යි. බාහිර අලංකරණය සඳහා දැඩි නැඹුරුතාවක් දක් වූ ඡබ්බග්ගිය භික්ෂූන් නිරන්තරයෙන් සෙසු භික්ෂූන් අතර කැපීපෙනීමේ උත්සාහයක නිරත වූ බව ද පැහැදිලි ය. බුද්දකවත්ථුක්ඛන්ධකයෙහි සඳහන් ප්‍රඥප්තීන් හා අනුප්‍රඥප්තීන් හතළිස් එකකම ආදි කම්මිකයන් වන මෙම භික්ෂූන් එම ප්‍රඥප්තීන් නැවත උල්ලංඝනය කළ බවට සාධක නොදක්වෙන නමුදු නිතර භික්ෂු සංස්ථාවේ ඇති කළ අර්බුද පිළිබඳ තොරතුරු එහි දක් වේ. බුද්ධකාලීන භික්ෂු පිරිස් අතුරින් මොවුන් සුවිශේෂ වන්නේ සමාන සිතුම් පැතුම් ක්‍රියාකලාප ඇති සදෙනෙකු වූ කණ්ඩායමක් ව භික්ෂු සමාජය තුළ ජීවත් වෙමින් එහි පැවැත්මෙහි ලා ප්‍රබල බලපෑමක් සිදුකිරීම හේතුවෙනි. ලාභයෙන් අගතියට පත් වූ මොවුහු කුල ගෙවල් හා පැවැත් වූ සමීප සබඳතා පිළිබඳ තොරතුරු ද බුද්දකවත්ථුක්ඛන්ධකයේ දක් වේ.

නිගමන සහ නිර්දේශ

නිතරම බාහිර අලංකාරය පිළිබඳ සැලකිලිමත් වූ භික්ෂූන්ගේ ගිහි පවුල් පරිසරය පිළිබඳව ද, ඇතිකර ගත හැකි නිගමනයක් නම් ඔවුන් ඉසුරුමත් කුලවලින් පැවිදි වූවන් විය හැකි බව යි. විමුක්ති සාධන පරමාර්ථයෙහි ලා නොව වෙනත් යම් යම් ලෞකික ලාභ පරමාර්ථ උදෙසා මොවුන් පැවිදි වන්නට ඇත. විවිධ නොසරුප් ඇඳුම් පැළඳුම් ආදිය භාවිතය ද පාත්‍ර සිවුරු ආදි එදිනෙදා පරිහරණය කෙරෙන භාණ්ඩ ශ්‍රමණ බවට නොගැළපෙන අයුරින් පරිහරණය කිරීමට උත්සාහ දැරීම ද, මොවුන් තුළ පෙනෙන සුවිශේෂ ලක්ෂණය කි. මල් ගඳ, විලවුන්, ආදිය දැරීම, නැටුම්, ගැයුම්, වැයුම් ආදියෙහි යෙදීම වැනි මොවුන් විසින් සිදුකරන ලද විවිධ අශ්‍රාමණික ක්‍රියා කලාපයන් ද බුද්දකවත්ථුක්ඛන්ධකයෙහි දක් වේ, ගිහි කාමභෝගීන් මෙන් ජීවිත ගත කළ මෙම පැවිද්දෝ බුදුරජාණන් වහන්සේගේ නිරන්තර අවධානයට පාත්‍ර වූහ. දිගු කාලීන ශාසනික පැවැත්ම විෂයයෙහි ලා මෙවන් පුද්ගලයන් පිළිබඳ ව අවධානය අත්‍යවශ්‍ය සාධකයක් විය. රන්, රිදී, මුතු, මැණික් ආදිය පරිහරණය කිරීමෙන් අප්පිච්ඡතා (අල්පේච්ඡතාව) සන්තුට්ඨිතා (සන්තුෂ්ටිය) සුභරතා (පහසුවෙන් පෝෂණය කළ හැකි බව) සල්ලහුකවුත්ති (සැහැල්ලු දිවි පැවැත්ම) ආදි ශ්‍රමණ ගුණාංග වලින් තොර වූ මොවුන්ගේ ක්‍රියා කලාපය විනය ප්‍රඥප්තීන් හා අනුප්‍රඥප්තීන් විශාල සංඛ්‍යාවක් පැනවීම සඳහා හේතුවීමත්, එය විනයෙහි සංවර්ධනයට උපස්ථම්භක වූ ආකාරයත් බුද්ධකවත්ථුක්ඛන්ධකයෙහි සඳහන් විනය ප්‍රඥප්තීන් ඇසුරෙන් විමසිය හැකි ය.

ප්‍රමුඛ පද: *පඨමාභිසම්බෝධිය, ඡබ්බග්ගිය භික්ෂූන්, අශ්‍රාමණික පැවතුම්, විනය පැනවීම්*

ආශ්‍රිත ග්‍රන්ථ

චුල්ලවග්ගපාළි 02. (2005). බුද්ධ ජයන්ති මුද්‍රණය. බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
පාරාජිකාපාළි 01. (2005). බුද්ධ ජයන්ති මුද්‍රණය. බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
මජ්ඣිමනිකාය 02. (2005). බුද්ධ ජයන්ති මුද්‍රණය. බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
මහාවග්ගපාළි 02. (2005). බුද්ධ ජයන්ති මුද්‍රණය. බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
සංයුත්තනිකාය 01. (2005). බුද්ධ ජයන්ති මුද්‍රණය. බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

අමනුෂ්‍ය දෝෂ නිවාරණය සඳහා පෙළ හා අටුවාගත ප්‍රතිකර්ම පිළිබඳ අධ්‍යයනයක්

ඒ. විමලධම්මික හිමි
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
wimaladhammika@gmail.com

හැඳින්වීම

අමනුෂ්‍යයන් හා ඒ ආශ්‍රිත දෝෂ පිළිබඳ මිනිසුන් අතර විවිධාකාර විශ්වාසයන් පවතින්නේ අනාදිමත් කාලයක සිටයි. බටහිර විද්‍යාවේ ආධිපත්‍යය පැතිරී ඇති වර්තමානය තුළ ද බෞද්ධ, අබෞද්ධ විවිධ ජන කොට්ඨාස අතර අමනුෂ්‍යයන් හා දෝෂ පිළිබඳ පවතින්නේ සැලකිය යුතු පිළිගැනීමකි. චතුර්වේදයේ පටන් බුදුදහම දක්වා ම පෙරදිග බිහි වූ ආගමික සම්ප්‍රදායයවල ද අපරදිග ප්‍රචාරය වූ ක්‍රිස්තියානි, යුදෙව් ආදි ආගමික සම්ප්‍රදායවල ද අමනුෂ්‍යන් හා ඔවුන්ගෙන් සිදුවන විවිධ බලපෑම් පිළිබඳ සාකච්ඡා කර තිබේ. ඒ අනුව ත්‍රිපිටකය හා පාලි අට්ඨකථාවන්ට මූලික අවධානය යොමු කරමින් අමනුෂ්‍ය දෝෂ නිවාරණයෙහි ලා බුද්ධදේශනාවන්හි අන්තර්ගත ප්‍රතිකර්ම පිළිබඳ අධ්‍යයනයක් සිදුකිරීමට මෙහි දී අපේක්ෂා කෙරිණි.

පර්යේෂණ ගැටලුව, පර්යේෂණ අරමුණු

මෙහිදී මූලිකව ම, අමනුෂ්‍ය දෝෂ සඳහා ප්‍රකිකර්ම පාලි ත්‍රිපිටකය හා අට්ඨකථා තුළින් හඳුනාගත හැකිද ? යන පර්යේෂණ ගැටලුව මත පදනම් වී මෙම අධ්‍යයනය සිදුකරන ලද අතර මෙහි ප්‍රධාන අරමුණ වූයේ අමනුෂ්‍ය දෝෂ නිවාරණය සඳහා පාලි ත්‍රිපිටක හා අටුවාගත ප්‍රතිකර්ම පිළිබඳ සොයන නූතන වත්මන් විද්‍යාර්ථීන්ට දැනුවත්භාවයක් ලබා දීමයි. අමනුෂ්‍ය දෝෂ හේතුවෙන් පීඩාවට පත්වන පුද්ගලයන්ට ඉන් අත්මිදීම සඳහා බෞද්ධ ඉගැන්වීම් උපයෝගී කර ගැනීමට හැකි ය. මෙහි අවශේෂ අරමුණ වූයේ ඒ සඳහා අවශ්‍ය දැනුම සමාජය වෙත ප්‍රදානය කිරීමයි.

පර්යේෂණ ක්‍රමවේදය

මෙය ගුණාත්මක පර්යේෂණ ගණයට අයත්වන අධ්‍යයනයකි. එබැවින් එම ක්‍රමවේදය යටතේ සාහිත්‍යය මූලාශ්‍රයන්හි පාඨ හා සන්ධාර විශ්ලේෂණ ක්‍රමවේදය භාවිතයට ගැනිණි. මෙහිදී පාලි ත්‍රිපිටකයට අයත් සූත්‍ර හා විනය යන පිටකද්වයත් අට්ඨකථාවලට අයත් සූත්‍ර හා විනය අට්ඨකථාත් නියැදිය ලෙස ගන්නා ලදි. දත්ත රැස්කිරීම සඳහා පුස්තකාලය භාවිතය ඔස්සේ ප්‍රාථමික මූලාශ්‍රය ලෙස පෙළ හා අටුවා පරිශීලනය කරන ලද අතර එම මූලාශ්‍රය තුළින් එක්රැස් කරගන්නා ලද දත්ත විග්‍රහාත්මක ව හා විශ්ලේෂණාත්මක ව අධ්‍යයනය කෙරිණි.

සාකච්ඡාව හා ප්‍රතිඵල

As a literature survey, primary and secondary literary sources were used. Contents named "Salla Vidiya" were selected in the textbooks of Sārārta Samgrahaya (Anuradhapura era), Sinhala Yōga Rathnākaraya (Dambadeni era), Swadēsha Agnikarma Cikitsa (Polonnaruwa era), Talpatē Piliyam (unknown era), and Yōgārnawaya (Dambadeni era) and they were systematically reviewed. The technical terms used in the text were extracted and referring to the Monnier-Williams Sanskrit-English Dictionary, Mahā Sinhala Śabdakōṣaya, Tamil-English Dictionary, and Sinhala-Pāli Śabdakōṣaya, were categorized into their language of origin. Each technical term was analyzed etymologically and compared with the characters of each language to confirm its language of origin.

Results and Discussion

A total of 124 technical terms used in Nila Vedakama were identified and they consisted of different languages as follows: Sanskrit – 60 (48.4%), Sinhala – 44 (35.5%), Tamil – 13 (10.5%) and Pāli – 07 (5.6%). As this study focused specifically on Tamil language terminology, the Tamil terms were etymologically analyzed in detail (Table 1).

Tamil language terminology has been used for two main purposes: either to identify instruments that were used in Nila Vedakama (Suliya, Suraya, Sulumbuwa) or to name diseases (Hanu pūṭṭuwa, Iruwā radaya, Kudi vādan, Mani vādan, Mulakkāl vādan, Nitta vāyuwa, Sanniya, Ulappu vāyuwa, Ulkāciya, and Visappu). Interestingly, there were some technical terms formed as a combination of both Tamil and Sinhala languages (Hanu pūṭṭuwa, Iruwā radaya).

Table1. Etymological analysis of Tamil terms

	Original term	Tamil term	Meaning of the Tamil term	Use of the term
1	*Hanu pūṭṭuwa*	*pūṭṭu*	lock	name of a disease
2	*Iruwā radaya*	*iru*	great, vast	name of a disease
3	*Kudi vādan*	*kudi*	heel, as of the foot	name of a disease
4	*Mani vādan*	*mani* *vādam*	joint, ankle disease, ailment	name of a disease
5	*Mulakkāl vādan*	*mulaikkāl* *vādan*	knee disease, ailment	name of a disease
6	*Nitta vāyuwa*	*nittai*	sleep	name of a disease
7	*Sanniya*	*canni*	delirium	name of a disease
8	*Suliya*	*suli*	a small coin, whirling	name of an instrument
9	*Sulumbuwa*	*suluppu*	a vessel, sloop	name of an instrument
10	*Suraya*	*surai*	a kind of sharp crow-bar	name of an instrument
11	*Ulappu vāyuwa*	*ulappu*	trembling, shaking	name of a disease
12	*Ulkāciya*	*ulārci*	dryness, withered state, aridity	name of a disease
13	*Visappu*	*visaippu*	crevice, cleft	name of a disease

Conclusion and Recommendations

This study shows that around 10% of Tamil language terminologies have been incooperated in the Ola leaf textbooks of Nila Vedakama in identifying instruments and diseases. This may depict the impact of repeated invasions and ruling of Sri Lanka, by South Indians who spoke the Tamil language during the time of composing the Ola leaf manuscripts, and on the terminology of Nila Vedakama. This may also show the close language association between Sinhala and Tamil-speaking communities.

Keywords: *Nila Vedakama, Indigenous Medicine, Tamil language, Terminology, Ola leaf manuscripts*

References

Dhammakeerthi, T. (1997). *Swadēsha Agnikarma Cikitsa* (pp.1-48). Lanka Buddhist Press.
Gammana, M. (1998). *Sinhala Yōga Ratnākaraya* (pp.531-544). Government Ayurveda Department Press.
Gnanavimala, K. (1963). *Yōgārnawaya* (pp.260-262). Government Ayurveda Department Press.
Kumarasinghe, A. (1987). *Vaidyaka Sārārta Samgraha* (pp.1098-1119). National Museum Press.
Unknown author. (1993). *Talpate Piliyam* (pp.1-41). Government Ayurveda Department Press.

ශ්‍රී ලාංකේය අභිලේඛනවල සඳහන් ශාප පාඨ පිළිබඳ ව පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

ඩබ්. ඩී. කල්පනී

ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

wdkalpani@gmail.com

හැඳින්වීම

අභිලේඛන මෙරට ඉතිහාසය අනාවරණය කරගැනීමෙහි ලා සුවිශේෂ දායකත්වයක් සපයන ඉතා වැදගත් පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයකි. ක්‍රි. පූ. 3 වන සියවසේ සිට භික්ෂූන්වහන්සේලාට සිදුකරන ලද ලෙන්, ආරාම, පියගැට, පරිත්‍යාග පිළිබඳ ව ඉතා කෙටියෙන් බ්‍රාහ්මී ශිලා ලේඛන රචනා වුණු නමුත් පසුකාලීන ව අභිලේඛන ඉතා දීර්ඝවත්, සුවිශාල තොරතුරු ප්‍රකාශනයක් සහිතවත් රචනා වුණි. අනුරාධපුර යුගයේ මධ්‍ය භාගය වන විට එනම් ක්‍රි.ව. 4-5 වන සියවස් වන විට ආගමික පරිත්‍යාග මුල්කොටගෙන ලියැවුණු ශිලා ලිපිවල අවසානයේ එම කටයුත්තේ පින් සියලු සත්වයන්ට අත්වේවා'යි, ප්‍රාර්ථනා කිරීම් ද දැක ගත හැකි ය. එහෙත් අනුරාධපුර යුගයේ අග භාගයේ දී එනම් ක්‍රි.ව. 8 වන සියවස වන විට මෙලෙස ආගමික ප්‍රදාන පිළිබඳ ව සඳහන්වන ලිපි අවසානයේ ඉතා දරුණු ශාපකිරීම් දක්නට ලැබේ. මෙම ශාප පාඨ අත්තාණි කණුවල විශේෂයෙන් යෙදී ඇති අතර තඹ සන්නස්, පුවරු ලිපි, ගිරි ලිපිවල ද යොදා තිබෙන බව පෙනේ. විශේෂයෙන් මෙම ශාප පාඨ, බෞද්ධ ආගමික ආරාමවලට ලබාදුන් පරිත්‍යාග උදෙසා ලියැවුණු ලිපි වල අවසානය දැක්වීම ද විශේෂ කරුණකි. මුලදී ඉතා සරල ව මෙම ශාප පාඨ ලියවුණ ද පසු කාලීන ව ඉතා බරපතල ලෙස ශාප පාඨ ලියැවුණු බව දැකිය හැකි ය. මෙම ශාප පාඨවල, ශාසනයට අයත් දෑ අනවසරයෙන් ලබාගතහොත්, නීතිමය වශයෙන් ලැබෙන දඬුවම් නොව ධර්මයෙහි ඉගැන්වෙන මෙලොවදී, පරලොවෙහි ලැබෙන කටුක විපාක පිළිබඳව සඳහන්වීම තවත් විශේෂත්වයකි. මෙරට අභිලේඛනවල ශාප පාඨ ලියැවීම දකුණු ඉන්දීය ආභාසය මත ආරම්භ වූ දැකගත හැකිය. මෙරට ප්‍රථම වරට මෙවැනි ශාප පාඨයක් ලංකාවට දකුණු ඉන්දීය ආභාසය දැඩිව ලැබුණු අවධියක දක්නට ලැබේ. III වන කාශ්‍යප රජු කල ලියවුණු ගැරඬිගල ශිලා ලිපියේ ප්‍රථමවරට ශාප පාඨ හමුවන අතර එම කාලයේ දී මෙරට තුළ සමාජ විපර්යාස ගණනාවක් ඇතිවූ බව හඳුනාගත හැකි ය.

පර්යේෂණ ගැටලුව, පර්යේෂණ අරමුණු

බුදු දහම ඉතා ප්‍රබලව සමාජයේ ව්‍යාප්ත වූ කාල වකවානුවක සියලු සත්ත්වයන්ට මෛත්‍රී කිරීම මත, සමාජයේ හර පද්ධතිය ගොඩනැගී තිබුණ කාල වකවානුවක මෙවැනි ශාප පාඨ ලියැවීමට කුමක් බලපෑවේද යන්න ගැටලු සහගත ය. ඒ අනුව බෞද්ධාගමික සමාජයක් තුළ සාංඝික දේපළ ආරක්ෂා කර ගැනීමට ශාප පාඨ භාවිත කිරීමට හේතු වූ කාරණය කුමක්ද යන්න මෙහි පර්යේෂණ ගැටලුව ලෙස හඳුනාගත හැකිවේ. මෙරට ලියවී ඇති විවිධ ශාප පාඨ වර්ග හඳුනා ගැනීම, ශාප පාඨයන්හි කාර්යභාරය හඳුනාගැනීම හා ශාප පාඨයන්හි සුවිශේෂතා හඳුනාගැනීම මෙම පර්යේෂණයේ අරමුණු ලෙස දැක්විය හැකි වේ.

පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයට අනුව සිදු කරන ලද අතර ද්විතීයික මූලාශ්‍රය භාවිත කොට තොරතුරු එක්රැස් කරන ලදි. ප්‍රධාන වශයෙන් මහාවංශය, ටී.පී. කුලතුංග මහතාගේ අභිලේඛන ශාප පාඨ කෘතිය හා Epigraphia Zeylanica ග්‍රන්ථ කාණ්ඩය මේ සඳහා උපයෝගී කර ගන්නා ලදි.

ප්‍රතිඵල හා සාකච්ඡාව

ශාසනයට බලවත් හානියක් සිදුවන අවස්ථාවන්හි දී, ශාසනය රැක ගැනීම උදෙසා භික්ෂූන් වහන්සේලා, බුදුන්ගේ ධර්මයට පටහැනි අදහස් ප්‍රකාශ කොට ඇති අයුරු දැකගත හැකි වේ. ඉතා උසස් කොට සැලකූ ශාසනික දේපළ කොල්ලකෑම, පැහැර ගැනීම කෙරෙහි ජනතාව යොමු වීමට නම් රට ඉතා බරපතල ආර්ථික අවපාතයකට ලක්විය යුතු ය. ක්‍රි.ව. 614 න් ඇරඹී වසර 70ක් පමණ දක්වා වූ කාලපරිච්ඡේදය; යුද්ධ, කැරලි කෝලාහල, අභ්‍යන්තර අර්බුද බහුල ව පැවැති කාලපරිච්ඡේදයක් වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස රට ආර්ථිකමය වශයෙන් අර්බුදකාරී තත්ත්වයකට පත්විය. මේ නිසා සාමාන්‍ය ජනතාව පමණක් නොව පාලකයන් පවා මේ සමයේ සාංඝික දේපල කොල්ලකෑම් සිදු කරන ලද බව දැකිය හැකිවේ. මෙම ශාප පාඨ ක්‍රි.ව. 800 - 1000 අතර කාලවකවානුවේදී රචනා වූ විශේෂ අභිලේඛන වර්ගයක් වූ අත්තාණි පරිහාර කණුවල, අවසානයේ දක්වා තිබේ, 'අත්තාණි පරිහාර' යන්නෙන් 'රාජසභාවෙන් පවරාදුන්' යන්න අදහස්වන අතර මහා සංඝයා වෙත සීමා නියම කොට එලෙස ලබාදුන් ඉඩම් කොල්ලකන පුද්ගලයන් එල්ලකොටගෙන මෙම ශාප පාඨ අත්තාණි පරිහාර කණුවල අවසානයේ ලියැවී ඇත. පසුව කණු ආකාරයෙන් ලියැවුණු ලිපි පමණක් නොව සීමා ලකුණු කොට, විහාරගම්වලට දුන් තඹපත්, පුවරු ලිපි ආදියේද මෙම ශාප පාඨ ලියැවුණු බව හඳුනාගත හැකි ය. රට දේශපාලනිකමය හා ආර්ථිකමය වශයෙන් අවිනිශ්චිතව පැවැති කාල පරිච්ඡේදයක මෙවැනි ශාපයන් භාවිත කිරීම සාධාරණ වුවත්, මෙරට ඉතා සාධාරණ නීති හා අධිකරණ ක්‍රමයක් පැවති ක්‍රි.ව. 9-10 සියවස් වලදී ද ඊට පසුවද දිගින් දිගටම විහාරාරාමවලට පරිත්‍යාග සිදු කොට පිහිටුවන ලද අභිලේඛනවල ශාප පාඨ ඇතුළත් කර තිබීම විශේෂ කරුණකි. නීතිය කෙතරම් විනිවිදභාවයෙන් හා සාධාරණත්වයෙන් පැවතිය ද මහා සංඝයා සාමාන්‍ය ජනයාට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග වෙත යාමට පැවැති නොකැමැත්ත නිසාද, ශාපපාඨනවල දැක්වෙන බරපතල කර්ම විපාක සම්බන්ධයෙන් පවතින මනෝවිද්‍යාත්මක

පසුබිම ජනයා ඉන් බොහෝ දුරට වළක්වන බැවින් ද, ශාප පාඨයන්හි කාර්යය සාර්ථක වූ බව පැහැදිලි වේ. ශාප පාඨ සැලකිල්ලට ගැනීමේදී විවිධාකාර භයානක ශාප වර්ග විසි දෙකක් දක්නට ලැබේ. බලු කපුටන් වීම, ආහාරය සඳහා බත් නොලැබීම, කපුටන්ට බත් දමන භාජනයේ කෑමට සිදුවීම, නරකයේ වැටීම, මෛත්‍රී බුදුන් නොදැකීම, ප්‍රේතයන් වී ඉපදීම, මුහුදු තීරයේ මසුන් මැරූ පාපය අයත්වීම, මහාතිත්ථයේ එළුවන් මැරූ පව් අයත්වීම, ගංගානම් තීරයේ ගවයන් මැරූ අකුසල් අයත්වීම, සියලු රටවාසීන් කළ අකුසල් අයත්වීම, ශ්‍රී මහා බෝධිය පලා ගිනිතැබීමේ පාපය අයත්වීම, දළදා වහන්සේට අනදර කිරීමේ පාපය අයත්වීම, දුප්පත් ව ඉපදීම, චණ්ඩාල /රොඩී කුලයක ඉපදීම මේ අයුරින් දැක්වෙන ශාප පාඨ කිහිපයක් වේ.

වගු අංක 1. මෙරට අභිලේඛනවල දැක්වෙන ශාප පාඨ කිහිපයක්

ශාප පාඨය	ශිලාලිපිය	ශාප පාඨය සඳහන් අයුරු	අර්ථය/ විශේෂතා
1. බලු කවුඩන් වීම	**මොරගොඩ ටැම් ලිපිය** - (EZ Vol. Ⅰ)	මේ ආන්නැ උලඝණ කළ කෙනෙක් ඇත් නම් **කවුඩු බලු වෙත්වා**	අභිලේඛන වැඩිම ප්‍රමාණයක දක්නට ලැබෙන ශාප පාඨය මෙය වේ. නිරන්තර ආහාර අහේනියක සිටින සතුන් දෙදෙනෙකු තෝරාගැනීම විශේෂ සන්නිවේදන ක්‍රමයකි.
2. ආහාරය සඳහා බත් නොලැබීම	**ගැරඬිගල ලිපිය** - (EZ Vol.Ⅲ)	මෙලෙනට් බහාලූ කුඹුර අවුල් කල කෙනෙක් **බුදෙනා බත් නොලැබෙත්**	ශාප පාඨ සඳහන් වන ප්‍රථම ලිපිය මෙය වන අතර මේ ආත්මයේ දී විපාක දීමට ප්‍රාර්ථනා කර තිබේ.
3. නරකයේ/ නිරයේ වැටීම	**සංගමු පුවරු ලිපිය** - (EZ Vol. Ⅰ ඈ)	මෙට විරුධයක් කළමොනම් තුනුරුවන් ආඥා මැකුවම්හ **නරකයෙන් මුක්ත නොවූහ**	මෙහි නිරයට යාම වෙනුවට කිසිදාක නිරයෙන් නොමිදෙන බව දක්වා තිබේ.
4. ප්‍රේතයන් වී ඉපදීම	**ඔරුවල තඹ සන්නස** - (EZ Vol.Ⅲ)	සජීව කාලසූත්‍රාදී අට මහා නරකයෙහි පැසී ගොඩ නොදැක **අනන්ත ජාතිශ්මශාන ප්‍රේතව උපදින්නාහු** නම් වෙති	ශ්‍රී ලංකාවේ අභිලේඛන අතුරින් ප්‍රේතයන්ව ඉපදේවා ලෙස සඳහන් අවස්ථා දෙකෙන් එකක් වේ.
5. එළුවන් මැරූ පාපයන් අයත් වීම	**කතරගම ලිපිය** - (EZ Vol.Ⅲ	මිහි සමවත බුන **මහවුටියේ එළු මැරුවා** කල පා කම් ගත්තා	මහාතිත්ථයේ එළුවන් මැරූ පාපය අයත්වන බව කියා මෙය විශේෂ කොට ඇත.

නිගමන සහ නිර්දේශ

මෙම ශාප පාඨ, ක්‍රි.ව. 8 න් පසුව සැලකිය යුතු ශිලා ලිපි ගණනාවක යෙදී තිබීම නිසාත් මහනුවර රාජධානිය දක්වා ම ශාප පාඨවලට පැවැත්මක් තිබුණු බැවින්ද, ශාප පාඨ, මනෝ විද්‍යාත්මක පසුබිමක් මත සාර්ථක වූ බව පැහැදිලි වේ. මිනිසුන්ට දුගතියක් වේවා යනුවෙන් විහාරාශ්‍රිතව ලියැවුණු ශාපයක් සංඝයා වහන්සේලා භාර ගත්තේ නම් ඉතා විශාල සමාජ විපර්යාසයක් මෙකල ඇතිවන්නට ඇති බව පැහැදිලි වේ. ඒ අනුව සියලු සත්ත්වයන්ට මෛත්‍රී කිරීම යන සංකල්ප පරිබාහිරව, ආගමික ස්ථාන උදෙසා ලබාදුන් පරිත්‍යාග ආරක්ෂා කරගැනීමට, ශාප පාඨ යොදාගැනීම කෙරෙහි සමාජීය පරිසරයේ සිදු වූ වෙනස පලපෑ බව පැහැදිලි වේ. මෙම ශාප සලකන කල, සමහර ශාප මේ ආත්මයේදී ඵලදෙන පාඨ ලෙස ද, බොහොමයක් මරණින් මතු ව අපරාපරියවේදනීයව බලපාන ආකාරයට ලියා ඇත. මේ අනුව විහාරගම්වලට පවරා දුන් ඉඩම් කොල්ලකෑම මේ ආත්මයේදීත්, පර ජන්මයේදීත් බරපතල ලෙස විපාක දෙන කර්ම ලෙස මෙම ශාප පාඨවලින් සන්නිවේදනය කර තිබෙන බව පැහැදිලි ය.

ප්‍රමුඛ පද : *අත්තාණි කණු, ආරක්ෂා කරගැනීම, මනෝවිද්‍යාත්මක පසුබිම, ශාප පාඨ, සාංඝික දේපළ*

ආශ්‍රිත ග්‍රන්ථ

Paranavithana, S. (1943*). Epigraphia Zeilanica Vol Ⅳ*, Oxford University Press.

Wickramasinghe, D.M.Z. (1912). *Epigraphia Zeilanica Vol Ⅰ,* Oxford University Press.

Wickramasinghe, D.M.Z. (1928). *Epigraphia Zeilanica Vol Ⅱ,* Oxford University Press.

Wickramasinghe, D.M.Z., & Codrington H.W. (1933). *Epigraphia Zeilanica Vol Ⅲ,* Oxford University Press.

කුලතුංග ටී. ජී. (2000). *අභිලේඛන ශාප පාඨ*, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

Evidence in Sri Lanka Proving that the Epic of the Ramayana is True

D. P. S. N. Pathirana

Department of Languages, Cultural Studies and Performing Arts, University of Sri Jayewardenepura, Sri Lanka

sinalipathirana12@gmail.com

Introduction

Ramayana is called as 'Rama's Journey'. The epic of Ramayana is known as India's first great Sanskrit poem. It is composed by the Indian sage 'Valmiki' in 400 AD. When it comes to Hindi mythology, the legend of Ramayana is one of the most important epics. 'Ram' is the main role in the epic of Ramayana who known as king 'Dasharatha's elder son. One of the most important experience 'Rama' faced after leaving the palace is, Sitha was abducted by the demon king Ravana in Sri Lanka. That is the most significant event depicted in the legend of Ramayana to prove that some evidence of Ramayana can be seen in Sri Lanka.

Research Problem/s, Objective/s

Ramayana is a great Hindu epic and there are number of sites in India that confirm about this epic. In fact, the Ramayana tour in Sri Lanka is the most popular incident according to the historical references. The main objective of this research is to confirm the accuracy of the Ramayana tour in Sri Lanka. What are the Ramayana related places in Sri Lanka and what are the most powerful evidences that can be proved the epic of Ramayana, is not only a legend? Gathering data according to this problem is the other purpose of this research.

Results and Discussion

It is believed that the origin of Hinduism was in the Ramayana. Later, it became popular all over the world in many languages. According to the Ramayana, the prince of Ayodhya was deported from the kingdom for fourteen years along with his wife Sita and brother, Lakshmana. Ram's wife Sita was abducted by King Rawana in Ceylon. It was an act that led to war. Historical sources mention the burning of Ceylon and the siege of Ravana's fort. The Ramayana is an ancient story based on universal themes such as love, courage, duty and human weakness. Valmiki's Myth about Sri Lanka has been identified by some in Sri Lanka. There is no geographical certainty among some scholars that the Lankapura mentioned by Valmiki in any of the early translations of the Ramayana, is actually Sri Lanka. But in recent times, in Sri Lanka, Ravana has been recognized as a heroic figure among Sinhala Buddhists. Also, some believe that Ravana was a very pious man and the founder of the early monarchy according to the legends of the island. Therefore, evidence of certain places can be found in Sri Lanka to confirm the existence of a connection between Sri Lanka and the Ramayana.

King Ravana has abducted King Sita in his miraculous plane from the forest called *'Panchavati*' in the Maharashtra region of India. She was later enslaved by Ravana. According to historical sources, she lived in a place called *'Asoka Vatika'* in the central hills of Sri Lanka. Sources say that Ram and Lakshmana came with Hanuman with his army to abduct Sita. It is a well-known opinion that *'Ram Sethu'* Bridge has built to come to Sri Lanka from India. According to some geologists, the existence of a limestone area clearly visible from satellite images is the evidence of the ancient man-made land connection between India and Sri Lanka. Laksamana was badly wounded in the battle of Rama Ravana and asked San Hanuman to fly to the Himalayas to fetch '*Sanjeevani'* herbs, an Ayurveda medicine with magical life giving properties. Despite the great religious and cultural changes that took place in Sri Lanka, many sites related to the Ramayana can still be seen in Sri Lanka from the time of Goddess Sita's captivity to the time of the Rama-Ravana war. They are important evidences for the facts of the Ramayana.

Kelaniya temple is an important place where evidence of the Ramayana can be seen. After Rama's death, Lakshmana was anointed Vibhishana in Kelaniya. The Valmiki Ramayana mentions the Kelani River and it

is said that the Kelani temple is located on the banks of that river. Rama temples can be found in several places in Sri Lanka including Rattota. Also, Laggala is another important place which gives evidence about Ramayana. Sources state that Laggala was a stronghold of the Ravana army. It was at Laggala that Rama's Brahmastram killed Ravana. Sita Fort and Hasalaka Gurulupotha are other important facts that testify the relationship between Ramayana and Sri Lanka. Sita Fort must have been a monastery complex that can be traced back to the time of Gautama Buddha, that is, to the time of Kasyapa Buddha. This place is believed to have been used by a great king who descended on Cyril before Gautama Buddha and later dedicated to the Maha Sangha. The '*Gurulupotha'* is the most famous and its called '*Sita Fort'*. Some of the ruins associated with the Sita Fort in *'Gurulupotha'* village near Hasalaka are now being deforested. There are also a couple of waterfalls nearby which are also known as Sita Fort Falls. '*Gurulupotha'* also means peacock. Therefore, Gurulupotha may have been a place of some repair work of Dandumonara. If so, if the reed peacock is repaired only at this place, it means that it is a place frequented by King Rawana. So it is arguable that intoxicants of choice of the taste in Indian cuisine. Gurulupotha Sita Fort may have been the place where Sita and Ravana stayed when repairing the dam as it is a time consuming task. *'Ramboda Sri Bhakta Hanuman Temple'* is an important place in the Ramayana tour of Sri Lanka. There is also the tallest Hanuman statue in Sri Lanka which is 18 feet high. According to the Ramayana, Hanuman rested at this place in search of Sita. The '*Sita Amman Kovi'l* is also a famous place related to the Ramayana. According to the Ramayana, Rama hid Sita in the area near the present '*Sita Amman Kovil'*. It is said that Hanuman had seen Sita when he came in search of Sita. It is believed that Hanuman's footprints can be seen on a nearby rock plateau. There is another popular place in Sri Lanka related to Ramayana called '*Divurumpola'* in Welimada Today that place is known as '*Divurumwela'.* Today, a Rajamaha Vihara has been built there. According to the Ramayana, this place is special because Goddess Sita faced the ordeal on behalf of Rama to show her devotion. There is also another place in Sri Lanka called '*Sthripura'* which is associated with Ramayana. In the legend, it is mentioned that Ravana hid Seetha in a tunnel located in the Uvaparanagama.

Conclusion and Recommendations

From the above, it seems that the Valmiki Ramayana contains some facts about certain places in Sri Lanka. Many places associated with these facts can still be seen in ruins in Sri Lanka today. As a legend, there can be plenty of doubt about the realism of any story that has been around for years. According to ancient legends, the soil in the Ussangoda area turned a special red color because Ravana's unique aircraft landed at that place. But advances in technology and geology have eliminated such issues. Therefore, many facts cannot be accepted as true just because they are mentioned in myths. However, there are some places in Sri Lanka mentioned above as evidence that the facts pertaining to certain events related to the Ramayana are true. Since they can be seen with the naked eye and can be matched with the events of the Ramayana, it can be inferred that the Ramayana is a fact.

Keywords: *Epic, Ramayana, Setu Bridge, Ravana, Sanjeewani*

References

Abhayasinghe, P. M. P. (2008). *Valmiki's Ramayanaya.* M. D. Gunasena Publications.
Mohota, S. (2002). *Valmikikrit Ran-kata*. Manak Publications.
Obesekara, M. (2008). *Ravana Shishtacharaya*. Book Rack Publications
Samarasinghe, R. P. (2003). *The Ravana Legend.* Vasana Piblications.
Vithanage, M. (2018). *The ideology woven around Ussangoda and its scientific background*, Blog, Research,Science, https://www.sjp.ac.lk/blog.

ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික කළු අභිචාරයන්හි අන්තර්ගත ගැටුම් කළමනාකරණ ක්‍රියාවලිය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

කේ. සී. එස්. සිල්වා
ඉන්දියානු හා ආසියානු නර්තන අධ්‍යයනාංශය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
chamarasampath228@gmail.com

හැඳින්වීම

යම් නිශ්චිත වූ ඉෂ්ට හෝ අනිෂ්ට හෝ ප්‍රතිඵලයක් අපේක්ෂාවෙන් යුතුව කරනු ලබන විද්‍යාත්මක නොවන පිළිවෙත් සමුදායක් අභිචාර ලෙස හැඳින්විය හැකි ය. මෙම පිළිවෙත් යන්නට පර්යාය වශයෙන් ශාන්තිකර්ම, යන්ත්‍ර, මන්ත්‍ර, ගුරුකම් යනාදී යෙදුම් භාවිත වේ (කරුණාරත්න, 1990). අභිචාර යනු පුද්ගලයන් මෙන්ම සමාජ සමූහ ස්වකීය අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා පරිසරය පාලනය කිරීමේ මාර්ගයක් වශයෙන් යොදාගත් සංකීර්ණ විශ්වාස හා ක්‍රියාකාරකම් පද්ධතියකි. ප්‍රාථමික මිනිසා තමන් දන්නා උපක්‍රම මගින් පමණක් ස්වකීය අභිමත ප්‍රතිඵල නොලැබෙන කල්හි අභිචාරවල පිහිට අපේක්ෂා කරන්නේ යැයි බ්‍රොනිස්ලොව් මැලිනොවුස්කි ප්‍රකාශ කර ඇත. අභිචාර පිළිබඳ සාකච්ඡා කරන ෆ්‍රේසර් අභිචාර යහපතට කෙරෙන අභිචාර (White Magic) හා අයහපතට කෙරෙන අභිචාර (Black Magic) යනුවෙන් ප්‍රධාන කොටස් දෙකකට බෙදා දක්වා ඇත. මෙම පර්යේෂණය මගින් සාකච්ඡා කරනුයේ කළු අභිචාර පිළිබඳවයි.

පර්යේෂණ ගැටලුව, පර්යේෂණ අරමුණු

ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික කළු අභිචාරයන්හි අන්තර්ගත ගැටුම් කළමනාකරණ ක්‍රියාවලිය හා ඒ සඳහා පදනම් වන මනෝවිද්‍යාත්මක පසුබිම ගවේෂණය කිරීම මෙම පර්යේෂණයේ මූලික පරමාර්ථය වූ අතර ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික සමාජයන්හි ගැටුම් කළමනාකරණය උදෙසා කළු අභිචාර ඉවහල් වී ඇත් ද? යන්න පර්යේෂණ ගැටලුව ලෙස මෙහි දී අධ්‍යයනය කරනු ලැබීය.

පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය භාවිත කරන ලදි. පර්යේෂණයට අදාළ දත්ත එක්රැස් කිරීම සඳහා ප්‍රාථමික දත්ත හා ද්විතීයික දත්ත භාවිත කරන ලදි. අප විසින් මෙම අධ්‍යයනයේ දී නියැදියක් ලෙස අධ්‍යයනය කරනු ලබන්නේ කටු ගැසීම සහ මිරිස් ඇඹරීම යන කළු අභිචාරයන් ද්විත්වය වන අතර අධ්‍යයන ප්‍රදේශය ලෙස තෝරාගනු ලැබුවේ කළුතර හා ගාල්ල යන ප්‍රදේශයන් ය. මෙම ප්‍රදේශයන්හි සූනියම් සිදු කෙරෙන ස්ථානයන්හි දී අහඹු ලෙස තෝරාගත් පුද්ගලයන් දස දෙනෙකු සමග සිදු කරන ලද ව්‍යූහගත සම්මුඛ සාකච්ඡා මගින් ලබාගත් තොරතුරු මත පදනම් ව පර්යේෂණයේ අවසන් නිගමනවලට එළඹෙන ලදි. මෙහි දී ගැල්ටූන්ගේ ගැටුම් ත්‍රිකෝණය මගින් කළු අභිචාර මගින් සිදුවන ගැටුම් කළමනාකරණ ක්‍රියාවලියත්, ආරක්ෂණ යාන්ත්‍රණය, මනෝවිද්‍යාත්මක ප්‍රක්ෂේපණය හා මනෝවිද්‍යාත්මක විස්ථාපනය යන මනෝවිද්‍යා මූලධර්ම ඇසුරින් කළු අභිචාර මගින් සිදුවන පුද්ගල මනස පවිත්‍රීකරණ ක්‍රියාවලියත් විශ්ලේෂණය කරනු ලැබීය.

ප්‍රතිඵල හා සාකච්ඡාව

කළු අභිචාර

කළු අභිචාර හෙවත් සූනියම් යනු පුද්ගලයෙකු විසින් තවත් පුද්ගලයෙකුට හෝ පවුලක් කෙරෙහි ඇති ඊර්ෂ්‍යාව, වෛරය හෝ තම සිතැඟි ඉටුකර ගැනීම සඳහා මන්ත්‍ර ගුරුකම් විශේෂයක් බලයෙන් ඒ ඒ පුද්ගලයාගේ හෝ පවුලේ ක්‍රියාකාරකම් පාලනය කොට ඔවුන්ට අපල උපද්‍රව පැමිණවීම සඳහා භාවිත කරන හානිදායක ක්‍රියාවලියකි. විද්වතුන් විසින් අංගම්, පිල්ලි, ජීවම්, බන්ධන, පැන්නුම්, කටු ගැසීම්, පෙතලි ගිනියම් ලෙස තද බල හානි පැමිණවිය හැකි සූනියම් හෙවත් කොඩිවින වර්ග හතක් යටතේ විග්‍රහ කොට ඇත (ගරුසිංහ, 2007). කටු ගැසීම යනු වින කිරීමට අපේක්ෂිත පුද්ගලයාගේ අනුරුවක් සකසා නම ලියා මන්ත්‍ර මගින් මතුරා මරස්ථානයන්හි කටු ගැසීම යි. කටු ගැසීම මගින් පුද්ගලයාට වින පැමිණවීමේ දී සන්ධි කොරවීමක් හා මරණයට පත්කිරීමක් අපේක්ෂා කෙරේ. මිරිස් ඇඹරීම යනු පුද්ගලයන්ට සිදු වූ ආලාභ, හානි, හිරිහැර, දුක දෙවොල් දෙවියන්ට කියා ප්‍රතිවිරුද්ධ පාර්ශ්වයට දඬුවම් සහිතව හෝ රහිත ව සහනයක් අත්කර ගැනීම සඳහා පළියක් පුනරුච්චාරණය කරමින් දරු ගලෙන් පස් වර්ගය කෙටීම යි.


කටු ගැසීම, පෙතලි ගිනියම්, මිරිස් ඇඹරීම යන කළු අභිචාරයන්හි මනෝවිද්‍යාත්මක පදනම විශ්ලේෂණය

ශ්‍රී ලාංකේය කළු අභිචාරයන්හි ප්‍රායෝගික අංශය පිළිබඳ විමසීමේ දී එහි මනෝවිද්‍යාත්මක ආරක්ෂණ යාන්ත්‍රණ ක්‍රියාවලියක ලක්ෂණ ප්‍රකට වේ. ආරක්ෂක යාන්ත්‍රණය (Defense Mechanism) යනු පිළිගත නොහැකි සිතුවිලි හෝ හැඟීම් නිසා ඇති වන කාංසාවෙන් පුද්ගලයෙකු ආරක්ෂා කිරීමට අවිඥානිකව භාවිත කරන මනෝවිද්‍යාත්මක උපාය මාර්ග වේ (McLeod, 2019). මෙම පර්යේෂණයේ දී මනෝවිද්‍යාත්මක න්‍යාය භාවිතයෙන් කලු අභිචාරයන් විශ්ලේෂණයේ දී අනාවරණය වූයේ කළු අභිචාර මගින් සිදුවන්නේ ද මනෝවිද්‍යාත්මක ප්‍රක්ෂේපණය (Psychological Projection) හා මනෝවිද්‍යාත්මක විස්ථාපනය (Psychological Displacement) යන මානසික සංරක්ෂණ ප්‍රයෝගයන් බවයි. මනෝවිද්‍යාත්මක ප්‍රක්ෂේපණය යනු පුද්ගලයෙකුගේ පිළිගත නොහැකි හැඟීම් හා

ආවේගයන් වෙනත් පුද්ගලයෙකු සතෙකු හෝ වස්තුවකට ආරෝපණය කිරීමේ ක්‍රියාවලිය යි (Psychology Today, 2022). මනෝවිද්‍යාත්මක විස්ථාපනය යනු පුද්ගලයෙකුගේ නිශේධනාත්මක හැඟීම් හා චර්යාවන් එහි ප්‍රභව මූලය වෙත එල්ල නොකොට අඩු තර්ජනාත්මක හා අවදානමක් සහිත ස්ථානයක් වෙත හරවා යැවීමේ ක්‍රියාවලියයි (Vinney, 2021). මෙමගින් වේදනාකාරී අභ්‍යන්තර මානසික තත්ත්ව හා මනසේ ප්‍රතික්ෂේපිත තත්ත්ව වන පීඩාවට ඇති බිය, වෛරය, ඊර්ෂ්‍යාව, පාවාදීම, සතුරුකම, පිළිකුල, නිෂ්ඵලත්වය, දුක, රාගය, තණ්හාව, දුර්වලකම ආදී මනෝභාවයන්ට එරෙහිව මනෝවිද්‍යාත්මක ආරක්ෂාවක් ලෙස ක්‍රියාකරයි. මෙම පර්යේෂණයේ දී අප විසින් නියැදියක් වශයෙන් අධ්‍යයනය කළ කළු අභිචාරයන් මගින් සිදුවන්නේ පුද්ගල මනසෙහි කැළඹෙන නිශේධනාත්මක මනෝභාවයන් සෘජුව ප්‍රතිවිරුද්ධ පාර්ශ්වයට එල්ල නොකොට අජීවී වස්තුවකට/ අවම අවදානමක් සහිත ස්ථානයකට කේන්ද්‍රගත කිරීමයි. මෙහි දී කළු අභිචාර නිශේධනාත්මක මනෝභාවයන් හා ගැටුම් උත්පාදනය වීමට හේතු සාධක වන සන්නිවේදන අන්තර්ගතයන් ප්‍රතිවිරුද්ධ පාර්ශ්වය වෙත සම්ප්‍රේෂණය වීම වළක්වන බාධකයක් ලෙස ක්‍රියාත්මක වේ. මෙවැනි විනාශදායක අභිචාරයන් මගින් මනඃකල්පිතව විරුද්ධවාදීන්ට දඬුවම් කිරීමෙන් කෝපය හා පළිගැනීමේ ආශාව සංසිඳුවා ගැනීම, මනස පෙළෙන වේදනාත්මක තත්ත්වයන්ගෙන් නිදහස් වීම හා එමගින් මානසික තෘප්තියක් ඇති වීම යනාදී ප්‍රතිලාභ කළු අභිචාරයන්හි නියැලෙන්නන්ට හිමිවේ. මේ අනුව කළු අභිචාර මානසික ආතති කළමනාකරණ ප්‍රවේශයක් ද වේ.

කටු ගැසීම, මිරිස් ඇඹරීම යන කළු අභිචාරයන්හි අන්තර්ගත ගැටුම් කළමනාකරණ ක්‍රියාවලිය

ගැටුම් කළමනාකරණය ලෙස හැඳින්වෙන්නේ ගැටුමට සම්බන්ධිත පාර්ශ්ව තුළ ධනාත්මක චර්යා වෙනස්කම් මගින් අනාගතයේ ඇති විය හැකි ප්‍රචණ්ඩ ක්‍රියා සීමා කිරීම සහ මගහැරවීමත් උග්‍ර ගැටුම් තත්ත්වයක් දක්වා ව්‍යාප්ත වීමට සහ වර්ධනය වීමට නොදී පවත්වා ගැනීමත් වේ (ජාතික අධ්‍යාපන ආයතනය, 2009). ගැටුමක් තුළින් විද්‍යමාන වන එකිනෙකට සම්බන්ධ ව්‍යූහය හෙවත් ගැටුම් හා සම්බන්ධ විෂය මූලික සාධක, ආකල්ප හෙවත් ගැටුම් සඳහා මුල් වන මනෝවිද්‍යාත්මක සාධක, චර්යාව හෙවත් ගැටුම ප්‍රකට වන ආකාරය ගැල්ටූන්ගේ ගැටුම් ත්‍රිකෝණයෙන් විග්‍රහ කෙරේ (Galtung, 1996). කළු අභිචාර ක්‍රියාවලිය ගැල්ටූන්ගේ ගැටුම් ත්‍රිකෝණයට අනුව විශ්ලේෂණය කිරීමේ දී කළු අභිචාර මගින් ගැටුමකට මූලික වන ආකල්ප හෙවත් මනෝවිද්‍යාත්මක සාධක කළමනාකරණය කිරීමක් සිදුවන අතර එමගින් නිශේධනාත්මක මනෝභාවයන් චර්යාවක් තුළින් ප්‍රකට කිරීම අවහිර කිරීමත් එමගින් ව්‍යූහයේ ගැටුම් ඇතිවීම කළමනාකරණය කිරීමත් සිදුවේ. මෙහිදී ගැටුම කළමනාකරණයට සහභාගී වන තෙවන පාර්ශ්වය වන්නේ සූනියම් කිරීමේ ඇදුරන් ය. මෙම කරුණු වඩාත් තහවුරු කර ගැනීම උදෙසා අප විසින් කළුතර සහ ගාල්ල යන ප්‍රදේශවල සූනියම් කිරීමේ ස්ථානවල දී අහඹු ලෙස තෝරාගත් පුද්ගලයන් දස දෙනෙකු සමග සිදු කරන ලද ව්‍යූහගත සම්මුඛ සාකච්ඡා පැවැත් වූ අතර එමගින් අනාවරණය වූයේ කළු අභිචාරයන්හි නියැලීමෙන් ස්වකීය සතුරන් පිළිබඳ ඔවුන්ගේ චිත්ත අභ්‍යන්තරයේ පවත්නා නිෂේධනාත්මක මනෝභාවයන් කළමනාකරණය කර ගැනීමට හැකි බවත් එමගින් නිෂේධනාත්මක සිතුවිලි ගැටුමක් දක්වා වර්ධනය වීම වළක්වන බව යි.



රූපසටහන 1. ගැල්ටූන්ගේ ගැටුම් ත්‍රිකෝණය

නිගමනය සහ නිර්දේශ

ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික සමාජයන්හි ගැටුම් කළමනාකරණය උදෙසා කළු අභිචාර ඉවහල් වී ඇත. කළු අභිචාර මගින් පුද්ගල මනසෙහි කැළඹෙන නිශේධනාත්මක මනෝභාවයන් මෝචනය කර පුද්ගල මනස පවිත්‍රීකරණ ක්‍රියාවලියක් සිදුවේ. එබැවින් කළු අභිචාර ආතති කළමනාකරණ ප්‍රවේශයක් ලෙස ද ක්‍රියාත්මක වේ. මෙවැනි කළු අභිචාර නිසි කළමනාකරණ ක්‍රියාවලියකට, අගය එකතු කිරීමේ ක්‍රියාවලියකට හා තත්ත්ව පාලනයකට යොමු කොට නූතන උපදේශන මනෝවිද්‍යාත්මක ක්‍රියාවලීන් සඳහා දායක කර ගැනීම සිදු කළ හැකි ය.

ප්‍රමුඛ පද: *කළු අභිචාර, ගැටුම් කළමනාකරණ, මනෝවිද්‍යාත්මක ප්‍රක්ෂේපණය, මනෝවිද්‍යාත්මක විස්ථාපනය*

ආශ්‍රිත ග්‍රන්ථ

කරුණාරත්න, කේ. ඊ. (1990). සිංහල චිකිත්සක අභිචාර විධි පිළිබඳ විමර්ශනයක්. *Journal of the Royal Asiatic Society of Sri Lanka*, *35*, 91–109. http://www.jstor.org/stable/23731157.

ගරුසිංහ, පී. එස්. (2007). *සූනියම් කැපීමේ ශාන්තිකර්ම සහ සමාජය.* කර්තෘ ප්‍රකාශන.

ජාතික අධ්‍යාපන ආයතනය. (2009). *දේශපාලන විද්‍යාව-ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය.* ජාතික අධ්‍යාපන ආයතනය.

Galtung, Johan. (1996). *Peace by Peaceful Means: Peace and Conflict, Development and Civilization*. Sage Publications.

McLeod, S. A. (2019, April 10). *Defense mechanisms*. Simply Psychology. www.simplypsychology.org/defense-mechanisms.html.

මහනුවර රාජධානි අවධියේ කාන්තාව සතු ඉඩම් අධිකාරී බලය පිළිබඳ විමසුමක් (සීට්ටු, ගම්පත්කඩ සහ පූජාපත්‍ර ඇසුරෙන් කෙරෙන විමසුමක්)

එම්. ඒ. පී. කුමාර

මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

prasadmallawaarachchi85@gmail.com

හැඳින්වීම

පැරණි ඉන්දීය සමාජ පසුබිම තුළ සියලු සමාජ, ආර්ථික, ආගමික ක්ෂේත්‍ර කෙරෙහි කාන්තාව හිමිකර ගන්නා ලද අවම වරප්‍රසාද ලාංකේය කාන්තාව විෂයයෙහි එලෙසින්ම අත්පත් වූ බවට මූලාශ්‍රය සාධක නැත. විශේෂයෙන් ඉඩම් අධිකාරී බලය නැමති කාරණයේදී ඒ හා සම්බන්ධව පුරුෂ පාර්ශ්වය සතු බලයට සමාන සැලකිය යුතු බලයක් කාන්තා පාර්ශ්වය උරුම කරගෙන තිබේ. මහනුවර යුගයේ දී රටේ සාමාන්‍ය ජනතාවට ද ඉඩම් හිමිකම් පැවති බවට සාක්ෂ්‍ය පෙනෙන්නට තිබේ. ඉඩම් මිල දී ගැනීමට, ඉඩම් විකිණීමට, ප්‍රදානය කිරීමට ආදී වශයෙන් වූ සෑම බලයක් ම ස්වාධීන ව ඔවුන් භුක්ති විඳ ඇත. උඩ ඇඹිලිපිටියේ පදිංචි ජාලන් ආරච්චිල හා ජාගින් ආරච්චිල යන දෙදෙනා විසින් නාරද්දාව ගමේ වැව අසල පන්සලට එකී ගම පරිත්‍යාග කිරීමට අදාළ පූජා පත්‍රයක් හමු වී තිබීම පුරුෂ පාර්ශ්වය සතු ඉඩම් අධිකාරී බලය හෙළිදරව් කරන්නකි. මහනුවර රාජධානී අවධියේ කාන්තාව ඉඩකඩම් සම්බන්ධයෙන් සැලකිය යුතු බලයක් හිමිකරගත් බවත්, ඉඩම් හිමි ප්‍රභූ පෙළැන්තිය තුළ ඇය සැලකිය යුතු කාර්යයක් ඉටු කරන ලද බවත් මූලාශ්‍රය අධ්‍යයනයෙන් පැහැදිලි වේ. මහනුවර රාජධානි සමයේ කාන්තාව සතු වූ ඉඩම් අධිකාරී බලය පිළිබඳ ගම්පත්කඩ සහ පූජාපත්‍ර ඇසුරෙන් අධ්‍යයනය කිරීමක් මෙම පර්යේෂණයෙන් සිදු කෙරේ.

පර්යේෂණ ගැටලුව, පර්යේෂණ අරමුණු

මහනුවර අවධියේදී කාන්තාව සතු වූ ඉඩම් අධිකාරී බලය පුරුෂ පාර්ශ්වයට හිමි ඉඩම් අධිකාරී බලය අභිභවායාමක් ද? යන්න මෙහි පර්යේෂණ ගැටලුව වේ. මහනුවර රාජධානි සමයේ කාන්තාව සතු ඉඩම් අධිකාරී බලය පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ වූ අතර ඉඩම් හා සම්බන්ධව මහනුවර අවධියේ කාන්තාව හිමිකරගත් බලය ස්වාධීන වූවක් ද?, එය පුරුෂයාට හිමි වූ තත්ත්වයට සමාන හෝ එය අභිභවායාමක් ද? යන්න විමසීම සෙසු අරමුණු වේ.


පර්යේෂණ ක්‍රමවේදය

මෙහිදී යොදාගත් පර්යේෂණ ක්‍රමවේදය ඓතිහාසික පර්යේෂණ ක්‍රමවේදය යි. දත්ත සපයා ගැනීම සඳහා පුස්තකාලය අධ්‍යයනය සිදු කෙරිණි. 17 වන සියවසේ පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය, කොළඹ සහ මහනුවර රාජ්‍ය ලේඛනාගාරයන්හි තැන්පතු ලේඛන, යුගයට අදාළ සීට්ටු, ගම්පත්‍ර සහ පූජාපත්‍ර රැසක් අධ්‍යයනයට ලක් කොට ලබාගත් දත්ත සන්සන්දනාත්මක ව සහ විශ්ලේෂණාත්මක ව අධ්‍යයනය කරමින් නිගමනවලට එළඹීම මෙහි පර්යේෂණ ක්‍රමවේදය වෙයි.

ප්‍රතිඵල හා සාකච්ඡාව

මූලාශ්‍රයාගත සාධකවලට අනුව තමා වෙත දේපළ පවරා ගැනීමටත්, තමා සතු දේපළ පුද්ගල විෂයයෙහි පමණක් නොව ආගමික ආයතනවලට පැවරීමටත්, ඉඩම් විකිණීමටත් මිල දී ගැනීමටත් කාන්තාව සතුව පැවති අයිතිය හෙළිදරව් වේ. ක්‍රි.ව. 1795 දී පමණ අප්පුහාමි නමැත්තා විසින් සිය මව වූ කිරිහාමිගෙන් ලද ඉඩකඩම් සිය දියණිය වන ටිකිරි එතනාටත්, මුණුබුරා වන අප්පුහාමිටත් භාරකාරත්වය පැවරීම පිළිබඳ ව තොරතුරු අනාවරණය වී තිබේ. මෙම ඉඩම පවරා දීමේ දී ඉඩම් ප්‍රදානය ලබන ටිකිරි එතනාට කිසියම් නියෝගයකට යටත් ව සිය ප්‍රදානය භාර ගැනීමට සිදුව ඇත. එනම් පුත් අප්පුහාමි විසින් සිය මිත්තණියට උපකාරාදිය කළහොත් ගොලුවැද්දිය නම් කුඹුරු ඉඩමෙන් ලාස් 05 ක් ඔහුට පරවේණියට ලබාදිය යුතු බව ය. මෙම ඉඩම් අප්පුහාමිට ලැබෙන්නේ සිය මව වූ කිරිහාමිගෙනි. ඒ අනුව කිරිහාමි සතුව පැවති ඉඩම් අයිතිය හා පරපුරට අත්පත් කරදීමේ හැකියාව පිළිබඳව අදහසක් ගොඩනගා ගත හැකි වේ. ඊට අමතර ව මෙම ඉඩම් සිය පුතුට ලබාදුන් පසු ඔහු විසින් මෙම ඉඩම් නැවතත් කාන්තාවක් අතට පත් කොට ඇත. එනම් සිය දියණිය වන ටිකිරි එතනාට ය. ඒ තුළින් සිය දියණියට පියාගෙන් ලද ඉඩම්හි අධිකාරීත්වයක් ගොඩනැගී තිබේ. ඉඩම් හිමිවන්නේ භුක්තියට නොව අයිතියට ය. එමගින් කාන්තාව සතු ඉඩම් අයිතිය පිළිබඳ ව යම් අදහසක් ගොඩනඟා ගත හැකි වේ. රජරට සභ්‍යත්ව අවධියේ සිට ම කාන්තාව විසින් හිමිකරගත් ඉඩම් බලය මහනුවර රාජධානි සමය වනවිට සංකීර්ණ ක්‍රියාදාමයක් බවට පත් වී තිබෙන ආකාරයක් ද දැකිය හැකි වේ. නිදසුනක් වශයෙන් දෙහිගම නවරත්න අතපත්තු වාසල මුදියන්සේ විසින් තම දේපළ කාන්තාවන් කිහිපදෙනෙකුටත්, පිරිමි දරුවන් කිහිපදෙනෙකුටත් ප්‍රදානය කරන විට වැඩි බලතල හිමිකර දී ඇත්තේ වෛරෝඩි මැණිකේ නම් කාන්තාවකට ය. සෙසු ප්‍රදාන ලබන්නන් විසින් වෛරෝඩි මැණිකේට උපකාර නොකළහොත් එම ඉඩම් නැවත පවරා ගැනීමේ බලය වෛරෝඩි මැණිකේට හිමි වේ. මෙකී ඉඩම් ප්‍රදානයෙහි යම් වෙනසක් කළ යුතුව ඇත්නම් එහි සම්පූර්ණ බලය ද වෛරෝඩි මැණිකේට හිමි වේ. මේ අනුව සහෝදර පාර්ශ්වය අතර හුවමාරු වූ ඉඩකඩම් විෂයයෙහි තිබූ අධිකාරී බලයට වඩා වැඩි අධිකාරී බලයක් වෛරෝඩි මැණිකේට හිමි වූ නිසා මේ තුළින් සමකාලින යුගයේදී කාන්තාව සතුව ඉඩකඩම් විෂයයෙහි පැවති අධිකාරත්වය පිළිබඳ ව පැහැදිලිය අවබෝධයක් ලැබේ. විශේෂයෙන් මහනුවර යුගයේ කාන්තාවගේ ඉඩම් අධිකාරී බලය සම්බන්ධයෙන් පැන නැංවෙන විශේෂ ම තත්ත්වය නම් විවාහය නැමැති සාධකය අභිභවා ගොස් අනියම් බිරින්දෑවරුන්ට පවා ඉඩමේ අයිතිය හා භුක්තිය ස්ථාවර කොට දී තිබීම යි. ඇරැපොල කෝරළේ මහත්මයා විසින් අනියම් බිරිඳකගේ

දරුවකු ලෙස සිතිය හැකි ඩිංගිරි මැණිකාට සිය බූදලයෙන් කොටසක් වෙන් කිරීම පිළිබඳ හන්දුකන්ද කෝණාර රණසිංහ ගම්පත්කඩයෙහි දක්වා තිබීම නිදර්ශන වේ. එහි සඳහන් ආකාරයට ඇය කිසියම් දිනක විවාපත් වුවහොත් ඇයට හිමි දෑවැද්ද ලෙස බෝගහ කුඹුරෙන් පහලොල්ලාහක ප්‍රමාණයක් ලැබෙන අතර ඇයට පෙළවාසියක් කරගැනීමට නොහැකි වුවහොත් ඇරැපොල කෝරළේ මහත්මයාට අයිති සෑම ගමකින් ම කොටසක් ඇයට හිමිවන බව දක්වා තිබේ. ඒ නිසා විවාහය නමැති සාධකය ඉක්මවා ගොස් අනියම් බිරින්දෑවරුන්ගේ දරුවන්ට පවා සාධාරණය ඉටු වන පරිදි ඉඩම් භුක්තිය හසුරුවාගත් ආකාරය සුවිශේෂ තත්ත්වයකි. ක්‍රි.ව. 1798 ට අයත් සීට්ටුවක දෙහිදෙණියේ පිටියගේ හේරත්හාමි විසින් කාන්තාවන් කිහිපදෙනෙකුට සිදු කරන ලද ඉඩම් ප්‍රදානය නඩුවක් දක්වා ගමන් කළ ආකාරය දක්නට ලැබේ.



රූප සටහන 1. දෙහිදෙණියේ පිටියගේ හේරත්හාමි තම ඉඩම් දියණියන් තිදෙනාට බෙදා දුන් ආකාරය හා එහි පරම්පරාගත භුක්තිය

දෙහිදෙණියේ පිටියගේ හේරත්හාමිට අයත් ඉඩකඩම්වල අයිතිකාරිත්වය හිමි තුන්වන පුරුක වන ඇටඹේගොඩ ආරච්චිල, වන්නිසුන්දර ආරච්චිල හා හේනේපොල මොහොට්ටාල යන තිදෙනා අතර ඉඩම් පහළ වී දෙපැල සම්බන්ධ ආරවුලක් පැන නැඟෙන බව තල්පතේ සඳහන් ය. හේනේපොල මොහොට්ටාල විසින් දිගින් දිගටම කියා සිටියේ වත්තුහාමි එතනාගේ පුත් වූ මාකිලිහාමි විසින් ඔහුගේ බෑනා වූ කුමුදුහාමිට තල්පතක් මගින් දෙහිදෙණිය කුඹුර එක් අමුණක් දෙන ලද බව ය. මෙහි සත්‍ය අසත්‍යතාව විමසීමේ දී පැහැදිලි වූයේ එම තල්පත වංචනික බව ය. 'දෙපැල' යන්න 'අමුණු' ලෙස වෙනස්කර ඇති බවත්, මැණික් එතනා සහ එතනාගේ පරම්පරා පහක් මුළුල්ලේ පහළ දෙපැල 'දෙපැලක්' වශයෙන් පැවති බව ය. ව්‍යාජ තල්පත ගම් සභාවට භාරගන්නා ලදුව පහල දෙපැළ ඇටඹේගොඩ ආරච්චිල විසින් සාමකාමී ව භුක්ති විඳින ලදී. මේ අනුව පැහැදිලි වන්නේ කාන්තාව සතු ඉඩම් අයිතිය කෙරෙහි පවා අභියෝග එල්ල වූ ආකාරය යි.

නිගමන සහ නිර්දේශ

ඉහත සඳහන් කරුණු අනුව මහනුවර යුගයේ කාන්තාව ඉඩම් අයිතිය සහ භුක්තිය විෂයෙයහි සැලකිය යුතු තරමේ අධිකාරී බලයක් හිමිකරගත් බව පැහැදිලි වේ. ඇතැම් විට එම බලය පුරුෂ පාර්ශ්වයට හිමි ඉඩම් අධිකාරී බලයට පවා අභියෝග කළ අතර නඩුමගට බැසීමෙන් පවා ඇය ඉඩම හා සම්බන්ධ ස්ථාවරය ඒ අයුරින් ම රැකගැනීමට සමත් වී තිබේ. ඒ අනුව මහනුවර රාජධානි සමයේ කාන්තාව සතු ඉඩම් අධිකාරී බලයට අභියෝග කිරීම පවා කළ නොහැක්කක් වූ බව පැහැදිලි වේ.

ප්‍රමුඛ පද: *අධිකාරීත්වය, භුක්තිය, අයිතිය, දේපළ, දෑවැද්ද*

ආශ්‍රිත ග්‍රන්ථ

ඤාණවිමල හිමි, කේ. (1967). *සපරගමු දර්ශන.* ගොඩගේ සහ සහෝදරයෝ.
ඤාණවිමල හිමි, කේ. (1942). *සපරගමුවේ පැරණි ලියවිලි.* මානවහිතවාදී ලේඛකපර්ෂදය.
ලෝරී, සී. (2014). *ලෝරි ගැසට්යර්.* උපාලි ජී. කිරිදීගොඩ (පරි.). මධ්‍යම පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව.
Ranawella, G.S. (2004). *Inscriptions of Ceylon.* Vol. V. Department of Archaeology.
Ranawella, G.S. (2007). *Inscriptions of Ceylon.* Vol. VI. Department of Archaeology.

මහනුවර රාජධානි අවධියේ විහාර දේපළ කළමනාකරණය සඳහා භික්ෂුව සතු වූ ඉඩම් අධිකාරී බලය මගින් ඇති කළ බලපෑම පිළිබඳ ගම්පත්කඩ සහ අන්තිම කැමතිපත්‍ර ඇසුරෙන් කෙරෙන විමසුමක්

එම්.ඒ. පී. කුමාර
මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
prasadmallawaarachchi85@gmail.com

හැඳින්වීම

භික්ෂු සංස්ථාව පුළුල් වී යත්ම වැඩිවන සංකීර්ණ අවශ්‍යතා පිරිමසා ගැනීම සඳහා විහාර සන්තකව ස්ථාවර ආදායම් මාර්ග පැවතීම අත්‍යවශ්‍ය කරුණක් වූ අතර විහාරාරාම සඳහා ඉඩම් පරිත්‍යාගයන් සිදු කිරීමට බොහෝ දෙනා ඉදිරිපත් වී තිබේ. මේ හේතුවෙන් ඉඩම් සම්බන්ධ සැලකිය යුතු අධිකාරියක් භික්ෂුව සතුවූ ආකාරයක් හඳුනාගත හැකි ය. මහනුවර රාජධානි අවධියේ භික්ෂුව සතු ඉඩම් අධිකාරී බලය පිළිබඳ විමසුමක් මෙම පර්යේෂණයෙන් සිදු කෙරේ. මැන්දිස් රෝහණදීර විසින් රචනා කරන ලද 'සාංඝික දේපළ' නම් . ක්‍රි.ව. 1222-1321 අතර කාලය තුළ මෙරට දැකිය හැකි වූ සාසන සම්මත ගම්බිම්, විහාර සන්තක දේපළ, විහාර දේපළ පරිහරණය පිළිබඳ සාකච්ඡා වී ඇතත් මහනුවර යුගයේ භික්ෂු පාර්ශවය දරණ ලද ඉඩම් අධිකාරී බලය පිළිබඳ කිසිදු අවධානයක් යොමු කර නැත. රැල්ෆ් පීරිස් විසින් රචනා කරන ලද 'සිංහල සමාජ සංවිධානය -මහනුවර යුගය' නම් කෘතියෙහි ද මහනුවර යුගයේ ඉඩම් භුක්තිය පිළිබඳ දීර්ඝ සාකච්ඡාවක් දැකිය හැකි මුත් භික්ෂුව සන්තක ඉඩම් අධිකාරී බලය පිළිබඳ සාකච්ඡාවක් සිදු වී නොමැත. රණවීර ගුණවර්ධනයන් විසින් රචිත 'සිවුර සහ නඟුල' ශ්‍රී ලංකාවේ විහාරස්ථ ජීවන සම්ප්‍රදාය හා එහි ආර්ථික පාර්ශවයන් පිළිබඳ මූලික අවධානයක් යොමු කරමින් රචිත කෘතියකි. එහෙත් එහිද මහනුවර යුගයේ භික්ෂුව සන්තක ඉඩම් පිළිබඳ අවධානය යොමු කර නැත. මෙම පර්යේෂණ හිඩැස පිරවීම සඳහා මාගේ පර්යේෂණයෙන් උත්සාහ ගෙන ඇත.

පර්යේෂණ ගැටලුව, පර්යේෂණ අරමුණු

මහනුවර රාජධානි සමය තුළ විහාර දේපළ කළමනාකරණය සඳහා භික්ෂුව සතු වූ ඉඩම් අධිකාරී බලය මගින් ඇති කළ බලපෑම කෙබඳු ද? යන්න මෙහි පර්යේෂණ ගැටලුව වේ. මහනුවර රාජධානි සමයේ දී භික්ෂුව සන්තක වූ ඉඩම් අධිකාරී බලය පිළිබඳ අධ්‍යයනය කිරීම මෙහි මූලික අරමුණ වේ. මහනුවර යුගයට සීමා වෙමින් ගම්පත්කඩ හා අන්තිම කැමතිපත්‍ර වලින් හෙළිවන තොරතුරු පාදක කර ගනිමින් මෙම පර්යේෂණය සිදු කර ඇත.

පර්යේෂණ ක්‍රමවේදය

මෙහි දී යොදාගත් පර්යේෂණ ක්‍රමවේදය ඓතිහාසික පර්යේෂණ ක්‍රමවේදයයි. දත්ත සපයා ගැනීම සඳහා 17 වන සියවසේ පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය, කොළඹ සහ මහනුවර රාජ්‍ය ලේඛනාගාරයන්හි තැන්පතු ලේඛන, එම යුගයට අදාළ ගම්පත්කඩ හා අන්තිම කැමතිපත්‍ර රැසක් අධ්‍යයනයට ලක්කොට ලබාගත් දත්ත සන්සන්දනාත්මකව සහ විශ්ලේෂණාත්මකව අධ්‍යයනය කරමින් නිගමනවලට එළඹීම මෙහි පර්යේෂණ ක්‍රමවේදය වෙයි.

ප්‍රතිඵල හා සාකච්ඡාව

කරතොට ධර්මාරාම හිමියන් විසින් අසරණයෙක් සරණපතා පැමිණි විට කළ ඉඩම් ප්‍රදානයක් පිළිබඳ තොරතුරු ඉදිරිපත් වී තිබේ. රාජකාරියක් සඳහා බුක්තියට බිංවාසියක් දීම හා සම්බන්ධ ලිපිය, 'පල්ලෙබැද්ද කියන ගමේ දොඩන්මුළුවේ ජනහාමිට නම නියම වශයෙන් ගමක් බිමක් නැත කියා රාජකාරි කර බුක්ති විඳීමට බිංවාසියක් කරා පැමිණ ඉල්ලා සිටින නිසා ළිඳගාවා කුඹුර මුල් බිජු පසෙළොස් ලාහේ වපසරිය පමණ ඊට අයිති ගොඩමඩ හෙවත් ගහකොළ වල්පිටත්..... මෙම ජනහාමිට එයට දාවූ පුංචිරාලට ද යන දෙන්නාට භාරදෙන්න යෙදුන නිසා එම ගමේ අනිකුත් පන්ගුකාරයො විසින් ගමලත් අපට යම් පමණ වැඩ රාජකාරියක් අවුරුදු පතා කරනවා ද කරවන සැටියට ද සේවයක් යම් දවසක දී එකී වැඩ ආදිය නොකර අත හැරුණ විටක දී එම පන්ගුව ඔවුන්ගෙන් මාරුකර එයින් නිදහස් කිරීමට ඒ ගැන මට යන් පමණ බලයක් ඇද්ද මගේ උරුමක්කාර ශිෂ්‍යාදීන්ටත් එපමණ බලේ තබා මේ ඔත්පින්නය... අත්තම කළේ මෙකී පල්ලෙබැද්ද කියන ගම්ලත් කරතොට ශ්‍රී ධම්මාරාම නායක උන්නාන්සේ විසින' මෙම ලිපියේ සඳහන් කරන ආකාරයට දොඩන්මුළුවේ ජනහාමිට කුඹුරු ඉඩම පරිත්‍යාග කරන්නේ කරතොට ශ්‍රී ධම්මාරාම භික්ෂුව විසිනි. සාංඝික දේ නිකම්ම බුක්ති විඳීමට දීම අපාගත වීමට කරුණක් යැයි සමකාලීනව පැවති අදහස නිසා රාජකාරිය සිදු කිරීමට නියම කරමින් ප්‍රදානය කිරීම සිදුකර තිබේ. මෙම රාජකාරිය පැහැර හරින විට එම පන්ගුව ඔවුන්ගෙන් නිදහස් කිරීමට ප්‍රදානය කරන භික්ෂුවට යම් පමණ බලයක් ඇතැයි ද එකී බලය ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට උරුමවන ලෙස මෙම ප්‍රදානය සිදු කරන බව දක්වා තිබේ. ඒ අනුව සමකාලීන සමය වන විට ඉඩකඩම් විෂයෙහි භික්ෂුවගේ බල අධිකාරිය පිළිබඳ යම් තොරතුරක් මේ තුළින් පැන නැංවේ.

ඇතැම් අවස්ථාවන්හි දී භික්ෂුව විසින් ඉඩකඩම් විවිධ අවශ්‍යතා සඳහා ඉල්ලා සිටි අවස්ථා පිළිබඳව ද මූලාශ්‍රය සාධක වේ. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු විසින් බණ පොතක් ලියවා දීම වෙනුවෙන් කරඳන දේවරක්ඛිත භික්ෂුවට සිදු කරන ගම් ඉඩම් ප්‍රදානයක් පිළිබඳ මහනුවර යුගයේ දී තොරතුරු ලැබේ. මෙහි සඳහන් ආකාරයට ගම් ඉඩම ඉල්ලා

සිටින්නේ භික්ෂුවක් විසිනි. ඒ මියන කොළ කඩා ගැනීම සඳහා ය. භික්ෂුවගේ ඉල්ලීම පිට රජු විසින් දුම්බර කීර ගම පරිත්‍යාග කර තිබේ. ඒ අනුව ඉඩමේ සීමා දැක්වීමේ දී එහි කල්පැවැත්ම ප්‍රධාන සාධකය බවට පත්කර ගත් බවක් පැහැදිලි වේ. මේ සියල්ලෙන් බලාපොරොත්තු වූයේ භික්ෂුව විෂයෙහි ප්‍රදානිත ගම් ඉඩමේ අනාගත ආරක්ෂාවයි. විහාර සන්තක ඉඩමෙන් තණ පතක්වත්, දර කැබැල්ලක්වත්, මලක් හෝ ගෙඩියක් පමණක්වත් බලහත්කාරයෙන් ලබා ගැනීම වරදෙකි. 'තමා විසින් හෝ අන්‍යයන් විසින් හෝ බුදුරජුන්ට පූජා කළ ඉඩම්වල හෝ කුඹුරුවල හෝ සන්තකය බලහත්කාරයෙන් ලබා ගන්නේ නම් ඔහු මිනිස් අසූචිවල හෝ අන්‍ය අපද්‍රව්‍යයේ පණුවෙක් සේ ඉපිද අවුරුදු 600 000 දුක් විඳිත්වා! බුදුන් සතු ඉඩමකින් තණ පතක් දර කැබැල්ලක් පමණක්වත්, මලක් හෝ ගෙඩියක් පමණක්වත් හෝ යම් කිසි අයෙකු විසින් නීති විරෝධි ලෙස ගතහොත් හෝ උසින් යොදුන් පනහක් හෝ හැටක් නෙරාගිය බඩකින් ද යුක්තව ඉපිද සෙම් සොටු කෙළ පමණක් මිස අහරක් නො ලබන නිරන්තරයෙන් කඳුළු වගුරන දෙඇසින් යුක්ත වනුයේ පංච ගංගාවක් උගුර තුළ පතිත වුව ද සමුදුර ජල කඳ අපාගින්නක් සිඳී නොයන්නා සේ නොසිඳෙන ප්‍රේතයෙකුව උපදින්නේ ය. එසේ හෙයින් එබඳු උපද්‍රව නො විඳිනු පිණිස මෙබඳු වූ පූජෝපකාරයකට බාධා නොකෙරෙත්වා.....ත දානමය වස්තූන් ආරක්ෂා කරන්නන් නිවන් අවබෝධ කර ගන්නෙමි' යනුවෙන් ක්‍රි. 1759 වර්ෂයට අයත් බම්බාව විහාරයෙන් හමු වූ පූජාපත්‍රයෙහි සඳහන්ව තිබීමෙන් භික්ෂුවගේ ඉඩම් අධිකාරීබලයෙහි ස්ථාවරත්වය පැහැදිලි වේ. භික්ෂූවක් විසින් විහාර නඩත්තුව සඳහා ඉඩම් මිල දී ගත් අවස්ථා පිළිබඳ මහනුවර යුගයේ දී අසන්නට ලැබේ. කැබිලියාපොල පුරාණ මහා විහාරයේ ආදී කර්තෘ කිරින්දේ ගණින්නාන්සේ විසින් පන්සලේ නඩත්තුව පිණිස ඉඩමක් අතමුදලට ගැනීම පිළිබඳ ක්‍රි. ව. 1805 ට අයත් ලේඛනයක සඳහන් වී තිබේ. ලිපියේ සඳහන් කරන ආකාරයට කිරින්දේ ගණින්නාන්සේ විසින් ඉඩම මිල දී ගන්නේ කැබිලියාපල අබේසි කන්නානම් පතිරගෙ බබෙ අප්පු, එම වසන් බාලප්පු, හක්මන හේවා ජාලජ්ගේ සිමං, ජුවන් යන සතර දෙනාගෙනි. ඒ ඕලන්දක්කාර මුදලෙන් පතාග දහසකට ය. මෙසේ මිල දී ගත් ඉඩම කුරක්කන් පස් කුරුණියේ ඉඩමකි. ඒ අනුව භික්ෂුවක් සන්තකව ඉඩම් මිල දී ගැනීමේ හැකියාවක් පැවති බව පැහැදිලි ය.

විහාර සන්තක ඉඩම් තම අවසාන කාලය වන විට තම ශිෂ්‍ය ගෝලනමට පැවරීමේ බලයක් විහාරාධිපති වහන්සේට පැවතිණි. 'මගේ ප්‍රානය ශරීරයෙන් තුරන්ව ගියායින් පසු ආත්මය සුවපත් වීමේ' යනුවෙන් බෝවල හිමියන්ගේ අන්තිම කැමති පත්‍රයේ සඳහන් වීමෙන් අවසාන මොහොතේ වගකීමෙන් හා බැඳීමෙන් තොරව තණ්හා බැමි බිඳ දමා සන්තක සියලු දෙය ඒ ඒ අයට පැවරීමෙන් පිරිසිදු සිතින් මෙලොවින් තුරන්වීමේ අරමුණින් දුන්නා මිස හිතවත්කම් වර්ධනය කරගැනීමට හෝ ආත්මාර්ථයෙන් බැඳි දුන් දීමනාවන් නොවන බව පැහැදිලි වේ. 'කනංකෙ යන ගමෙහි නිවාසී කුලවන්ත ඥානවන්ත හැම දෙනාටම මතු සඟමොක් සුවය සලසනු පිණිස' යනුවෙන් අගලකඩ හිමියන්ගේ අන්තිම කැමති පත්‍රයේ සඳහන් කරන්නේ ද මෙම අදහසයි. මෙමඟින් පැන නැගෙන ඊටත් වඩා ගැඹුරු අදහස නම් දායකයන්ගේ දේපල සංඝයාට දුන් පසු සංඝයා ද තවත් සංඝයාට පූජා කිරීමෙන් දායකයන්ගේ පින තව තවත් දියුණු වූ බව ය. අසාධ්‍ය රෝගයකින් පෙලෙමින් සිටි ශ්‍රී පාදස්ථානයේ හා පහතරට නායක තනතුරු ලත් කඹුරුපිටියේ ස්ථවිරයන් වහන්සේ පැල්මඩුල්ල විහාරයේ වැඩ සිටි ස්වකීය ශිෂ්‍ය කඹුරුපිටියේ හිමියන්ට එවන ලද අවවාදාත්මක අන්තිම කැමති පත්‍රයක් පැල්මඩුල්ලෙන් හමුවී තිබේ. ප්‍රදානය කළ දේපළවල ස්වභාවය හෝ ප්‍රමාණ පිළිබඳ කිසිදු තොරතුරක් සඳහන් කර නොතිබුණ ද 'මා සන්තකින් දැනට ඔතන තියන දේත් සියල්ලම දැන්ම තමුසේට මා විසින් දුන්නා ය' යනුවෙන් සඳහන් වී තිබීම නිසා සියලු චංචල නිශ්චල දේපළ ප්‍රදානය කළ බව පැහැදිලි ය. ඒ අනුව දේපළ පැවරීමේ දී භික්ෂුව සන්තක වූ අධිකාරීත්වය පිළිබඳ යම් අදහසකට එළඹිය හැකි ය.

නිගමන සහ නිර්දේශ

ඉහත සඳහන් කරුණු අනුව මහනුවර යුගයේ භික්ෂුව ඉඩම් අයිතිය සහ භුක්තිය විෂයෙහි සැළකිය යුතු තරමේ අධිකාරී බලයක් හිමි කර ගත් බව පැහැදිලි වේ. ඇතැම් විට එම බලයට අභියෝග කිරීම පවා කළ නොහැක්කක් වූ අතර විහාර නේවාසිකයන්ගේ කුදුමහත් අවශ්‍යතා පූරණය පිණිස එම ඉඩකඩම්වල ආදායම් විධිමත්ව යොදවාගෙන තිබේ. භික්ෂුව විසින් තම ජීවිතයේ අවසාන කාලයේ දී වග කීමෙන් හා බැඳීමෙන් තොරව තණ්හාව සුන් කර දමා තමා සතු දේ පින් පිණිස අන් අයට පැවරීමේ ක්‍රමයක් ද අනුගමනය කර ඇත. මෙම ප්‍රදාන බොහෝ විට පිරිසිදු සිතින්ම මෙලොවින් තුරන් වීමේ අභිප්‍රායෙන් දුන්නා මිස හිතවත්කම් වර්ධනය කර ගැනීමට හෝ ආත්මාර්ථයෙන් දුන්නක් නොවන බව දක්වා තිබීමෙන් විහාරදේපොළ ආරක්ෂාව තහවුරු කිරීම භික්ෂුව ඉඩම් අධිකාරී බලය දැරීමෙහි ඒකායන අරමුණ වූ බව පැහැදිලි ය.

ප්‍රමුඛ පද: *අධිකාරීත්වය, භුක්තිය, කළමනාකරණය, අන්තිම කැමති පත්‍ර, සාපය*

ආශ්‍රිත ග්‍රන්ථ

ඤාණවිමල හිමි, කේ. (1967). *සපරගමු දර්ශන.* ගොඩගේ සහ සහෝදරයෝ.
ඤාණවිමල හිමි, කේ. (1942). *සපරගමුවේ පැරණි ලියවිලි.* මානවහිතවාදී ලේඛක පර්ෂදය.
ලෝරී, සී. (2014). *ලෝරි ගැසට්යර්.* උපාලි ජී. කිරිඳිගොඩ (පරි.). මධ්‍යම පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව.
Ranawella, G.S. (2004). *Inscriptions of Ceylon.* Vol. V. Department of Archaeology.
Ranawella, G.S. (2007). *Inscriptions of Ceylon.* Vol. VI. Department of Archaeology.

Scenarios of Endangered Culture: A Study of the Intangible Cultural Heritage of Kurichiya and Kuruma Indigenous Communities in Wayanad, Kerala, India

L. Sebastian
Department of English, St.Joseph's College (Autonomous), Irinjalakuda, Thrissur, Kerala, India
linet@stjosephs.edu.in

Introduction

The UNESCO Convention for Safeguarding of Intangible Cultural Heritage (2003) defines the intangible cultural expression as the prime aspect for local cultural identity and it promises sustainable development**.** In an age of cosmopolitanism and trans-nationalism, indigenous cultures have been constructed as negative practices. Due to the push of modernization in all domains the unique cultural practices of indigenous communities are on the verge of extinction. Wayanad, a district of Kerala located in the Western Ghats with sizable tribal population and 37% forest coverage is demarcated from other Kerala states due to its geographical position. According to the latest survey Wayanad has the highest tribal population in Kerala. Kurichiya and Kuruma are significant indigenous communities in Wayanad with unique cultural practices, culinary habits, medicinal knowledge, archery skills, natural resource management, paddy farming, crafts skills and ecological conservation. These intangible cultural legacy of Kurichiya and Kuruma Communities are on the verge of extermination.

Research Problem/s, Objective/s

- To study the endangered culture of Kurichya and Kuruma indigenous communities in Wayanad, to safeguard them and to include their intangible cultural heritage in the cultural imaginary of the nation.
- To explore the ways by which the 'dominant centre' dismantled and disempowered the culture of Kurichya and Kuruma to an eco-cultural 'marginal surviva.l'
- To promote a viable eco system to maintain humanistic healing practices by incorporating the traditional healing knowledge of Kurichya and Kuruma in possible areas and to channelise holistic healing practices.
- To steer ecological preservation by adopting indigenous ecological knowledge in Wayanad, which falls in Western Ghats and faces serious threats due to climate change, fragile eco zones, diminishing forest coverage and crop failure in agriculture.

Materials and Methods

The study uses cultural study method and heritage discourses to demarcate endangered indigenous culture of Kurichiya and Kuruma tribal communities. The primary prerequisite to safeguard and protect intangible indigenous culture is to identify and categorise the endangered cultures and to add them as a part of heritage discourse. Hence, the study follows the methodology and theoretical aspects of cultural studies. Cultural study methods such as participating in the cultural expression, observing cultural artifacts, visiting the major and minor hamlets of Kurichiya and Kuruma settlements are used which helps to identify the unique elements in their culture.

Results and Discussion

The study focuses on the practical levels of identifying and safeguarding the indigenous intangible culture of Kurichiya and Kuruma communities in Wayanad. The research highlights, safeguarding as protection and not as commodification of culture. Intangible Cultural Heritage (ICH) is the outcome of the lived experience and a spontaneous intrinsic knowledge attained through the observation of immemorial times and it is different from academic knowledge. Hence, its application or harmonisation with the new advanced knowledge in possible areas may bring positive changes in facing the challenges of climate change, protection of the Western Ghats and bio-diversity management.

Conclusions and Recommendations

The Intangible cultural heritage (ICH) of indigenous communities includes traditional practices, cultural expressions, art forms, rituals, festivals, knowledge and skills. The study aims to explore the intangible cultural heritage of Kurichiya and Kuruma tribal communities in Wayanad and its current implications in bio diversity preservation, forestry and livelihood management, paddy farming and humanising healing practices. As Wayanad falls in Western Ghats, the district faces extreme climate change, fragile eco-zones and buffer-zones, it needs safeguarding the natural environment with due care. Synchronisation of the indigenous knowledge with the latest scientific observations will promise a holistic and sustainable development.

Keywords: *Kurichiya, Kuruma, Indigenous Knowledge, Endangered culture*

References

Johnny, O.K. (2001). *Wayanad Rekhakal.* Pappion.

Logan, William. (1887). *Malabar Manual*, vol. I & II. The Superintendent, Govt Press.

Nair, C.G., Gopalan-Nair, C., & Morse S.H. (1911). *Wayanad: Its Peoples and Traditions*. Higginbotham & Company.

Nair, G.S. Unnikrishnan J. (2016). Traditional Wisdom in Harvesting Water. *Traditional and Folk Practices* 2–4 (1): 50–53.

Hoagland, S.J. (2016). Integrating Traditional Ecological Knowledge with Western Science for Optimal Natural Resource Management. *IK: Other Ways of Knowledge.* 3(1). https://doi.org/10.18113/P8ik359744

අත්පිටපත් (පුස්කොළ පොත්) සංරක්ෂණ සඳහා නව ප්‍රවේශයක්

එච්. එච්. ඒ. කරුණාරත්න* සහ ඩබලිව්. ඒ. එන්. එම්. වාරියප්පෙරුම
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
**ashoka@sjp.ac.lk*

හැඳින්වීම

විවිධ කාලපරිච්ඡේද තුළ ලෝකයේ විවිධ රටවල දේශීය දැනුම අනාගත පරම්පරාවට සම්ප්‍රේෂණය හා ආරක්ෂා කිරීම සඳහා ලේඛන මාධ්‍ය භාවිත කර ඇත. මේ අතර ශිලා ලේඛන, තඹපත්, මැටිපුවරු, වීදුරු, රෙදි, දැව, පුස්කොළ, අස්ථි ආදිය වැදගත් වේ (Kathpalia, 1973). මෙම ලේඛන මාධ්‍ය අතර පුස්කොළපොත් වලට හිමිවනුයේ සුවිශේෂී ස්ථානය කි. දේශීය දැනුම විවිධ විෂය ක්ෂේත්‍ර ඔස්සේ අධ්‍යයනය කිරීමට හැකියාව ඇති අතර බෞද්ධ, ඉතිහාසය, පුරාවිද්‍යාව, දේශීය වෛද්‍ය විද්‍යාව, දේශීය දැනුම, ජ්‍යොතිෂ්‍යය, චාරිත්‍ර වාරිත්‍ර, වෛද්‍ය විද්‍යාව ආදී විෂයන් පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී පුස්කොළ පොත් වැදගත් කාර්යය භාරයක් ඉටු කරයි. ගෝලීය වශයෙන් බුරුමය, ජර්මනිය, ඉන්දියාව, ජපානය, නේපාලය, තායිලන්තය ආදී රටවල පුස්කොළ පොත් ලේඛන කලාව ප්‍රචලිතව පැවතී ඇත (Agrawal, 1984). ක්‍රි.ව 19 වන සියවසේ සිට ශ්‍රී ලංකාව තුළ පුස්කොළපොත් මූලික ලේඛන මාධ්‍යක් ලෙස පැවති හෙයින් ඒවා විධිමත් පරිදි සංරක්ෂණය කර පසුකාලීන අධ්‍යයන අරමුණු සඳහා ආරක්ෂා කර තැබීම සමාජ වගකීම කි. තල්පත්‍ර දේශගුණික, පාරිසරික ආදී ස්වභාවික හා මානව, සත්ත්ව ආදී භෞතික ක්‍රියාකාරිත්වයන් වලට සංවේදී හෙයින් ප්‍රතික්‍රියා දැක්වීම ඉහළ ප්‍රවණතාවක පවතී (Padhi, 1974). මේ අතර ක්ෂුද්‍ර ජීවී, කෘමීන්, දිලීර ආදී සත්ත්ව ක්‍රියාකාරිත්වයන් ද, පරිසර උෂ්ණත්ව, ආර්ද්‍රතාව, ජලය ආදී ස්වභාවික ක්‍රියාවන් ද, නොවිධිමත් ඇසුරුම්, නඩත්තු නොකිරීම, ආලෝකය, ආදී මානව ක්‍රියා ද පුස්කොළ පොත් විනාශ වීමට බලපාන ප්‍රධාන කාරක ලෙස ක්‍රියාකරයි (Agarwal and Mandana,1997). මුල් කාලයේ සාම්ප්‍රදායික ක්‍රමවේද තුළින් හායන කාරක තත්ත්ව පාලනය කර ඇත. නව තාක්ෂණික ප්‍රවේශයක් ලෙස, විද්‍යුත් පිටපත් කිරීම (Digitalization), ජායාරූපකරණය (Photography), වාර්තාකරණය (Reporting) ආදී කාර්යයන් පෙන්වාදෙයි (Joshi, 1995). තව ද දුමානය (Fumigation), කළුමැදීම (Blackpolosh), තෙල්මැදීම (Oiling) ආදී ක්‍රමවේදයන් ද පුස්කොළ පොත් කල් තබා ගැනීම සඳහා භාවිත කර ඇත. එහෙත් පුස්කොළ පොත් (අත් පිටපත්) වලට සිදුවන භෞතික හායන තහවුරු කිරීම සඳහා නව ප්‍රවේශයක අවශ්‍යතාවක් පවතී. විශේෂයෙන් මෙම මැදිහත් වීම් ලේඛනයේ සත්‍යතාව ආරක්ෂා වන පරිදි සිදු විය යුතුය. මෙහි දී අවධානයට ලක්කළ යුතු කරුණක් වනුයේ ලේඛනයේ ඓතිහාසික වටිනාකමට කිසිදු ආකාරයට පළුදු වීමක් නොවන පරිදි සංරක්ෂණය කිරීමයි. මෙම ලේඛන නැවත ලිවීම හෝ සංරක්ෂණය කිරීමේ දී අකුරු නොවැසීයන පරිදි හෝ වර්ණය, ඝණකම, ශක්තිය, ප්‍රමාණය ආදිය කෙරෙහි සැලකිලිමත් විය යුතුය. පුස්කොළ පොත් සංරක්ෂණය සඳහා විවිධ ක්‍රමවේද පැවතිය ද වඩාත් යෝග්‍ය පරිදි ලේඛන උරුමයක් සංරක්ෂණය කිරීම කුමක් ද යන්න හඳුන්වාදීම මෙම අධ්‍යයනය මගින් සිදු වේ.

පර්යේෂණ ගැටලුව, පර්යේෂණ අරමුණු

පොදුවේ පුස්කොළ පොත්වලට ඇති කරන හායන කාරක භෞතික හා භෞතික නොවන ලෙස හඳුනාගත හැකි අතර භෞතික නොවන හායන ලෙස දූර්වර්ණ වීම, පුස්බැඳීම ආදීය ද භෞතිකමය හායනකාරක ලෙස මතුපිට දියවීම, දිරායාම, ඉරියෑම, සිදුරු ඇති වීම ආදී ව්‍යුහාත්මක වෙනස් වීම් තහවුරු කරගත හැකි වේ. මේ අනුව පර්යේෂණ ගැටලුව වනුයේ පුස්කොල ලේඛනවලට භෞතික බලපෑම් ඇති කරන හායන කාරක මොනවාද යන්න ? හඳුනා ගැනීමයි. පුස්කොළ පොත් සංරක්ෂණ කාර්යය රසායනික එහි ජීව කාලය කෙරෙහි පමණක් සැළකිලිමත් නොවිය යුතු අතර ලේඛනයේ ඓතිහාසික හා ද්‍රව්‍යමය සත්‍යතාවය සුරකින අයුරින් සංරක්ෂණ ක්‍රමවේදය යොදාගත යුතු බවයි. මේ අනුව පර්යේෂණ අරමුණ වනුයේ නිවැරදි සංරක්ෂණ ක්‍රමවේද භාවිත කිරීමෙන් ලේඛනයට ඇති කරන සාධනීය තත්ත්වයන් අනාවරණය කිරීමයි.

පර්යේෂණ ක්‍රමවේදය

පුස්කොළ පොත් සංරක්ෂණයට පෙර සිදුව ඇති හායනකාරකයන්හි ව්‍යුහාත්මක ස්වරූපය තහවුරු කර ගැනීම සඳහා අධිසංවේදී අන්වීක්ෂයක් භාවිතයෙන් අදාළ ලේඛනය පරීක්ෂා කිරීම සිදු කරනු ලබයි. පූර්ව සංරක්ෂණ ක්‍රියාවලියන්හි දී ආදේශක ද්‍රව්‍ය ලෙස විවිධ ද්‍රව්‍ය හා ක්‍රමවේද භාවිත කර ඇත. උදාහරණ ලෙස ජැපනීස් පත්‍ර (Japanese paper), හැන්මෙඩ් පත්‍ර (Handmade Paper) පෙන්වාදිය හැකිය. ප්‍රථමයෙන්, හායන තත්ත්වය හා යොදා ගන්නා සංරක්ෂණ ක්‍රමවේදය කුමක් ද යන්න තහවුරු කරගනී. සංරක්ෂණ කාර්යේ දී යෝදා ගනු උපකරණ හා බන්ධන කාරක සාම්‍යත්වක් උසුළනු ලබයි. මෙම අධ්‍යයනය තුළින් පුස්කොළ පොත් සංරක්ෂණය සඳහා වඩාත් යෝග්‍ය ක්‍රමවේදය හා ඒ මගින් ලේඛනයට ඇති කරන සාධනීය ලක්ෂණ මොනවාද යන්න පිළිබඳව අවධානයට ලක් කිරීමයි. අධ්‍යයනය අනුව, සංරක්ෂණයට බඳුන් කරන පුස්කොළය මත ඇති විඛාදන තත්ත්වයේ ව්‍යුහාත්මක ස්වභාවය අන්වීක්ෂය මගින් පරීක්ෂා කරන ලදී. මෙම සංරක්ෂණ ක්‍රමවේදයේ දී පොදුවේ අනුගමනය කරන ක්‍රම කිහිපයකි, පළමු පියවරෙ දී පත් ඉරුව පිරිසිදු කළ යුතුය. මෙහි දී දිලීර පැල්ලම් ඇති ස්ථාන පිරිසිදු කිරීමේ දී තයිමෝල් 3% ද, දූවිලි සහිත ස්ථාන පිරිසිදු කිරීමේ දී ඇල්කොහොල් 50% භාවිත කරනු ලබයි. අනතුරුව පත් ඉරු දින 3 හෝ 4 ක් හොඳින් වියළා ගනී (මෙහි දී පත්ඉරු මාරු වීමට ඉඩ නොදිය යුතුය). සංරක්ෂණය කිරීමට පෙර සියලුම විඛාදන සහිත ස්ථාන ඡායාරූප, සැලසුම් මගින් වාර්තා කරයි.

අනතුරුව අන්වීක්ෂය මගින් විඛාදන ස්ථානයේ ව්‍යුහාත්මක තත්ත්වය පරීක්ෂා කිරීම, ආදේශක කොටස සකස් කිරීම, කෙමිෆික්ස් සහ C M C භාවිතය මගින් ආදේශක කොටස සම්බන්ධ කිරීම, Bone උපකරණය භාවිතයෙන් ශක්තිමත් කිරීම, පිරිසිදු විදුරු කැබැල්ලක ආධාරයෙන් බරක් තැබීම හා වියළා ගැනීම සිදු කරයි. ආදේශක කොටසේ හා අත්පිට

පතෙහි දාරවල සම්බන්ධතාව පරීක්ෂා කිරීම හා එයට ගැළපෙන පරිදි ආදේශක කොටස සකස් කර ගනී. මෙහි වැදගත්ම පියවරක් වනුයේ අදාළ ආදේශක කොටස මුල් නිර්මිතයට ආගන්තුක නොවන පරිදි සම්බන්ධ කිරීම හා සකස් කර ගැනීමයි. මේ සඳහා කෙමිපික්ස් හා C' M' C භාවිත කරයි. මෙය ඉතා සූක්ෂම අයුරින් සිදුකළ යුතු අතර අදාළ සංරක්ෂණ ප්‍රදේශයේ දාරය මත පමණක් බන්දන මාධ්‍ය ආලේප කළ යුතුය. අනතුරුව ඇළවුම් දාරය හොඳින් පිරිමැදිම හා ඒ මත බරක් තැබීම සිදු කරයි. පිටතට පැමිණෙන බන්දන කාරක වියළීමට පෙර ඉවත් කර ගැනීම වැදත් ය. ආදේශ කොටස හා තල්පත්‍රය අතර ඇති සියුම් හිඩැස් තල්පත් කුඩු හෝ සියුම් සිවි භාවිතයෙන් සම්පූර්ණ කළ යුතුය. මෙලෙස සංරක්ෂණය කරන ලද තල්පත්‍රය නැවත තෙල් මැදීම (දුම්මල තෙල්) මගින් සංරක්ෂණ කාර්යය නිමා කරයි.

ප්‍රතිඵල හා සාකච්ඡාව

අත්පිටපත්වලට බලපෑම් ඇති කරන හායනකාරක ප්‍රධාන කොටස් තුනකට වර්ග කළ හැකිය. එනම් භෞතික හායනකාරක, සත්ත්ව හායනකාරක හා රසායනික හායනකාරක ලෙස ය. භෞතික හායන වශයෙන් උෂ්ණත්වය, ආර්ද්‍රතාවය,ගිනි ගැනීම්, ජලය, ආලෝකය, වාතය ආදීය හදුනාගත හැකි අතර සත්ත්ව හායන කාරක ලෙස කෘමීන්, දිලීර ද රසායනික හායනකාරක ආම්ලිකතාව, ආර්ද්‍රතාව හා රසායනිත ප්‍රතික්‍රියා පෙන්වාදිය හැකිය. ඉහත සියලු බලපෑම්වල අවසාන ප්‍රතිඵලය වනුයේ අත්පිටපත් භෞතික වශයෙන් හානි ඇති කිරීමයි. මෙම භෞතික හායන සඳහා අත්පිටපත් සංරක්ෂණයේ දී මූලික වශයෙන් අවධානයට ලක්කළ යුතු මැදිහත් වීම් මට්ටම් කිහිපයක් අධ්‍යයනයේ දී අනාවරණය කර ගන්නා ලදී. එනම්, ආදේශක කොටසක් සඳහා වන මැදිහත් වීම් (Replacement interfire), ඉරුණු තැන් සංරක්ෂණය (Tire Conservation), මතුපිට දිය වී ඇති ස්ථාන සංරක්ෂණය (Surface Conservation), සිදුරු පිරවීම (Filling), පුස්කොළ අග කොටස් සංරක්ෂණය (Edge Conservation), වැදගත් වේ. පුස්කොළ පොත් සංරක්ෂණය සඳහා ආදේශක ද්‍රව්‍ය ලෙස තල්පත් කොටස් යොදා ගැනීමෙන් ලේඛනයට ඇති කරන සාධනීය තත්ත්වයන් කිහිපයක් අනාවරණය කරගත හැකිය. එනම්, මෙම ක්‍රමවේදය මගින් අත්පිටපත්වල සත්‍යතාව ආරක්ෂා කරගැනීමට ඉවහල් වන වර්ණය, ඝනකම, සංයුතිය, ශක්තිය, ව්‍යුහාත්මක ස්වභාවය ආදී මුලික ලක්ෂණ සම්පූර්ණ වේ, මුල් පිටපතේ අක්ෂරවලට ආසන්න ස්ථාන සංරක්ෂණය කිරීමේ දී අකුරුවලට කිසිදු හානියක් නොවන පරිදි සංරක්ෂණය කරගැනීමේ හැකියාව, පත් ඉරුවල වර්ණය, ඝනකමට සමාන ආදේශක පත් ඉරු කොටසක් භාවිත කිරීම නිසා නිමාව සම්පූර්ණ ලෙස දැක්වීමට හැකිවීම, ශක්තිය අතින් සමාන ආදේශක පත් ඉරු කොටස් භාවිත කිරීම නිසා පුස්කොළය මත ශක්තීන් දෙකක් නොපැවතීම හා දීර්ඝ කාලීන පැවැත්මට ඉවහල්වීම, පුස්කොළ මත ඇති කුඩා සිදුරු සහිත ස්ථාන සංරක්ෂණය කිරීමට පුස්කොළ කුඩු භාවිත කිරීමට හැකි වීම, පත් ඉරුවල මතුපිට දියවී දාර මතු වී ඇති අවස්ථාවල වර්ණයට සමාන වෙනත් පුස්කොළයකින් මතුපිට ස්තරයක් සියුම් ලෙස ගලවා ඒ මත ඇලවීමට හැකියාව ඇත. මේ අනුව, පුස්කොළ ලේඛන සංරක්ෂණය කිරීමේ දී ඉහත ක්‍රමවේදය වඩාත් යෝග්‍ය බව පැහැදිලිය.

නිගමන සහ නිර්දේශය

පුස්කොළ පොත් සංරක්ෂණය සඳහා මුල් කාලීන සාම්ප්‍රදායික ක්‍රමවේද භාවිත කළ ද තාක්ෂණික දියුණුවත් සමග නවීන සංරක්ෂණ ක්‍රම භාවිත කර ඇත. නමුත් ලේඛනයේ සතත්‍යතාව මෙන්ම කාලීන පැවැත්ම තහවුරු කිරීම සඳහා වඩාත් යෝග්‍ය සංරක්ෂණ ක්‍රමවේදයක අවශ්‍යතාව මතුවිය. මෙම අවකාශය සම්පූර්ණ කිරීම සඳහා ආදේශක ද්‍රව්‍ය ලෙස තල්පත් භාවිත කර සංරක්ෂණය කිරීම වඩාත් යෝග්‍ය ක්‍රමවේදය බව හදුනා ගැනීම සිදුවිය. මෙහි දී ඉරුණු තැන් සංරක්ෂණය, මතුපිට දිය වී ඇති ස්ථාන සංරක්ෂණය, සිදුරු පිරවීම, පුස්කොළ පොත්වල අග කොටස් සංරක්ෂණය ආදීය සඳහා මැදිහත් වීම පහසු වේ. එපමණක් නොව මෙම ක්‍රමවේදය භාවිත කිරීමෙන් ලේඛනයේ ජීව කාලය මෙන්ම, මුල් ලේඛනයේ ද්‍රව්‍යමය සතත්‍යතාව ආරක්ෂා කර ගැනීමට ද හැකි වනු ඇත. මෙහි දී මතුවන එක් දුෂ්කරතාවයක් නම් අදාළ ලේඛනයට ගැළපෙන තල්පත් සකස් කර ගැනීමේ ක්‍රියාවලියට දීර්ඝ කාලයක් වැය වීමයි. එමෙන්ම හායනයට ලක් වූ කොටසේ ව්‍යුහයට මනා සම්බන්ධතාවයකින් යුතුව ආදේශ කොටස සකස් කර ගැනීම ද ඉතා සංයමයෙන් සිදු කළ යුතුය. පුස්කොළ පොත් ලේඛනවල සියුම් සිදුරු හා මතුපිට දිය වී ඇති අවස්ථාවල වෙනත් විකල්ප ක්‍රමවේදවලට වඩා මෙම ක්‍රමවේදය උචිත බව පැහැදිලිය.

ප්‍රමුඛ පද: *පුස්කොළපොත්, සංරක්ෂණය, භෞතික හායනකාරක, ජැපනීස් පෙපර්, ආදේශක ද්‍රව්‍ය*

ආශ්‍රිත ග්‍රන්ථ

Agarwal, O.P. and Mandana, B. (1997), *Conservation of Books, Manuscripts and paper documents.* INTACT.

Alahakoon, C.N.K. (2009). Identification of physical problems of major palm leaf manuscripts collections in Sri Lanka. *Journal of the University Librarians Association of Sri Lanka.* 10. 10.4038/jula.v10i0.318.

Joshi, Y. (1995). Modern Techniques of Preservation and Conservation of Palm leaf Manuscripts, *In Proceeding of Conference on Palm Leaf and Other Manuscripts in Indian Languages*, Institute of Asian Studies, 275-285.

Kathpalia, Y.P. (1973). *Conservation and restoration of archive materials.* UNESCO.

Padhi, B.K. (1974). Preservation of Palm Leaf Manuscripts in Orissa, Conservation of Cultural Property of India, *Conservation of cultural property in India*, 7, 62-64. Indian Association for the Study of Conservation of Cultural Property.

Suryan, W. D. G., M.V. Nair, & Sinha, P.M. (1992). Improving the Flexibility of Palm Leaf, 13(1), 37-46. https://doi.org/10.1515/rest.1992.13.1.37

සාම්ප්‍රදායික ලාක්ෂා කර්මාන්තය පිළිබඳ මානව විද්‍යාත්මක අධ්‍යයනයක් (මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, හපුවිද ග්‍රාමය ඇසුරින්)

ඒ. ඒ. ඩී. එස්. එන්. ඩී. අබේසිංහ

මානව විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

dilkiabeysinghe1997@gmail.com

හැඳින්වීම

ශ්‍රී ලාංකිකයන් සතු අති ප්‍රෞඪවත් සාම්ප්‍රදායික ඥාන සම්භාරය හා සංස්කෘතික පද්ධතිය මෙන්ම උරුමයන් රැඳී ඇත්තේ කුල ක්‍රමය සමගය. ලාංකේය සාම්ප්‍රදායික කලා කර්මාන්තයන්ගේ අසිරිය විදහාපාන ලාක්ෂා කර්මාන්තයද ඒ ගණයට අයත් වන්නකි. නවන්දන්නා කුලීනයන් හෙවත් හී වඩුවන් අතින් නිර්මාණය වූ කලා කර්මාන්තයක් ලෙස ලාක්ෂා කර්මාන්තය හඳුනාගත හැකිය. ලාකඩ, ලෝකුරු, ලාභ කර්මාන්තය වශයෙන්ද මෙය හඳුන්වයි. ක්‍රි.පූ 6 දී දේවානම්පියතිස්ස රජ දවස සිදුවූ මහින්දාගමනය සහ දුමින්දාගමනය යන ඓතිහාසික සංක්‍රමණයන් මගින් ලත් දායාදයක් ලෙස ලාක්ෂා කර්මාන්තය වැදගත් වේ.

පර්යේෂණ ගැටලුව, පර්යේෂණ අරමුණු

ගැටලුව -

නියමු අධ්‍යයනයේදී අනාවරණය වූයේ කුල ආකල්පය, ආර්ථික ගැටලු, වෙළඳපොළ අවහිරතා ආදිය හේතුවෙන් වත්මන් පරපුර ලාක්ෂා කර්මාන්තයේ නියැලීමට මැලිකමක් දක්වන බවයි. එම තත්ත්වය අඛණ්ඩව පැවතුනහොත් මෙම සාම්ප්‍රදායික කලා කර්මාන්තයෙහි අභාවය සනිටුහන් වීම සිදුවිය හැකිය. එය මෙහිදී පර්යේෂණ ගැටලුව වශයෙන් යොදාගැණුනි.

අරමුණු -

- ලාක්ෂා කර්මාන්තයේ ප්‍රභවය සහ විකාශනය පිළිබඳ සාහිත්‍ය මූලාශ්‍රයගත තොරතුරු රැස් කිරීම.
- ලාක්ෂා කාර්මිකයන් වර්තමානයේ මුහුණදෙනු ලබන ගැටලු හඳුනාගැනීම.
- එම ගැටලුවලට විසඳුම් යෝජනා කර ලාක්ෂා කර්මාන්තය නගා සිටුවීම පිණිස ගතහැකි ක්‍රියාමාර්ග ඉදිරිපත් කිරීම.

පර්යේෂණ ක්‍රමවේදය

පර්යේෂණය සඳහා ප්‍රාථමික දත්ත රැස්කිරීමේදී සකස් කරගත් සම්මුඛ සාකච්ඡා උපලේඛයක්ද ද්විතීයික දත්ත රැස්කිරීමේදී සාහිත්‍ය මූලාශ්‍රය සහ අන්තර්ජාලයද භාවිත කෙරුණි. අධ්‍යයන ක්ෂේත්‍රය වූයේ ලාක්ෂා කර්මාන්තය සඳහා චිරප්‍රකට මාතලේ දිස්ත්‍රික්කයේ හපුවිද ග්‍රාමයයි. විනිශ්චය නියැදි ක්‍රමය යටත වර්තමානයේදී ලාක්ෂා කර්මාන්තයෙහි සක්‍රීයව නියැලෙන ශිල්ප පවුල් 5ක් දත්ත සම්පාදනය පිණිස භාවිත විය.

ප්‍රතිඵල හා සාකච්ඡාව

ලාක්ෂා කර්මාන්තය අතීතයේ සිටම පෙරදිග රාජ්‍යන්හි ගෘහ කර්මාන්තයක් වශයෙන් පැවතී ඇත. එය ශ්‍රී ලංකාවට දායාදව ඇත්තේ මහින්දාගමනය සහ දුමින්දාගමනය යන ඓතිහාසික සංක්‍රමණ ඔස්සේ මෙරටට පැමිණි භාරතීය ශිල්ප කුලවල ඇවෑමෙනි. ජය ශ්‍රී මහා බෝධිය සහ දළදා මාළිගාව සඳහා ධජ, සේසත්, අව් අතු සැපයීමේදී ඒවායෙ මිට අලංකාර කිරීමට ලාක්ෂා භාවිත කර ඇත. මහනුවර රාජධානි සමයේදී මෙම කාර්මිකයන් නවන්දන්නා කුලීනයන්, හී වඩුවන් ලෙස හඳුන්වා ඇත.

මෙහි වත්මන් තත්ත්වය පිළිබඳව විමර්ශනය කිරීමේදී පර්යේෂණය තුළින් අනාවරණය වූයේ කුල ආකල්පය හේතුවෙන් වත්මන් තරුණ පරපුර මෙම කර්මාන්තයේ යෙදීමට මැලිකමක් දක්වන බවයි. එය මෙම කර්මාන්තයේ අවනතිය කෙරෙහි බලපා ඇති වඩාත්ම නිශේධනාත්මක බලපෑම වේ. රාජ්‍ය අනුග්‍රහය යම් පමණකින් ලැබුවද කර්මාන්තයක් වශයෙන් නගා සිටුවීමට එය ප්‍රමාණවත් නොවේ. මෙම ලාක්ෂා භාණ්ඩ නිර්මාණය අසීරු බැවින් ඒවායෙහි මිලද ඉහළ මට්ටමක පවතියි. එබැවින් සාමාන්‍ය ජනයා මේවා මිලදී ගැනීම දුලබය. එය මේ සඳහා නිසි වෙළඳපොළක් නිර්මාණය කරගැනීමට ඇති බාධාවකි. අතීතයේ භාවිත කළ ස්වභාවික අමුද්‍රව්‍යය වෙනුවට කෘතිම අමුද්‍රව්‍යය ආනයනය කල යුතු වීමද මෙම කාර්මිකයන් මුහුණ දී ඇති බාධකයකි.

නිගමන හා නිර්දේශ

ලාක්ෂා කර්මාන්තය වූකලී තත්කාලීන සමාජය තුළ රාජ රාජ මහාමාත්‍යාදීන්ගේ සහ සිද්ධස්ථානයන්හි ප්‍රයෝජනය සඳහා නිර්මාණය කොටගත් සුඛෝපභෝගී කර්මාන්තයකි. එබැවින් එය කවර කලෙකවත් සාමාන්‍ය ජනයාගේ භාවිතය පිණිස භාණ්ඩ නිර්මාණය නො ක බැවින් කලින් කල ඉස්මතු වන කර්මාන්තයකි. එහෙත් එහි පවත්නා ශ්‍රම සූක්ෂම බව, නිර්මාණාත්මක බව, අලංකාරය මෙන්ම සාම්ප්‍රදායික හස්ත කර්මාන්තයක් ලෙසද මහත් වැදගත්කමක් උසුලයි. අස්පර්ශනීය සංස්කෘතික උරුමයන් පිළිබඳව විමසීමේදී මෙම ලාක්ෂා කර්මාන්තය තිරසර ලෙස ප්‍රයෝජනයට ගැනීම තුළින් විදේශ විනිමය ඉපයීමට හැකිවීම ප්‍රායෝගික වැදගත්කමකින්ද යුක්ත වේ.

ප්‍රමුඛ පද: *ලාක්ෂා, නවන්දන්නා කුලය, හී වඩුවන්, හස්ත කර්මාන්ත, අස්පර්ශනීය සංස්කෘතිය*

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

තිලකසිරි, ජේ. (1994). *ශ්‍රී ලංකාවේ පාරම්පරික ශිල්ප ගම් හා පාරම්පරික ශිල්පීන්ගෙන් පැවත එන පවුල් පිළිබඳ සමීක්ෂණයක්.* ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

සෝමරත්න, එච්.එම්. (1956). *ලාක්ෂා කර්මාන්තය.* ස්වභාෂා දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනකි.

Amarakoon, D. (2019). *Color and Visual Perception: Exploiting Visual Perception of Colour, in Traditional "Laksha" Products in Sri Lanka.* Researchgate, 2–3. https://www.researchgate.net/publication/346038768_Colour_and_Visual_Perception_Exploiting_Visual_Perception_of_Colour_in_Traditional_'Laksha'_Products_in_Sri_Lanka

Traditional Laksha Industry In Sri Lanka . (2021, June 1). Ceylon handycraft.lk. https://ceylonhandicraft.lk/2021/06/01/traditional-laksha-industry-in-srilanka/

Sachitha, S.L. (2022, April 25). *ලාක්ෂා කර්මාන්තය 03 කොටස* [Video]. youtube. https://www.youtube.com/watch?v=RZpNBriI7gU.

Ayurveda Medicine and Treatments for Stroke Recovery: With Special Reference to Ballaketuwa Rural Ayurveda Hospital, Badulla

W. M. C. D. Wijekoon* and N. Kanthilatha

Department of Anthropology, University of Sri Jayewardenepura, Sri Lanka

**chathurikawijekoon24@gmail.com*

Introduction

According to World Health Organization's Global Health Estimates (2019), stroke is the second leading cause of global mortality and the third leading cause of disability worldwide. Ayurvedic scriptures describe it as *Pakshagatha* (hemiparesis) which refers to a blow or severe damage produced by a sensory and a motor system dysfunction and its controller, the brain (Rais et al., 2019). Even though research on strokes has developed significantly during the past 25 years, still a huge gap exists on stroke treatment (Kuriakose & Xiao, 2020). Therefore, there is no widely accepted, safe, and effective treatment for stroke (Zimmerman & Yarnell, 2018). However, in Sri Lanka, the Ayurveda system of medicine acquires a significant place when searching for alternative treatment options, once the stroke patients are discharged from western medical hospitals (Gunaratne, 2011).

Research Problem/s, Objective/s

Statistics reveal that human health is deteriorating due to non-communicable diseases. Strokes are one of the most prevalent non-communicable diseases but advanced Western medicine has not been able to provide a successful cure for strokes. However, Ayurvedic medicine plays a unique role in curing strokes by using various treatments since ancient times. Thus, the problem of the research is how Ayurvedic medicine can be used to improve stroke survivors' life patterns. Accordingly, the main objective of this study is to identify the efficiency of Ayurveda medicine as a treatment for stroke survivors.

Materials and Methods

This study was conducted at the Ballaketuwa rural Ayurveda hospital in Badulla district. Utilizing the purposive sampling method, data were collected from a sample of 60 participants; 50 stroke survivors (SS) in the hospital, 05 completely recovered stroke survivors (CRSS), and 05 Ayurveda doctors. Structured interviews and observation methods were used for data collection with the participant's consent. Qualitative data was analyzed using the thematic analysis method and quantitative data was analyzed using SPSS and Excel.

Results and Discussion

The findings of the study revealed that strokes are one of the most prevalent non-communicable diseases (SS: 88% & CRSS: 100%) in adults ranging from 41 to 90 years of age, particularly among males (SS: 58% & CRSS: 60%). The main identified causes were substance use (SS: 46% & CRSS: 60%), unhealthy diet (SS: 22% & CRSS: 60%), and side effects of other medical complications (SS: 78% & CRSS: 100%). According to the stroke survivors, initially, they have got allopathy and other treatment methods (SS: 96% & CRSS: 100%), and secondarily they have shifted to Ayurvedic treatments. Stroke patients who were timely hospitalized have completely recovered within one year with the help of Ayurveda treatments (CRSS: 100%). All the stroke survivors appreciated the Ayurvedic hospital treatments because they have recovered from their paralysis condition considerably with the use of Ayurveda treatments (Figure 1).




Figure 1. Improvement of stroke survivors' physical functions after Ayurveda treatments

According to the results, their improvements include the ability to move appendages (25%), walking some distance without help (20%), doing daily activities independently (18%), improving sensory perception (11%), speech ability (11%) and memory (6%). Completely recovered stroke survivors have acquired body functions completely (9%) with Ayurvedic treatments. Their mental health has improved compared to the initial stage of their disease and self-confidence has also increased (89%) to a considerable level following Ayurveda treatments.

Conclusions and Recommendations

By considering the recovery rate of stroke patients, it can be concluded that Ayurvedic treatments are successful in controlling stroke symptoms. The majority of stroke survivors have acquired positive progress from paralysis conditions and progressively increased mental conditions parallel to physical improvements. Therefore, this study reveals that Ayurveda medicine provides better treatment methods for patients who are suffering from the side effects of strokes. However, the community should be aware of standard Ayurvedic hospitals for stroke patients. Adequate medical and environmental facilities should be provided in these hospitals for the upliftment of patients' physical and mental conditions. This may ultimately lead to the improvement of the health conditions of stroke patients as well as their families' social condition and lifestyle.

Keywords: *Ayurveda, Stroke, Recovery,* E*ffectiveness*

References

Global Health Estimates: Life expectancy and leading causes of death and disability. (2019). *World Health Organization*. https://www.who.int/data/gho/data/themes/mortality-and-global-health-estimates

Gunaratne, P. (2011). Stroke in Sri Lanka: remedies for recovery. *Journal of the Ceylon College of Physicians,* 42(1), 3-10. http://doi.org/10.4038/jccp.v42i1-2.4547

Kuriakose, D., & Xiao, Z. (2020). Pathophysiology and Treatment of Stroke: Present Status and Future Perspectives. *International Journal of Molecular Sciences,* 21(20), 1-24. https://doi.org/10.3390/ijms21207609

Rais, A., Tanwar, S. R., Prasher, B., & Thakar, A. B. (2019). Management of Stroke through Virechana: A Case Report. *Journal of Ayurveda Case Reports,* 2(2), 9-17. https://aiia.gov.in/wp-content/uploads/2019/11/AIIA-JournalApril-June-2019.pdf

Zimmerman, C., & Yarnell, E. (2018). Herbal Medicine for Stroke. *Alternative and Complementary Therapies,* 24(5), 232-239. https://doi.org/10.1089/act.2018.29186.

කෘෂි-වාණිජ ආර්ථිකය විධිමත් කිරීමට නීති මූලාශ්‍රයක් ලෙස ශිලාලේඛනවල උපයෝගීතාව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (තෝරාගත් ශිලාලේඛන කිහිපයක් ඇසුරින්)

එම්. ටී. ඒ. ආර්. ජයතිලක
මානව ශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරටවිශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
thilinamjayathilaka@gmail.com

හැඳින්වීම

ලංකාවේ දේශපාලන, ආර්ථික, ආගමික, සාමාජීය සහ සංස්කෘතික ක්ෂේත්‍රය තුළ කැපී පෙනෙන සිද්ධීන් විවරණය කරන ලද අභිලේඛන තුළ කෘෂි-වාණිජ ආර්ථිකය විධිමත්ව පවත්වාගනු වස් සිරිත් විරිත් සම්ප්‍රදායකින් නීති ව්‍යවස්ථා දැක්වීම සිදුකර ඇති බව හඳුනාගත හැකිය. තම රාජ්‍යය තුළ ශිෂ්ටත්වය තහවුරු කරමින් සාධාරණ මෙන්ම නීතිගරුක කෘෂි-වාණිජ ආර්ථිකයක් ඇතිකිරීමටත් රටේ ආර්ථික, දේශපාලන, ආගමික සහ සමාජ අංශයන්හි ව්‍යාකූලතා සංසිඳුවීමටත් පාලකයන් එමගින් උත්සාහ ගත් බව පැහැදිළි වේ. ඕනෑම සමාජ තලයක පැවැත්ම තහවුරු වීමට එම සමාජයට ආරෝපිත ආචාර ධර්ම සහ නෛතික විධානයන්හි ස්වරූපය ද බලපානු ලබයි. අතීත පාලකයන් උත්සාහ ගත්තේ සමාජ ආචාර ධර්ම ස්වයං විනයනයට නතු නොවූ අවස්ථාවල දී විධානයන් මඟින් සමාජය තුළ යළි ශිෂ්ටත්වය තහවුරු කිරීමටයි. අනුරාධපුර යුගයේ අවසාන අවධියෙහි ශිලාලේඛන කිහිපයක සිරිත්, ව්‍යවස්ථා යන වචන යොදා තිබීම මඟින් තත්කාලීන යුගයේ කෘෂි-වාණිජ ආර්ථිකය තුළ නීතියේ භාවිතයක් වූ බවට සාධාරණ නිගමනයකට එළඹිය හැකිය. එම යුගයේදී සමාජ සම්මතය තුළ පිළිගන්නට යෙදුණු නීති 'සිරිත්' වශයෙන් ද රජුගේ විධිවිධාන යටතේ පනවන ලද නීති 'ව්‍යවස්ථා' වශයෙන් ද දක්නට ලැබුණු බව සිතිය හැකිය.

පර්යේෂණ ගැටලුව, පර්යේෂණ අරමුණු

කෘෂිකර්මය හා වෙළඳාම ක්‍රමවත්ව පවත්වාගෙන යාමට නීති මූලාශ්‍රයක් ලෙස ශිලාලේඛන මූලාශ්‍රයෙහි උපයෝගීතාව කුමක්ද යන්න මෙහි පර්යේෂණ ගැටලුවයි. කෘෂි-වාණිජ ආර්ථිකය ක්‍රමවත්ව පවත්වාගැනීමට උපයුක්ත කරගත් ශිලාලේඛනගත නීති සහ සිරිත් හඳුනාගැනීමත්, ඒ තුළින් මෙරට කෘෂි-වාණිජ ආර්ථිකය පවත්වාගැනීමට පාලකයන් කටයුතු කර ඇති අයුරු විමසීමත් මෙහි අරමුණුයි.

පර්යේෂණ ක්‍රමවේදය

පුස්තකාල පරිශීලනය මඟින් ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍ර අධ්‍යයනය කිරීම මුඛ්‍ය පර්යේෂණ ක්‍රමවේදය යි. එතුළින් ලබාගන්නා ලද දත්ත සන්සන්දනාත්මක ව සහ විශ්ලේෂණාත්මක ව අධ්‍යයනය කරමින් නිගමනවලට එළඹීම සිදුවිය.

ප්‍රතිඵල සහ සාකච්ඡාව

පුරාණ පාලකයන් සිය රාජ්‍යයේ සමාජ-ආර්ථිකය නිසි ලෙස පවත්වාගැනීමට පැනවූ නෛතික විධිවිධාන රැසක් ශිලාලේඛනයන්හි අන්තර්ගත වේ. වෙළඳාම සම්බන්ධ තොරතුරු හමුවන හතරවන උදය රජුගේ බදුලු ටැම් ලිපියෙහි "පෙරෙ සිරිත් දඩගනුත් මිසැ අනියා නොකරනු ඉසා" යනුවෙන් දක්වා ඇත්තේ වෙළෙන්දන්ගෙන් සහ ගැනුම්කරුවන්ගෙන් සම්මතය පරිදි බදු අය කරගැනීම කළ යුතු බවත් වෙනත් ලෙසකින් බදු නො ගත යුතු බවත් ය. පොහොය දිනයන්හි වෙළඳාම් කිරීම සමාජ සිරිතට පටහැනි නමුත් යමෙකු පොහෝ දින වෙළඳාම් කිරීමට රිසි නම් ලිපිය අනුව මහියංගණ විහාරයේ ආගමික කටයුතු සඳහා තෙල් බද්දක් ගෙවිය යුතු විය. "පොහොදා සල් කළාකුගෙන් වැපුදයටිතෙල් පද්දක් ගන්නා ඉසා මියුගුණ් මහ වෙහෙර වැපුද පවත්වනු ඉසා" යනුවෙන් එය දැක්වේ. "බුලත් පුවක් මඩපයෙ තබා විකුණනු කොට් ඉසා නොතැන තබා වික්කා දුටුවා රදොලන් හරවා ගන්නා ඉසා" ලෙස ලිපියේ එන නීතියෙන් දැක්වෙන්නේ බුලත් හා පුවක් මණ්ඩපයක තබා විකිණිය යුතු බවත් කිසිවෙකු ඒවා නුසුදුසු තැනක තබා විකිණීම් කළහොත් රාජ්‍ය නිලධාරීන්ට මැදිහත් වීමට හැකි බවත්ය. "බඩු නොතැන හින්දෑ නොවිකනනු ඉසා" යනුවෙන් දැක්වෙන පරිදි ද්‍රව්‍යය විකිණීම් කිරීමට වෙළඳපොළ තුළ පිළිගත් ස්ථානයන් තිබූ බව පැහැදිලි වේ. "පදි වදිනා බඩු පෙර මඟට ගොස් නොගන්නා ඉසා" යන නීතියෙන් දක්වා ඇත්තේ වෙළඳපොළට ගෙන එන භාණ්ඩ අතරමඟදී මිලදී ගැනීම සපුරා තහනම් වූ බවයි. රාජ්‍ය බදු ආදායම අහිමිවීම වළකාලීම එමගින් බලාපොරොත්තු වන්නට ඇත. එසේම වෙළඳපොලේ ක්‍රමික පාලනය සඳහා වෙළඳුන් මෙන්ම පාරිභෝගිකයන්ද වග විය යුතු බව එමගින් අවධාරණය කර ඇත. සර්ව සාධාරණ නෛතික ප්‍රතිපත්ති යටතේ ඇතැම් සත්ත්ව කොට්ඨාසයන්ට ද නිදහස උරුම වූ බව හතරවන මිහිඳු රජුගේ වේවැල්කැටිය පුවරු ලිපියෙන් අවධාරණය වේ. " මීවුන් ගෙරි ගොන් එළුවන් මැරුවන් මරා පට්වනුකොට් ඉසා" යනුවෙන් එහි සඳහන් වන පරිදි රට පුරා සිටි මී ගවයන්, ගවයන්, හා එළුවන් මැරීම තහනම් වූ බවත් එම සතුන් ඝාතනය කරන්නන්ට මරණ දඬුවම හිමි වූ බවත් දක්වා ඇත. කෘෂිකාර්මික කටයුතු, ආහාර නිෂ්පාදනය, පොහොර නිෂ්පාදනය සඳහා දායක වූ එම සත්වයන් සමාජ බුහුමනට පාත්‍ර කරලීමට පාලකයන් උත්සාහ ගෙන ඇත. දෙවන උදය රජු පඬුවස්නුවර ටැම් ලිපියේ දී "මෙ ගැමැ සී කස්නට් ආනට් අනියා නොකරනු ඉව" යනුවෙන් නියම කර ඇත්තේ ගමෙහි සීසෑමට පැමිණි උදවියට කිසිවකු කිසිදු බාධාවක් නොකළ යුතු බවයි. "සිවු වරදට් කළන්දක් ගන්නා කොට් ඉසා" යනුවෙන් කොණ්ඩවට්ටවාන් ටැම් ලිපියේ සඳහන් පාඨයෙන් සීසෑම සම්බන්ධ වරදකට පුද්ගලයකුට කලඳක දඩයක් නියම කිරීමේ පුවතක් අනාවරණය වේ. "සෑගිරි ගල් උඩ තලන් පුළුපන් මිවන් සිනිම්බලාන් නොකපනු ඉසා කැපුයු කම්තැන් ගෙනැ දඩ් ගන්නා ඉසා" යනුවෙන් මිහින්තලා ටැම් ලිපියක එන විස්තරය අනුව මිහින්තලා පර්වතයේ වූ තල්, පොල්, මී, සියඹලා යන ගස්

වර්ග කැපීම කළහොත් දඩ නියම කළ බව පෙනේ. ඒ අනුව නෛතික විධිවිධාන මගින් ශක්තිමත් කෘෂි ආර්ථිකයක් ඇති කිරීමට රජවරු උත්සුක වූ බව විද්‍යමාන වෙයි. අල්ලායි ටැම් ලිපියේ එන "අවුණට් මීවුන් නොගන්නා ඉසා" පාඨයට අනුව අමුණ හෝ වේල්ල මතට ගවයන් නොගත යුතු බව දක්වා ඇත. ඊට හේතුව වන්නට ඇත්තේ ගවයන් අමුණ හෝ වේල්ල මත මළපහ කළ හොත් වැව් ජලය අපවිත්‍ර වීමයි. තවද පීලිගම පර්වත ලිපිය, බුද්ධන්නෙහෙල ලිපිය හා නාගරිකන්ද ලිපිය ආදී ශිලා ලිපි රැසක් මඟින් වාරිමාර්ගවලින් ජලය ලබා ගැනීමේදී බදු අය කර ගත් බව අනාවරණය වේ. වාරිකර්මාන්තය රාජ්‍ය ආර්ථිකයට දායක කර ගැනීමත් අනිසි ජල පරිභෝජනය මගහැරවීමත් එමගින් අරමුණු කර ගන්නට ඇත. ඒ අනුව නෛතික විධිවිධාන හා සිරිත් සම්ප්‍රදායන් නිසිව ක්‍රියාත්මක කරමින් ස්ථාවර ආර්ථිකයක් රටට දායාද කිරීමට පාලකයන් උත්සුක වූ බව අනාවරණය වේ.

නිගමන සහ නිර්දේශ

මේ අනුව රාජ්‍යය තුළ ක්‍රමික පාලන අධිකාරියක් පවත්වාගෙන යාම උදෙසා පාලකයන් විසින් සිය නෛතික අධිකාරීත්වය ශිලාලේඛනගත කළ බව පෙනේ. දේශපාලන ස්ථාවරත්වය යහපත්ව පවත්වාගෙන යාමට නම් රටේ සමාජ, ආර්ථික, ආගමික, සංස්කෘතික හා අධිකරණ අංශයන්හි ගැටලු උත්පන්න නොවිය යුතුය. ඒවායෙහි ගැටලු උත්පන්න වූ සෑම අවස්ථාවකදී ම රටේ දේශපාලන අස්ථාවරවීම් සිදු වූ බව ඉතිහාසයෙන් ප්‍රකට වෙයි. එම නිසා භූපතීන් සිය දේශපාලන අධිකාරීත්වය ඒකානුක්‍රමයෙන් පවත්වාගෙන යාම උදෙසා සමාජ, ආර්ථික, ආගමික, සංස්කෘතික හා අධිකරණ අංශයන්හි ආරවුල් ඇති නොවීමට දැඩිව වගබලා ගත්හ. එම තත්ත්වය දිගින් දිගට ම පවත්වාගෙන යාම උදෙසා පාලකයන් විසින් ඒ එක් එක් අංශයන්ට සබැඳි ව නීති රීති කෙටුම්පත් කළ බව පෙනේ. සමාජ සුබනම්‍යතාව සිය අධිකාරීත්වය යටතට හසුකළ පාලකයන් ශිලාලේඛන මගින් තමන්ගේ නෛතික ආධිපත්‍යය ප්‍රකට කිරීම සිය දේශපාලන බලය සුරක්ෂිත කර ගැනීමට යොදාගත් සාර්ථක උපක්‍රමයක් බව නිගමනය කළ හැකි අතර රටෙහි කෘෂි-වාණිජ ආර්ථික ස්වස්තතාව ඇතිකරමින් කෘෂිකර්මය හා වෙළඳාම ක්‍රමවත්ව පවත්වාගෙන යාම තුළින් පාලකයා රටවැසියාගේ යටහත් භාවය තවදුරටත් රැකගැනීමට උත්සහ ගත් බව පෙනේ.

ප්‍රමුඛ පද: *කෘෂිකර්මය, වෙළඳාම, ආර්ථිකය, ශිලාලේඛන, ලිපිය*

ආශ්‍රිත ග්‍රන්ථ

අමරවංශ හිමි, කේ. (1969). *ලක්දිව සෙල්ලිපි.* ගුණසේන සහ සමාගම.
තිස්සකුමාර, ඒ. (1990). *පැරණි ලක්දිව අත්තානි ප්‍රධාන විධි.* විද්‍යාලංකාර මුද්‍රණාලය.
මුදියන්සේ, එන්. (1971). *ශාස්ත්‍රීය ලිපි සංග්‍රහය.* ගුණසේන සහ සමාගම.
විමලකිත්ති හිමි, එම්. (1957). *ශිලා ලේඛන සංග්‍රහය.* 4, සීමාසහිත මාතර වෙළෙන්දෝ.

සමාජයේ ශිෂ්ට සම්පන්න බව හා නීතිගරුක බව රැකගැනීම සඳහා අභිලේඛන මූලාශ්‍රගත ශාප පාඨයන්හි උපක්‍රමික බව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

එම්. ටී. ඒ. ආර්. ජයතිලක
මානව ශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරටවිශ්වවිද්‍යාලය, මිහින්තලේ
thilinamjayathilaka@gmail.com

හැඳින්වීම

මෙරට බොහොමයක් අභිලේඛන ආගමික අවශ්‍යතාව මත පිහිටුවා ඇති අතර ඊට මුඛ්‍ය හේතුව නම් රජයත් බුදුසමයත් අතර සුවිශේෂ සබැඳියාවක් පැවතීමයි. රජරට සභ්‍යත්වයේ මුල් කාලයෙහි අභිලේඛන මගින් අනාවරණය වන්නේ මින්සුන් බුදුසමය සමග ඉතාමත් ගෞරවාන්විතව කටයුතු කරමින් සාමයික භවභෝග දිවිහිමියෙන් ආරක්ෂා කළ බවයි. නමුත් කාලානුරූපීව සාමයික දේපළවලට සමාජීය තර්ජනයන් එල්ල වූ අතර ඒ හමුවේ ශාප පාඨ අභිලේඛනාරූඪ ගත කරමින් ඒවායෙහි පැවැත්ම තහවුරු කිරීමට පාලකයෝ උත්සාහ ගත්හ. බෞද්ධ විහාර ආශ්‍රිත ඉඩකඩම් සම්බන්ධ කරගෙන අභිලේඛනගත කළ එකී ශාප පාඨ මගින් ශිෂ්ට සම්පන්න නීතිගරුක සමාජයක් ඇතිකිරීම විනා වෛරයක් සමාජගත කිරීමට පාලකයෝ නො සිතූහ.

පර්යේෂණ ගැටලුව, පර්යේෂණ අරමුණු

ශිෂ්ට සම්පන්න හා නීතිගරුක සමාජයක් ප්‍රතිෂ්ඨාපනයට අභිලේඛනගත ශාප පාඨ කෙතෙක් දුරට උපක්‍රමික වූයේද? යන්න පර්යේෂණ ගැටලුව වේ. නීතිගරුක සමාජයක් ප්‍රතිෂ්ඨාපනය උදෙසා අභිලේඛන මූලාශ්‍රගත ශාප පාඨයන්හි උපක්‍රමික බව විමර්ශනය කිරීම හා අභිලේඛන මූලාශ්‍රගත ඍපපාඨයන්හි සවරූපය හඳුනා ගැනීම පර්යේෂණ අරමුණු වේ.

පර්යේෂණ ක්‍රමවේදය

පුස්තකාල පරිශීලනය මඟින් ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍ර අධ්‍යයනය කිරීම මුඛ්‍ය පර්යේෂණ ක්‍රමවේදය යි. එතුළින් ලබාගන්නා ලද දත්ත සන්සන්දනාත්මක ව සහ විශ්ලේෂණාත්මක ව අධ්‍යයනය කරමින් නිගමනවලට එළඹීම සිදු විය.

ප්‍රතිඵල සහ සාකච්ඡාව

රජරට සභ්‍යත්වයේ සමාරම්භක අවධියේ දී අභිලේඛන මූලාශ්‍රයන්හි දක්නට ලැබුණේ කිසියම් පුණ්‍ය ක්‍රියාවක් සිදු කිරීමෙන් අනතුරුව එහි කුසල් තමන් අනුමෝදන්ව අන්‍යයන්ටත් අනුමෝදන් කිරීමේ සම්ප්‍රදායයි. අනුරාධපුර අභයගිරි විහාර පරිශ්‍රයේ පියගැටපෙළෙහි දක්නට ලැබෙන ක්‍රි.ව. පස්වන සියවසට අයත් ශිලාලිපි අටක එන ''මේපල සවසතනට'' යන වදනින් පවසා ඇත්තේ මෙපින් සියලු සත්ත්වයන්ට අයත් වන බවයි. මුල් යුගයේ දී මානව සමාජයේ පැවති දැඩි ආගමික භක්තිය හමුවේ ශිෂ්ටත්වයට විරුද්ධවීමට ජනයා පසුබට වූහ. රාජානුග්‍රහය යටතේ ක්‍රමක්‍රමයෙන් බෞද්ධාරාම සංකීර්ණයන් වර්ධනය වූ අතර ඒවායෙහි නඩත්තුව සඳහා පාලකයන් විසින් භවභෝග පිරිනමන ලදි. දිනෙන් දින විහාරාරාමයන්හි ධන ධාන්‍ය හා භූමිභෝග වර්ධනය වූ අතර සමාජයේ පෘතග්ජන මිනිසුන් ඒවා කෙරෙහි ලෝභය ඇති කරගන්නා ලදි. ඔවුන් ආරාමික භවභෝගයන්ට තර්ජනයන් පැමිණවීම හමුවේ ඊට ක්‍රියාමාර්ගයන් ගැනීමට පාලනාධිකාරියට සිදුවිය. වැරදිකරුවන්ට තදබල දඬුවම් පමුණුවා මෙල්ල කිරීමට වඩා ආගමික ගරුත්වය මගින් ම මෙල්ල කරලීමේ ක්‍රියාමාර්ගයක් ලෙස ශාප පාඨ භාවිත කිරීමට පාලකයෝ උත්සුක වූහ. ඒ අනුව බෞද්ධ විහාරාශ්‍රිත ඉඩකඩම්වල ආරක්ෂාව තහවුරු කිරීමට පාලකයෝ ඍපපාඨ අභිලේඛනගත කළහ. බෙලිගල සන්නස හා පෙරප්පන්මුල්ල සන්නස ''මෙ වග අකඩ කළ කෙනෙක් ඇත්නම් කවුඩා බල්ලන්ව උපදිනවා ඇත'' යනුවෙන් සඳහන් කරන්නේ විහාර කර්තව්‍යයේ ආරක්ෂාව වෙනුවෙන් පැනවූ නීති කඩ කළහොත් එම තැනැත්තා කවුඩන් සහ බල්ලන් ලෙස උපදින බවයි. එසේම වහරක්ගොඩ සෙල්ලිපි අංක 03 ලිපියෙහි ''කවුඩා බල්ලා පුතු යැ'' යන පාඨයෙන් පැහැදිලි වන්නේ එම නීතියට එරෙහි වූවන් කවුඩන්ට හා බල්ලන්ට දාව උපදින ලෙසට ශාප කළ බවයි. මෙහිදී ශාපකරණය සඳහා වෙනත් සත්වයන් නොගෙන කවුඩා සහ බල්ලා පමණක් ඉවහල් කරගැනීම සුවිශේෂ ය. සමාජයෙහි කවුඩාටත් බල්ලාටත් හිමිවන්නේ අප්‍රසන්න පිළිගැනීමකි. කුසට නිසි අහරක් නැතිව හමුවන අපවිත්‍ර දෑ බුදින ඔවුනට 'බලු කපුටු දානය' නමින් කෙරෙන අපල දුරු කරගැනීමේ චාරිත්‍රයක් ද සමාජයේ පවතී. අමිත්තතාපා නම් කාන්තාව මහළු පූජක බමුණකු සමඟ විවාහවීම නිසා ''තී ගිය ජාතියෙහි කවුඩන්ට පිඬුදුන් කල තී ලූ බත් කෑයේ මහළු කවුඩුවකු වනැ'' යනුවෙන් ඇගේ යෙහෙළියන් විසුළු කිරීමේ පුවතක් බුත්සරණෙහි දැක්වේ. එසේ පිළිකුලට ප්‍රාප්ත වූ කවුඩා සහ බල්ලා ශාපකරණයට බඳුන් කර ගනු ලැබුවේ නීති කඩ කළහොත් බුදිනා බත් නො ලැබෙන බව ඒත්තු ගැන්වීම උදෙසා ය. පැපිලියාන සන්නසෙහි ''...සඤ්ජීව කාළ සූත්‍රාදි වූ අටමහ නරකය ඇතුළු වූ එක්සිය සතිස් නරකයෙහි වැටී අපමණ දුක් විඳීමට පැමිණෙන්නාහු නම් වෙති. මාතෘඝාතාදි පංචානන්තරිය කර්මයට හේතුවූවාහු නම්වෙති'' යනුවෙන් එන විස්තරය අනුව විහාරස්ථානයේ බුද්ධභෝගයට හානි පමණුවන්නන්ට අටමහා නරකය ඇතුළු 136ක් නරකයෙහි ඉපිද අනන්ත දුක් විඳීමටත් පංචානන්තරිය කර්මය කිරීමට හේතු වීමටත් සිදුවන බවට ශාප කොට ඇත. වහරක්ගොඩ ශිලා ලිපියෙහි ''මෙතේ බුදුන් ඇසින් නොදුටු වොයැ'' යනුවෙන් මෛත්‍රී බුදුන් දැකීමට නො හැකි වේවා ලෙසට ශාප කොට ඇත. වහරක්ගොඩ ලිපියේ සහ කැලණි විහාර ලිපියේ එන ශාප පාඨයක් වන්නේ ''සත් කරාවේ මරපු සතුන්ගේ පව් ගත්තෝය'' යන්නයි. රුවන්මල නිඝණ්ඩුවෙහි සඳහන් වන පරිදි 'කරාව' යනු මුහුදයි. 'සත්කරාව' යන්නෙන් සත්

දිශාවෙහි මුහුද අර්ථවත් වේ. ඒ අනුව විහාරස්ථානවල භවභෝගයන්ට හානි පමුණුවන්නන්ට සත් සමුදුරෙහි මත්ස්‍ය ඝාතනයෙන් කෙරෙන අකුසල් හිමිවන බවට ඝාප කොට ඇත. ඔරුවල සන්නස ''අවුලක් උද්දරණයක් කළ කී කෙනෙක් ඇත් නමුත් කියලා කර වූ අයෙක් ඇත්නම් සංජීව කාළසුත්‍රාදි අටමහා නරකයෙහි පැසී ගොඩ නොදැක අනන්ත ජාතිශ්මශාන ප්‍රේතව උපදින්නාහු නම් වෙති.'' යනුවෙන් දක්වන පාඨයෙන් අටමහා නරකයෙහි මනු ලොව නොදකින ප්‍රේතයෙක් ව උපදින ලෙසට ශාප කොට ඇත. බෞද්ධ විහාරස්ථාන සතු බුද්ධභෝග ආරක්ෂා කිරීමට ද්‍රවිඩ භාෂාවෙන් රචිත නායිමන පුවරු ලිපිය. ''ගංගා නම් ගඟ අසල ගවයින් හා බමුණන් ඝාතනය කරන්නට ලැබෙන පවු වැනි මහා පාපයන් ලබන්නාහු වෙති...'' යනුවෙන් දක්වන පරිදි විහාරස්ථානවලට හානි කරන්නන්ට අත්වන ඉරණම ද්‍රවිඩ සභ්‍යත්වය අනුව විස්තර කර ඇත. හින්දු සමයට අනුව ගංගා නදිය ශුද්ධ වස්තුවකි. එහි ජලස්නානයෙන් සියලු පව් සෝදා ගත හැකි බව මහාභාරතයෙහි දැක්වේ. එසේම ගවයා යනු ශිව දෙවියන්ගේ වාහනයයි. මහාභාරතය දක්වන්නේ කිසිවෙක් ගවයකු ඝාතනය කළ හොත් ගවයාගේ ශරීරයේ ලොම් තරමට නිරයේ පැසෙන බවයි. ගව දෙනක මැරූ පුද්ගලයෙකු එම අකුසලයෙන් මිදීමට කළ යුතු දුෂ්කර ව්‍රතයන් පිළිබඳව මනුස්මෘතියේ දැක්වේ. හින්දූන්ගේ ශුද්ධ වස්තුවක් වූ ගංගා නදිය අසල පූජනීය ගවයන් ඝාතනය කිරීම විශාල පාප කර්මයක් බව ඔවුනගේ විශ්වාසය වන අතර විහාරස්ථානයේ භවභෝගවලට හානි කිරීම හමුවේ එම විශාල පාපයේ හිමිකාරිත්වය ලැබෙන බව දක්වා ඇත.

නිගමන සහ නිර්දේශ

මේ ආකාරයෙන් විමර්ශනය කළ විට පෙනෙන්නේ ආදි පාලකයන් විසින් ශාප පාඨ සෙල්ලිපි තුළට ඇතුළත් කිරීමට මුඛ්‍ය අරමුණ බුද්ධ භෝගයන්හි ආරක්ෂාව තහවුරු කිරීම බවයි. බුද්ධ භෝගවලට හානි පැමිණවීම මගින් භයානක විපාක විඳීමට සිදුවන බව ශාප පාඨ මගින් ඉස්මතු කිරීම තුළින් නිරායාසයෙන් ම භවභෝග ආරක්ෂා කර ගන්නා තැනට සමාජය පරිවර්තනය කිරීමට උත්සාහ ගෙන ඇත. එසේම සොරකම හා වංචාව පිටුදකින, යහපත් පැවැතුම් ඇති, නීතියට අවනත සමාජ වපසරියක් බිහිකිරීමට පාලකයන් උපක්‍රමශීලී වූ බව පෙනේ. රජය යටතේ බෞද්ධ විහාරස්ථානයන්හි භවභෝග වර්ධිතව තිබූ අතර දිළිඳු ජනයා ඒවා සොරකම් කර ජීවිතය රැක ගන්නට උත්සාහ ගන්නට ඇත. එවැනි දිළින්දන් අත් අඩංගුවට ගෙන දඬුවම් පැමිණවීම කළ හොත් සමාජයෙන් රජයටත් ශාසනයටත් අවලාද එල්ල වන නිසා බුද්ධිමත් වූ පාලකයන් ධර්මය තුළින් ම ඔවුන් ශිෂ්ට කිරීමේ අරමුණින් මෙසේ ශාප පාඨ ජනගත කළ බව සිතිය හැකි ය. එය හුදෙක්ම ශිෂ්ට සම්පන්න සහ නීති නීතිගරුක සමාජයක් ප්‍රතිෂ්ඨාපනයට ගත් උපක්‍රමයක් බව පැහැදිලි ය. පැරණි ලංකා සමාජය තුළ ක්‍රමික නීති සහ අධිකරණ පද්ධතියක් තිබුනත් ශාප පාඨ තුළින් විනය තහවුරු කරලීමට පාලකයන් අවතීර්ණ වූයේ ඇතැම් විට විහාර සම්බන්ධ නීතිය නිසිව ක්‍රියාත්මක නොවීමත් බෞද්ධ භික්ෂුව තම දේපළ සම්බන්ධ කාරණා වෙනුවෙන් නෛතික රාමුවක පිහිට පැතීම ප්‍රතික්ෂේප කිරීමත් නිසා වන්නට ඇත.

ප්‍රමුඛ පද: *අභිලේඛන, ශාපපාඨ, විහාරාරාම, බුද්ධභෝග, ශාප*

ආශ්‍රිත ග්‍රන්ථ

අමරවංශ හිමි, කේ. (1969). *ලක්දිව සෙල්ලිපි.* ගුණසේන සහ සමාගම.
මුදියන්සේ, එන්. (1971). *ශාස්ත්‍රීය ලිපි සංග්‍රහය.* ගුණසේන සහ සමාගම.
විමලකිත්ති හිමි, එම්. (1957). *ශිලා ලේඛන සංග්‍රහය.* 4, සීමාසහිත මාතර වෙළෙන්දෝ.
සුමංගල හිමි, එච්., සහ දේවරක්ෂිත, බී. (සංස්.). (1996). *මහාවංසය.* ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව.

විරෝධාකල්ප ගී තුළින් ප්‍රකට වන ලාංකේය ජනප්‍රිය බුදුදහමේ ලක්ෂණ පිළිබඳ සංස්කෘතික මානව විද්‍යාත්මක විමර්ශනයක්

ඩබ්ලිව්. කේ. එම්. විජයරත්න*[1], පී. එන්. අභයසුන්දර[2] සහ පී. එම්. ජයවීර[3]

[1]පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය, [2] මානව විද්‍යා අධ්‍යයනාංශය, [3] පරිගණක විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

**wkanishka27@gmail.com*

හැඳින්වීම

'විරෝධය' යනු අවමානයක්, උපහාසයක් හෝ අපහාසයක් නැතිනම් අණ කිරීමක් වැනි හැඟීමක් ලෙස සාහිත්‍යයේ දී හඳුන්වයි. යමකු යමකට විරුද්ධ වීම තුළ විශේෂයෙන් වැළැක්වීම යන අරුත ගැබ් වී තිබේ. විරෝධාකල්ප ගීත සඳහා විශ්ව සාහිත්‍යය තුළ ඇත්තේ ඉපැරණි ඉතිහාසයකි. එය වාල්මීකීගේ රාමායණය (ක්‍රි.පූ. අවධිය) දක්වා දිවෙන බව විද්වතුන්ගේ අදහස යි. සීගිරි කුරුටු ගීවලත්, අමාවතුරෙත්, බුත්සරණෙත්, ජාතක පොතෙත් මෙකී විරෝධාකල්පයන් හමුවේ. ලාංකේය සමාජ සන්දර්භය තුළ විරෝධාකල්ප ගීත වඩාත් සාර්ථක අන්දමකින් ප්‍රචලිත වන්නේ 1980-1989 කාලපරිච්ඡේදවල දී ය. එකල වූ සමාජ, දේශපාලනික සහ සංස්කෘතික පරිහානිය හමුවේ විරෝධාකල්ප ගී කෙරෙහි ජනයා වැඩි වශයෙන් යොමු වන්නට විය. මෙම විරෝධාකල්ප ගී සමාජයේ විවිධ මට්ටමේ ආයතන, සංස්ථා, සිරිත්-විරිත්, සහ මතිමතාන්තර දැඩි ලෙස අභියෝගයට ලක්කර තිබේ. මේ අතුරෙන් එකල වූ බෞද්ධ සංස්කෘතියට විරෝධාකල්ප ගී හෙළන ලද බලපෑම ද සුවිශේෂී වේ. ඊට ලාංකේය සමාජ යාන්ත්‍රණය තුළ කාලානුරූපීව වෙනස් වන ජනප්‍රිය බුදුදහම සහ ඉන් විද්‍යමාන වන ලක්ෂණ ද පසුබිම් වී තිබේ. ජනප්‍රිය බුදුදහම පිළිබඳ මානව විද්‍යාඥයන් දක්වන අදහස් සහ ඊට අනුරූප වන පරිදි විරෝධාකල්ප ගීවලින් පිළිබිඹු වන කතුවර දෘෂ්ටිවාදයේ ස්වභාවය මෙම අධ්‍යයනය සඳහා පදනම් වෙයි.

පර්යේෂණ ගැටලුව, පර්යේෂණ අරමුණු

මානව විද්‍යාඥයන් විසින් දක්වනු ලබන සිංහල බුදුදහමේ පරිණාමයත් සමඟ සාම්ප්‍රදායික බෞද්ධ සංස්කෘතියෙන් චිතැන් වුණු සහ වඩාත් ලෞකික ජීවිතයක් කෙරෙහි නැඹුරුතාවක් දක්වන ජනප්‍රිය බුදුදහමේ ලක්ෂණ, විරෝධාකල්ප ගී තුළින් ප්‍රකට කෙරුණා දැයි විමසීම මෙම පර්යේෂණයේ ගැටලුව වන අතර ඒ තුළින් කතුවරයා දක්වන ලද දෘෂ්ටිවාදය කෙබඳු දැයි විද්‍යමාන කරගනිමින් ඒවායේ වර්තමාන වලංගුභාවය සනාථ හෝ අනාථ කරලීමට අප විසින් අරමුණු කරගනු ලැබේ.

පර්යේෂණ ක්‍රමවේදය

උක්ත පර්යේෂණ ගැටලුවත්, අරමුණු සහ සීමාවන් සලකා මෙම පර්යේෂණය සඳහා අප යොදාගනු ලබන්නේ මහාචාර්ය සුනිල් ආරියරත්නයන් විසින් 1985 වර්ෂයේ රචිත "හේමන්තයේ දී" සහ 1987 දී රචිත "පවන" යන නන්දා මාලිනියගේ කැසට්පට සඳහා වූ ගී පද මාලාවන්ගෙන් නිශ්චිත ව තෝරාගනු ලැබූ ගීත පහකි. උක්ත සමයන්හි රට තුළ පැවති දේශපාලනික අර්බුද හමුවේ මෙම කැසට්පටයන්හි ඇතුළත් ව තිබූ ගීත බොහොමයක් විරෝධාකල්ප දැරූ ඒවා විය. ''හේමන්තයේ දී" සඳහා රචිත (1)"පානං පත්තුවේ ඩිංගිරි අම්මා" ගීතයත්, "පවන" සඳහා රචිත (2)" සුභාෂිත හෙවත් හිතෝපදේශ", (3)"උපාසකම්මා ඉපදුණු හීන කුලේ", (4)"දෙවු මවු විලප", (5)"දනන් රුහිරු බී" යන ගීත පහ ඒවායේ පද රචනයන් පිළිබඳ සලකා නිශ්චිත ව මෙම පර්යේෂණය සඳහා යොදා ගැනුණි. අර්ථ නිරූපණ සුසමාදර්ශයට (Interpretive Paradigm) අනුකූල ව මෙම පදමාලාවන් විවරණය කරනු ලැබූ අතර සමාජීය වශයෙන් ගොඩනැගුණු සංකල්ප දෙකක් වන විරෝධාකල්පයත්, ජනප්‍රිය බුද්ධාගමත් නිශ්චිත ව අවබෝධ කරගනිමින් එහි ලා කාලය, සංස්කෘතිය සහ සන්දර්භය යනාදිය බලපා ඇති අන්දම වටහාගැනීම සඳහා මෙම සුසමාදර්ශීය ප්‍රවේශය වඩාත් යෝග්‍ය බැවින් ඊට අනුරූප ව මෙම පර්යේෂණය සිදු කරන ලදි. මෙම පදමාලාවන්ගෙන් මතු වන ජනප්‍රිය බුදුදහමේ ලක්ෂණ සාහිත්‍ය මූලාශ්‍රය හා සසඳමින් ගුණාත්මක දත්ත විශ්ලේෂණයකට ලක් කෙරිණි.

ප්‍රතිඵල හා සාකච්ඡාව

ඊ.බී. ටයිලර් විසින් ඉදිරිපත් කරන ලද ප්‍රාථමික සමාජවල ආගමික ස්වභාවයන් වන සර්වාත්මවාදය (Animism) වැනි විශ්වාස මත පදනම් වූ ලාංකේය වැසියාට මිහිඳු හිමියන් මෙරටට බුදුදහම හඳුන්වා දුන්, රාජ්‍ය අනුග්‍රහය බෙහෙවින් ලැබුණු බුද්ධ ධර්මය කෙරෙහි යොමු වීමට වැඩි කලක් නො ගිය බව විද්වත් අදහස යි. විශේෂයෙන් ම බුද්ධාගම රාජ්‍යාගම වීම තුළ එහි ආදි ලක්ෂණ වූ වෛරාග්‍ය හා අල්පේච්ඡතාව සුන් වී ගොස් බුදුසසුන ආගමික අතින් ද, දේශපාලන අතින් ද රාජකාරි රැසක් කරට ගත් පූජක සංවිධානයක් බවට කෙමෙන් කෙමෙන් පෙරළී ගිය බව වල්පොළ රාහුල හිමියෝ කියති. ආගම දේශපාලනීකරණය වීම ජනප්‍රිය බුදුදහම තුළ වර්තමානයේ දී වඩා ප්‍රබල ව දක්නට ලැබෙයි. ''උපාසකම්මා ඉපදුණු හීන කුලේ'', ගීතයේ එන පහත කොටස් අතුරෙන් උක්ත ලක්ෂණ කියැවේ.

''පිරිත් නූල් බඳිමින් ජන හතුරන්ට
යතුරු කැරලි අඳනය යට ගසාගෙන
අපවත් වෙන්ට පෙර සහ ලේ ඥාතිවරු
මහණ කරන එකදැයි මුනි බණේ අණේ''

''කුණු හෝදන්ඩ මහ තැන්වල අපේ රටේ
පන්සල තමුන්නැහෙගේ හොඳ වෙල්ලාව
ටිකට් විකුණලා පෙරහැර කරන කොට
කරඬුවේ ඉඳීවි ද ධාතූන් වහන්සෙලා''

මහාචාර්ය ටෙනිසන් පෙරේරා සඳහන් කරන අන්දමට ජනප්‍රිය බුද්ධාගම සමන්විත වන්නේ ඓතිහාසික සාධක මුල් කරගෙන ය. ඒ අතර ප්‍රාග් බෞද්ධ ඇදහිලි, මුල් බුදුසමය, මහින්දාගමනයෙන් පසු මෙරට ඇති වූ බුදුසමය, මෙරට ඇති වූ ආගමික ප්‍රතිසංස්කරණ, මහායාන බුදුසමයේ බලපෑම සහ බහු සමාජය විසින් ජනිත කරන ලද සංස්කෘතික බලපෑම් ආදිය ඊට හේතු වුණු වග ඔහු දක්වයි. ජන හතුරන් ලෙස හඳුන්වන පාලක පන්තියට පිරිත් නූල් බැඳීම තුළින් රචකයා බුදුදහම දේශපාලනීකරණය වීම පෙන්නුම් කරයි. බුදුදහම දේශපාලනීකරණය වීම ජනප්‍රිය බුදුදහමේ ලක්ෂණයකි. ජනප්‍රිය බුද්ධාගම කෙරෙහි බලපාන දේශපාලනික යාන්ත්‍රණයට බුදුදහම යොමු වීම මේ තුළින් ගම්‍යමාන වෙයි. ''පානං පත්තුවේ ඩිංගිරි අම්මා'' ගීතයේ එන පහත කොටස් තුළින් උක්ත අවසන් කරුණ සෙසු අනෙකුත් කරුණ හා බද්ධ වන අන්දම පැහැදිලි වේ.

''වඳිනට ගිය කලට නුවරට දළදාව
ගමේ චණ්ඩි ඉස්ටැන්ලි ද සිටියාය
යාළු නිලමෙලා දොර හැර දුන්නාය
ළඟට ම ගිහින් ඔහු දළදා වැන්දාය''

''සිරි මහ බෝධියට ගිය දා උදයේ ම
කාර් ගොඩක් ආවා එක එක පාට
තෙරපී සිටිද්දී අපි පඩිපෙළ ගාව
ඒ මහතුඟ රන්වැට පැන වැන්දාය''

මහින්දාගමනයෙන් පසු මෙරට ඇති වූ බෞද්ධ සංස්කෘතිකාංගයන්ගේ භාවිතය, පවත්නා සමාජ වෙනස් වීම් හමුවේ පන්ති භේදයකට නතු වීම මෙහි කියැවේ. ජනප්‍රිය බුදුදහම නමැති සංකල්පය බිහි වීම කෙරෙහි බලපෑ මුඛ්‍යතම සංකල්පයක් වන්නේ කිත්සිරි මළල්ගොඩ, ගණනාත් ඔබේසේකර, රිචඩ් ගොම්බ්‍රිච් වැනි මානව විද්‍යාඥයන් විසින් ඉදිරිපත් කරන ලද 'ප්‍රොතෙස්තන්ත්‍ර බුදුදහම' යි. ඔබේසේකර, ගොම්බ්‍රිච් දක්වන ආකාරයට ක්‍රිස්තියානි සංස්කෘතියේ හැඩයට අනුරූපී වුණු ආකෘතියකට බුදුදහමේ සංස්කෘතිය වෙනස් වෙයි. ''දෙවු මවු වලප'' හිසින් යුත් පවනෙහි එන ගීතයෙහි *''කිසා ගෝතමීය සිද්ධාර්ථට කියූ නිබ්බුත පදමයි පුතේ මේ අහිංසක මරියා කුරුස යට අඬ අඬ කියන්නේ''* යනුවෙන් කොටසක් වෙයි. සැබවින් ම ගතහොත් එම ගීය ද ප්‍රොතෙස්තන්ත්‍ර බුදුදහමේ අංග හා සම වෙයි. කිතුණු සංස්කෘතිකාංග මුල් බුදුසමය හා බැඳුණු සංස්කෘතිය හා ගළපයි.

ජනප්‍රිය බුදුදහම ප්‍රචලිත වීමෙහි ලා බලපාන ප්‍රධාන ම හේතුවක් ලෙස බෞද්ධ භික්ෂුවගේ කාර්යභාරය සැලකිය හැකි ය. එය විරෝධාකල්ප ගී තුළ සඳහන් ව තිබේ. එමෙන් ම සිංහල බුදුදහම තුළ එන දේවවාදී චින්තනය විවිධ හැඩගනිමින් වර්තමාන ජනප්‍රිය බුදුදහමට පැමිණ තිබේ. ''සුභාෂිත හෙවත් හිතෝපදේශය'' නම් ගීයෙන් (වම) භික්ෂුවගේ කාර්යය විමසන කතුවරයා, ''දනන් රුහිරු බී'' ගීයෙන් (දකුණ) දේවවාදයට හෙළන විරෝධය පසක් වෙයි.

''බුදු හිමි, ජේසු හිමි නබි හිමි වැඳ පුදනු
දැ ගොත් කුල නුදුටු උන් බණ පිළි පදිනු
වැදි බණ මැදින් මුනි බණ තෝරා අසනු
වැදි බණ දෙසන සඟ ගණ වුව පිට දකිනු''

''නැගෙන්නට සදන අත් පෙළ බිමට නැමූ
සිතන්නට තිබෙන සිත්වල අගුළු දැමූ
යකුන් නසනු බැරි නම් තට අපි නසමූ
සමන් සුරිඳ යනු නොරැඳී සබර ගමූ''

නිගමන සහ නිර්දේශ

මෙම පර්යේෂණයේ ප්‍රධාන ම නිගමනයක් වන්නේ ආරියරත්නයන් විසින් අසූව දශකයේ රචනා කළ විරෝධාකල්ප ගී තුළින් එකල පැවතියා වූ ඇතැම් බෞද්ධ සංස්කෘතින් කෙරෙහි විරෝධයක් හෙළූ බව යි. ජනප්‍රිය බුදුදහම ලෙස වර්තමානයේ හඳුන්වන්නේ එකල සිදු වූ ආගමික ප්‍රතිසංස්කරණවල ම නව ස්වරූපයක් ය. සිංහල බුදුදහමත්, ප්‍රොතෙස්තන්ත්‍ර බුදුදහමත් ඒවාට පෙර වූ ප්‍රාග් ඓතිහාසික ඇදහිලි හා විශ්වාස යන සියල්ලේ ම පරිවර්තනයකි, ජනප්‍රිය බුදුදහම. රචකයාගේ ඇතැම් විරෝධාකල්ප ගී තුළ ප්‍රොතෙස්තන්ත්‍ර බුදුදහමේ ලක්ෂණ අඩංගු වී තිබෙන අතර බෞද්ධ භික්ෂුවගේ කාර්යභාරයේ වෙනස් වීම, බුදුදහම දේශපාලනීකරණය වීම, දේව සංකල්පය වැනි ජනප්‍රිය බුදුදහමේ ලක්ෂණ මෙම ගීතවලින් ප්‍රකට වන බව නිගමනය කරගත හැකි ය.

ප්‍රමුඛ පද: *ජනප්‍රිය බුදුදහම, පවන, මානව විද්‍යාව, විරෝධාකල්ප ගී, හේමන්තයේ දී*

ආශ්‍රිත ග්‍රන්ථ

ආරියරත්න, එස්. (1994). *තුටු පඬුරු.* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම.
පෙරේරා, ටී. (2011). ජනප්‍රිය බුදුදහම. සී.වික්‍රමගේ, එච්.ඒ. අභයවර්ධන (සංස්.), *ලෞකික බුදුදහම: සිද්ධාන්ත සහ භාවිතය* (පි.342-362). අභස් ප්‍රකාශන.
Obeyesekere, G. & Gombrich, R. (1988). *Buddhism Transformed: Religious Change in Sri Lanka*. Princeton University Press.
Rahula, W. (1956). *History of Buddhism in Ceylon.* Buddhist Cultural Centre.

ශ්‍රී ලාංකික චීන ජන ප්‍රජාවගේ සමාජ ආර්ථික පසුබිම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ආර්. කේ. ඒ. පී. ඉනුරිකා
ඉතිහාසය අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
rkaginurika@gmail.com

හැඳින්වීම

ශ්‍රී ලංකාව බහුවාර්ගික රටකි. සිංහල, දෙමළ, හා මුස්ලිම් යන ප්‍රධාන ජනවර්ගවලට අමතරව කාපිරි, මැලේ, චෙට්ටි, ආදී ජනවර්ග අල්ප වශයෙන් වාසය කරති. ශ්‍රී ලංකාවේ වාසය කරන තවත් අප්‍රකට ජන වර්ගයක් ලෙස ශ්‍රී ලාංකික චීන ප්‍රජාව හැඳින්විය හැකි ය. ශ්‍රී ලාංකික චීන වැසියන්, බාහිර පෙනුමෙන් මොංගොලොයිඩ් මානව වර්ගයට සුවිශේෂ වූ සිහින් ඇස්, කහ පැහැයට නුරු සම, තුනී හිසකෙස් හා ශරීර උස ප්‍රමාණයෙන් තරමක් අඩු යන ලක්ෂණවලින් යුත් ජන වර්ගයකි. අතීතයේ සිට චීනය හා ශ්‍රී ලංකාව අතර ආර්ථික, දේශපාලන හා සංස්කෘතික සබඳතා පැවතුනි. එමෙන්ම ස්වාධීන සංක්‍රමණිකයන් ලෙස පැමිණි පිරිසක් ද සිටියහ. වර්තමානයේ මෙරට වාසය කරන චීන වැසියන් එලෙස පැමිණි අයගෙන් පැවත එන පිරිසකි.

පර්යේෂණ ගැටලුව, පර්යේෂණ අරමුණු

ශ්‍රී ලාංකික චීන ජන ප්‍රජාවගේ සමාජ, ආර්ථික අනන්‍යතාව ශ්‍රී ලංකාව තුළ ප්‍රකාශ වන්නේ කෙබඳු ආකාරයෙන් ද යන පර්යේෂණ ගැටලුව මුල් කරගෙන අධ්‍යයනය සිදු කරන ලදී. පර්යේෂණයේ මූලික අරමුණ වූයේ අප්‍රකට ජන පිරිසක් වන ශ්‍රී ලාංකික චීන ප්‍රජාවගේ සමාජ හා ආර්ථික හා පසුබිම පිළිබඳ අධ්‍යයනය කිරීමයි.

පර්යේෂණ ක්‍රමවේදය

සාහිත්‍ය මූලාශ්‍රය අධ්‍යයනය හා සම්මුඛ සාකච්ඡා ක්‍රමවේද පර්යේෂණය සඳහා භාවිත කරන ලදී. පුස්තකාල හා අන්තර්ජාලය ඔස්සේ මූලාශ්‍රය අධ්‍යයනය කිරීම සිදු කළ අතර මරදාන ප්‍රදේශයේ වාසය කරන ශ්‍රී ලාංකික චීන පුද්ගලයන් 5දෙනකු සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීම මගින් දත්ත ලබාගැනීම සිදු කරන ලදී.

ප්‍රතිඵල හා සාකච්ඡාව

ස්වාධීන සංක්‍රමණිකයන් වශයෙන් චීන ජාතිකයන් මෙරටට සංක්‍රමණය වී තිබෙන්නේ 1920 දශකයේ අවසාන භාගයේ සිට 1950 අතර කාලය තුළය. දෙවන ලෝක යුද සමයේ සහ චීනය මුහුණ දුන් සිවිල් යුද තත්ත්වය සංක්‍රමණයට බලපා ඇත. වර්තමාන ශ්‍රී ලංකාවේ ජීවත් වන්නේ එසේ සංක්‍රමණය වූ චීන ජාතිකයන්ගේ දෙවන හා තෙවන පරම්පරාවන්ට අයත් පුද්ගලයන්ය. 2008 වර්ෂයේදී චීන සම්භවයක් සහිත පුද්ගලයන්ට පුරවැසිභාවය ලබා දීමේ පනත යටතේ 1947 නොවැම්බර් 15 සිට මෙරට ස්ථිරව පදිංචිව සිටින චීන ජාතිකයන්ට පුරවැසි භාවය හිමි විය. ශ්‍රී ලාංකික චීන ජාතිකයන් ප්‍රධාන වශයෙන්ම සිය ජීවනෝපාය වශයෙන් සිදුකරන්නේ දත් බැඳීමයි. ඊට අමතරව ඔවුහු රෙදි වෙළඳාම සහ හෝටල් ක්ෂේත්‍රයේ රැකියාවලද නිරත වෙති. ඔවුන් සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි යන භාෂා භාවිත කරන අතර චීන වචන ඉතා ස්වල්ප ප්‍රමාණයක් දන්නා බව අනාවරණය විය. ඔවුන්ගෙන් බහුතරය බෞද්ධාගමිකයෝ වෙති. සිංහල බෞද්ධයින් සමග විවාහ සම්බන්ධතා පැවැත්වීම ඊට හේතුවී තිබේ. ඇඳුම්පැළඳුම් හා ආහාරපාන ශ්‍රී ලංකාවේ භාවිත ඒවාට සමානය. ඔවුන්ගේ නම් චීනයේ භාවිතවන නම්වලට සමානවේ. උදා- ලියූ, හැන්ග්.

නිගමන සහ නිර්දේශ

බාහිර ස්වරූපයෙන් චීන ජාතිකයන්ට සමානකමක් දැක්වුවද ඔවුන් මෙරට පුරවැසිභාවය හිමි සාමාන්‍ය ශ්‍රී ලාංකිකයන් පිරිසක් බව නිගමනය කළ හැකිය.

ප්‍රමුඛ පද: *ශ්‍රී ලාංකික චීන ප්‍රජාව, සංක්‍රමණය, පුරවැසිභාවය, දත් බැඳීම, ඇඳුම් පැළඳුම්*

ආශ්‍රිත ග්‍රන්ථ

Dhammadinna, V. N. (2021). *Sri Lankan Chinese:A Forgotten Ethnicity Of Sri Lanka.* Http://Repository.Kln.Ac.Lk/Handle/123456789/23223

Jemson, T. C. (2017). The Chinese Community Of Sri Lanka. In *People Of Sri Lanka* (Pp. 213-224). Ministry Of National Coexistence Dialouge And Official Languages.

Pathirana, H., & Peiris, J. (2015). *The Culture And Citizenship Of The Sri Lankan Chinese Dental Technicians.* Https://Www.Researchgate.Net/Publication/282331783_The_Culture_And_Citizenship_Of_The_Sri_Lankan_Chinese_Dental_Technicians

An Investigative Study of the Concept of *Rajjurubandāra Dēva* Related to the Life of the People of *Morawakkorale*

J. K. A. Kanthi
Department of History and Archaeology, University of Ruhuna, Sri Lanka
jkanthi@hist.ruh.ac.lk

Introduction

Moravakkoralaya is an area bordered by the Sinharaja site, Chukkakoralaya, Hinidumpatthu and Weligamkoralaya. Agriculture and commercial crops are the primary sources of income of the villagers. People in Moravakkoralaya love to worship Gods. The main deity worshiped by these people is God Rajjurubandara. They believe that Bandara, the local leader, has been born as Lord Rajjurbandara and helps the people who are in misery.

Research Problem/s, Objective/s

The research problem here iss how the concept of Rajjurubandara Deva had spread among the people of Morawakkorale. The main objective of this research is to identify how Rajjubandara Deva had become popular among the people. A sub-objective is to investigate what kinds of problems are hoped to be solved by the Rajjubandara worshippers.

Materials and Methods

The qualitative research method was used for the data collection and analysis. Gatabaruwa Rajjuru Bandara temple was selected for field studies. Primary data was collected using a group of 30 people consisting of 01 main Nilame of the temple, 04 Kapumahatvaru, 04 attendants, 02 monks, and 19 devotees for the interviews. Secondary data was collected from books, magazines, and research papers.

Results and Discussion

The concept of Rajjurubandara Deva is prevalent among the people of Morawakkorale. Although they seek medical treatment for their ailments, they pray to God with even greater devotion. They pray to God for chickenpox, measles, mumps, and coronavirus considering them as diseases of the gods. They pray to God for revenge on the enemies, to have children, to succeed in business, and to protect the vehicles. Most people believe that Rajjurubandara is the only help they have to get rid of diseases and disasters and bring happiness.

Conclusions and Recommendations

Mental health is essential to prevent physical diseases. Many people use behavioural methods for that. But in this study, it was revealed that the people who go to heal their illnesses without proper medical treatments end up with unfortunate fates. Therefore, it is concluded that even if religious offerings are held for mental healing, necessary medical treatment also should be done.

Keywords: Morawakkoralaya, God Rajjurubandara, Prayers to God, Mental Health, Gatabarudevalaya

References

Ananda, K. (2019). Gatabaru dewola saha Rajjurubandara Deva Sankalpaya, *In Rev. Damminda. Angulugaha, P. Vidanapathirana, & D. M. De Silva (Eds.), Review of Morawakkorala Vanshaya, Ministry of Culture and the Arts of Southern Province.*

Ashoka, M. (2008). *Matara Devivaru*, [Review of Matara Devivaru,]. In *Matara Wanshaya, Ministry of Cultural Affairs.*

Wanarathana, K. (1994). *Matara puravidyathmaka Ithihasaya.* Sri Rohana Sangasaba Mulasthanaya.

Lakshmi Plaques in Sri Lanka

N. L. K. Sandunika
Faculty of Humanities and Social Sciences, University of Sri Jayewardenepura, Sri Lanka
kalaliyanage@gmail.com

Introduction

Lakshmi plaque is a metallic coin, among the other media of exchange used and widely circulated since the 2nd century BC. They were recovered from Anuradhapura Salgahawatta excavations and reportedly the earliest example can be dated back to the 1st century BC (Coningham, 2006, p.10). Further, the plaques are reported from excavations at Jetavana Vihara and Abhayagiri monastery which also date back to the 1st century to the 2nd century BC (Coningham, 2006, p.10). According to Reinhold Walburg's excavations at the ancient sea-port of Godawaya andTissamaharama, have yielded that Lakshmi plaques were used from the second half of the first century BC to at least the seventh, perhaps even to the eighth or ninth century (Weisshaar et. al., 2008, p.88). The coin's obverse displays a feminine image; Goddess Lakshmi while the coin's reverse displays the 'railed swastika' symbol. The concept of goddess Lakshmi; the goddess of wealth and good fortune, comes from the Hindu pantheon and gradually has been inserted into the obverse of the coins. According to the radiocarbon dating of the recovered Lakshmi plaques, these coins are fractional pieces of the 'Kahavana'; the first used term of the monetary unit, to various types of which they can be assigned with some probability. (Coningham, 2006, p.16) (Codrington, 1924, p. 81). A large number of Kahavana that were found in Sri Lanka may have first entered into circulation during the reign of Mauryan King Asoka. The earliest epigraphical evidence of the circulation of Kahavana on the island dates back to the end of the 3rd century BC (Paranavithana, 1790, p.791).

Research Problem/s, Objective/s

Even though coins and currencies have been subjected to study in Sri Lanka, only a few writings are available on Lakshmi plaques. Some archaeological evidence can be used in creating a sequence on the circulation of Lakshmi coins, but these evidences do not provide a full context on the origin and the diversity of the Lakshmi plaques. Therefore, this research was initiated to find out and collect information, both on the origin and the diversity of the Lakshmi Plaques.

Materials and Methods

A literature-based secondary analysis was carried out to collect data by considering the timeline of the writings, specially which were published for the past 5 years. A special attention was given to excavation reports and literature on the origin and diversity of Lakshmi plaques. The collected data was analyzed through themetic analysis/ (or content anslysis) and arguments were built up.

Results and Discussion

According to the findings of the study, engraving and punching the image of goddess Lakshmi in Sri Lanka can be traced back to the 3rd to 2nd century BCE. Initially, these coins were neutrally called "*oblong copper coins,*" or "*Tissa coins,*" "*Mulleittivu coins*" and "*Anuradhapura coins.*" On the obverse of these rectangular pieces of copper alloy, a female figure is shown standing or sitting as the main feature while the reverse has a railed swastika (Weisshaar et.al, 2008, p.85). According to S. Paranawithana, the railed swastika depicts the symbol "*Gamani Thisha*" which is also engraved in Brahmi Inscriptions. The symbol "*Gamani Thisha*" was used by King Sadhdhatissa in Sri Lanka. Therefore, the origin of the coin can be traced back to the 3rd to 2nd century BCE in Sri Lanka.

Lakshmi plaques in *Ujjain*, India were turned out during the 3rd to 2nd century BCE while *Arjunain coins* in the 2nd century BCE and *Kune coins* in the 1st century BCE. Therefore, Sri Lankan Lakshmi plaques were exposed to and influenced by the Indian coins during this period (Kulatunga, 2005, p.224). Further, a single

example of a Lakshmi coin was recovered from the Salgahawatta excavation and Codringotton notes that this coin may be assigned to the late 9th or 10thcentury AD (Coningham, 2006).



Figure I - Image of a *Lakshmi plaque* (Jayasuriya, 2020)

The Lakshmi plaques were rectangular in shape and differ from other forms of coins circulated in Sri Lanka. It represents two different angles of the goddess Lakshmi as standing or seated on the obverse of the coin. The coin with the standing image has two elephants on either side of the goddess and is titled as *Gaja Lakshmi* coins. The other coin with the seated image is generally called the *Sri Lakshmi* coin, the right leg of the goddess is bent towards the seat and the other leg is directed towards the earth (Kulathunga, 2005, p.218). The reverse of the coin is mainly engraved with a railed swastika which is turned to the right side of the coin.

Codrington stressed upon the wide distribution of Lakshmi coins and reported that they had been found in most of the major monuments in Anuradhapura including Thuparama and Kiribath vihara, Chilaw in the Northern coast and Kantarodi and Villupuram in the Jaffna Peninsular (Coningham, 2006, P.10). The findings of the Lakshmi coins have given an idea of the different sub coin classifications such as large sized, medium-sized, and small sized coins based on the size and weight. Further, technology and the metal types are also distinguished into two categories as engraved symbols and moulded symbols on copper alloys (Kulathunga,2005; 219). Coins are cataloged according to the denominations by taking their dimensions into account. According to John Still, these coins were cut into strips from sheet copper and then chopped into pieces to fit the die (De silva, 2000, p.35). However, there is a controversial discussion about whether these objects were coins or worn jewellery. Reinhold Walburg has concluded the earlier convincing arguments centered around unsettled weights, careless manufacturing, and the fact that there are no physical signs that they were ever in circulation and these could be used as a memento (Weisshaar et.al, 2008, p.85).

Conclusions and Recommendations

The identification presented concerning metrology, manufacturing, iconography and the archaeological discoveries concludes that the origin of the Lakshmi plaques dates back to the 3rd century BC to the 7th century AD following an analysis of the plaques' nature and the goddess plaques were diversified based on the size, weight and formation of the goddess.

Keywords: *Lakshmi Plaques, Goddess, Numismatics, Archaeology, Ancient Coins*

References

කුලතුංග, ටී. ජී. (2005). *ශ්‍රී ලංකාවේ කාසි හා මුදල් ව්‍යවහාරය, මධ්‍යම සංස්කෘතික අරමුදල.*

Coningham, R. (2006). *Anuradhapura. The British - Sri Lankan Excavations at Anuradhapura Salgaha Watta* 2, (Vol 02.). BAR International Series.

Coningham, R., Gunawardhana, P. (2013). Anuradhapura Volume III, the Hinterland. BAR International Series

Jayasuriya, K. (2020). *A Comparative Study of The Origins of the Lakshmi Concept in Sri Lanka, Numerological Sources in Sri Lanka and India*. 10.13140/RG.2.2.20166.50240.

Walburg, R. (2008). *Coins and Tokens from Ancient Ceylon*. Reicher Verlag Wiesbaden.

ලාංකේය වතුකර හින්දු දමිළ අවමංගල උත්සව සංගීතයෙහි වර්තමාන භාවිතය පිළිබඳ මානවවංශ සංගීත විද්‍යාත්මක අධ්‍යයනයක්

ආර්. එම්. පී. එස් වීරසූරිය*[1] සහ කේ. එම්. ඩී. ඩී. බණ්ඩාර[2]
[1]පළාත් පාලන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව, [2]පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
**prasad.weerasooriya1@gmail.com*

හැඳින්වීම

ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශ ආශ්‍රිත ව දමිළ ජනතාව ජීවත් වුව ද ලාංකේය දමිළ ජනතාව පිළිබඳ කතිකාවේ දී වතුකර දමිළ ජනතාව සඳහා විශේෂ ස්ථානයක් හිමි වෙයි. මධ්‍යම කඳුකරයෙහි ජීවත්වන දමිළ ජනයා දකුණු ඉන්දීය සම්භවයක් සහිත වන අතර වර්තමානය වන විට ඔවුන්ට ආවේණික සංස්කෘතියක් ශ්‍රී ලාංකේය සමාජයෙහි නිර්මාණය කර ගෙන ඇත. වතුකරයෙහි ජීවත්වන දමිළ ජනතාව වතුකර දමිළ හින්දු සහ වතුකර දමිළ කතෝලික ලෙස වර්ගීකර්ණය කළ හැකි අතර ආගම අනුව ඔවුන්ගේ චාරිත්‍ර ද වෙනස් වේ. වතුකර දමිළ හින්දු සංස්කෘතියේ දී ජීවන චක්‍ර උත්සවයන්හි දී අවමංගල උත්සවය ප්‍රධාන වන අතර ඒවායෙහි භාවිත වන සංගීතය ද ඔවුන්ගේ සංස්කෘතිය හා ඉතා සමීප සබඳතාවක් පවත්වයි. වතුකරයේ දමිළ පුද්ගලයෙකුගේ මරණයක් සිදු වූ විටෙක ඒ බව අනෙක් පුද්ගලයන්ට සන්නිවේදනය කිරීම සඳහා මළබෙර වාදනය සිදුකරනු ලබයි. එය ඔවුන්ගේ සංස්කෘතියට ආවේණික "තප්පු" බෙරයෙන් මෙම වාදනය සිදු කරන අතර මෙම තප්පු වැයීම "සාව් තප්පු" නමින් හැඳින් වේ. සිය ස්වාමියා මරණයට පත් වූයෙහි නම් මහුගේ මරණය නිසාවෙන් වැන්දඹු වූ බිරිඳ මළ කඳ අසල වාඩි වී ඇය ගේ දුක ගීත මගින් ප්‍රකාශ කරන අතර සිංහල සමාජයේ මළ ගෙදරක දී යශෝදරාවත කියන්නාක් මෙන් වතුකරයේ කාන්තාවන් දුක ප්‍රකාශ කිරීමට නිර්මාණය කරනු ලබන ගීත "ඔප්පාරි" නමින් හඳුන්වනු ලැබේ (දිසානායක, 2009, පි.106).

පර්යේෂණ ගැටලුව, පර්යේෂණ අරමුණු

මෙම පර්යේෂණයේ දී වතුකර හින්දු දමිළ අවමංගල උත්සව සංගීතයෙහි වර්තමාන භාවිතය කෙසේ ද? යන ගැටලුව මූලික වෙමින් පර්යේෂණය සිදු කළ අතර පර්යේෂණ අරමුණු ලෙස ශ්‍රී ලාංකේය වතුකර හින්දු දමිළ ජනතාවගේ අවමංගල උත්සව පිළිබඳව අධ්‍යයනය කිරීම, ලාංකේය වතුකර හින්දු දමිළ ජනතාවගේ අවමංගල උත්සවයන්හි භාවිත සංගීතය පිළිබඳ අධ්‍යයනය කිරීම, මෙම අවමංගල සංගීතයෙහි වර්තමාන වෙනස්වීම හා වර්තමාන භාවිතයෙහි ස්වරූපය අධ්‍යයනය කිරීම ඇතුළත් විය.

පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණයේ දී ගුණාත්මක දත්ත රැස්කිරීමේ ක්‍රමවේදය හා කතිකා විග්‍රහය නමැති පර්යේෂණ ක්‍රමවේදය භාවිත කළ අතර එහි දී ප්‍රාථමික මූලාශ්‍රය හා ද්විතීයික මූලාශ්‍රය යොදා ගනු ලැබීය. ප්‍රාථමික මූලාශ්‍රය යටතේ දත්ත රැස් කිරීමේ දී ක්ෂේත්‍ර අධ්‍යයනය හා සම්මුඛ සාකච්ඡා යොදාගනු ලැබීය. ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී වතුකර ප්‍රදේශයෙහි හින්දු දමිළ ජනතාවගේ අවමංගල උත්සවවලට සහභාගී වී සංගීතය පිළිබඳ අධ්‍යයනය කළ අතර ඔවුන්ගේ සමාජ හැසිරීම් සහ චාරිත්‍ර වාරිත්‍ර නිරීක්ෂණය කරමින් ඔවුන් සමඟ සම්බන්ධ වී සංස්කෘතිය පිළිබඳව අධ්‍යයනය කරන ලදී. මෙම තොරතුරු ශ්‍රව්‍ය පට හා දෘශ්‍ය පට ලෙස ලබා ගන්නා ලදී. එහි දී පර්යේෂකයා පිළිබඳව එම සමාජ සන්දර්භයෙහි ජීවත්වන පුද්ගලයන්ට විශ්වසනීයත්වය ඇති වන පරිදි දත්ත ලබා ගැනීම පිළිබඳව පර්යේෂක අවධානය යොමු විය. සම්මුඛ සාකච්ඡාවල දී දමිළ සංස්කෘතිය පිළිබඳ සාධනීය දැනීමක් සහිත දමිළ සංගීතය පිළිබඳව අවබෝධයක් සහිත විදග්ධයන් හමු වී ඔවුන්ගෙන් ගුණාත්මක කරුණු ලබා ගත් අතර වතුකරයේ දමිළ ජනතාව (පූඩඑඔය හා හපුතලේ තංගමලේ ප්‍රදේශ ආශ්‍රිත) හමු වී ඔවුන්ගෙන් තොරතුරු ලබා ගනිමින් එම සංස්කෘතික අනන්‍යතාව විමසමින් පර්යේෂණයට අවශ්‍ය දත්ත රැස් කරගන්නා ලදී. ද්විතීයික මූලාශ්‍රය ලෙස ග්‍රන්ථ පුවත්පත් පරිශීලනය, ලිපි ලේඛන පරිශීලනය සිදු කරන ලදී. දත්ත විශ්ලේෂණයේ දී ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී, සම්මුඛ සාකච්ඡා මඟින් ශ්‍රව්‍ය හා දෘශය පට ලෙස ලබා ගත් දත්ත ගුණාත්මකව විග්‍රහ කරමින් පර්යේෂණයේ දත්ත විශ්ලේෂණය කරන ලදී.

ප්‍රතිඵල හා සාකච්ඡාව

වතුකර දමිළ ජනතාව බහුතරයක් හින්දු ආගම අදහන පිරිසක් වන අතර ඔවුන්ගේ ආගමික චාරිත්‍ර පැවත එන්නේ දකුණු ඉන්දියානු සංස්කෘතිය අනුව ය. නමුදු මේ වන විට බෞද්ධ, ක්‍රිස්තියානි ආදී ආගමික චාරිත්‍ර අනුව වතුකර දමිළ ජනතාවගේ චාරිත්‍ර ද වෙනස් වීමට ලක් ව ඇත. මෙම අවමංගල චාරිත්‍ර මියගිය පුද්ගලයා අනුව වෙනස් වේ. එමෙන් ම එම ජන සමාජයෙහි පුද්ගලයකු මිය ගිය පසු මිය ගිය වෙලාව අනුව සෝෂයර් (පූසාරි) කෙනෙකු ලවා නැකත් සෑදීම සිදු කිරීම සිදු කරයි. ඒ අනුව පූසාරි අවමංගල උත්සවයේ දී සිදු කළ යුතු චාරිත්‍ර පිළිබඳ විස්තර නිවෙස් හිමියන්ට ලබාදෙයි. එහි දී යම් යම් චාරිත්‍ර සඳහා සංගීතය භාවිත කරයි. මෙහි දී ශ්ලෝක ගායනය සිදු කරන අතර වාදන අංග සිදු කරන්නේ "තප්පුව" භාවිතයෙනි. පුද්ගලයකු මියගිය විගස ප්‍රථමයෙන් කෝවිලෙහි පූජකතුමා ගෙන්වා මියගිය පුද්ගලයා වෙනුවෙන් සිදු කරන ශ්ලෝක ගායනය සිදු කර කකුලේ මහපට ඇඟිලි දෙක එකට ගැටගසන අතර මෙම අවස්ථාවේ මළ ගෙදර වූ බව අනෙක් අවට සිටින පුද්ගලයන්ට දැනුම් දීමට තප්පු වාදනය සිදු කරනු ලබයි. ලාංකේය සමාජයට තප්පු වාදනය සංක්‍රමණය වන්නේ වතු වගාව ආරම්භ වීමත් සමඟ ය. තප්පු වාදන ශිල්පියා කුලයෙන් පහත් යැයි පිළිගැනෙන "පරයර් හෝ සක්කිලියර්" කුලයට අයත් වේ. එහෙත් වර්තමානයේ කුල භේදයෙන් තොරව එම වාදනය ඉදිරිපත් වුව ද, මෙම වාදනයට කුලය නමැති සමාජ සංකල්පය

මූලික වී ඇත. මෙම වාදනය වර්තමාන සමාජයෙන් ගිලිහෙමින් යන සංස්කෘතික වාදනයක් ලෙස හඳුනාගත හැකි ය. පිරිමි පුද්ගලයන් පමණක් වාදනයට සම්බන්ධ වන අතර මෙමඟින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය ද නිරූපණය කෙරේ. මෙම "පරයර්" කුලය වතුකරයෙහි උසස් කුලයන් පිළිනොගන්නා නිසාවෙන් තප්පු වාදන ශිල්පීහු තමන්ගේ සේවය උසස් කුලයේ පුද්ගලයන්ට ලබා දීමට අකමැති වෙති. වතුකරයෙහි සමහර වතු ආශ්‍රිතව තප්පු වාදන ශිල්පීන්ව අවමංගල උත්සව සඳහා සහභාගි කර නොගැනේ. එයට හේතු වන්නේ තප්පු වාදන ශිල්පීන් සඳහා අමතර වියදමක් දැරීමට සිදුවන නිසාවෙන් මෙම වාදනය සිය අවමඟුල් සඳහා යොදා නොගැනීමයි. එමෙන් ම ඔවුන් සඳහා මත්පැන් හා සිගරට් ද ශිල්පීන් නියම කරන මුදල ද නොදුන්නහොත් ඔවුන් එම මොහොතේ ම කලබල ඇතිකර ගැනීමට පෙළඹෙන නිසා අවංගල අවස්ථාවේ සාමකාමී වූ දුක්මුසු පරිසරයක් උදාකරගත නොහැකි බැවින් අවමංගල උත්සව සඳහා තප්පු වාදකයන්ගේ සහභාගීත්වය බහුතරයක් ජනතාව විසින් ප්‍රතික්ෂේප කෙරේ. තප්පු වාදනයන්ගේ අයහපත් හැසිරීමත්, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීවන් වීමත් හේතුවෙන් ඔවුන්ගේ පාරම්පරික සේවය දමිළ වතුකර සමාජය විසින් ප්‍රතික්ෂේප කර ඇත. අවංගල අවස්ථාවන් සඳහා භාවිත වන මෙම "සාවි තප්පු" වාදනය මියගිය නිවසෙහි වාදනය කරන්නේ එම නිවසේ මරණය පිළිබඳව වත්තේ අනෙක් පුද්ගලයන්ට දැනුම් දීම සඳහා ය. මෙම වාදනය නොකඩවා දින තුනක් සිදු කරයි. එය නිවසේ පුද්ගලයන්ගේ කැමැත්ත හා උපදෙස් මත මෙය සිදු වේ. මිය යන ලද්දේ විවාහක කාන්තාවක් නම් ඇයගේ තැල්ල තම ස්වාමියාට භාර දෙන අවස්ථාවේ මෙන් ම මෘත දේහය නිවසින් එළියට ගන්නා අවස්ථාවේ දී ද මෙම තප්පු වාදනය සිදු කරනු ලබයි. මෙම අවස්ථාවන්හි නාද රටා එකිනෙකට වෙනස් වේ. එනම් මළ ගෙදර වූ බව දැනුම් දීමේ වාදනය, අවමංගල පෙරහැර වාදනය, තුංමංසලේ දී මෘත දේහයෙහි දිශාව වෙනස් කිරීමේ වාදනය ආදී ලෙස මෙම තප්පු වාදනයන්හි නාද රටා, තාල රටා එකිනෙකට වෙනස් ලෙස වාදනය කෙරේ. මෙම රිද්ම ලක්ෂණ පහත පරිදි සංකේතාත්මකව ප්‍රස්තාර කළ හැකි ය.

මළ ගෙදර සිදු වූ බව දැනුම් දීමේ වාදනය

ටට්ටරටර ටට්ටටට්ට/ ටට්ටරටර ටට්ටටට්ට ටට්ටටටක් ටට්ටටට්ට / ටට්ටටටක් ටට්ටටට්ට

මළගෙදර සිට මිනිය රැගෙන යෑම

ටට්ටරටර ටටරටට්ට / ටට්ටරටර ටටරටටර

මෙම වතුකර හින්දු දමිළ ජනතාව අවමංගල පෙරහැරවල දී තප්පු වාදනය සමඟ "සක් (හක් ගෙඩිය) හා සේවාංගි" වාදනය සිදු කරයි. නමුදු "සාවි තප්පු" වාදනය අවමංගල උත්සවයන්හි දී වර්තමානයේ එතරම් දක්නට නොලැබෙන අතර ඒ වෙනුවට සංගු පිඹීම හා සේවංගි ගැසීමේ චාරිත්‍රය සිදු වේ. වර්තමානය වන විට වතුකර දමිළ ජනතාවගේ අවමංගල අවස්ථාවල දී අවමංගල තූර්ය වාදනය භාවිත කරයි. මෙය නව ප්‍රවණතාවක් හා සම්ප්‍රදායක් බවට පත්ව ඇත. මුල්කාලීනව කතෝලික ජනතාව මෙය භාවිත කළ ද වර්තමානය වන විට දමිළ හින්දු ජනතාව ද මෙම බටහිර තූර්ය වාදනය භාවිත කරයි. හින්දු අවමංගල තූර්ය වාදනය සඳහා වැඩි වශයෙන් භාවිත කරන්නේ බයිලා ගීත හා වේග රිද්ම වාදන ය. වතුකර දමිළ හින්දු ජනතාව අවමංගල උත්සව අවස්ථාවන්වල භාවිත කරනු ලබන ගායන අංගයන් ලෙස "ඔප්පාරි ගායනය" හඳුනාගත හැකි ය. මෙය රිද්මයානුකූල හැඬීමක් වන අතර මියගිය පුද්ගලයාගේ ගුණ ගායනය කරමින් මෘත දේහය අසලට වී කාන්තාවන් විසින් පමණක් ගායනය කරනු ලැබේ.

නිගමන සහ නිර්දේශ

දමිළ හින්දු වතුකර ජනතාව සතුව අවමංගල උත්සව ආශ්‍රිතව ලාංකේය අනක් ජාතීන්ට සාපේක්ෂව වෙනස් වූ සංගීත සංස්කෘතියක් බිහි වී ඇති අතර එහි ජන සංගීතාංග ද අන්තර්ගතව ඇත. එම සංගීතය මඟින් එම සන්දර්භයේ ජීවත්වන ජනතාවට නාද රටා ඔස්සේ සන්නිවේදනයක් සිදුවෙන අතර නාද ඒවා පුද්ගලයන්ට අවස්ථාව පිළිබඳව අවබෝධයක් ලබාදෙයි. එහි දී ගායන ක්‍රම හා වාදන ක්‍රම මූලික වන අතර අතීත භාවිතයට සාපේක්ෂව වර්තමානය වන විට මෙහි යම් වෙනස්කම් සිදු වී ඇත. මරණය සිදු වූ අවස්ථාවේ සිට මෘත දේහය සුසාන භූමිය වෙත රැගෙන යන තෙක් යම් යම් අවස්ථාවලදී තප්පුව භාවිත කරමින් වාදන අංග සිදු කෙරෙයි. ඔප්පාරි හා ශිව පුරාණම් ආදී ගායන අංග අතීතයේ භාවිත කළ ද වර්තමානයෙහි මෙහි භාවිතයේ අඩුවක් දක්නට ලැබේ. මෙම අවමංගල සංගීතයේ දී කුලය නමැති සමාජ සාධකය ඉදිරිපත්වන අතර යම් අවස්ථාවල දී පන්ති පරතරයද ඉදිරිපත් වේ. සෑම ශබ්දයකට ම ක්‍රමවත් නාදයකට ම එක් එක් සංස්කෘතීන් නිර්මාණය කර ගත් සන්නිවේදනමය අර්ථකථන ඇත. එකී අර්ථකථන සංස්කෘතික ප්‍රවාහයන්ට අනුව නිර්මාණය වෙයි. වර්තමානය වන විට මෙම සිංහල හා දමිළ සංස්කෘතිය දෙමුහුන්කරණය වී ඇති බව දමිළ හින්දු අවමංගල උත්සව සංගීතයෙහි නාද නිෂ්පාදනය, නාද පරිභෝජනය ආදියෙන් පැහැදිලි වේ.

ප්‍රමුඛ පද: *ලාංකේය දමිළ සංස්කෘතිය, දමිළ අවමංගල උත්සවය, අවමංගල සංගීතය, සන්නිවේදනය, වතුකර දමිළ ජනතාව*

ආශ්‍රිත ග්‍රන්ථ

ජයවර්ධන, කේ. (1989). *ශ්‍රී ලංකාවේ කම්කරු ව්‍යාපාරයේ නැඟීම.* සී/ස කරුණාරත්න සහ පුත්‍රයෝ.
දිසානායක, එම්. (2009). *ශ්‍රී ලංකාවේ දමිළ සංස්කෘතිය.* සී/ස ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.
පියරත්න, ඒ. (2005). *වතුකරය කම්කරුවා හා වෙනස්වන ජීවන රටාව.* විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.
සේනාරත්න, පී. එම්. (1999). *ශ්‍රී ලංකාවේ අවමංගල චාරිත්‍ර.* ඇම් ඩී ගුණසේන සහ සමාගම.

අභාවයට යන පැදුරු කර්මාන්තය (වාද්දුව, වේරගම ප්‍රදේශය ඇසුරින්)

එම්. ඩී. එම්. ප්‍රනාන්දු
මානව විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
dilini.madhuwanthi111@gmail.com

හැඳින්වීම

මානව පරිණාමයේ මුල්කාලීන යුගයේ පටන්ම මිනිසා තමාට අවශ්‍ය විවිධ උපකරණ තම අවට පරිසරයේ ඇති සම්පත් භාවිතයට ගෙන නිපදවා ගත්තේය. මෙම ස්වාභාවික සම්පත් කාලගුණික හා දේශගුණික හේතූන් මත විවිධ ප්‍රදේශයන් තුළ විමධ්‍යගත වී ඇත.ඉන්දු ශ්‍රී ලංකා සහෝදරත්වයේ සංකේතයක් ලෙස මෙරටට හිමිවූ පැදුරු කර්මාන්තය මෙරට අමුද්‍රව්‍ය භාවිත කරමින් මෙහිදී සැකසීම නිසාවෙන් අනන්‍ය සංස්කෘතිකාංගයක් බවට පැදුරු කර්මාන්තය ජනගත වී ඇත.මේ සඳහා මෙරට තුළ භාවිතයට ගන්නා අමුද්‍රව්‍ය විවිධ වීම නිසාවෙන් ප්‍රධාන වශයෙන් උඩරට ප්‍රදේශයේ දුම්බර පැදුරුත් පහත රට ප්‍රදේශයේ පන් පැදුරුත් යන කර්මාන්ත ද්විත්වය ප්‍රචලිත වේ.පැදුරෙහි උපත් කතාව මහා සම්මත රජ දවස දක්වා දිව යන අතර විවිධ ප්‍රදේශයන්හී පැදුරු කර්මාන්තය සඳහා භාවිත වන අමුද්‍රව්‍ය ද විවිධ වේ. මෙම අධ්‍යයනයට පාදක කර ගන්නා වේරගම ග්‍රාමයේ භාවිතයට ගන්නා අමුද්‍රව්‍ය ලෙස ගල්ලැහැ පන්, බොරු පන්, පොතු කොළ, ගින් කොළ, හාල් පන් හා තුන්හිරියා පන් යන වර්ගයන් දක්නට ලැබේ. ග්‍රාමයේ භූවිද්‍යාත්මක පිහිටීම මෙලෙස අමුද්‍රව්‍ය ගණනාවක් පැවතීමට හේතු වී ඇත.එනම් මෙම ග්‍රාමය බොල්ගොඩ ජලාශයටත් හංගිලි ගඟටත් මායිම්ව හැල් කුඹුරු යායකින් වට වී පිහිටා ඇත.අතීතයේ ග්‍රාමයේ විසූ සීමිත පවුල් සංඛ්‍යාවක් තුළ සාමාජිකයන් විශාල ප්‍රමාණයක් ජීවත් වූ හෙයින් ඔවුන්ගේ අවශ්‍යතාවන් උදෙසා සහ මුදල් උපයා ගැනීම සඳහා මෙම ගම්වාසීන් පැදුරු කර්මාන්තයේ යෙදී ඇත. පැදුරුවලට අමතරව වට්ටි, පෙට්ටි, ඇතුල්පත්, හැදි අලු ආදී දෑද ඔවුන් සැකසූ බව පෙනේ. මෙහි පසුබිම් අධ්‍යනයෙන් වර්තමානයේ හැල් කුඹුරු ගොඩ කිරීමත්,පන් කොටු විනාශ වීමත්, ගම නාගරීකරණය වීමත් යන කරුණු කාරණා මත වේරගම ප්‍රදේශයේ පැදුරු කර්මාන්තය අභාවයට යන බව මූලික වශයෙන් අනාවරණය විය.

පර්යේෂණ ගැටලුව, පර්යේෂණ අරමුණු

ස්වභාව ධර්මයේම කොටසක් වූ මිනිසා එහිම අමුද්‍රව්‍ය භාවිත කොට සිය අවශ්‍යතාවන් තෘප්තිමත් කරගෙන සරල ජීවිතයක් ගත කළ කෙනෙකි. එහෙත් ක්‍රමයෙන් ශිෂ්ටාචාරය තුළ නවාංග ඇතිවී සංස්කෘතිය සංකීර්ණ වීමත් සමඟ සරලකම ඔවුන් වෙතින් පලා ගොස් ඇත. අතීත වේරගම ගම්වාසීහු පැදුරු මිලට ගන්නට පැමිණෙන වෙළෙන්දන් හට පැදුරු මිලට දී ඔවුන්ට අවශ්‍ය ද්‍රව්‍ය මිලට ගත්හ. ඇතැම් අවස්ථාවල ඔවුන් පැදුරක් වියන්නේ උදෑසන පාසල් යන දරුවාගේ ආහාර අවශ්‍යතාව සඳහා ය. කෙසේ වුවද ගම ක්‍රමයෙන් ජනාකීර්ණ වීමත් නාගරීකරණය වීමත් සමගින් අදවන විට පැදුරු විවීමේ නිරතව සිටින්නේ ඉතා අතළොස්සක් පමණි. එය පවුල් දහයකට පමණ සීමා වී ඇත. එම තත්ත්වය ඇතිවීමට බලපෑ ගැටලු මෙහිදී අධ්‍යනයට ලක් කෙරේ.

පර්යේෂණ අරමුණු

- වාද්දුව වේරගම ප්‍රදේශයේ පැදුරු කර්මාන්තය පැවතුන ආකාරය සොයා බැලීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණයි.
- වර්තමානයේ පැදුරු කර්මාන්තය අභාවයට යාමට බලපෑ පාරිසරික හා සමාජීය හේතූන් අධ්‍යයනය කිරීම.
- නැවත මෙම ග්‍රාමය තුළ පැදුරු කර්මාන්තය සවිමත්ව ස්ථාපිත කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග හඳුනාගැනීම.

පර්යේෂණ ක්‍රමවේදය

විස්තරාත්මක පර්යේෂණ ගණයට ගැනෙන මෙම පර්යේෂණයේ පර්යේෂණ නියැදිය වශයෙන් වේරගම ග්‍රාමයේ දැනට ජීවත් වී සිටින පැදුරු කර්මාන්තයේ නිරතවී සිටි/සිටින. ගැමියන් දහ දෙනෙකුගෙන් (10) තොරතුරු ලබා ගැනීම සඳහා පර්යේෂණ ක්‍රමවේදය ලෙස සම්මුඛ සාකච්ඡා ක්‍රමය හා නිරීක්ෂණය භාවිත කරන ලදි. පර්යේෂණයේ ප්‍රාථමික අලිඛිත මූලාශ්‍රය ලෙස දත්ත දායකයන් ලබා දුන් තොරතුරු ද ද්විතීයික අලිඛිත මූලාශ්‍රය ලෙස පැදුරු කර්මාන්තය ආශ්‍රිත වීඩියෝ පටද ද්විතීයික ලිඛිත මූලාශ්‍රය ලෙස පැදුරු කර්මාන්තය ආශ්‍රිතව ලියවී ඇති ලිපි භාවිත කරන ලදි.

ප්‍රතිඵල හා සාකච්ඡාව

මෙම අධ්‍යනය යටතේ ලබා ගත් ප්‍රතිඵල වශයෙන් පෙනී යන්නේ වේරගම ග්‍රාමයේ ජන සංඛ්‍යාව ක්‍රමයෙන් වර්ධනය වීමත් පිට පළාත්වල ජනයා මෙහි පදිංචි වීමත් යන හේතූන් සඳහා හැල් කුඹුරු බොහෝමයක් ගොඩ කර නිවාස සාදා ඇති බවයි.තවද ගම්මුන්ගෙන් ලද තොරතුරු අනුව විවෘත ආර්ථිකය නිසාවෙන් ප්ලාස්ටික් පැදුරු, විවිධ ගෘහ උපකරණ භාවිතයට මිනිසුන් හුරුවීම නිසාවෙන් පැදුරු කර්මාන්තයෙන් ජනයා ඈත් වූ බවයි. මේ වන විට ගම තුළ අමුද්‍රව්‍ය බොහෝමයක් ශේෂව ගොස් ඇති අතර පොතු කොළ, ගිං කොළ ආදී කිහිපයක් පමණක් ඉතිරිව ඇති බවයි.තරගකාරී ජීවන රටාව හේතුවෙන් මෙම කර්මාන්තය මහලු පරපුරට පමණක් වර්තමානයේ සීමා වී ඇති බව අනාවරණය විය.

නිගමන සහ නිර්දේශ

වේරගම ග්‍රාමය ජනාකීර්ණ වීම, දෙවන හා තෙවන පරපුර කාලය විශාල වශයෙන් වැය කිරීමට අකමැති වීම හේතුවෙන් පැදුරු කර්මාන්තය ඉගෙන ගැනීමට අකමැති වීම මෙහිදී දක්නට ලැබුණි.නූතනයේ ග්‍රාමයෙන් වියැකී යන පැදුරු කර්මාන්තය යම් පමණකට හෝ රැක ගත හැක්කේ එහි වූ දැනුම බාල පරපුරට ලබා දීම හරහාය. ග්‍රාමීය පාසල හා දහම් පාසල හරහා පන් කර්මාන්තය ආශ්‍රිත අත්කම් තරඟ දරුවන් අතර ප්‍රචලිත කිරීම මීට කදිම විසඳුමකි. පාසල් හා දහම් පාසල් දරුවන් සඳහා පන් නිෂ්පාදන ආශ්‍රිත මල් වට්ටියක් අනිවාර්ය කිරීම. ආදිය යම් පමණකට හෝ පැදුරු කර්මාන්තය සුරක්ෂිත කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග වේ.

ප්‍රමුඛ පද: *මෝට්ට,ගල්ලැහැ,පන් මෝල,පන් කොටු,හෙට්ටු කරනවා*

ආශ්‍රිත ග්‍රන්ථ

සිල්වා, සී. (2019.09.21). *එදා වගේම අදත් වැදගත් පැදුරේ පුරාණය.* දේශය. https://www.deshaya.lk/article/51.

A.D. Creation Channel. (2021, Jul 5). *ලංකාවේ පාරම්පරික පැදුරු කර්මාන්තය* [Video]. YouTube. https://youtu.be/dq4Sxuz_iQY.

ක්‍රි.ව. 1818 විමුක්ති අරගලය හේතුවෙන් විනාශ වූ වෙල්ලස්සේ වාරි උරුමය පිළිබඳ අධ්‍යයනයක් (බිබිල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය ඇසුරින්)

කේ. එච්. එම්. ආර්. ඩී. මල්කාන්ති
පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
rasikamalkanthi1122@gmail.com

හැඳින්වීම

ඉංග්‍රීසීන් විසින් ශ්‍රී ලංකාව යටත්විජිතයක් බවට පත්කර ගැනීමෙන් පසු ඊට එරෙහිව පළමු විමුක්ති අරගලය ක්‍රි.ව.1818 දී පැන නැඟී ඇත්තේ නූතන උඟව පළාතෙනි. මෙම විමුක්ති අරගලය ඉංග්‍රීසි පාලකයන්ගේ දැඩි මර්දනයට හසුවන අතර විශාල ජන සංහාරයක් ද සිදු වේ. වෙල් ලක්ෂයකට දියවර සැපයූ වෙල්ලස්සේ වැව්, අමුණු බ්‍රිතාන්‍යයන්ගේ මර්දනකාරී ප්‍රතිපත්තිය හේතුවෙන් විනාශ විය. උඩරට රාජධානි සමයේ උඟව වෙල්ලස්සට අයත් නූතන බිබිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින් මෙම අධ්‍යයනය සිදු කරනු ලැබී ය. අරගල සමයේ දී විනාශකරන ලද වැව් ලෙස අඹගොල්ල ආසන්නයේ පිහිටි වටවල වැව, උස්සාගල වැව, බිහිරි වැව ද කොටගම ආසන්නයේ ඇති මාලිත්පොත වැව ද කුරුවාඹ ප්‍රදේශයේ බොක්කේමඩවල වැව ද හඳුනාගත හැකි ය. උස්සාගල වැවේ හා වැව් බැම්මේ ඇතැම් ස්ථාන පමණක් දක්නට ලැබේ. කුරුවාඹ ගම්මානයේ පැවති බොක්කේමඩවල වැව පිළිබඳ සාධක ද හඳුනාගත හැකි විය. ඇතැම් වැව් වර්තමානයේ ප්‍රතිසංස්කරණය කර තිබේ. මෙම වැව් සකස් කිරීමේ දී පාරම්පරික ක්‍රමවේද භාවිත කර ඇති බව ශේෂ වී ඇති සාධක අනුව පැහැදිලි විය. එක් ගමකට එක් කුඩා වැවක් හෝ තිබෙන්නට ඇති බවත් ඒවා අරගල සමයේ දී විනාශකර ඇති බවත් අධ්‍යයනය තුළින් හඳුනාගත හැකි විය. වෙල්ලස්ස අරගලය සිදු වී වර්තමානය වන විට වසර 200ක් ඉක්මවා ගොස් තිබේ. නමුත් අරගලයෙන් සිදු වූ හානියේ ප්‍රතිවිපාක වර්තමානයේ ද විවිධ ක්ෂේත්‍ර තුළ දක්නට ලැබේ. අරගල සමයේ දී වැව් අමුණු රාශියක් බ්‍රිතාන්‍යයන් විනාශ කර ඇති බව මූලාශ්‍රයගත සාධක හා ක්ෂේත්‍ර අධ්‍යයනය තුළින් හඳුනාගත හැකි ය. වෙල් ලක්ෂයකට ජලය සැපයූ වෙල්ලස්සේ වාරි උරුමය පිළිබඳ වර්තමානයේ ශේෂ වී ඇති සාක්ෂි ඔස්සේ අධ්‍යයනය කිරීම වැදගත් වේ.

පර්යේෂණ ගැටලුව, පර්යේෂණ අරමුණු

අරගලයෙන් විනාශ වී ගිය වෙල්ලස්සේ වාරි උරුමයේ ස්වරූපය කෙබඳුද? යන්න අධ්‍යයන ගැටලුව විය. අරගලයෙන් වසර දෙසියයකට පසුව වෙල්ලස්සෙහි පැවති සශ්‍රීක බව පිළිබඳ අධ්‍යයනය කිරීම වැදගත් වන අතර අරගලයෙන් විනාශ වූ වෙල්ලස්ස ප්‍රදේශයේ පැවති වැව් පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනයේ ප්‍රමුඛ අරමුණ විය.

පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනයේ දී ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ ක්ෂේත්‍ර අධ්‍යයනය, සම්මුඛ සාකච්ඡා හා මූලාශ්‍රය පරිශීලනය මගින් දත්ත රැස්කරගනු ලැබී ය. සම්මුඛ සාකච්ඡා පැවැත්වීමේ දී විධිමත් නොවූ සම්මුඛ සාකච්ඡා පැවැත්වීම සිදු වූ අතර අරගල සමය පිළිබඳ තොරතුරු ලබාගැනීම සඳහා මෙම යුගය පිළිබඳ ලියවූ විදේශිකයන්ගේ මූලාශ්‍රය ද භාවිතයට ගනු ලැබී ය. මූලාශ්‍රය, ක්ෂේත්‍ර අධ්‍යයනය හා සම්මුඛ සාකච්ඡා මගින් ඒකරාශිකරගත් තොරතුරු වර්ගීකරණය කර, විශ්ලේෂණය කරමින් නිගමනවලට එළඹෙනු ලැබී ය.

ප්‍රතිඵල හා සාකච්ඡාව

වෙල් ලක්ෂයක් අස්වැද්දීමට ජලය සැපයූ වැව් අමුණු ද අරගල සමයේ දී විනාශ කරන ලදි (De Silva , 1995, p. 179: මාර්ෂල්, 2004, පි.158). එලෙස විනාශ කරන ලද බිබිල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් වැව් කිහිපයක් පිළිබඳ තොරතුරු ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී හඳුනාගත හැකි විය. අඹගොල්ලේ පිහිටි වටවල වැව හා බිහිරි වැව, කොටගම ආසන්නයේ ඇති මාලිත්පොත වැව, අඹගොල්ල ආසන්නයේ ඇති උස්සාගල වැව, කුරුවාඹ ප්‍රදේශයේ ඇති බොක්කේමඩවල වැව අතර වේ. අඹගොල්ල ආසන්නයේ ඇති උස්සාගල වැව අරගලය සමයේ බිඳදමා ඇත. එහි වැව් බැම්මේ ඇතැම් ස්ථාන පමණක් හඳුනාගත හැකි විය. වැව පිහිටා තිබූ ප්‍රදේශයේ හා වැව් බැම්ම පිහිටි ප්‍රදේශයේ වර්තමානය වන විට ජනාවාස ව්‍යාප්තව ඇති ආකාරය හඳුනාගත හැකි ය. බිබිල ආසන්නයේ ම ඇති කොහුකුඹුර ගම්මානයේ වැව් දෙකක් තිබූ බව ගැමියන්ගේ මතයයි(ආර්. ඒ. නිමල් රණසිංහ, අවු: 47, සම්මුඛ සාකච්ඡාව, 2019). වර්තමානයේ එම වැව් පැවති ප්‍රදේශ ජනාවාසකරණය වීම හේතුවෙන් වැවක නටබුන් හඳුනාගත නොහැකි ය. බිබිල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් කුරුවාඹ ගම්මානයේ උඩවල ලන්ද නමින් හැඳින්වෙන කඳුකර ප්‍රදේශයේ බොක්කේමඩවල වැව පැවති බවට සාක්ෂි දක්නට ලැබේ. ඒ අනුව අරගල සමය වන විට වැව් ව්‍යාප්ත වී ඇති ආකාරය දෙස බැලීමේ දී එක් ගම්මානයකට හෝ ගම්මාන දෙකකට එක වැවක් බැගින් තිබෙන්නට ඇතැයි අනුමාන කළ හැකි ය. 1818 අරගලයෙන් පසුව වෙල්ලස්සට සිදු වූ වෙනත් විනාශයක් පිළිබඳ මූලාශ්‍රයවල සඳහන් නොවේ. වර්තමානය වන විට අරගලය සිදු වී වසර 200ක පමණ කාලයක් ඉක්මවා ගොස් ඇති අතර මෙම අරගල සමයේ දී ම වැව්, අමුණු විනාශකර ඇති බව පැහැදිලි වේ. ක්‍රි.ව. 1891 වන විටත් උඟව උප දිසාපති වාර්තාවල ජනගහනය හෝ වැව් අමුණු පිළිබඳ සඳහන් නොවේ. නමුත් 1901 සිට ඇතැම් ප්‍රදේශවල ජනගහනය සීමිත ප්‍රමාණයක් සිටි බව හා ගම්මාන පිළිබඳ සඳහන් වේ(Assistant Government Agent's Report, Uva, 28th Feb. 1930).

නිගමන හා නිර්දේශ

බ්‍රිතාන්‍යයන් උඟව වෙල්ලස්ස විනාශ කිරීමට අනුගමනය කළ මර්දනකාරී ප්‍රතිපත්ති හේතුවෙන් උඟව වෙල්ලස්ස ප්‍රදේශයේ වැව් අමුණු විනාශ වී ඇති බව පැහැදිලි විය. ශ්‍රී ලංකාවේ සශ්‍රීක ප්‍රදේශයක් වූ වෙල්ලස්ස ප්‍රදේශයයේ වැව්, අමුණු විශාල ප්‍රමාණයක් පැවති බවත්, ඒවා අරගල සමයේ විනාශකර ඇති බවත් මෙම අධ්‍යයනය තුළින් තහවුරු විය. වෙල්ලස්ස පුරා ව්‍යාප්ත වූ කුඩා වැව් පද්ධතියක් පැවති බවත් ඒවා උපයෝගි කරගෙන වෙල් ලක්ෂයක් අස්වද්දන්නට ඇති බවත් අනුමාන කළ හැකි ය. 1818 අරගලයෙන් වසර දෙසියයකට පසුව වුව ද මෙම වැව් භාවිතයට ගත හැකි ආකාරයට සකස්කරගත හැකි බව පැහැදිලි වේ. මෙම වැව් ප්‍රතිසංස්කරණය කර වෙල්ලස්ස ප්‍රදේශය ස්වයංපෝෂිත කිරීමට දායක කරගැනීම කාලෝචිත ය.

ප්‍රමුඛ පද: *වාරි තාක්ෂණය, පාරම්පරික දැනුම, කුඩා වැව්, විනාශ වූ වැව්*

ආශ්‍රිත ග්‍රන්ථ

(1930). *Assistant Government Agent's Report: Uva*.

De Silva, C. R. (1995). *Ceylon Under The British Occupation*. Navarang Booksellers and Publishers.

මාෂල්, එච්. (2004). *සිංහලේ.* ඇල්ලේපොල එච්.ඇම්. සෝමරත්න. (අනු.). විසිදුනු ප්‍රකාශකයෝ.

A Study of the Hot-Water Bath Building at the Ancient Buddhist Monastery in Rajagala, Sri Lanka

M. D. I. K. Abeynayake
Department of History and Archaeology, University of Sri Jayewardenepura, Sri Lanka
inojabey@gmail.com

Introduction

This study is based on health and hygiene of the Buddhist monks who had resided in monasteries in Sri Lanka, the Janthāghara as a special kind of building to maintain the health of the monks who suffered from diseases due to consumption of rich diets and lack of physical exercise during their dwell in the monasteries (Maithreye and Jinananda, 2005). According to the literary sources such as Pārājikāpāli, Pācittapāli, Mahāvaggapāli, Cullavaggapāli, Pālimuttaka Vinayaviniścaya, and Caraka Saṁhitā, the Janthāghara called Aggiśālā has been used to make one of the steam bath therapies to help to release sweat and burning of unnecessary fat in the body (Bandaranayake, 1974: Kulatunga, 2021). According to the ancient chronicles, after the arrival of Mahinda Thera, Janthāghara was introduced to the monks of the first monastery built in Anuradhapura (Mahāvaṁśa, 1959), and later, this building was established in every monastery complex in the country. The Rajagala is one of the places where the monks had been following meditation activities since the 3rd century BC in the Anuradhapura era, and it was a well-built Buddhist monastery connecting some special buildings such as Janthāghara for the residential monks.

Research Problem/s, Objective/s

This study aims to recognize the existing architectural features as well as the activities of Janthāghara according to Buddhist and Ayurvedic literary sources, and particularly, the research focused on investigating 'whether Rajagala Janthāghara had been built with the influence of the literary sources such as Buddhist as well as Ayurvedic instructions.'

Materials and Methods

According to the deductive research approach, qualitative and quantitative methods were used for investigating the field survey, interviewing relevant scholars, and using literary sources. The field survey had systematically been conducted with the drawings related to the field excavation held in 2016, then, chronicles, particularly, the code of disciplines (Vinayapitaka) was compared with survey data in archaeological remains in the building furthermore to analyze the data with the support of the Ayurvedic medical texts as well.

Results and Discussion

The study revealed that this building had consisted of main construction features such as entrance gates, walls, stone-paved central depression (water container), stone pavilions, drain, stone pillars, small rooms, and a fireplace. The foundation which was built using stone strengthened and to some degree high to confirm the guidance of Vinaya, which was said to build Janthāghara on the high ground (Maithreye and Jinananda, 2005). The wall made of bricks has extended to four sides. At present, it can be seen as only seven layers. Furthermore, evidence of the wall verified that Vinaya was the source to follow guidelines to use masteries such as stone, bricks, and wood to construct Janthāghara wall. Moreover, the Maṇḍalikā had been used to protect the wall at that time. So far, the evidence is not enough to prove it. A short stone wall attached to the main wall had been built around the inside of the building in the form of a low slab. It may have been designed to keep equipment or other items. Caraka Saṁhitā pointed out that a short bench built inside the main wall had been made of clay (Kumarasinghe, 1991). The central depression can be considered the main feature, which is visible in the Janthāghara building in Sri Lanka. Each central depression had been built with rough stone since it had been used as a bathing place where the water dropped to the ground. Following the Vinaya, the floor of the building had been paved with brick, stone, or wood (Maithreye and Jinananda, 2005). A closed drainage system made with stone slabs had been used to transport the water collected inside the central stone bath area, which starts on the

west side, flows the contaminated water through a closed drain about 6 m to the west boundary wall of the building and another 6 m outside into an open drain. Furthermore, the Vinaya also allowed to use a sluice to drain water (ibid, 2005). Also, text in this regard provided evidence that a stone-paved chamber was used as a dressing room for the bathing place. Rajagala provided evidence of such a pavilion adjoining the central bath depression, which was constructed with paved stone. Adjacent to the south wall, two rooms paved with stone slabs can be seen, and it is believed that these chambers were used by the monks to store equipment or various types of medicine materials. The Pālimuttakavinaya states that when the elder monk enters the building, the trainee monks (Samanera) must provide facilities such as a chair, water, etc., and other necessities that they need (Pannasara & Amaramoli, 1931). The fireplace had been used to prepare hot water for the monks who needed to bathe to maintain good health. Sven furnaces are made of a series of bricks, stones, tiles, and mortar attached to the western wall of the building. According to the Vinaya, the furnaces should be built on one side and in the middle of the Janthāghara. Furthermore, the furnaces should be constructed on one side of a small Janthāghara and center of the large Janthāghara (Maithreye and Jinananda, 2005).

Conclusion and Recommendations

Considering all archaeological evidence, I would like to suggest that the Rajagala Janthāghara was a building used to maintain the hygiene of the monks who resided in the monasteries. The definition of the Janthāghara made a clear image of a Sauna-type building as well as a hot water bathing place that can be used to emit sweat from the human body. While constructing this building for the monks, they may have used Vinayapitaka as a source of guidance in erecting all the features associated with the concept of Buddhism. According to the literature, Janthāghara must be a closed building with some structures. However, the lack of evidence to identify the roof and the wall which goes around the building makes it difficult to identify structures with their true positions. Nnevertheless, Janthāghara had been built in accordance with the Buddhist code of discipline as well as the experience of traditional ayurvedic medicine.

Keywords: *Hot water, Hygiene, Janthāghara, Rajagala, Vinayapitaka*

References

Anada Maithreye, B., and Jinananda, U. (Eds.). (2005). *Cullavaggapāli* (pp 43-56). Buddhist Cultural Centre.

Bandaranayake, S. (1974). *Sinhalese Monastic Architecture*. (pp. 297-307). Leiden.

Kulatunga, T.G. (2021). Janthāghara within ancient Buddhist monasteries (Ed.), *Hero-Stone at Anuradhapura, and other essays* (pp 41-63). Buddhist Culture Centre.

Kumarasinghe, A. (Ed). (1991). *Caraka saṁhitā*. (Pp 265-268). Department of Ayurveda.

Pannasara, D. & Amaramoli, W. (Eds). (1931) *Pālimuttaka Vinaya Viniccaya Sangrahaya* (pp 225-226). Colombo.

Incorporation of Sound and Light Shows in Revitalizing the Military Heritage of Galle Fort in Sri Lanka

I. G. R. N. Wimalasuriya* and K. M. Alexander
Department of History and Archaeology, University of Sri Jayewardenepura, Sri Lanka
**raviniwim@gmail.com*

Introduction

Having been built in 1588 by the Portuguese, extensively fortified by the Dutch and upheld by the British, the Galle Fort was the major stronghold of the island's southwest coast during the colonial period of Sri Lanka. This fortified city has served the purposes of military, residential, administrative and trade, since its inception. 'The Old Town of Galle and its fortifications' has been inscribed as a UNESCO Cultural World Heritage in 1988. Although centuries have passed since its establishment, this old town continues as a living urbanscape. The surrounding rampart and its associated defensive works are in an averagely preserved state after several conservation interventions made by the heritage management institutions. Presently (2022), a project is underway to conserve the defensive works with the aim of enhancing the interpretive visitor presentation of this heritage site.

Research Problem/s, Objective/s

The fortification, including all defensive works, was one of the attributes produced when inscribing the Galle fort as a UNESCO World Heritage. However, during the pre-research, it was identified that the level of on-site interpretation of the aforesaid military heritage is insufficient. Meanwhile, the same study revealed the potentiality of utilizing digital interpretation techniques at Galle fort, specifically Sound and Light shows (Wimalasuriya, Kapukotuwa, & Ranasinghe, 2022). Hence, the aim of the present study was enhancing the level of on-site interpretation and the objectives were optimizing the nocturnal tourism of the site and launching a revenue generation source for the country's economy. Accordingly, this research conducted a feasibility assessment followed by an operational plan, to introduce a third-generational Sound and Light show in Galle Fort, for the first time on a Sri Lankan heritage site.

Materials and Methods

Since no previous attempts on third-generational Sound and Light shows were in Sri Lankan heritage sites, the 'On-site Digital Heritage Interpretation Development Framework for Cultural Heritage Sites of Sri Lanka', developed by the present author in the preceding research (Wimalasuriya, Kapukotuwa, & Ranasinghe, 2022), and Zhiyue Zhang's framework to analyze Sound and Light shows (Zhang, 2019) were adopted in the present study, in assessing the feasibility and developing its operational plan. Specifically, the criteria under the headings of 'Narrative', 'Infrastructure' and 'Sites', in Zhang's framework were overlaid with the criteria under the phases of 'Assess' and 'Design,' in Wimalasuriya's Sri Lankan framework, in assessing the feasibility. To ascertain a better understanding of the actual context, diverse data were collected from Dec 2019-May 2022, via in-depth interviews, field observation, online reviews analysis and a literature survey.

Results and Discussion

The combined results of the criterion analysis of Physical accessibility, sufficient audience space, Social impact assessment and controlled accessibility revealed that the outmost terrace of the 'Zwart Bastion (Black Fort)' (figure 1) is the optimal location for setting up a third-generational Sound and Light show, out of the 14 bastions in the fort. Although the said bastion is currently occupied by the Department of Police and is inaccessible to the public at present (2022), relevant measures have already been proposed to relocate the said usage and ensure constant accessibility for heritage purposes. The curved façade on the Zwart bastion, made of coral stone and granite, was selected as the display surface for the video projection and 'Projection Mapping' technique was found necessary to accommodate the projection's perspective effects. The decay assessment on stone fabrics caused by the proposed video projection resulted in no 'none/insignificant impact' on the fabric deterioration. As for infrastructural requirements,

upon comparative calculations done, one 20,000 lumens video projector was found sufficient, given the area of the projecting façade, along with several other light equipment to create optical illusions. Further, several audio devices were found required to create audio effects (depending on the narrative) and to minimize sound disturbances to the neighborhood, while delivering the best experience to the spectators. Reversibility of the above infrastructural installments (including seating) resulted as attainable and less impact was identified on the visual setting during the daytime. The analysis of the recommended time length resulted in 30-40mins and several themes were identified for the narratives (i.e. 'Capturing of the Portuguese Fort by the Dutch and Kandyan Troops, Evolution and utilization of Galle Harbour since ancient times, etc.). Renewal of narratives every 2-3 years found required to secure diversity and novelty. Encouraging public-private partnerships for initial investment, design, operation and maintenance were found optimal for the proposed Sound and Light show and online pre-reservation was found necessary. Furthermore, 'Ensuring a multi-disciplinary study approach', 'Integrating with the scope of the existing site interpretation strategies', 'Credibility of information', 'Content evaluation and verification', 'Cultural accessibility', 'Periodic evaluation and optimization', and 'Research and Development' were identified as essential.

Conclusion and Recommendations



Figure 1. Proposed location for the Sound and Light show on the 'Zwart Bastion (Black Fort)'

Accordingly, the present research recommends introducing a third-generational Sound and Light show at the Zwart Bastion and trusts its ability in achieving the effective message delivery and emotional rendering of the military heritage of the Galle fort. In addition, the methodology adopted in this research could be utilized in assessing the feasibility and preparing operational plans for other potential Sri Lankan sites as well. Furthermore, this research study sees the potential of introducing first and second generational Sound and Light shows for heritage interpretation, subjected to a detailed assessment.

Keywords: *Galle fort, Heritage Interpretation, Military heritage, Sound-and-Light shows*

References

Acosta, C. V. (2013, June). Light Shows and Narratives of the Past. *International Journal of Historical Archaeology, 17*(2), 332-350. doi:10.1007/s 10761-013-0224-3

Wimalasuriya, R. N., Kapukotuwa, A., & Ranasinghe, G. (2022, January 01). Conceptual Framework for On-site Digital Interpretation Developments in Cultural Heritage Sites. *Vidyodaya Journal of Humanities and Social Sciences, 7*(1), 64-84. doi:http://doi.org/10.31357/fhss/vjhss.v07i01.04

Zhang, Z. (2019, May). *Preservation in the dark: Current Trends and Future Prospects for Son-et-Lumiere in China.* Columbia: Graduate School of Architecture of Columbia University. Retrieved from https://academiccommons.columbia.edu/doi/10.7916/d8-hjss-mk49

An Overview of the Dismantling of Kotte Rampart and the Utilization of Kotte Rampart as a Tourist Site

E. M. D. G. K. Perera*[1] and A. G. N. Muthumini[2]

[1]Department of Philosophy and Psychology, University of Sri Jayewardenepura, Sri Lanka, [2]Department of Criminology and Criminal Justice, University of Sri Jayewardenepura, Sri Lanka

**gavindukawishka@gmail.com*

Introduction

People have employed wall-protected fortress cities to protect from enemies. For instance, Machu-Picchu, China can be elaborated, and Sri Lanka has several similar constructions too. Most of these peripheral walls and cities were conserved as tourist attraction sites to generate revenue. Galle fort, Jaffna fort, and Yapahuwa are similar examples, and Sri Jayewardenepura Kotte, which was the seventh kingdom of the country, was first built as a fortress and later reformed into an all-inclusive city, also has a similar peripheral wall. The Kotte fort had several war tactics and strategies mostly adopted from the "Ummagga Jataka Story", and the peripheral wall was one of the main war strategies the Kotte stronghold used against its invaders. The term rampart has been defined as "a large wall built around a town, castle, etc. to protect it" by the Cambridge dictionary. "Kabook", or the laterite rock which can be found in the Kotte area, was the element used to build it. The wall was resilient so that it could tolerate the weight of elephants during the "perahara". The beauty and splendor that the Kotte Rampart once held are described in great detail in several writings by both domestic and foreign authors, and the glory is still visible in the remaining portions of the wall. Even though Kotte rampart used to be the city's shield and guardian, its fate and level of civility are pitiful. This remarkable ancient site can be developed and conserved as a tourist site and earn more foreign income through upgrading to the tourist market.

Research Problem/s, Objective/s

Identifying the origin of the tradition of dismantling the rampart and the current utilization of Kotte Rampart as a tourist attraction site to earn revenue were the primary and secondary objectives of the research.

Materials and Methods

The research used both primary and secondary data. Primary data was collected under the snowball sampling method from residents of Kotte City through interviews. In addition, some primary information was collected through direct observations at selected research areas. In order to distinguish its significance, secondary sources; such as books, journal articles, and related literature were gathered.

Results and Discussion

Both Cuoto and Queyroz who were Portuguese travelers, had described the glory of the Rampart and they mentioned that they were mesmerized by the technology the Sinhalese had regarding fortification. Nikaya Sangrahaya described that the rampart was made out of granite stones and fortified with iron spikes, a mechanism resembling the mouth of a tiger, and iron tools similar to horns. Moreover, to that, security pillars, poisonous panels, machines to kill nearby enemies, and bastions were made to fortify the defense of the rampart. After a siege that lasted for years, led by King Rajasinghe I, the Portuguese decided to abandon the city and dismantle it. The tradition of dismantling Kabook can be traced back to the Portuguese era. When they abandoned the city, they ordered the native inhabitants to dismantle kabook rocks and bring them to Colombo city to build a new fortress there. Later, during the British Colonial period, they dismantled the outer ramparts, inscriptions inscribed pillars to street on construction, and encouraged the natives to engage in such activities to demean the pride Sinhalese once held. The streets were laid in between the rampart and the rampart got disconnected from several locations, and continued development of Kotte city as the contemporary capital of Sri Lanka has also negatively affected the remaining archeological monuments. Commercialization of the city has created more attractions for

people to purchase land from Kotte. Due to this, the area is massively occupied by residents and most of the land overlaps with archeological sites. Whenever landowners discover a worthwhile archeological inspection, they intentionally either destroy or cover it with soil and avoid reporting it to the Department of Archeology. Furthermore, demand for wide roads and street networks increased, hence roads were constructed by the government by dismantling a selected part of the rampart. Less or cipher infrastructure and sanitary facilities for the tourists, insufficient awareness regarding the history of Kotte, unavailability to access most of the remaining archeological sites in Kotte, and, lack of guidance from the tourism board and other government agencies are preventing visitors from stopping at Kotte as a tourist site.

Conclusion and Recommendations

The Kotte rampart was not a mere wall erected by aristocrats but was a crucial part of the Kotte Kingdom. The rampart has been given insufficient emphasis as an archeological and tourist attraction site. The current Antiquity ordinance after the amendment state only Rs. 50,000 fines should be revoked to increase fines, and surveillance for the safety of the rampart must be enacted. Kotte rampart, which is 9km away from Colombo, could be developed as a tourist attraction site to generate revenue and new employability for residents. A few suggestions can be explicated as, creating infrastructure facilities around the Kotte archeological monuments, promoting the remaining archeological sites and the glory of the rampart to visitors, and creating new jobs and economic advantages for local inhabitants by making the rampart a tourist site, printing more leaflets, brochures, and books regarding the importance of Kotte and Rampart. Kotte rampart, which was once the protecting ring of the realm, can be used as one of the protecting rings for tourism that will still affirmatively impact the country's development.

Keywords: *Kotte Rampart, Sri Jayewardenepura Kotte, King Parakrambahu VI, Tourism*

References

Fonseka, P. (2010). The Ancient City of Koṭṭe and its Fortification. *Journal of The Royal Asiatic Society of Sri Lanka*, 56, 57-117. https://doi.org/192.248.32.234.

Perera, E.W. (1951). Jayawardenepura Rajadhaniye Kotuwa. *Silumina*. p. 151.

Piyadasa, A. (2017). *Kotte Heritage 2: The Ramparts and the Moat - Sri Lanka Archaeology.* Sri Lanka Archaeology. https://www.archaeology.lk/kotte-heritage-2-the-ramparts-and-the-moat/.

Somaratna, G.P.V. (1969). *Political history of the kingdom of Kotte* (c. A.D. 1400-1521). [PhD Thesis, University of London). University of London.

The Censorship Culture of Rabaliya Pattini Devalaya

B. Weerasuriya
Department of Archaeology, University of Peradeniya, Sri Lanka
buddisha96@gmail.com

Introduction

The Pattini cult is one of the major religious beliefs found throughout Sri Lanka. Sri Lankans perform rituals on behalf of Goddess Pattini to bless with fertility, eradicate plagues, as well as to bless young children and pregnant mothers. Special rituals designed for the above purposes are associated with the Pattini cult. The rituals performed on behalf of Goddess Pattini are special as they are usually associated with rituals as well as dancing and sports. These habits vary from region to region. The study of cultural censorship (killa) often reveals the censorship imposed on women in society. Censorships for women are often found among many cultures of the world. But cultural censorship of men is minimal. However, this study looks at a cultural censorship imposed on men and women in general. Another speciality here is the study of an unpopular censorship tradition regarding the Pattini cult, which imposes various censorship, especially on women. No matter how innovative, the basis for implementing such censorships in these lowland villages is studied with special attention. Although Gananatha Obeyesekare focused on this area in his research (Obesekara, 1984), he has not focused on the more active censorship in the area and no other field research has been conducted since that study. This study focuses on the traditional philosophy of the Rabaliya Devalaya and its associated culture, which has not yet been formally studied.

Research Problem/s, Objective/s

The research problem of this study is mainly focused on whether different traditions related to the Pattini faith can be identified in the traditional villages. This study focuses on censorship associated with the Pattini cult, which is still in use in low-country villages in Sri Lanka. This study will be an important case study to find out whether the discrimination against different sections of society found in the Great Tradition is also found in the Minor Tradition.

Materials and Methods

The basic research methodology is the ethnographic analogy. In that methodology, ethnological data are analyzed in parallel with archaeological data (Ancient buildings, coins, manuscripts). Due to the lack of support from literary sources as a method of study, the researcher basically had to stay in the field for several days and work with those residents of the village and engage in research. The area selected for the study is the Rabaliya Devalaya and the adjoining village which is located in the Udugala Kanda Grama Niladhari Division of the Bulathsinhala Divisional Secretariat in the Kalutara District. From Bulathsinhala, one has to take the Ayagama Road via Agal Oya and turn right at Udugalakanda Junction and travel for about 5 km to reach the Rabaliya Pattini Devalaya. From Udugalakanda Junction there is a very difficult road to reach Rabaliya. The area bounded by a natural water stream is considered the devoted area of Goddess Pattini.The data which are obtained in the field are analyzed along with theories of different cultures and interpretations of how concepts such as censorship still operates today. Here, the concept of Kili is identified and studied as censorship.

Results and Discussion

The Rabaliya Pattini Devalaya and the surrounding villages, which are the focus of this study, appear to have different religious traditions than other areas. The specialty is that the customs have been preserved by the villagers to the present day. A natural canal has to be crossed to enter the village around the Rabaliya Devalaya. The part surrounded by that waterway is dedicated to Goddess Pattini. Rituals for Goddess Pattini are performed in this section. The cultural censorship focused on in this research is related to the concept of Kili. Some of these kili are restricted to females and some kilis are common to both males and females. They are, Malwara killa (Puberty), Mās killa (Menstruation), Wadum gē killa (Birth of a child), Awamagul Killa (Funeral), Mānsa Killa (Eating meat) and Surā Killa (Alcoholism).

Anyone with the above kili is subject to cultural restrictions on this land. Populism refers to the tragic events that befell those who violated these laws. Therefore, the villagers, regardless of generation, are afraid to violate this customary rule. The devotees of the Devalaya can also observe a number of rituals associated with the Rabaliya Devalaya to protect it from chaos and to keep the Devalaya clean.

One of the peculiarities of the Rabaliya is that the censorship is limited to the concept of Kili. Kili, for example, has banned women from joining the cult. But a woman called "Kapu Amma" has been set aside for the religious beliefs of Rabaliya. In Rabaliya there is the possibility of associating with rituals without any distinction between men and women. Discrimination against women is not so prevalent in other places where the Pattini cult is practised.

In traditional beliefs, we usually hear of a man named "Kapu Mahaththaya", but the mention of a man named "Kapu Amma" here is significant. "Kapu Amma" is mentioned in the traditional stories and poems of the Rabaliya area. Although Goddess Pattini is a woman, Pattini has a very low place for women in the cult. But the situation in Rabaliya is very different. This is popular in society but can be considered a condition that needs to be popularized.

Another amazing censorship in Rabaliya is the inability to replace the ancient Devala building. Rabaliya Pattini Devalaya is a very small devalaya made of clay and lime mortar. It has been repaired in its original form for centuries but has been banned from making new additions, changes in length and width, and painting. Stories about this censorship also appear in folklore. The above are basically two types of cultural censorship and how the villagers of Rabaliya deal with them. These behaviours represent a different situation than those in other areas related to cultural censorship. This censorship culture reveals the traditional philosophy of the villagers that we usually do not pay attention to.

Conclusions and Recommendations

The above research has basically revealed how the censorship culture associated with the Rabaliya Pattini Devalaya differs from the censorship associated with the Pattini cult. This research reveals that the Rabaliya Pattini Devalaya is more progressive than other villages. Also this can be considered a revelation of the life philosophy of the people living in the traditional villages. The essence of the village philosophy of life, such as respect for women, purity, protection of women, and the dedication of time, money, and labour to spiritual advancement without wasting material resources, is illustrated by a focus on the culture of censorship associated with Rabaliya. Several suggestions can be made after this study. It is important to note and preserve the traditional features of the village as Rabaliya is still a village that has preserved its ancient traditional form. The second important point is to promote at the national level the culture of non-discrimination that is prevalent in the Rabaliya Devalaya.

Keywords: Censorship Culture, Concept of Kili, Pattini Cult, Rabaliya Devalaya

References

Liyanagamage, A. (2008). *Society, State and Religion in Pre-modern Sri Lanka*. Social Scientists Association.

Obesekara, G. (1984). *The Cult of Goddess Pattini*, University of Chicago Press.

Weerasuriya, W.L.A.B.J., Rajanayake, R. M. C. P. K, & Hewawasam, S. S. (2019). *A philosophical analysis on the alienation of women in the Sri Lankan culture with special reference to the concept of Kili.* Annual Research Symposium. Department of Sinhala, University of Colombo. p.52.

රුවන්වැලි සෑ ස්තූප කර්මාන්තය ඇසුරින් පුරාණ ශ්‍රී ලංකාවේ ස්වාභාවික සම්පත් ව්‍යාප්තිය හා පරිහරණය පිළිබඳ සාහිත්‍ය මූලාශ්‍රයගත තොරතුරු විමර්ශනයක්

ජී. කේ. විදානපතිරණ*සහ ඩී. එල්. රණගල
ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
**pathiranagayathri@gmail.com*

හැඳින්වීම

ප්‍රාථමික සාහිත්‍ය මූලාශ්‍රයවල පුරාතන ශ්‍රී ලංකාවේ ස්වාභාවික සම්පත් ව්‍යාප්තිය, පරිහරණ හා ඒ ආශ්‍රිත කර්මාන්ත පිළිබඳ තොරතුරු සඳහන්ව ඇත්තේ අල්ප වශයෙනි. දුටුගැමුණු රජුගේ (ක්‍රි.පූ. 161-137) රුවන්වැලි සෑ ස්තූප කර්මාන්තයේ දී ඒ සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සපයාගැනීම පිළිබඳ සාහිත්‍ය මූලාශ්‍රයවල ඇතුළත් තොරතුරු එහිදී සුවිශේෂ වැදගත්කමක් ගනී. රුවන්වැලි සෑය ඉදිකිරීමේ දී අවශ්‍ය ගඩොල්, රත්නන්, තඹ, රිදී, මුතු සහ මැණික් සපයාගැනීම පිළිබඳ මහාවංසයේ විසිඅටවන පරිච්ඡේදයේ සවිස්තර සටහනක් හමුවේ. මීට බොහෝදුරට සමාන විස්තරයක් කාම්බෝජ මහාවංසයේ, වංසත්ථප්පකාසිනියේ හා ථූපවංසයේ ද දැක්වේ. මෙම සෑම මූලාශ්‍රයකම හඳුනාගත හැකි පොදු ලක්ෂණය නම් ආශ්චර්යවත් සිද්ධි දාමයක් හා බැඳුණු ප්‍රවාදගත කතාන්දර වශයෙන් එම තොරතුරු ඉදිරිපත් කර තිබීමයි. එළාර සමඟ කළ දීර්ඝ කාලීන යුද ව්‍යාපාරය නිසා පීඩාවට පත්ව සිටි ජනයා තව තවත් පීඩාවට පත් නොකොට දුටුගැමුණු රජතුමා ස්තූප කර්මාන්තය සිදු කිරීම දැක්වීමේ අරමුණින් දිවයිනේ නොයෙක් දෙසින් වටිනා වස්තු පහළ වූ බව වාර්තා කිරීම පූර්වෝක්ත සියලු වංසකතාකරුවන්ගේ පරමාර්ථය වූ බව පෙනේ.

පර්යේෂණ ගැටලුව, පර්යේෂණ අරමුණු


රුවන්වැලි සෑය ඉදිකිරීමේ දී ද්‍රව්‍ය සපයාගැනීම පිළිබඳව පූර්වෝක්ත මූලාශ්‍රයවල අන්තර්ගත ආශ්චර්යමත් සිද්ධි බැහැර කළ කල්හි, අනුරාධපුර යුගයේ ස්වාභාවික සම්පත් ව්‍යාප්තිය හා පරිහරණය සම්බන්ධව කොතරම් දුරට නිවැරදි තොරතුරු හෙළිවේ ද? යන්න පර්යේෂණ ගැටලුව වේ. එම තොරතුරුවල පවතින නිරවද්‍යතාව වර්තමානයේ පවතින භූ විද්‍යාත්මක දැනුම, ස්වාභාවික සම්පත් පිළිබඳ දැනුම යොදාගනිමින් පර්යේෂණාත්මකව විමසා බැලීමක් මෙතෙක් සිදු වී නොමැත. ඒ අනුව මෙම පර්යේෂණයේ දී රුවන්වැලි සෑය ඉදිකිරීමේ දී ද්‍රව්‍ය සපයාගැනීම සම්බන්ධව මහාවංසය ප්‍රමුඛ සාහිත්‍ය මූලාශ්‍රයවල ඇතුළත් තොරතුරු, වර්තමාන ශ්‍රී ලංකාවේ ඛනිජ සම්පත් ව්‍යාප්තිය පිළිබඳ දැනුම භාවිත කරමින් විමසා බැලීම ප්‍රධාන අරමුණ වේ. තවද වංශකතාවල ඇතුළත් තොරතුරු හුදු ප්‍රලාපයන් සහ වර්ණනාවන් පමණක් යැයි ඇතැමුන් තුළ පවතින මතය කෙතරම් දුරට නිවැරදි ද යන්න නැවත විමසා බැලීම ද මෙම අධ්‍යයනයෙන් අපේක්ෂා කෙරුණි.

පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය සිදුකිරීමේ දී භාවිත පර්යේෂණ ක්‍රමවේදය ඓතිහාසික පර්යේෂණ ක්‍රමවේදයයි. මූලික වශයෙන් පුස්තකාල අධ්‍යයනය සිදුකරන ලද අතර ඒ යටතේ ප්‍රස්තුතයට අදාළව මෙතෙක් ප්‍රකාශයට පත්කොට ඇති ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය විමර්ශනයට ලක්කෙරුණි. එහි දී මහාවංසය, කාම්බෝජ මහාවංසය, වංසත්ථප්පකාසිනිය හා ථූපවංසය යන සාහිත්‍ය මූලාශ්‍රයවල රුවන්වැලි සෑය ඉදිකිරීමේ දී අවශ්‍ය ද්‍රව්‍ය පහළවීම පිළිබඳ සඳහන් පරිච්ඡේද තුලනාත්මකව අධ්‍යයනය කොට එහි සඳහන් සම්පත් පහළ වූ ස්ථාන හඳුනාගන්නා ලදී. එම ස්ථාන නූතන ඛනිජ සම්පත් ව්‍යාප්තිය දැක්වෙන සිතියම් හා පර්යේෂණ වාර්තා සමඟ සන්සන්දනාත්මකව විමසා බලන ලදී.

ප්‍රතිඵල හා සාකච්ඡාව

මහාවංස විස්තරයේ රුවන්වැලි සෑය ස්තූප කර්මාන්තයට අවශ්‍ය ද්‍රව්‍ය, ඒවා හමුවූ ප්‍රදේශය හා එම ප්‍රදේශවලට අනුරාධපුර නගරයේ සිට පැවති දුර පැහැදිලිව දක්වා තිබේ. එම විස්තරය අනුව නගරයට උතුරු දෙසින් යොදුනක් දුරින් ගම්හීර නම් ගංගාව ආසන්නයේ ගඩොල් ද නගරයට ඊසාන දෙසින් යොදුන් තුනක් දුරින් අචාර විදි නම් ගමෙන් රත්නන් ද නගරයට නැගෙනහිර දෙසින් යොදුන් හතක් දුරින්, මහවැලි ගඟින් එතෙර තඹවිට නම් ගමෙන් තඹ ද නගරයේ ගිණිකොණ දෙසින් යොදුන් හතරක් දුරින් සමන් වැව නම් ගමින් මැණික් ද නගරයේ දකුණු දෙසින් යොදුන් අටක් දුරින් අම්බට්ඨකොල නම් ජනපදයෙන් රිදී ද නගරයේ බටහිර දෙසින් පස් යොදුනක් දුරින් උරුවෙල් පටුනෙන් මුතු හා පබළු ද නගරයේ උතුරු දෙසින් යොදුන් හතක් දුරින් පෙළවැව් නම් ගමෙන් මැණික් ද හමු වූ බව සඳහන් කොට තිබේ. (රූප සටහන 1), ඇතුළත් මෙම විස්තරයේ එක් ස්ථානයක පමණක් වෙනසක් දැකිය හැකි අතර, ඒ නගරයෙන් උතුරු දෙස මැණික් හමු වූ ස්ථානය වේලිවාපික ලෙසින් ද නගරයට යොදුන් හැටක් (60) ක් දුරින් බව ද සඳහන් වීමයි. ථූපවංසයේ සඳහන් විස්තරයේ දී ද්‍රව්‍ය හමු වූ ස්ථානවලට නගරයේ සිට පවතින දුර ගව්වලින් දැක්වීම හැර මහාවංසයේ ඇතුළත් විස්තරය හා සැසඳීමේ දී වෙනත් කිසිදු වෙනසක් දක්නට නැත. එහි දී යොදුනක් ගව් හතරක ප්‍රමාණයක් වශයෙන් සැලකුවහොත් මහාවංසයේ යොදුන්වලිනුත් ථූපවංසයේ ගව්වලිනුත් දක්වා ඇත්තේ එකම දුර ප්‍රමාණයකි. මේ අනුව විමර්ශනය කරන ලද වංසකතා සියල්ල ම රුවන්වැලි සෑයට ද්‍රව්‍ය ලබාගත් ස්ථාන වශයෙන් දක්වා ඇත්තේ එකම ස්ථානයන් යැයි නිශ්චය කළ හැකිය. මහාවංසයේ ඇතුළත් මෙම විස්තරය වංසත්තප්පකාසිනියේ ද ඒ ආකාරයෙන් ම සඳහන් වේ. කාම්බෝජ මහාවංසයේ අනුරාධපුර නගරයේ සිට දක්වා ඇති දිශාව හා නූතන ඛනිජ සම්පත් ව්‍යාප්තිය සසඳමින් වංශකතාවේ සඳහන් ස්ථාන හඳුනාගත හැකිය. ගඩොල් සපයාගත් අනුරාධපුර නගරයට උතුරින් පිහිටි ගම්හීර නදිය, කනදරා ඔය වශයෙන් හඳුනාගත හැකිය. වර්තමාන ශ්‍රී ලංකාවේ ඛනිජ සම්පත් දක්වන සිතියමේ ද මෙම ප්‍රදේශය උළු හා ගඩොල් කර්මාන්තයට සුදුසු මැටි සහිත කලාපයක් වශයෙන් දැක්වේ. රත්නන් ලබාගත් අනුරාධපුර නගරයට ඊසාන දෙසින් පිහිටි අචාරවිදි නම් ග්‍රාමය කැබිතිගොල්ලෑව ආසන්න ප්‍රදේශයකි. ආචාර්ය රෝලන්ඩ් ද සිල්වා විසින් සිය පර්යේෂණවලදී මෙම ප්‍රදේශය ආශ්‍රිතව රත්නන් පවතින බව පෙන්වා දී ඇත. තඹ හමු වූ අනුරාධපුර ඇතුළු නගරයට නැගෙනහිර දෙසින් පිහිටි තඹවිට නූතන සේරුවාවිල ප්‍රදේශයයි. මෙම ප්‍රදේශයේ විශාල ප්‍රමාණයේ ස්වාභාවික තඹ නිධියක් පැවති බවත් අනුරාධපුර රාජධානියේ අවසාන භාගය වන තෙක් ම මෙම තඹ නිධිය භාවිතයට ගත් බවට ආචාර්ය අර්ජුන තන්තිලගේ සිය පර්යේෂණවලින් සනාථ කරයි.



රූප සටහන 1 - අනුරාධපුර නගරයේ සිට රුවන්වැලි සෑය සඳහා අමුද්‍රව්‍ය ලැබුණු ස්ථානවල පිහිටීම

මැණික් ලැබුණේ යැයි සඳහන් අනුරාධපුර නගරයට ගිණිකොන දෙසින් පිහිටි සමන් වැව නම් ගම නූතන ඇලහැර ප්‍රදේශය වශයෙන් හඳුනාගත හැක. මෙම ප්‍රදේශය වර්තමානයේ ද මැණික් කර්මාන්තය සම්බන්ධයෙන් ප්‍රචලිතය. රිදී හමු වූ අනුරාධපුර ඇතුළු නගරයට දකුණු දෙසින් පිහිටි අම්බට්ඨකොල ජනපදය නූතන රිදීවිහාරය අවට ප්‍රදේශය විය හැකි බව සී.ඩබ්. නිකොලොස් මහතා පෙන්වා දී ඇත. වර්තමාන ශ්‍රී ලංකාවේ බනිජ සම්පත් දක්වන සිතියමේ මෙම ප්‍රදේශය මිනිරන් සම්පත සහිත කලාපයක් වශයෙන් දක්වයි. මුතු, පබළු හමු වූ අනුරාධපුර නගරයට බටහිර දෙසින් පිහිටි උරුවෙල පටුන යනු කලාවැව මුහුදට වැටෙන ස්ථානයේ හෝ ඒ ආශ්‍රිතව පිහිටි ප්‍රදේශයකි. මෙම කලාපයේ මුතු කිමිදීම පිළිබඳව අනුරාධපුර යුගයේ සිට බ්‍රිතාන්‍ය යුගය දක්වා වාර්තා ගණනාවක තොරතුරු හමුවේ. මැණික් හමු වූ ස්ථානයක් වන අනුරාධපුර ඇතුළු නගරයට උතුරු දෙසින් පිහිටි පේලිවාපික ග්‍රාමය නිශ්චිතව හඳුනාගත නොහැකි ස්ථානයකි. වංශකතාවේ ද්‍රව්‍ය හමුවේ යැයි සඳහන් ස්ථානවලට ඇති දුර, අධ්‍යයනයේ දී හඳුනාගත් ස්ථානවලට ඇති දුර සමඟ පහත වගුවේ දැක්වෙන පරිදි සැසඳිය හැකිය.

වගුව අංක 1. වංශකතාවල සඳහන් ස්ථාන හා නූතනයේ හඳුනාගත් ස්ථාන අනුරාධපුර නගරයට ඇති දුර සැසඳීම

අමුද්‍රව්‍ය	වංශකතාවේ සඳහන් ස්ථාන නාමය	වංශකතාවලට අනුව අනුරාධපුර නගරයේ සිට දුර		සැ: 1 = ගවු 2 නම් වංශකතාවේ සඳහන් එම දුර ප්‍රමාණය නූතන සැතපුම්වලින්	වර්තමාන ස්ථානය	වර්තමාන ගුවන් දුර (සැතපුම්)
		යොදුන්	ගවු			
ගඩොල්	ගම්භීර නදිය අසබඩ	01	04	8	කනදරා ඔය අසබඩ	6
රත්නන්	ආචාර විදි නම් ගම	03	12	24	කැබිතිගොල්ලෑව ආශ්‍රිතව	27
තඹ	තඹවිට	07	28	56	සේරුවිල	55
මැණික්	සමන්වැව ගම	04	16	32	ඇලහැර	47
රිදී	අම්බට්ඨකොල	08	32	64	රිදීගම	55
මුතු	උරුවෙල් පටුව	05	20	40	කලා ඔය ගංගා මෝදර	39
මැණික්	පෙළවැව්	07	28	56	-	-

නිගමනය

ඉහත අධ්‍යයනය අනුව නගරයට උතුරු දෙසින් මැණික් හමු වූ ස්ථානය වශයෙන් සඳහන් වන ස්ථානය හැරුණුවිට අනෙක් සියලු ම අමුද්‍රව්‍යයක් ම ලැබුණු ස්ථාන වර්තමාන ශ්‍රී ලංකාවෙ හඳුනාගෙන ඇති එක් එක් ස්වාභාවික සම්පත් ව්‍යාප්තිය හා සමපාත වේ. තවද හඳුනාගත් ස්ථානවලට වර්තමානයේ ඇති ගුවන් දුර හා වංශකතාවේ සඳහන් දුරත් අතර යම් සබඳතාවක් ද හඳුනාගත හැකිය. ඒ අනුව මෙම ද්‍රව්‍ය ලැබුණු බවට වංශකතාවේ සඳහන් ස්ථාන හුදු ස්ථාන නාමයන් පමණක් නොව සැබවින් ම ස්වාභාවික සම්පත් පිහිටීම අනුව සඳහන් කර ඇති බව තහවුරු වේ.

ප්‍රමුඛ පද *- කර්මාන්ත, රුවන්වැලි සෑය, ස්වාභාවික සම්පත්, සාහිත්‍ය මූලාශ්‍රය*

ආශ්‍රිත ග්‍රන්ථ

කරුණානන්ද, එස්. ඩබ්. (සංස්). (2017). *සිංහල ථූපවංසය.* ඇම්.ඩී.ගුණසේන සහ සමාගම.
සිංහල මහාවංශය. (2010). බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
Cooray, P.G. (1984). *An Introduction to the geology of Sri Lanka*. National Museum.

ශ්‍රී ලාංකේය බ්‍රිතාන්‍ය යටත්විජිත යුගයේ නිර්මිත භූමි දර්ශන විෂය කරගත් සිතුවම් සන්නිදර්ශන සහ වාර්තා ඡායාරූප පිළිබඳ පාඨනයක්

එස්. එම්. දුලාරී ගයත්‍රිකා සූරියබණ්ඩාර
ඉතිහාසය හා කලා සිද්ධාන්ත අධ්‍යයනාංශය, දෘශ්‍ය කලා පීඨය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
dularisuriyabandara@gmail.com

හැඳින්වීම

යටත්විජිතකරණයේ ප්‍රතිඵලයක් ලෙස විදේශීය ශිල්පීහු රැසක් ශ්‍රී ලංකාවට පැමිණ ස්වදේශික භූමිය හා යටත්වැසියන් පිළිබඳව දෘශ්‍යමය තොරතුරු වාර්තාකරණයේ නියැලුණහ. මෙම දෘශ්‍ය වාර්තා විජිතවාදීන්ගේ අවශ්‍යතාවක ප්‍රතිඵලයකි. මුල්කාලීනව දළ සටහන් (*sketchs*), ඇඳීම් (*drawings*), සන්නිදර්ශන (*illustration*) සහ සිතුවම් (*painting*) යන ක්‍රමවේද භාවිතයෙන් යට කී වාර්තාකරණ සිදු විය. බ්‍රිතාන්‍ය යටත්විජිත යුගයේ දී මෙම දෘශ්‍ය වාර්තාකරණයන් වඩාත් විශ්වාසනීයත්වයෙන් යුතුව ග්‍රහණය කර ගැනීමට හැකි වන පරිදි ඡායාරූපයේ ආගමනය සිදු විය.

මෙම ශිල්පීන්ගේ ප්‍රධාන තේමා බවට පත්වූයේ යටත්විජිත ජන සමාජය, ස්වදේශික භූමිය, අලි-ඇතුන් දඩයම් කිරීමේ අවස්ථා, ස්වදේශික වැසියන් සහිත විවිධ අභිචාර විධීන්, පුරාවිද්‍යාත්මක වැඩබිම් හා නටබුන් නගර ආශ්‍රිත සිදුවීම් ය. ඒ අතර ස්වදේශික භූමිය අරමුණු කරගත් දෘශ්‍ය නිර්මාණ සුවිශේෂී වේ. ස්වදේශික භූමි දර්ශන නාභිගත කිරීමේ මූලික අරමුණ වූයේ එය යුරෝපීය භූමියෙන් වෙනස් බව ඉස්මතු කර පෙන්වීමට සහ ආර්ථික වටිනාකම්වලින් සුපෝෂිත බව පෙන්වා දීමයි. බ්‍රිතාන්‍ය යටත්විජිත පාලකයෝ තමන්සතු වූ ද තමන් විසින් ගවේශිත වූ ද ප්‍රදේශකොට්ඨාශවල භූ දර්ශන පිහිටීම සටහන් කිරීම සඳහා සිතුවම් අඳින්නන් කැටිව ගියහ. ඔවුන්ගේ අරමුණ වූයේ තමන් කරන කියන දෑ බ්‍රිතාන්‍ය දේශවාසීන්ට දැනගන්නට සැලැස්වීමයි (ධර්මසිරි, 1990). මේ අනුව පැහැදිලි වන කරුණක් නම්, යටත්විජිත යුගයේ නිර්මිත දෘශ්‍ය මූලාශ්‍රය හුදු ඓතිහාසික අහම්බයක් නොවන බවයි.

පර්යේෂණ ගැටලුව, පර්යේෂණ අරමුණු

බ්‍රිතාන්‍ය යටත්විජිත යුගයේ ශේෂ වූ දෘශ්‍ය මූලාශ්‍රයවල ස්වදේශික භූමිය යුරෝපීය ශිල්පීන්ගේ අවශ්‍යතාවන්ට අනුව ප්‍රතිනිර්මාණය කර ඇත්තේ කෙසේ ද යන්න අවබෝධ කර ගැනීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වේ. ඒ අනුව ශ්‍රී ලාංකේය යටත්විජිත දෘශ්‍ය මූලාශ්‍රයවල ස්වදේශික භූමිය නිරූපණය කර ඇත්තේ කෙසේ ද සහ එම නිරූපණයන්ගෙන් මතුවන යටත්විජිත කතිකාවත් සහ එයින් ඇඟවෙන යටත්විජිතකාරක බල පද්ධතීන් කවරේද යන පර්යේෂණ ගැටලුවට පිළිතුරු සැපයීමට අපේක්ෂිත ය. එමෙන් ම ස්වදේශික භූමිය සිතුවම් කිරීමේ සුවිශේෂතා කවරේද සහ ස්වදේශික භූමිය නිරූපණ විෂයෙහි බලපෑ සමාජ-දේශපාලනික ගතිකයන් මොනවාද යන ද්විතීයික ගැටලු පිළිබඳව අවධානය යොමු කෙරේ.

පර්යේෂණ ක්‍රමවේදය

ක්‍රි.ව 1796-1948 අතර කාල පරිච්ඡේදයට අයත් තෝරාගත් සිතුවම්, සන්නිදර්ශන සහ ඡායාරූප නියැදියක් ආශ්‍රයෙන් මෙම පර්යේෂණය සිදු කෙරේ. ඒ අනුව මෙම අධ්‍යයනය *Plâté collection, Shan Perera collection, Ismith Raheem collection, Palinda de Silva Collection* යන පෞද්ගලික ඡායාරූප එකතූන් හි අන්තර්ගත ඡායාරූප සහ ජාතික කෞතුකාගාරයේ ප්‍රදර්ශිත ඇන්ඩෲ නිකෝල්ගේ සිතුවම් එකතුවේ ඇති සිතුවම් මෙන් ම ආර්නොල්ඩ් රයිට්ගේ *Twentieth Century Impression of Ceylon (1907)*, ඉස්මත් රහීම්ගේ *Archaeology and Photography (2009)* සහ *Images of British Ceylon (2009)*, ආර්. කේ ද සිල්වාගේ *Early Prints of Ceylon 1800-1900 (1985)* යන ග්‍රන්ථවල අන්තර්ගත සිතුවම් සහ ඡායාරූප මත පදනම් වේ.

මෙහි මූලික උපකල්පනය වනුයේ බ්‍රිතාන්‍ය යටත්විජිත සමයේ නිර්මිත සිතුවම් එම දෘශ්‍ය කලා ව්‍යාපෘති නිර්මාණය වූ අවස්ථාවේ ආධිපත්‍යය දරන දැනුම් පද්ධති, ප්‍රවාද සහ මතවාද සමඟ සම්බන්ධව ගොඩනැගුණු සමාජ දේශපාලනික අවශ්‍යතාවන්ගේ නියෝජනයක් බව තහවුරු කිරීමයි. එනම් යටත්විජිත සිත්තරා ස්වදේශික රූපය ප්‍රතිනිර්මාණය කර ඇත්තේ ඔහු නිර්මාණ ක්‍රියාවලියෙහි නිමග්නව සිටි අවස්ථාවේ අධිපතීත්වය දරන ලද දැනුමට අනුරූපීව බවයි. 'ශ්‍රී ලාංකේය යටත්විජිත යුගය' මෙම පර්යේෂණයේ ප්‍රධාන අධ්‍යයන වපසරිය වශයෙන් හඳුනා ගැනේ. එබැවින් අධ්‍යයනයට යටත් දෘශ්‍යමය කියැවීම් සඳහා මූලිකව ම භාවිත කෙරෙනුයේ යටත්විජිතවාදී හා පශ්චාද් යටත්විජිතවාදී න්‍යායාත්මක ප්‍රවේශ ය. මෙම පර්යේෂණය මඟින් අවධානය යොමු කෙරෙන දෙවැනි ප්‍රවාදය වනුයේ එඩ්වඩ් සයීද් විසින් න්‍යායගත කරන ලද පෙරදිගවාදී (*orientalism*) සංකල්පය හා රංජිත් ගුහා, සයිඩ් අමීන්, ඩේවිඩ් ආර්නෝල්ඩ්, ඩේවිඩ් හාඩිටන්, පාර්තා චැටර්ජි, ගයාන් පාණ්ඩේ ආදී විද්වතුන් විසින් සංකල්පගත කරන ලද නිර්ප්‍රභූ අධ්‍යයනය (*subaltern studies*) අතර පවත්නා අන්තර් සම්බන්ධතාවයි.

ප්‍රතිඵල හා සාකච්ඡාව

මෙම අධ්‍යයනය සඳහා ස්වදේශික භූමිය නිරූපිත අහඹු ලෙස තෝරාගත් සිතුවම්, සන්නිදර්ශන හා ඡායාරූප නියැදියක් නිරීක්ෂණයට භාජනය විය. යටත්විජිත දෘශ්‍ය මූලාශ්‍රයවල ස්වදේශික භූමිය ආකෘතිගත කිරීමේ දී යුරෝ-කේන්ද්‍රීය දෘෂ්ටිවාදයේ බලපෑම ප්‍රකට කරවන ලක්ෂණ රැසක් හඳුනාගත්නා ලදි. පුරාවිද්‍යාත්මක වැඩබිම් හා නටබුන් නගර ආශ්‍රිත භූමි දර්ශන, ස්වදේශික පාරිසරික සෞන්දර්ය නිරූපිත භූ දර්ශන, වැවිලි ආර්ථිකයට යෝග්‍ය භූගෝලීය පිහිටීම පිළිබඳ සංඥාර්ථ, වෙළඳාම ප්‍රමුඛ ආර්ථික ප්‍රතිලාභ පිළිබඳ ව්‍යංගාර්ථ, ආර්ථික මර්මස්ථාන ව්‍යංගවත් කරවන භූමි දර්ශන, යටත්විජිත මැදිහත්වීම් සහිත ක්‍රියාකාරකම් සහ නව ඉදිකිරීම් ආදී වශයෙන් එම ලක්ෂණ අනුමාතෘකා කිහිපයක් යටතේ වර්ගීකරණය කළ අතර උද්හිත සුවිශේෂතා හුවා දැක්වීමේ යටත්විජිත රුචිකත්වය යනුවෙන් පහත ඉන් එක් මාතෘකාවක් විස්තර කර දැක්වේ.

යටත්විජිත භූමියේ පවතින සුවිශේෂී වූ උද්භිත අරමුණු වස්තුවිෂය කරගනිමින් නිර්මිත භූමි දර්ශන සහිත දෘශ්‍ය මූලාශ්‍රය පිළිබඳව මෙහි දී අවධානය කටයුතු කරන ලදි. යටත්විජිත භූමියට ආවේණික වූ අනන්‍යතා ලක්ෂණ සහිත ශාක හා සත්ත්වයින් අරමුණ කරගත් අවස්ථා යුරෝපීයයාට ආගන්තුක අත්දැකීමකි. යටත්විජිතයන්ට ආවේණික වූ පෙර නොදුටු විරූ අපූර්ව ශාක, ඵල, පත්‍ර, පුෂ්ප ආදී සියලු දෑ යුරෝපීයයන් විසින් ඉතා සවිස්තරව ස්වකීය මව් රාජ්‍යයට වාර්තා කිරීමට යොමු විය. නිදසුන් ලෙස ස්වදේශික භූමියේ ඇති කෙසෙල්, පොල්, මීවන හා ප්ලාම් ආදී ශාක විශෙෂ සුවිශේෂී දෘශ්‍ය අරමුණු වශයෙන් සිතුවම් අතර හමු වේ (රූපසටහන් 1, 2). පහත නිදර්ශිත ඇන්ඩෘ නිකෝල්ගේ ගාලු වෙරළ අරමුණු කරගත් සිතුවම් ද්විත්වය එකිනෙකින් වෙනස් වන්නේ ප්ලාම් හා කෙසෙල් ගස්වල ස්ථානගත කිරීමත් සමඟ ය. එනම් එකම භූ දර්ශන අවස්ථාවක් කෙසෙල් සහ ප්ලාම් ගස්වල නිරූපණයන් සමඟ නැවත නැවත ප්‍රතිනිර්මාණය කර තිබේ. වෙරළ මායිම්ව පිහිටි මෙම ගස්වල ස්ථානගතවීම ඉතාමත් අසාමාන්‍ය ය. මන්දයත් කෙසෙල් හා ප්ලාම් වෙරළාශ්‍රිතව වර්ධනය නොවන නිසාවෙනි. ඒ අනුව පැහැදිලි වන කරුණක් නම් යටත්විජිත රුචිකත්වයට අනුරූපීව සිතුවම් නිර්මාණයේ දී ශිල්පියාට ආසක්ත වූ අනුභූතීන් භූ දර්ශන අතර ස්ථානගත කර ඇති බවයි. මෙම උද්භිත අරමුණු යටත්විජිත කාරකයාගේ අවධානයට ලක් වූ සුලභ තේමාවක් බව තත්කාලීන ඡායාරූප ද සාක්ෂි දරයි (රූපසටහන් 3). මෙමඟින් යටත්විජිත භූමියේ ඇති අපූර්වත්වය ස්වකීය මවු රටට වාර්තා කිරීමේ ආස්ථානයන් හඳුනාගත හැකි ය.



රූපසටහන 1. ගාලු වෙරළ 1846
(ඇන්ඩෘ නිකෝල්)



රූපසටහන 2. ගාලු වෙරළ 1846
(ඇන්ඩෘ නිකෝල්)



රූපසටහන 3. ප්ලාම් (ස්කෝවන් සහ සමාගම)

නිගමන සහ නිර්දේශ

අධ්‍යයන ප්‍රතිඵල අනවු බහතුරයක් දෘශ්‍ය මූලාශ්‍රයගත යටත්විජිත භූමිය යුරෝපීය භූමියෙන් වෙනස්, අපූර්ව, විවිධ යන පෙරදිගවාදී හැඟවුම් පිළිබිඹු කිරීම සඳහා අරමුණු කර තිබේ. ඇතැම් අවස්ථාවල ස්වදේශික භූමිය ආර්ථිකමය ප්‍රතිලාභ ලැබියහැකි වටිනාකම්වලින් ගහණය වන බව ද අඟවා තිබේ. එමෙන් ම ස්වදේශික භූමිය පහත්, නොදියුණු යන යුරෝ-කේන්ද්‍රීය මතවාදය තුළ ස්ථානගත කර තිබුණි. මේ අනුව යටත්විජිත දෘශ්‍ය මූලාශ්‍රය ඔස්සේ යුරෝ-කේන්ද්‍රීය යටත්විජිත දෘෂ්ටිය මෙන් ම පෙරදිගවාදී චින්තන ක්‍රමවල බලපෑම ප්‍රදර්ශනය කරන බව නිගමනය කළ හැකි විය.

ප්‍රමුඛ පද: *ස්වදේශික භූමිය, බ්‍රිතාන්‍ය යටත්විජිත යුගය, යටත්විජිත දෘශ්‍ය මූලාශ්‍රය, පශ්චාද් යටත්විජිතවාදය, යුරෝ-කේන්ද්‍රීය දෘෂ්ටිය, පෙරදිගවාදය*

ආශ්‍රිත ග්‍රන්ථ

පතිරගේ, ජේ.බී. (2005). පශ්චාද් යටත්විජිතවාදී කතිකාවට ප්‍රවේශයක්. *පඨන*, තෙවන වෙළුම. සමාජ සංස්කෘතික තීව්‍ර අධ්‍යයනය සඳහා වූ කොළඹ ආයතනය.

පෙරේරා, රංජිත්. (1993). නිර්ප්‍රභූ පර්යාවලෝකය: මානසිකත්වය යටත්විජිතහරණයකට කිරීමේ ලා උපාය මාර්ගයකි". *ප්‍රවාද*, 5. සමාජ සංස්කෘතික තීව්‍ර අධ්‍යයනය සඳහා වූ කොළඹ ආයතනය.

පෙරේරා සසංක. (2017). සොරා ගැනීමේ සහ මංකොල්ලකෑමේ අයිතිය: පන්සීය වසරකට පසුව, සංස්කෘතිය සහ දැනුම පිළිබඳ දේශපාලනය, දෙවන වෙළුම. තීර්ථ ජාත්‍යන්තර කලාකරුවන්ගේ එකතුව.

Alloula, Malek. (1986). *The Colonial Harem*. University of Minnesota Press.

De Silva, R.K. (1998). *19th Century newspaper engravings of Ceylon.* Serendib Publications.

වියකී යන සිංහල අලුත් අවුරුදු චාරිත්‍ර චාරිත්‍ර පිළිබඳ මානව විද්‍යාත්මක අධ්‍යයනයක් (කෑගල්ල ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින්)

එස්. ජේ. කේ. වීරසූරිය

මානව විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

jayaniweerasooriya3@gmail.com

හැඳින්වීම

මානවයා ජීවිතයේ විවිධාකාර උත්සව පැවැත්වීම සිදු කරයි. එම උත්සව දෙයාකාර වේ. ජීවිතයේ වැදගත් අවස්ථා සමරන ජීවන සංක්‍රාන්ති උත්සව සහ සමාජයක ජන කොට්ඨාසයක් ලෙස එම සමාජයට අනුගතව සමරනු ලබන උත්සව එම දෙවර්ගයයි. සිංහල අලුත් අවුරුදු උත්සවය මෙයින් දෙවන වර්ගයට අයත් වේ. ලොව සම්මත අලුත් අවුරුද්ද ලෙස පිළිගැනෙන්නේ ජනවාරි පළමු වැනිදාය. මෙය බොහෝ පෙර අපරදිග රටවල බොහෝ උත්සවශ්‍රීයෙන් සමරනු ලැබේ. ශ්‍රී ලංකාව තුළ ජනවාරි පළමු දිනට අමතරව අප්‍රේල් නෙහොත් බක් මාසයේ අස්වනු කපා, පාගා එම අලුත් අස්වැන්න ලැබීමේ ප්‍රීතිය නිමිත්තෙන් හා අස්වනු සරු කළ බලවේගයන්ට ස්තුති කිරීම පිණිස අතීතයේ සිට මෙම උත්සව පවත්වා ඇත. සිංහල මෙන්ම දෙමළ ජනයාද ඔවුන්ට අනන්‍ය චාරිත්‍ර-චාරිත්‍ර ඉටු කරමින් මෙම උත්සවය සමරයි. මෙම උත්සවය ඉතාම සුවිශේෂී වන්නේ දේශීය අනන්‍යතාව හා සංස්කෘතිය පිළිබිඹු වන නිසාය. සිංහල අලුත් අවුරුද්ද තුළින් ශ්‍රී ලාංකේය සමාජ සංස්කෘතික වටපිටාව හා සිංහලයන්ට ආවේණික වූ සංස්කෘතිකාංග පිළිබිඹු වේ. ඒ අතර අතීතයේ සිටම පැවත එන චාරිත්‍ර-චාරිත්‍ර රාශියක් සිංහල අලුත් අවුරුද්ද සමඟ බැඳී පවතී. මෙය කෝණ මංගල්‍යය, සූර්ය මංගල්‍යය ලෙසින් හඳුන්වයි.

පර්යේෂණ ගැටලුව, පර්යේෂණ අරමුණු

නාගරීකරණය (Urbanization), නවීකරණය (Modernization), බටහිරකරණය (Westernization), වාණිජකරණය (Commercialization), ගෝලීයකරණය (Globalization) නිසා ශ්‍රී ලාංකේය ජන සමාජය මෙන්ම පුද්ගලයාද බොහෝ ලෙස විවිධත්වයකට ලක්ව ඇත. එම නිසා ශ්‍රී ලාංකේය සංස්කෘතිය වර්තමානය වන විට නවීකරණය වී පැරණි සිරිත්-විරිත් වියකී යන ස්වභාවයක් ගෙන ඇත. මේ ආකාරයට වර්තමානයේ සිංහල අලුත් අවුරුදු චාරිත්‍ර-චාරිත්‍රද සමාජයේ මෙන්ම පුද්ගලයා තුළද අමතක වී ගොස් ඇති බවක් පෙනේ. එලෙස සිංහල අලුත් අවුරුදු චාරිත්‍ර-චාරිත්‍ර වියකී යන ස්වභාවයක් ගෙන ඇත. එය මෙහි පර්යේෂණ ගැටලුවයි. මෙලෙස වියකී යන සිංහල අලුත් අවුරුදු චාරිත්‍ර-චාරිත්‍ර පිළිබඳව අධ්‍යයනය කොට ඒ පිළිබඳව සමාජයට හෙළි කොට ජනසතු කිරීම මෙහි පර්යේෂණ අරමුණු වේ.

පර්යේෂණ ක්‍රමවේදය

සමස්ත පර්යේෂණය සඳහා ප්‍රාථමික, ද්විතීයික මූලාශ්‍රය යොදාගත් අතර අධ්‍යයන ක්ෂේත්‍රය වශයෙන් සබරගමු පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය යොදා ගනු ලැබිය. ඒ අනුව අධ්‍යයන ක්ෂේත්‍රය තුළ අහඹු නියැදියකින් තෝරාගත් දත්ත දායකයින් විසි දෙනෙකු සමඟ සම්මුඛ සාකච්ඡා හා නිරීක්ෂණ ක්‍රම යටතේ දත්ත ලබාගෙන අධ්‍යයනයේ අරමුණු හා පර්යේෂණ ගැටලුව සඳහා පිළිතුරු ලබා ගැනීමට හැකි විය.

ප්‍රතිඵල හා සාකච්ඡාව

සිංහල අවුරුද්ද සඳහා චාරිත්‍ර-චාරිත්‍ර රැසක් ඇත. අතීතයේ සිටම මෙරට තුළ එම චාරිත්‍ර-චාරිත්‍ර ක්‍රියාත්මක වේ. සෑම අවුරුද්දක් පාසාම සාම්ප්‍රදායිකව වැඩ ඇල්ලීම, ආහාර අනුභවය, ගනුදෙනු කිරීම, හිස තෙල් ගෑම, නෑගම් යාම, ආදී චාරිත්‍ර-චාරිත්‍ර රැසක් සිදු කරනු ලබයි. වර්තමානය වන විට සමාජය මෙම චාරිත්‍ර වලට පමණක් සීමා වී ඇත. නමුත් ඊට එහා ගිය විශාල චාරිත්‍ර-චාරිත්‍ර ප්‍රමාණයක් අතීතයේ සිට සිංහල සමාජයේ සංස්කෘතිය තුළ ඇත. එම චාරිත්‍ර ලෙස අවුරුදු කුමාරයා පිදීම, පට්ටි කිරි ඉතිරවීම, අලුත් සහල් මංගල්‍යය චාරිත්‍රය, ගම්මැද්දේ මල්වර වීමේ චාරිත්‍රය, කෝදුරු කැවුම් ඉවීමේ චාරිත්‍රය, තෙල් වළං චාරිත්‍රය, ළිඳ අලෙයි කිරීමේ චාරිත්‍රය, කුණු මුත්තා පිදීමේ චාරිත්‍රය, නව සඳ බැලීමේ චාරිත්‍රය, නොනගත චාරිත්‍ර ආදිය වර්තමානයේ සමාජයෙන් ගිලිහී යාමට පත්ව ඇත. මෙවැනි චාරිත්‍ර වර්තමාන සමාජයේ වැඩි පිරිසක් දැක හෝ අසා නැත.

ගෙදර මිදුලේ මල් පැලක් පිළියෙල කොට නිවසේ ගෘහ මූලික පියා විසින් නිවසට ඉර එළිය පැමිණෙන දිසාවට අලුත් අවුරුදු කැවිලි පෙවිලි පිළිගන්වා පහන් පත්තු කර අවුරුදු තුමාරයා පිළිගනු ලබයි. අලුත් අවුරුදු චාරිත්‍ර අරඹනුයේ නව සඳ බැලීමෙනි. මේ සඳහා නිවසේ සියලු දෙනා එක් වෙයි. නොනගතය නැකත් නැති, නැකැත් තහංචි ඇති කාල සීමාවකි. එදිනෙදා සම්මත චාරිත්‍ර-චාරිත්‍ර නතර කර බලා සිටීම සිදු කරයි. ආගමික කටයුතුවල නිරත වෙමින් ආහාර අනුභව ආදියෙන් ද වැළකී සිටීම නොනගතයේ දී සිදු වේ.

අතීතයේ මුතුන් මිත්තන් නවම්, මැදින් මාසයේ සිටම අවුරුදු චාරිත්‍ර පවත්වා ඇත මහ කන්නය නිමා වී අස්වනු නෙලා ගම් ජනයාට උදා වූ විවේක කාලයක් ලෙස අවුරුදු සමය සලකයි. ගැමියාගේ සරල ජීවන රටාව සමඟ එම චාරිත්‍ර වලට වැඩි ඉඩ කඩක් ලැබී ඇත. ස්වභාව ධර්මයාටත්, සත්ත්වයාටත් මනුෂ්‍යත්වය බෙදාහරින කාලයක් ලෙස අවුරුදු කාලය හඳුනා ගත හැකිය.

අවුරුදු චාරිත්‍රයට මුල පිරුවේ පට්ටි කිරි ඉතිර වීමේ චාරිත්‍රයෙනි. එහි අරමුණ කිරි ලබා දෙන ගවයන්ට විවේක කාලයක් ලබා දීමටයි. මංගර දෙවියන්ට යාඥා කරමින්, ගව පට්ටිය අසල කොල්මුර ගායනා කරමින් කිරි ඉතිරවයි. අලුත් සහල් මංගල්‍යය චාරිත්‍රය ද පැරැන්නෝ කිසි දිනෙක මඟ හැර නැත. ගොයම් පෑගූ කමතේ බැත කන්දෙන් උඩු කොටස වන අක්යාලෙන් දෙවියන්ට පූජා කිරීමට කොටසක් ලබා ගෙන අක්යාල පූජාව සිදු කරයි. තමාට

අස්වැන්න ලබා දීමට උදව් වූ සූර්යයා, වැස්ස, ස්වභාව ධර්මයාට කෘතගුණ සලකයි. මුලින්ම බත් සකසා පන්සලට පූජා කරයි. අස්වැන්නෙන් කොටස් කීපයක් දැකුම් පිදීම ලෙස විශේෂිත අයට බෙදා හදා දෙනු ලබයි. එමඟින් සූර්ය මංගල්‍යය හරහා මනුෂ්‍යත්වය හා සහජීවනත්වය පතුරුවයි.

නිගමන සහ නිර්දේශ

ස්වභාව ධර්මයාටත්, සත්ත්වයාටත්, මනුෂ්‍යත්වය පතුරවන සමයක් ලෙස සිංහල අලුත් අවුරුදු චාරිත්‍ර-වාරිත්‍ර හඳුනාගත හැකිය. වර්තමාන නාගරික පවුල් සංස්කෘතිය ඉස්මතු වී විස්තෘත පවුල නැතිවී යාම තුළින් කුඩා දරුවන්ට පවුල තුළින් ඉගෙන ගැනීමට ඇති සිරිත්-විරිත් ඉගෙනීමට නොහැකි වී ඇත. වැඩිහිටියන් සමග ජීවත් වීමට ඔවුන්ගේ අත්දැකීම් දරුවන්ට ලබා ගැනීමට නොහැකි තරම් සමාජය ඩිජිටල්කරණය, නාගරීකරණය, ගෝලීයකරණයට ලක්ව ඇත.

මේ හේතුවෙන් වර්තමානය වන විට තරගකාරී අධ්‍යාපන ක්‍රමයක් නිර්මාණය වී ඇත. වර්තමාන පරපුර එම තරගකාරීත්වය පසුපස හඹා යාමෙන් මෙවැනි සිරිත්-විරිත් අද වන විට මග හැරී ගොස් ඇත. එවැනි චාරිත්‍ර රැසක් මෙම අධ්‍යයනය තුළින් හෙළි කර ගැනීමට හැකි විය. ඒ අනුව වර්තමාන තරුණ පරපුරට වඩා මෙම සිරිත්-විරිත් ගබඩා වී ඇත්තේ වැඩිහිටි පරපුර ළඟ පමණි. එම නිසා මෙම අස්පර්ශනීය සංස්කෘතික උරුම රැක ගැනීමට නම් මෙම වියකි යන අවුරුදු සිරිත් විරිත් සමාජගත කළ යුතුය.

ඒ සඳහා වැඩිහිටි පරපුරේ සහභාගිත්වය අවශ්‍ය වේ. පාසල් ළමයි මෙවැනි සිරිත් විරිත් පිළිබඳව පාසල් විෂය නිර්දේශයට පාඩම් ඇතුලත් කිරීම, වියැකී යන මෙවැනි චාරිත්‍ර පිළිබඳ නිර්මාණාත්මක වැඩසටහන් රූපවාහිනිය, ගුවන් විදුලිය ආදී මාධ්‍යයන් මඟින් ප්‍රචාරණය කිරීම, විස්තෘත පවුල් පරිසරය නැවත නිර්මාණය කිරීම හා මෙවැනි පර්යේෂණ සිදුකිරීම මඟින් මෙම සිරිත් විරිත් ජනසතු කිරීමට හැකි වේ.

ප්‍රමුඛ පද: *සිංහල, අවුරුද්ද, චාරිත්‍ර-වාරිත්‍ර, සංස්කෘතිය, සමාජය*

ආශ්‍රිත ග්‍රන්ථ

චාන්දනී. පී. (2017). *සිංහල අලුත් අවුරුද්ද එක්ක එන පොඩ්ඩන්ගේ සැමැරුම්.* https://parenting.lk/2017/04/1593.

නිශ්ශංක. ඩී. එස්. (2018). *ගොවිතැනට සෙත සදන අලුත් සහල් මංගල්‍යය.* https://www.silumina.lk/2018/04/07/%E0%B6%BB%E0%B6%B1%E0%B7%8A%E0%B6%B6%E0%B7%92%E0%B6%B8/%E0%B6%9C%E0%B7%9C%E0%B7%80%E0%B7%92%C2%AD%E0%B6%AD%E0%B7%90%C2%.

විජයවර්ධන, කේ. (2022). *අවුරුදු නැකතේ ගුණා ගුණ,* https://roar.media/sinhala/main/srilanka-life/virtues-of-the-new-year.

සූරියආරච්චි. කේ. එස්. ආර්. (2017). *පට්ටිකිරි උතුරුවන මීකිරි දෙමහ.* https://www.lankadeepa.lk/rasawitha/%E0%B6%B4%E0%B6%A7%E0%B7%8A%E0%B6%A7%E0%B7%92%E0%B6%9A%E0%B7%92%E0%B6%BB%E0%B7%92.

හේරත්, එස්. (2019). *සිංහල අලුත් අවුරුද්ද එක්ක එන පොඩ්ඩන්ගේ සැමැරුම්.* https://familylife.lk/%E0%B7%83%E0%B7%92%E0%B6%82%E0%B7%84%E0%B6%BD-%E0%B6%85%E0%B6%BD%E0%B7%94%E0%B6%AD%E0%B7%8A.

Heritage Value Assessment as a Tool for Holistic Heritage Management: with Special Reference to Sigiriya World Heritage Site

M. J. R. S. Fernando*[1] and S. D. Y. Jayarathne[2]

[1]Department of Tourism and Hospitality Management, Sri Lanka Institute of Advanced Technological Education, Sri Lanka, [2]Department of Anthropology, University of Sri Jayewardenepura, Sri Lanka

**rishini@sliate.ac.lk*

Introduction

Heritage management is a complex and serious task as heritage is believed to be owned by many stakeholders, in different viewpoints. Therefore, holism is necessary to make sustainable upbringing of heritage resources and heritage value assessment can be utilized as a tool in that process. Heritage Value Assessment is a study which considers the values and attributes of one single heritage resource from the perspectives of different stakeholders. Holism is a vital principle of sustainable development of cultural resources as it carries several principles of sustainability including efficiency, equity, cultural and ecological integrity, community ownership, integration, balance, and harmony (Heras et al., 2019). Sri Lanka has an abundance of heritage resources and this emphasizes the importance of proper heritage management through different viable strategies.

Research Problem/s, Objective/s

When it comes to the majority of the Asian countries, especially like Sri Lanka, it generally lacks holistic management of heritage resources. Each public sector, individual tourism business, or level of government or other different party is primarily interested only in its own set of responsibilities and interests (Timothy, 2009). To exacerbate the issue further, individuals or groups rarely communicate or coordinate their efforts or needs on a common platform. This is against the sustainable principles of modern heritage management, which highlights that heritage management should be a cohesive effort to prevent conflicts between different parties.

When Sigiriya site is concerned, the 1967 vandalism incident in Sigiriya is said to have taken place due to the resentful feeling a local man had developed as his soft drink shop was removed all of a sudden during Sigiriya tourist developments. From the side of this rural villager it is an understandable fact. (Walpola, 2021). Considering this problem, the present study was carried out with the purpose of applying and conducting the heritage value assessment to Sigiriya World Heritage Site to promote holistic management.

Materials and Methods

The qualitative research approach was followed in order to obtain the results relevant to the previously mentioned objective. This study takes the form of explorative research as it looks for facts that have not been completely published before. Primary data was collected through personal observations and structured interviews conducted with different stakeholders. Interviews were recorded with the consent of the participants. Primary data collection was done from November 2021 to March 2022.

The sample size was 42 and the sample was extracted through convenience and judgmental sampling techniques. Secondary data was much essential to get an idea about what the composition of the sample should be. Those Secondary data was collected through reliable sources and news articles and research papers. Moreover, the content from social media sites and other internet platforms were also used. Transcripts were made for the interviews conducted and then they were analyzed via content analysis with the support of NVivo software.

Results and Discussion

Table 1. Value Assessment of Sigiriya World Heritage Site

Categories of Values	Values	Attributes	For Whom
Archaeological and Historical	Depicts the early historical time period of the country and social setting	The graffiti, the remains of buildings, sculptures, frescoes	Archaeologists/ Historians
Social	Act as a social development of the country. A milestone in the social evolution of Sri Lanka	The entire site itself	The community of the country and the given region
Scientific	Evidence of scientific usage during the given time. Engineering, Irrigation technology	Plan of the fortress and construction specs	Scientists. Hydro-engineers, architects
Educational	Helps to understand the functionality of the given time period	The graffiti, the remains of buildings, sculptures, frescoes and the museum.	For anyone who wishes to learn about the past, especially younger generation, authors.
Recreational	Helps people recreate themselves	Calm environment, interior, large space	Tourists/ Visitors
Economical	Helps strengthen the national economy and the economic condition of the rural community	The entry tickets, the tourism experience and activities happen there	Government, General public, tourism practitioners, nearby shops, local craftsmen, tuk tuk owners etc.
Aesthetic	Generates a scenic beauty	The view from the summit, natural surroundings, pleasure gardens	Photographers, movie makers

The above table indicates that the same heritage site is looked upon by different people from different angles according to their interest and knowledge.

Conclusions and Recommendations

The value assessment stresses out how varied the needs of stakeholders are about the same site. Moreover, those different parties might be highly likely to get disappointed if they fail be satisfied with the specific requirements they have of the site. Sometimes, the benefits that they are seeking can be conflicting and that should be properly handled. The very first step of planning any projects based on Sigiriya in the coming time should be the findings of the value assessment. This should be kept in mind in if Sigiriya heritage site to be managed sustainably.

Keywords: *Heritage Management, Heritage Value Assessment, Holistic Management, Sigiriya*

References

Heras, V. C., Moscoso Cordero, M. S., Wijffels, A., Tenze, A., & Jaramillo Paredes, D. E. (2019). Heritage values: towards a holistic and participatory management approach. *Journal of Cultural Heritage Management and Sustainable Development*, 9(2), 199–211. https://doi.org/10.1108/jchmsd-10-2017-0070

Timothy, D. (2009). *Cultural heritage and tourism in the developing world* (1st ed.). Routeledge.

Sri Lankan Socio-Cultural Heritage Depicted in Photographs Abroad During the Colonial Period

H. R. Priyantha Lal
University College of Ratmalana, University of Vocational Technology, Sri Lanka
ravipriyanlal@gmail.com

Introduction

Photographs taken in Sri Lanka with various needs and objectives are published in some contemporary print media, and are now preserved in foreign galleries and archives. Many of them also have the ability to be viewed online. The purpose of this study is to explore the photographs taken during the Colonial period and now published in foreign online photo galleries.

Research Problem/s, Objective/s

The research problem is whether the socio-cultural identity of Sri Lanka has been preserved through photographs currently in foreign collections and to what extent these photographs have helped to express that sociocultural identity to the world. The objective of the study is to examine the nature of the communication of the photographs taken in the Colonial period in Sri Lanka.

Materials and Methods

Information could be found in various books about the history of photography in Sri Lanka, but there are a few works of literature specifically written about it. Dr. Uditha Gayashan Gunasekara's book is a PhD Thesis, and focuses on Sri Lankan images made by photographs taken in the Colonial period. "A Guide to Locating Photographs of Colonial Ceylon" published by the American Institute for Sri Lankan Studies is a repository of information on this subject and this study is based on the online galleries of this publication. The literary survey and online web galleries were used to collect data related to the study. Initially, 20 web galleries in the Ceylon Photographic Guide published by the American Institute for Sri Lankan studies and about 900 photos published in them were used for the study. The study was conducted with a qualitative research approach, using content analysis for data analysis.

Results and Discussion

There were photographs published in online galleries of 6 photographers who photographed in Sri Lanka during the Colonial period and photographs of unknown artists. The following is a list of galleries with over one million users, including photographs without the identity of the photographer.

Table 1. Several galleries that exceeding one million visitors (Stambler, 2014).

Name of the Gallery	Number of Photographs
The Alinari Archives	128 Photographs
The British Library, UK	100 Photographs
The Royal Commonwealth Society Library Photograph Project, UK	More than 1000 Photographs
Brigham Young University, USA	20 Photographs
The Philadelphia Museum of Art, USA	9 Photographs
New York State Archives, USA	7 Photographs
The National Geographic Image Collection	Approx.: 70 Photographs

These photographs identified four aspects of Sri Lanka's socio-cultural heritage as daily life, cultural life, religious activities and archaeological monuments and artifacts. In addition, there were many environmental photographs. The study-based collection of photographs is available in Asia, the West and Europe, and is widely distributed throughout the world.

Conclusions and Recommendations

Accordingly, it could be concluded that these photographs strongly express the socio-cultural heritage of Sri Lanka and that these photographs have left a mark on the cultural identity of Sri Lanka in the world. The information expressed in these photographs have also led foreigners to visit Sri Lanka for socio-anthropological and cultural studies.

Keywords: *Socio-Cultural Heritage, Photographic heritage, the Colonial Period*

References

(1994). *Library of Congress*. https://www.loc.gov/

Columbia University Libraries Finding Aids. (1992). Columbia University Libraries. https://findingaids.library.columbia.edu/

Stambler, B. (2014). *A Guide to Locating Photographs of Colonial Ceylon*. American Institute for Sri Lankan Studies.

William Louis Henry Skeen - National Portrait Gallery. (2012). National Portrait Gallery. https://www.npg.org.uk/collections/search/person/mp86248/william-

ගුණසේකර, යූ.ජී. (2011). *ශ්‍රී ලාංකේය ඡායාරූප වංශය.* සරසවි ප්‍රකාශකයෝ.

විසිවන සියවස මුල් භාගයේ ශ්‍රී ලාංකේය ඉතිහාසකරණය පිළිබඳ විමර්ශනයක්

එන්. ඊ. අයි. විජේරත්න
ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
eshanpanhinda@gmail.com

හැඳින්වීම

මෙම අධ්‍යයනය විසිවන සියවස මුල් භාගයේ ශ්‍රී ලංකාවේ ඉතිහාසකරණයේ ප්‍රභවය, විකාශය හා ප්‍රවණතා පිළිබඳ අධ්‍යයනයකි. දීර්ඝ ඓතිහාසික සම්ප්‍රදායක් ලාංකේය ඉතිහාසකරණයට පැවතුණ ද, දහසය වන සියවසේ සිට ඊට යුරෝපීය බලපෑම් එල්ල විය. දහනම වන සියවස බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරයේ නැගීමත් සමග ලාංකේය ඉතිහාසකරණය තුළ ප්‍රධාන ධාරාවන් දෙකක ඉතිහාස ශික්ෂණ සම්ප්‍රදායක් ගොඩනැගුණි. එනම්, අනුභූතිවාදී සහ ජාතිකවාදී ඉතිහාසකරණ සම්ප්‍රදාය යි. මෙම ප්‍රවණතා විසිවන සියවස මුල් භාගයේ ඉතිහාසකරණයේ වර්ධනයට බලපෑවේ ය. ඉතිහාසකරණය පිළිබඳ පූර්ව නූතන කතිකාව දහනම වන සියවසේ දී ස්වදේශීය සමාජය පිළිබඳ යටත් විජිත දැනුම් සම්පාදනය අරමුණු කරගෙන ඇත." නොදන්නා භූමියක් " (*Terra Incognita*) නම් සංකල්පය ලංකාවේ උඩරට රාජ්‍යය සම්බන්ධයෙන් යුරෝපීන් සතුව පැවතුණි. එබැවින් ලංකාව සම්බන්ධයෙන් පෘතුගීසි, ලන්දේසි හා බ්‍රිතාන්‍ය පාලන සමයන්හි වාර්තා සපයන ලද්දේ යටත්විජිත ආධිපත්‍යය ගැනීම සඳහා ය. යටත්විජිතවාදීන්ට මුල් අවධියේ උඩරට රාජධානිය යනු නොදන්නා කලාපයක් විය. යුරෝපීයන්ගේ යටත් විජිත දැනුම් සම්පාදනයට සාපේක්ෂව දේශීය සමාජයේ ඇති වූ ප්‍රති දැනුම් සම්පාදනය ජාතිකවාදයක් ලෙස ගොඩනැගුණි. එබැවින් විසිවන සියවස මුල භාගයේ රචිත ඉතිහාසය හා සබැඳි වාර්තා මෙම අධ්‍යයනයෙහිලා ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් හඳුනාගත හැකි ය. ඒ අනුව, එල්.ඊ. බ්ලේස්, පී. අරුණාචලම්, ඩොනල්ඩ් ඔබේසේකර, පෝල්. ඊ පීරිස්, එස්.ජී. පෙරේරා පියතුමා, හික්කඩුවේ සුමංගල හිමි, වල්පොල රාහුල හිමි, ඊ.ඩබ්. අදිකාරම්, ජී.සී. මෙන්ඩිස්, කොල්වින් ආර් ද සිල්වා, ජේම්ස් ද අල්විස්, ජී. පී. මලලසේකර, එච්. ඩබ්. කොඩ්රින්ටන්, විල්හෙල්ම් ගයිගර්, එච්. ජේ. සක්ලිංග්, එමර්සන් ටෙනන්ට්, එඩ්වඩ් උපම්, ජෝර්ජ් ටර්නර් ආදීන්ගේ රචනා ඇතුලු විසිවන සියවස මුල් භාගයේ මෙරට ඉතිහාසඥයන්ගේ මූලාශ්‍රය පර්යේෂණයට ලක් කරනු ලැබේ. මෙම අවධිය තුළ ඉතිහාසකරණයේ යෙදුණු ඉතිහාස ශික්ෂණවේදීන් බ්‍රිතාන්‍ය සිවිල් සේවකයන්, ව්‍යෘත්තීය ඉතිහාසඥයන්, ඉතිහාසය පිළිබඳ පුහුණුවක් නොලද ඉතිහාස රචකයන් ආදී වශයෙන් හඳුනා ගත හැකි ය. අතීතය ප්‍රතිනිර්මාණය කිරීම උදෙසා ඉතිහාසඥයන් විසින් අනුගමනය කළ ඉතිහාසකරණයෙහි විවිධ සන්දර්භ දැකගත හැකි ය. ලංකාවේ ඉතිහාසය පදනම් කරගත් නිබන්ධ, කතා ක්‍රමයේ ඉතිහාස වාර්තා, පුරාවිද්‍යා අධ්‍යයන වාර්තා මෙන් ම පශ්චාත් උපාධි අධ්‍යයන ආදිය මෙකල දැකිය හැකි ය. දහනම වන සියවස අග භාගයේ සිට විසිවන සියවස මුල් භාගයේ අවසානය දක්වා කාලවකවානුවේ ලංකාවේ ඉතිහාසකරණය පිළිබඳ අවධාරණය කෙරේ. එකල රචිත ප්‍රාථමික මූලාශ්‍රය වර්ගීකරණයට ලක් කෙරේ. ඒවා, ප්‍රතිකාල් හා ඕලන්ද භාෂාවන්ගෙන් පැවති මූලාශ්‍රය කෙරෙහි අවධානය යොමු කළ ලේඛන, දේශීය පාලි වංසකතා ආශ්‍රේය මාර්ග කරගත් විවරණ, බ්‍රිතාන්‍ය රාජ්‍ය ලේඛන පාදක කරගත් අධ්‍යයන, පාලි අට්ඨකතා විමසුමට ලක් කළ මූලාශ්‍රය, ඉතිහාසය පාඨ්‍ය ග්‍රන්ථ, සමස්ත ඉතිහාස කෘති හා සාමාන්‍ය ගණයේ ඓතිහාසික කෘති ලෙස විවරණය කළ හැකි ය. විසිවන සියවස මුල් භාගයේ ලාංකේය ඉතිහාසකරණය පිළිබඳ ප්‍රාථමික මූලාශ්‍රය විශේෂයක් වශයෙන් ඒවා කොතෙක් දුරට වැදගත් වන්නේ ද යන්න හඳුනාගැනේ.

පර්යේෂණ ගැටලුව, පර්යේෂණ අරමුණු

දහනම වන සියවසේ ඉතිහාස ශික්ෂණවේදය පිළිබඳ පූර්ව නූතන කතිකාව ස්වදේශීය සමාජය පිළිබඳ යටත්විජිත දැනුම් සම්පාදනය අරමුණු කරගෙන ඇතත්, විසිවන සියවසේ දී ජාතිකවාදී දෘෂ්ටිවාදය හා නවීන විචාරාත්මක ඉතිහාස ශික්ෂණය මත ලාංකේය නූතන ඉතිහාසකරණය ආයතනගත ඉතිහාසකරණයක් දක්වා වර්ධනයට පත්වන්නේ මන්ද? යන ගැටලුවට පිළිතුරු සැපයීම මෙම අධ්‍යයනයේ පරමාර්ථය වේ.

පර්යේෂණ ක්‍රමවේදය

විද්‍යාත්මක ඉතිහාසකරණයේ ඥානමීමංසාව උදෙසා ඓතිහාසික පර්යේෂණ ක්‍රමවේදයත්, ඥාන විභාග අධ්‍යයනයේ දී යොදා ගන්නා සංකථන විශ්ලේෂණයත් යන අංග දෙකම යොදා ගැනේ. ලංකාවේ පූර්ව නූතන ඉතිහාසකරණ සම්ප්‍රදාය හා විසිවන සියවස මුල් භාගයේ නූතන ඉතිහාසකරණය අතර පවතින වෙනස ඉතිහාස ශික්ෂණවේදයේ ක්‍රමවේද හා ප්‍රවේශ තුළින් හඳුනාගැනීම මෙහි අරමුණ වේ. ගැටලුව ගවේෂණය කිරීමේ දී මෙම අධ්‍යයනයට මග පෙන්වන මූලික තීසිසය වන්නේ , විසිවන සියවසේ මුල් භාගයේ ලාංකේය ඉතිහාසකරණය දහනම වන සියවසේ ඉතිහාසකරණයට වඩා වෙනස් මගක් ගත් බව ය. පුරාතනය පිළිබඳ අධ්‍යයනය හා යටත්විජිත ව්‍යාපෘතිය සහ නවීන දැනුම් නිෂ්පාදනය අතර සම්බන්ධය විසිවන සියවසේ ඉතිහාසකරණ ශික්ෂණය තුළ සුසමාදර්ශය (*Paradigm*) වෙනසකට ලක් වූ බවයි.

ප්‍රතිඵල හා සාකච්ඡාව

ලංකාවේ පූර්ව නූතන ඉතිහාසකරණ සම්ප්‍රදාය සහ විසිවන සියවස මුල් භාගයේ නූතන ඉතිහාසකරණය අතර පවතින වෙනස ඉතිහාස ශික්ෂණවේදීත්වයේ ක්‍රමවේදය, අරමුණු හා ප්‍රවේශයන් තුළින් හඳුනා ගැනීමට ප්‍රයත්න දරා ඇත. ඒ අනුව, (අ) ස්වදේශීය සමාජය පිළිබඳ යටත්විජිත දැනුම් සම්පාදනය පිළිබඳ න්‍යායාත්මක ප්‍රවේශයක් ගොඩනඟා ගන්නේ කෙසේ ද? (ආ) පුරාතනය පිළිබඳ අධ්‍යයනවල ආරම්භය සිදු වූයේ කෙසේ ද? සහ (ඇ) මුල් කාලීන ඉතිහාසකරණ පරිශ්‍රම තුළ දක්නට ලැබෙන මූලික ලක්ෂණ මොනවා ද යන්නත් විමසීමට ලක් කෙරේ. සමකාලීනව අපරදිග ඉතිහාස ශික්ෂණවේදීත්වය තුළ ප්‍රචලිත වූ **නව ඉතිහාසය** ලිවීමේ සම්ප්‍රදාය ප්‍රංශයේ අනාල්ස්

ගුරුකුලය (***Annales School***) හරහා ජනප්‍රිය වීමත්, ලාංකේය ඉතිහාසඥයෝ 1960 දශකය හා 1970 දශකය වන විට නව ඉතිහාසය ලිවීමේ සම්ප්‍රදායෙන් පෝෂණය වූහ. එහි ප්‍රතිඵලය වූයේ කතා ක්‍රමයේ ඉතිහාසයෙන්, විවරණ ක්‍රමයේ ඉතිහාසය වෙත නැඹුරු වීමේ ප්‍රවණතාව යි. එහි දී පාලි වංසකතා මූලාශ්‍රය ඇසුරෙන් කාලානුක්‍රමික ඉතිහාසය ගොඩනැගීමට වඩා විවරණ ක්‍රමයේ ඉතිහාස ශික්ෂණවේදීත්වයක් ගොඩනැගීම සිදු වූ බව නිගමනය කළ හැකි ය. විසිවන සියවස මුල් භාගයේ ලාංකේය ඉතිහාසකරණ පාලි වංසකතා, අට්ඨ කතා සහ ටීකා පදනම් කරගත් අධ්‍යයන හරහා වර්ධනයට ලක්විය. සාම්ප්‍රදායික ඉතිහාසකරණය අඛණ්ඩතාව සඳහා මහාවංසය අඛණ්ඩව රචනා වීම, මහාවංසයේ සිංහල පරිවර්තන, මහාවංසය පදනම් කරගත් සාම්ප්‍රදායික ඓතිහාසික රචනා, මහාවංසය සහ පුරාතනය පිළිබඳ අධ්‍යයන (***Antiquarian Studies***) ද මෙම අවධියේ ඉතිහාස ශික්ෂණවේදීත්වයේ ප්‍රවණතා විය. විසිවන සියවස ආරම්භක අවධියේ ලංකාවේ විද්‍යාත්මක ඉතිහාසකරණයේ සංවර්ධනය හේතුවෙන් සාම්ප්‍රදායික ඉතිහාසකරණය සමඟින් ගැටුම් නිර්මාණය විය. එසේ ම, විද්‍යාත්මක ඉතිහාසකරණයේ බලපෑම ලැබූ සාම්ප්‍රදායික ඉතිහාසකරණයක් ද ගොඩ නැගුණි. විසිවන සියවස දෙවන, තෙවන දශකවල ඉතිහාසය හා ඊට සමගාමී විෂයයන් ඇසුරෙන් යුරෝපීය විශ්වවිද්‍යාලවල පශ්චාත් උපාධි අධ්‍යයනයේ නිරත වූ ජී. සී. මෙන්ඩිස් යුරෝපයේ වර්ධනයට පත්ව තිබූ විචාරාත්මක ඉතිහාසකරණයේ ආභාසය ලැබීය. එබැවින් මෙන්ඩිස්ගේ අධ්‍යයනය හරහා බ්‍රිතාන්‍යය අනුභූතිවාදී ඉතිහාසකරණ බලපෑම් ද ලංකාවට බලපා ඇත. මෙම අධ්‍යයනය පදනම් වන්නේ විසිවන සියවස මුල් භාගයේ ලාංකේය විද්‍යාත්මක ඉතිහාසකරණයේ විකාශය වර්ධනය හා ප්‍රවණතා පිළිබඳ ගවේෂණාත්මක අධ්‍යයනයක් සඳහා ය. යටත් පිරිසෙයින් වැඩි කාල පරිච්ඡේදයක් අයත් වන්නේ බ්‍රිතාන්‍ය යටත් විජිත අවධියට ය. එබැවින්, ලංකාවේ යටත් විජිත අවධියේ අවසාන අවධියේ ඉතිහාසකරණය පිළිබඳ මෙහි දී අවධානය යොමු කෙරේ.

නිගමන සහ නිර්දේශ

දහනම වන සියවසේ වෛෂයික ඉතිහාසය ලිවීම පිළිබඳ යුරෝපීය බලපෑම් ලැබුණු බව ද, විසිවන සියවස මුල් භාගයේ සාම්ප්‍රදායික ඉතිහාසකරණයේ සුසමාදර්ශ වෙනස් වීමෙන් යටත්විජිත දැනුම් සම්පාදනයෙන් ඔබ්බට ගමන් කළ බව ද, පශ්චාත් නූතන ඉතිහාසකරණ කතිකාව 1956 දී ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය ව්‍යාපෘතිය මගින් ආයතනගත ඉතිහාසකරණයක් දක්වා වර්ධනය වූ බව නිගමනය කෙරේ.

ප්‍රමුඛ පද: *ඉතිහාසය , ඉතිහාසකරණය , විසිවන සියවස මුල් භාගයේ ඉතිහාසකරණය*

ආශ්‍රිත ග්‍රන්ථ

අත්තනායක, ඒ. (1994). *දහනම වැනි සියවසේ බ්‍රිතාන්‍යයන් දුටු ලංකාව*. බුක්ස් පබ්ලිෂින් හවුස්.

විජයරත්න, ඊ. (2019). *ජී.සී. මෙන්ඩිස්: ශ්‍රී ලාංකේය නූතන ඉතිහාසකරණයේ පුරෝගාමියා*. පන්හිඳ ප්‍රකාශන.

විජයරත්න, ඊ. (2021). *ඉතිහාසකරණයේ විද්‍යාවේදියා: ශ්‍රී ලංකාවේ නූතන ඉතිහාසකරණ කතිකාවෙහි ලා රණවීර ලෙස්ලි ගුණවර්ධනගේ භූමිකාව*. පන්හිඳ ප්‍රකාශන.

De Silva, K. M. (1978). *History and historian in twentieth century* (G.C. Mendis Memorial Lecture). *Sri Lanka Journal of Social Sciences.*

Perera, F. (1974). *The early Buddhist historiography of Ceylon* [Ph.D Thesis]. Georg-August-Universität.

ඇත්දළ කැටයම් කලාව තුළින් හෙළි වන ඇඳුම් හා ආභරණ භාවිතය

එච්. එම්. එන්. එම්. ඒකනායක* සහ ඩබ්ලිව්. ඒ. ඩී. වී. මධුෂාණි
මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
**nimeshaekanayake65@gmail.com*

හැඳින්වීම

දේශීය කැටයම් කලාවේ සුළු කලා නිර්මාණ අතර වැදගත් නිර්මාණයක් ලෙස ඇත්දත් කැටයම් කලාව හැඳින්විය හැකිය. මෙම කැටයම් කලාවේ ඉතිහාසය මානව ශිෂ්ටාචාරයේ ආරම්භය දක්වා දිවයයි. අතීතයේ සිට වැදගත්කමක් ගන්නා සේම ඇත් දළින් නිර්මාණය කරන ලද කලා කෘතීන් විශාල සංඛ්‍යාවක් පවතින අතර ඒවා කෞතුකාගාර හා විහාරස්ථාන මුල් කරගෙන දැකිය හැකිය. එමෙන්ම ප්‍රභූත්වය පෙන්වීම හා සෞභාග්‍යත්වය දැක්වීමට ඇත් දත් භාවිතා කර ඇත. අභිලේඛනවල ''දට්ඨික'' යනුවෙන් හඳුන්වන ලද්දේ ඇත්දත් කැටයම් ශිල්පීන් ය. පරණවිතාන මහතා "දට්ඨික" යන පදයෙන් ඇත්දත් කැටයම් ශිල්පය අර්ථ ගැන්වෙන බව දක්වා ඇත (Paranavithana,1970:XCVIII). ඒ අනුව පුරාතන යුගයේ පටන් පැවත එන සුළු කලා නිර්මාණ අතර ඇත්දළ කැටයම් කලාව තත්කාලීන සමාජයේ විවිධ පැතිකඩයන් නිරූපණය කරන බව හඳුනා ගත හැකි ය.

පර්යේෂණ ගැටලුව, පර්යේෂණ අරමුණු

ඇත්දළ කැටයම් තුළින් හෙළි වන ඇඳුම්, ආභරණ භාවිතය හා සමාජමය පසුබිම කෙබඳු ද යන්න මෙම පර්යේෂණයේ ගැටලුව වේ. ඇත්දළ කැටයම් තුළින් නිරූපිත කලාත්මක වැදගත්කම හඳුනා ගැනීම මෙම පර්යේෂණයේ අරමුණ විය.

පර්යේෂණ ක්‍රමවේදය

ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය අධ්‍යයනය මෙහි අධ්‍යයන ක්‍රමවේදය වශයෙන් භාවිත කරන ලදි.

ප්‍රතිඵල හා සාකච්ඡාව

ලාංකේය ඉතිහාසයේ මුල් කාලයේ සිට ම ඇත් දළ කැටයම් කලාව දියුණු තත්ත්වයක තිබූ බව වංශකතාගත කරුණු අනුව සනාථ වේ. ශ්‍රී ලංකාවේ ඇත් දත් කැටයම් කලාවට දීර්ඝ ඉතිහාසයක් ඇති බවට හමු වී ඇති සාධකවලින් අනාවරණය කරගැනීමට හැකි වී ඇත. ඇත් දළ උපයෝගී කොටගෙන සිදුකරන ලද නිර්මාණ පිළිබඳව වංශකතාවල පිළිබිඹු වන අවස්ථාවක් වංසත්තප්පකාසිනියේ සඳහන් වේ. ඒ අනුව ''....පළිඟු අතළ මනරම් බිමෙහි ඇත් දළින් කළ මනහර පළඟෙක්.....''යනුවෙන් විවිධ නිර්මාණයන් කළ බවට සාධක පවතී (වංසත්තප්පකාසිනිය, 2001, පි. 401). කැටයම් කලාවේ දී ඇත් දත් නිර්මාණ දේශීය මෙන්ම විදේශීය වශයෙන් ද සුවිශේෂී තැනක් ගත්හ. එබැවින් ඇත් දත් කැටයම් කලාවේ දී මෝස්තර බහුල ව යොදා ගෙන ඇත.

අනුරාධපුර යුගයේ දී ජෙට්ඨතිස්ස රජු විසින් ඇත් දත් කැටයම් කලාවේ විශිෂ්ට නිර්මාණයන් කළ බව සඳහන් වේ (මහාවංශය, පරි-37, ගාථා.100-103). නමුදු මේ පිළිබඳව පුරාවිද්‍යාත්මක සාධක නොවුව ද මෙම යුගය වන විට ඇත්දත් කර්මාන්තයෙහි ප්‍රවීණයන් සිටි බවත් ඒ ආශ්‍රිත කැටයම් කලාව වර්ධනීය අවධියක් වූ බවත් පිළිගැනීමට හැකිවේ. මහා පරාක්‍රමබාහු රජ දවස පොළොන්නරුවේ උයනක් කරවා එහි අංග ඇත් දත් කැටයමින් අලංකාරය කළ බව සඳහන් වේ. හතරවන බුවනෙකබාහු රජු දවස ඉන්දීය නිලධාරීන් විසින් ඇත්දත් කැටයම් කර වූ බවත් එය කැටයම් කලාවේ උන්නතියට හේතු වූ බවත් සඳහන් වේ. ඇත් දළයෙන් කළ අගනා උළුවස්සක් කුරුණෑගල රීදී විහාරයේ දක්නට ලැබේ. මෙය කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ අනුග්‍රහයෙන් තිබ්බටුවාවේ මහානායක ස්වාමීන් වහන්සේගේ අනුශාසනා පරිදි නිර්මාණය කරන ලද නිර්මාණයකි. මහනුවර දළදා මාළිගයේ උඩ මළුවේ ද දක්නට ලැබෙන ඇත්දත් කැටයම් සහිත උළුවස්ස ඉතා වැදගත් කැටයමකි. කීර්ති ශ්‍රී රාජසිංහ රජු විසින්ම කරවා ඇත. මාතර හින්තැටිය රජමහා විහාරයට අයත් ඇත්දත් මණ්ඩපය ද විචිත්‍ර නිර්මාණයකි. අස්ගිරිය විජේසුන්දරාරාමයේ දක්නට ලැබෙන ඇත්දත් පිළිමය ද වැදගත් වේ. අභය මුද්‍රවෙන් යුක්ත මහනුවර යුගයේ චීවර ලක්ෂණ සහිත ව නිර්මාණය කරන ලද මෙම බුද්ධ ප්‍රතිමාව මණ්ඩපයක් මත තැන්පත් කොට තිබේ. මෙම මණ්ඩපය ද මහනුවර යුගයේ පත්තිරිප්පුවට සමාන වන අතර එය ද හස්ති කැටයමින් අලංකාර කොට ඇත. එමෙන් ම වැලිවිට ශ්‍රී සරණංකර සංඝරාජ හිමියන්ට සංඝරාජ පදවිය පිරිනැමීමේ දී කීර්ති ශ්‍රී රාජසිංහ රජු විසින් පූජා කරන ලද විජිනිපතෙහි ඇත්දළ සහිත මිටක් විය. වර්තමානයේ මල්වතු විහාරයේ තැන්පත් කර ඇති මෙය කලාත්මක නිර්මාණයකි.

අතීතයේ සිට මහනුවර යුගය දක්වා විකාශනය වූ දළකඩ කැටයම් කලාවේ කලාත්මක නිර්මාණ අතර ඒවාහි ඇඳුම් හා ආභරණ භාවිතය සුවිශේෂී වේ. හමු වී ඇති සාධක මත මෙම ඇත් දළ නිර්මිතයන් භාවිත කර ඇත්තේ ප්‍රභූ නිලධාරීන් ය. රුවන්වැලි සෑයේ වාහල්කඩ කැණීමේ දී හමු වූ කුඩා ප්‍රමාණයේ ස්ත්‍රී රූපයෙහි ඉනේ මුතු වැලක් පළන්දා ඇත. වටිනා ද්‍රව්‍ය පැළඳ සිටින්නේ ප්‍රභූ ස්ත්‍රීන් ය. විශේෂයෙන් තම සමාජ තත්ත්වය පෙන්නුම් කිරීමේ සාධකය වශයෙන් මෙම ඇත්දළ නිර්මාණ පරිහරණය හා ළඟ තබා ගැනීම සිදු කර ඇත. ඇඳුම් හා ආභරණ පිළිබඳ පැහැදිලි ව සඳහන් වන්නේ 10 වන සියවසින් පසුව ලියැවුණු සාහිත්‍යය මූලාශ්‍රයවල ය. ඇත්දත් කැටයම් කලාව ද මහනුවර හා දකුණු පළාත් ආශ්‍රිත ව ඉතා ප්‍රසිද්ධ කර්මාන්තයකි. මෙම කර්මාන්තය ආශ්‍රිත ව පරම්පරා වෙසෙනුයේ මාවනැල්ල උතුවන්කන්ද ආශ්‍රිත ව ය. මෙම ඇත් දළ කැටයම් සඳහා පලාපෙති, ලියවැල්, නාරිලතා මල, සැරපෙන්දියා, හංස, හේරුඬ පක්ෂියා, ලියපත් සහ අරිම්බුව වැනි සැරසිලි භාවිත කිරීම දැකිය හැකිය. සුවඳ පැන් ඉසීම සඳහා වන කෙණ්ඩි, මහා ධාතු කරඬු පිළිම, වටාපත්, පුස්කොළ පොත් කම්බා හා ආභරණ පෙට්ටි ආදී භාණ්ඩ ඇත් දළ උපයෝගී කොටගෙන නිර්මාණය කර ඇති තවත් නිර්මාණ කිහිපයකි. ඇත් දළ කැටයම්වල මිනිස් රූප මඟින් නිරූපණය වන ඇඳුම් ආයිත්තම් ද ඇත් දළින් නිමවා ඇති ආභරණ වන මාල, වළලු මෙන් ම පනා, කොණ්ඩ

කටු, මංජුසා ආදිය ද කලාත්මක නිර්මාණ අතර වැදගත් වේ. කොළඹ ජාතික කෞතුකාගාරයේ දක්නට ලැබෙන කරඬු සහ ප්‍රතිමා අතර ඇත්දත් කරඬු ලෝහ පටි යොදා ගනිමින් නිර්මාණය කර ඇත. ඒ අතර රදළවරුන්ගේ පිළිම, කාන්තාවන්ගේ පිළිම, කුඩා ප්‍රමාණයේ ප්‍රතිමා, බෙර වාදක ප්‍රතිමා, රටේ මහත්තයෙකුගේ ප්‍රතිමා, හිටි ප්‍රතිමා, හිඳි ප්‍රතිමා, ආදිය ද රාජකීය මන්තය සහිත ඇඳුම්, රදළ රූපවල මන්තේ සහිත බෝ හැට්ටය, බෝ පටිය, ආභරණ ආදී ඇඳුම් ආයිත්තම් ද වේ.

ඇත්දළවලින් කළ රාජකීයකුගේ රූපය මහනුවර යුගයේ ඇඳුම් හා ආභරණ භාවිතය පිළිබඳ කදිම නිදසුනකි. ආභරණ, ඇඳුම, ඔටුන්න, රැවුල පවා නිර්මාණය කර තිබේ. මහනුවර යුගයේ භාවිත ඇඳුම් අතර වන මෙම ජෝතිය සහිත කලිසම හා මන්තය සහිත හැට්ටය ඉතාමත් සියුම් රටා යොදා ගනිමින් නිර්මාණය කර ඇත. මහනුවර කෞතුකාගාරයේ ඇති කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ යයි සිතිය හැකි මෙම ඇත්දළ ප්‍රතිමාවේ මාල 04ක් පැළඳ සිටින අතර විශාලතම මාලයේ ගරුඬ පක්ෂියා කැටයම් කර තිබේ. මෙහි වන ඉතා හොඳ ඉවසීම ශිල්පීය කුසලතාව මැනවින් නිරූපණය කරන්නකි. එසේ ම දළකඩ නිර්මාණ අතර සුලභ ව දක්නට ලැබෙන්නේ හිටි බුද්ධ ප්‍රතිමා ය. අභය මුද්‍රාවෙන් ඇති මෙය දැකුම්කලු ය. සිරුරේ පාරූපණය සමාන්තර රේඛා ලෙස පහළට දක්වා ඇත. මුද්‍රාව සහිත හිටි පිළිමයේ ද සිවුරේ රැළි සැකසීමේ දී ඉතා සියුම් ලෙස දක්වා ඇත. අභය මුද්‍රාවෙන් සිටින සිරස්පතක් තිබෙන කුඩා හිටි පිළිම මේ අතර වැඩි වශයෙන් හඳුනා ගත හැකි වේ. කෝට්ටේ හා මහනුවර යුගයන්ට අයත් ඇත් දළ කැටයම් අතර බොහෝ පනාවල නාටිකාංගනාවන් දක්වා තිබේ. ඒ අනුව ඇත් දත්වලින් කළ පනාවල වැඩිපුර දක්නට ලැබෙන්නේ කාන්තා රූප ය. ඒ අතර කොළඹ ජාතික කෞතුකාගාරයේ දක්නට ලැබෙන පනාවල කුන්දිරක්කන් කැටයම, අරිම්බුව, නලඟන රූප, කුරුලු රූප, ලියවැල ආදි වශයෙන් මධ්‍ය කොටස් ගණනාවක් බෙදා ඉතා සියුම් කැටයම් නිර්මාණ ලෙස නිර්මාණය කර ඇත. කාන්තා රූප තුනක් ලෙස නිර්මාණය කර ඇති කැටයම අනුව දරුවෙකු වඩාගෙන සිටින කාන්තා රුව, කුරුලු රූපය, ප්‍රේමවන්ත යුවලක් වශයෙන් හඳුනා ගත හැකි ය. මෙය නිර්මාණ ශිල්පියාගේ දක්ෂතාවය පිළිබිඹු කරන අතර ඔහුගේ කල්පිතයක් ලෙස නිර්මාණය වූ බවට ද හඳුනා ගත හැකි ය. පනාවක කොටසක් ලෙස දැක්වෙන රූපයේ කිරිදෙන මවකගේ රූපයක් ද ඒ අසල කුරුලු රූපයක් ද දක්නට ලැබේ. සිටගෙන රූප තුනකින් යුක්ත පනාවක් ද දක්නට ලැබේ. මහනුවර කෞතුකාගාරයේ ඇති කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ යයි සිතිය හැකි ඇත්දළ ප්‍රතිමාවේ මාල 04ක් පැළඳ සිටින අතර විශාලම මාලයේ ගරුඬ පක්ෂියා කැටයම් කර තිබේ. රිදී විහාරයේ ගබඩා කාමරයේ දොර අලංකරණ නිර්මාණ අතර නලඟනන් ද කන් හැඳිවල කාන්තා රූප ද ඇත්දළින් නිම වූ මිනිස් රූප අතර රටේ මහතුන්, බෙර වයන්නන්, කාන්තාවන්, රජුන්, රදලයන් ද දක්නට ලැබේ. රදළ රූපවල මන්තේ සහිත බෝ හැට්ටය, බෝ පටිය, ආභරණ ආදී ඇඳුම් ආයිත්තම් වේ. ඇත් දළ කැටයම් කලාවේ දී යොදා ගෙන ඇත්තේ ඉතාමත් සියුම් කලාත්මක මෝස්තර රටා ය. ඝනත්වය හා වර්ණය එහි කලාත්මක බව තීව්‍ර කිරීමට සමත් ය.

නිගමන සහ නිර්දේශ

දළකඩ කැටයම් කලාවේ කැටයම්කරුවා විසින් කැටයම් කර ඇති ඇඳුම් - පැළඳුම් හා ආභරණ ආදිය මඟින් එම සමය තුළ දී මෙරට පැවති සමාජ, ආර්ථික තත්ත්වය පිළිබඳ ව මනා වැටහීමක් ලබා ගත හැකි ය. සුඛෝපබෝගී ජීවිතයක් ගත කළ ඉහළ පැලැන්තියේ හා සාමාන්‍ය ජීවිතයන් ගෙන ගිය මධ්‍යම පංතිකයන් ද වශයෙන් සමාජය තුළ පංති ස්තරායනයක් පැවති බව පැහැදිලි ය. මිනිස් රූප නිර්මාණයේ දී කැටයම්කරුවන් නිතර ම ප්‍රභූන් කැටයමට නැඟීමට උත්සාහ ගත් බව පෙනේ. එසේ ම විදේශීය ආභාසයන් විලාසිතා සඳහා එක් වීම ද මෙමඟින් හඳුනා ගත හැකි ය. එබැවින් දළකඩ කැටයම් නිර්මාණ කලාත්මකභාවය, නිර්මාණාත්මක තාක්ෂණය, සමකාලීන සමාජයේ පැවති දේශපාලනික, ආර්ථික, සමාජීය පසුබිම මනා ව හෙළිදරව් කරන්නකි.

ප්‍රමුඛ පද: *ආභරණ, ඇඳුම්, කලාත්මක, කැටයම්, සමාජය*

ආශ්‍රිත ග්‍රන්ථ

විමලජෝති හිමි, කේ. (2003). මහාවංශය (සිංහල). බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

අමරවංස හිමි, ඒ., හා දිසානායක, එච්. (1994). වංසත්තප්පකාසිනි.

කුමාරතුංග, එච්.ඩබ්. (2002). මධ්‍යකාලීන මහනුවර යුගයේ පාරම්පරික කලා කර්මාන්ත චිත්‍ර කලාව 1. සී/ස ඇසී ගොඩගේ සහ සහෝදරයෝ.

කුමාරස්වාමි, ඒ. (2011). *මධ්‍යකාලීන සිංහල කලා.* තිසර ප්‍රකාශකයෝ.

Paranavithana, S. (1970). *Inscriptions of Ceylon*, Vol. I, Department of Archaelogy.

ශ්‍රී ලංකාවේ ද්‍රවිඩ අභිලේඛන ඇසුරෙන් හෙළි වන හින්දු ආගමික ඉතිහාසය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

එච්. එම්. එන්. එම්. ඒකනායක

මානව ශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

nimeshaekanayake65@gmail.com

හැඳින්වීම

පුරාතන ලංකාවේ ආගමික ඉතිහාසය බුදු දහම හඳුන්වා දීමටත් පෙර කාලයට දිව යන්නකි. ඒ අනුව මෙරට ජනතාව අතර පැවති බ්‍රහ්ම, ඉන්ද්‍ර, සූර්යය වැනි දේව ඇදහිලි ද ස්වදේශීය ජනයා අතර වූ යක්ෂ, නාග හා දේව යන ඇදහිලි ක්‍රම ද ගත් කල මේ කිසිවක් සංවිධානාත්මක ආගම් ලෙස සැලකිය නොහැකි ය. සංවිධානාත්මක ආගමක් ලෙස බුදු දහම වර්ධනය වුව ද බුදු දහමට මෙන් ම ආගමික කටයුතු තුළ අනුරාධපුර මුල් යුගයේ බ්‍රාහ්මණ ආගමටත් එම යුගයේ අවසාන කාලයේ හා ඉන් පසු පොළොන්නරු යුගයේ දී බ්‍රාහ්මණ ආගම ඇසුරෙන් වර්ධනය වූ හින්දු ආගමටත් වැදගත් ස්ථානයක් ලැබිණි. දකුණු ඉන්දියාවේ වර්ධනය වූ හින්දු ආගම ද්‍රවිඩ රාජ්‍යයන්ගේ රාජ්‍යය ආගම බවට ඒ අනුව පත් විය. විෂ්ණු ඇදහීම උතුරු ඉන්දියාවේ ජනප්‍රිය වූ අතර ශිව ඇදහීම දකුණු ඉන්දියාවේ ප්‍රචලිත විය. ලංකාවට හින්දු ආගම ලැබීමට ප්‍රධානම හේතුව වූයේ ද්‍රවිඩ ආක්‍රමණයන් ය. ලංකාව ආක්‍රමණය කළ ද්‍රවිඩයන් මෙන් ම ආක්‍රමණිකයන්ගේ පාලන කාල තුළ සංක්‍රමණය වූ ද්‍රවිඩ පිරිස් ද මෙරට ස්ථිර ව ම පදිංචි වීම නිසා ලංකාවේ හින්දු ආගමික ජන සමාජයක් ස්ථාපිත විය. 11 වන සියවසින් පසුව මෙරටට එල්ල වූ ද්‍රවිඩ බලපෑම සමඟ එම ආභාෂය මෙරටට ලැබුණු බැවින් ද සිංහල අභිලේඛන මෙන් ම ද්‍රවිඩ භාෂාවෙන් රචිත අභිලේඛන ද පොළොන්නරු යුගය වන විට දී පිහිටුවා තිබීම දක්නට ලැබේ.

පර්යේෂණ ගැටලුව, පර්යේෂණ අරමුණු

ශ්‍රී ලංකාවේ ද්‍රවිඩ අභිලේඛන ඇසුරෙන් හෙළි වන හින්දු ආගමික ඉතිහාසයේ ස්වභාවය කෙබඳු ද යන්න මෙම පර්යේෂණයේ ගැටලුව වේ. හින්දු ආගමික ඉතිහාසයේ විකාශනය ද්‍රවිඩ අභිලේඛන මූලාශ්‍රය ඇසුරින් සොයා බැලීම මෙම පර්යේෂණයේ අරමුණ වේ.

පර්යේෂණ ක්‍රමවේදය

මෙහි දී යොදා ගන්නා ලද පර්යේෂණ ක්‍රමවේදය ඓතිහාසික පර්යේෂණ ක්‍රමවේදයයි. දත්ත සපයා ගැනීම සඳහා පුස්තකාල අධ්‍යයනය සිදු කරන ලදී. ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය ආදී මූලාශ්‍රය රැසක් අධ්‍යයනයට ලක්කොට ලබා ගත් දත්ත සංසන්දනාත්මකව සහ විශ්ලේෂණාත්මකව අධ්‍යයනය කරමින් නිගමනවලට එළඹීම මෙහි පර්යේෂණ ක්‍රමවේදය වේ.

ප්‍රතිඵල හා සාකච්ඡාව

ශ්‍රී ලංකාව යටත් කර ගෙන සිටි චෝල පාලකයන් කිහිප දෙනෙක් වෛෂ්ණවයන් වූ නමුත් වැඩි දෙනා ශෛව භක්තිකයෝ වූහ. චෝල ආධිපත්‍යය පැවති කාලයේ දී බ්‍රාහ්මණයන් බොහෝ දෙනෙකු මෙරටට පැමිණි බව පෙනේ. එබැවින් 1වන විජයබාහු රජතුමා රාජ්‍යත්වයට පත් වූ පසුත් බ්‍රාහ්මණාගමට වෙනස්කමක් නොදක්වන ලදි (හේමචන්ද්‍රරාය, 1972). චෝල යුගයේ පිහිටුවන ලද කෝවිල්වල වැඩ කටයුතු එපරිද්දෙන් ම කර ගෙන යාමට ඉඩ දුන් හෙතෙම තම රාජ්‍යය කාලය තුළ දී පිහිටුවන ලද කෝවිල්වලට ද අනුග්‍රහ කළේ ය. ඒ අනුව චෝල ආක්‍රමණිකයන්ගේ විනාශකාරී ප්‍රහාරයන් හා සසඳන විට හිතා මතා කරන ලද ආගම් විරෝධී විනාශයක් හෝ කෙලෙසීමක් 1වන විජයබාහු රජුගේ සේනාව විසින් චෝලයන් හා යුද වැදුණු කිසිදු අවස්ථාවක සිදු වූ බව වාර්තා වී නැත. නියමාකාරයෙන් සිදු වී ඇත්තේ හින්දු කෝවිල් ආදිය ආරක්ෂා වී සිංහල බෞද්ධ රජුන්ගේ අනුග්‍රහය පවා නොකඩවා ලැබීම ය (විජේතුංග, 2016). කන්තලේ ද්‍රවිඩ ලිපියට අනුව කන්තලෙන් හමු වී ඇති විජයරාජ - ඊශ්වරන් කෝවිලට 1වන විජයබාහු රජු විසින් කරන ලද ප්‍රදානයන් හා ඊට යාබද විජයරාජ - චතුර්වේදි මංගලම් නම් බ්‍රාහ්මණ ගම් පියසක් ආරක්ෂා වී තිබීම මෙම සහනශීලී ආකල්පයට නිදසුන් ලෙස දැක්විය හැකි ය (Codrington, 1994).

හින්දු ආගම පිළිබඳ ව ශ්‍රී ලංකාවෙන් තොරතුරු හමු වන පැරණිත ම අභිලේඛන අයත් වන්නේ ක්‍රි.ව 10 වන සියවසට ය (ඉන්දික, 2012, පි.188). අනුරාධපුර හින්දු නටබුන් ප්‍රදේශයෙන් හමු වූ දම්ළ ශිලා ලිපි දෙකක හින්දු දේවස්ථානවලට සිදු කරන ලද ප්‍රදානයන් පිළිබඳ සඳහන් වේ. මෙම අංක 1 ශිලා ලිපියට අනුව 'කුමාරකනම්' නම් ආයතනයක සාමාජිකයන් විසින් ශිව දේවාලයක දිනපතා පැවැත් වූ දේවාල පූජා කටයුතු හා එහි පහන් දැල්වීම සඳහා ඊළක්කාචු 30ක් ප්‍රදානය කර තිබේ. එම පිරිස විසින් වසර දෙකකට පසුව නැවත වරක් හින්දු දේවාලයකට ඊලක්කාචු 30ක් ලබා දුන් බව එම අංක 2 ශිලා ලිපිය වාර්තා කරයි. මේ අනුව 'කුමාරකනම්' යන්න දකුණු ඉන්දීය සෙල්ලිපිවල ද හමු වන බව පෙන්වා දෙන ඉන්ද්‍රපාල ඔවුන් හින්දු සිද්ධස්ථානවල භාරකාරත්වය දරූ පිරිසක් වන්නට ඇතැයි යන මතය ද එක් විකල්ප මතයක් ලෙස ඉදිරිපත් කර තිබේ (Indrapala, 1971, p. 3). එසේ ම මෙම ශිලා ලිපි හමු වූ ප්‍රදේශයේ ශිව හා කාලි දේවාලවල නටබුන් දක්නට ලැබීම ද මේ බව තවදුරටත් තහවුරු කරයි.

12 වන සියවසට අයත් දෙමළ භාෂාවෙන් ලියන ලද අභිලේඛනයක් වන වේළයික්කාර පුවරු ලිපියට අනුව ද විජයබාහු රජු මිය ගිය පසුව අර්බුද පැවති කාලයේ දී දළදා මැදුර රැකවල් කිරීමට වේළයික්කාර සේනාව කැමති කරවා ගත් ව්‍යාකරණාකාර මොග්ගල්ලාන මහා ස්ථවිරයන් වහන්සේ උත්තර මූලායතනයට අයත් කෙනෙකු වූ බව එම කුලී හමුදාව විසින් පිහිටුවන ලද මෙම ද්‍රවිඩ සෙල්ලිපියේ දක්වා තිබේ (Wickramasinghe, 1994, p. 254). ඒ අනුව දළදා මාළිගය වේළයික්කාර හමුදාවේ ආරක්ෂාව යටතට පත් කිරීම නිසා දළදා හෝ පාදාවටත් දළදා මාළිගාවටත් ආරක්ෂාව සැපයිය යුතු අවස්ථාවක් උදා වී තිබූ බව පෙනේ. රටේ පැවති වියවුල්කාරී තත්ත්වයන් නිසා ඇමතියන් කිහිප දෙනෙකු සමඟ මොග්ගල්ලාන මහා ස්ථවිරයන් එකල බල සම්පන්නව සිටි වේළයික්කාර ජනතාවට දළදා මන්දිරයේ සම්පූර්ණ භාරකාරත්වය පැවරූ බවත් මෙමඟින් පැවසේ (කුලතුංග,2005:66පිටුව). දළදා මැදුරේ

නඩත්තුව සඳහා ඉඩම් වේලියක් හෙවත් වෙල් යායක් පූජා කළ වේළයික්කාරයෝ එක් එක් හමුදාවකින් එක් සේවකයෙකු බැගින් පත් කොට එයට තම සේනාවේ නම තැබූ බව සඳහන් වේ (Wickramasinghe, 1994, p. 253). යමෙකු ඊට ආරවුලක් කළ හොත් එසේ කිරීම වේළයික්කාර සේනාවට මහා ස්ථවිරයන්ට හා බුද්ධ ශාසනයට කරනු ලබන වරදක් වශයෙන් සැලකෙන බව ද එම ලිපියේ සඳහන් ය. කෙසේ වුවත් දළදා මැදුරට අයත් දේපළ රැක ගැනීමට වේළයික්කාරයන් පොරොන්දු වී සිටි නමුත් ඒවා කොල්ල කෑම නැවැත්වීමට ඔවුන්ට හැකි වූයේ නැත.

පොළොන්නරුව හා පදවිය වැනි වෙනත් ස්ථානවල දෙමළ ශිලා ලිපි පිහිටුවීම හා දේවාල ඉදි කිරීම වැනි භාවිතයක් ඇති වූයේ රාජරාජ හා 1වන රාජේන්ද්‍ර චෝල රජවරුන්ගේ කාලයේ දී ය. පොළොන්නරුවෙන් ලැබී ඇති 1වන රාජේන්ද්‍ර රජුට අයත් චෝල ශිලා ලිපිවල ජනනාථ මංගලම්හි වානවන්මාදේවි ඊශ්වරම් යන නමින් වූ ශිව දේවාලයක් ගැන සඳහන් කරයි. ද්‍රවිඩ බැතිමතුන් ශෛව හා වෛශ්‍රවණ කෝවිල්වලට අනුග්‍රහ දැක්වූ බව ද ඒවායේ නඩත්තුවට එළදෙනුන්, ගවයන් හා පහන් වැනි දෑ ප්‍රදානය කළ බව ද මෙම සාධකවලින් ඒ අනුව අනුමාන කළ හැකි ය. එසේ ම ක්‍රි.ව 1012 කාලනිර්ණය කර ඇති රාජ රාජ චෝල රජුගේ කාලයට අයත් පදවිය ලිපියට අනුව එහි නගරෙ අරනුක්කුත්තේඩිගල් යන්න සඳහන් ය. එහි නගරම් යනු එම සෙට්ටින්ගේ පදවිය මධ්‍යස්ථානය බව පෙනේ. අරන් යනු ශිව දෙවියාට නමකි. මෙම ලිපිය කෝවිලකට නුදුරින් හමු වී ඇති බැවින් එම කෝවිලට කළ පූජාවක් මෙහි සඳහන් බව සැලකිය හැකි ය. කාලි කණම් යනු කාලිගේ සමූහය යන අර්ථයයි. කාලි දේවිය වනාහි පාර්වති හෙවත් දුර්ගාගේ අවතාරයකි. වට කළි යනු කාලි කෝවිල යන අර්ථය දෙයි. මේ අනුව මෙම ලිපියෙන් ගවයන් නවයක්, ලෝකඩ ගව රූපයක් හා ලෝකඩ සීනුවක් හින්දු දේවාලයට පූජා කළ බව සඳහන් වේ. මෙම ස්ථානයේ දක්නට ලැබෙන හින්දු දේවාල නටබුන් ඒ බව තහවුරු කරයි (Indrapala, 1971).

නිගමන සහ නිර්දේශ

දමිළ අභිලේඛනගත කරුණු අනුව ගත් කළ බෞද්ධ විහාර අසල ම හින්දු විහාර ඉදි වීම ද ඇතැම් බෞද්ධ විහාර හින්දු විහාර බවට පරිවර්තනය වීම නිසා ද බෞද්ධයන් ද දේව වන්දනයට හුරු වීම මෙන් ම හින්දු ආගමේ ජනප්‍රිය ලක්ෂණයන් බෞද්ධයන් ද අනුගමනය කර ඇති බවට මේ අනුව හඳුනා ගත හැකි ය. මෙලෙස වූ ද්‍රවිඩ භාෂාවේ වර්ධනය හා බලපෑම පොළොන්නරු යුගයේ දී ලාංකේය සමාජය තුළ මුල් බැස ගත් බව ද අනුරාධපුර යුගයෙන් පසුව ඇති වූ ආගමික පසුබිම තුළ හඳුනා ගත හැකි වේ. ඒ අනුව බුදු දහමේ ඉගැන්වෙන ලෝකෝත්තර ප්‍රතිපත්ති අනුගමනය කිරීමට වඩා පහසු ක්‍රමයක් වූ හින්දු ආගමේ එන ලෞකික පුද පූජා ක්‍රමවලට සිංහල ජනතාව හුරු වූ බව පෙනේ. පාලකයන්ගේ අනුග්‍රහය ද හින්දු ආගම කෙරෙහි ලැබීමත් ඇතැම් දමිළයන් අතර බෞද්ධයන් වූ බවත් අභිලේඛන අනුව සනාථ වන බැවින් දමිළ භාෂාවට හෝ හින්දු ආගමට බලපෑමකින් තොර ව වර්ධනය වීමට හේතු විය. එනිසා දකුණු ඉන්දියාවේ ආභාසය සහිත ව ශ්‍රී ලංකාවට ආවේණික ලෙස හින්දු ආගම විකාශනය වූ බව ද්‍රවිඩ අභිලේඛනගත සාධක මඟින් හඳුනා ගත හැකි ය.

ප්‍රමුඛ පද: *ආගමික ඉතිහාසය, ද්‍රවිඩ අභිලේඛන, පොළොන්නරු යුගය, ශිව දේවාල, හින්දු*

ආශ්‍රිත ග්‍රන්ථ

ඉන්දික, එ. එම්. කේ. (2012). අනුරාධපුර යුගයේ සමාජ ක්‍රමය (ක්‍රි.ව.300-1017 දක්වා). ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

කුලතුංග. ටී. ජී. (2005). *අභිලේඛන ශාප පාඨ.* තරංජී ප්‍රින්ටර්ස්.

හේමචන්ද්‍රරාය, (1972). ලංකා විශ්වවිද්‍යාල ලංකා ඉතිහාසය, දෙවන කාණ්ඩය, විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය.

Codrington, H.W. & Wickramasinghe, D.M.D. Zilva, (Ed.). (1994), *Epigraphia Zeylanica*, Vol.4, Archeologycal Survey of Ceylon.

Indrapala, K. (Ed.), (1971), *Epigraphia Tamilica.* Jaffna Archeological Society.

යුරෝපීය ජාතීන්ගේ ආක්‍රමණයන්ට එරෙහිව මහනුවර රාජධානියේ යුධ හේවායින් භාවිත කළ අවි ආයුධ

එස්. ඒ. ප්‍රසන්න
පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
prasasakbo@gmail.com

හැඳින්වීම

ක්‍රිස්තු පූර්ව 490 දී චීන (wu) රාජධානියේ විසූ සන්-ටිසු යුධ කලාව පිළිබඳව පවසන්නේ යුද්ධ ශිල්පය රාජ්‍යයකට අතිශයින්ම වැදගත් වන බවයි. එය ජීවිතය හා මරණය පිළිබඳ කාරණයක් ලෙසයි. එමෙන්ම ආරක්ෂාවට සහ විනාශයට ද මාර්ගය වන බැවින් කිසිදු කාරණයක් නිසා හෝ එය නොසලකා හැරිය නොහැකි බවයි. නමුත් ශ්‍රී ලංකාවේ පැරණි රාජධානි සම්බන්ධයෙන් සැලකීමේ දී පෙනී යන්නේ බොහෝ පර්යේෂකයින් විවිධ අංශ කෙරෙහි අවධානය යෙමුකරමින් පර්යේෂණ සිදුකර ඇති මුත් එම ජන සමාජයන්ගේ මිනිසුන් විසින් භාවිත කළ අවි ආයුධ පිළිබඳව ප්‍රමාණාත්මක මෙන්ම ක්‍රමවත් වූ අධ්‍යයනයක් මෙතෙක් සිදුකර නොමැති තරම්ය. විශේෂයෙන්ම මහනුවර රාජධානිය සම්බන්ධයෙන් බැලූ කල එහි විශාල හිඩසක් දැකිය හැකිය. නමුත් මනුෂ්‍ය වර්ගයක් පිළිබඳව කරුණු හැදෑරීමේ දී ඔවුන්ගේ සම්භවය ඥතීත්වය, සංචරණය හා සම්බන්ධතා මෙන්ම සංස්කෘතිය හඳුනාගැනීමෙහි ලා ඔවුන් විසින් භාවිතකරන ලද ආයුධ ඉතා වැදගත් මෙහෙයක් ඉටුකරනු ලැබේ. ශ්‍රී ලාංකේය ඉතිහාසය පිළිබඳව සැළකීමේ දී හඳුනාගත හැකි සුවිශේෂී ලක්ෂණයක් වන්නේ අනුරාධපුර රාජධානිය ආරම්භයේ සිට මහනුවර රාජධානිය බ්‍රිතාන්‍ය කිරීටයට පාවාදෙන තෙක් වූ ඉතා දීර්ඝ කාල පරිච්ඡේදය තුළ පැවති සෑම ජන සමාජයක්ම විවිධ ආකාරයේ වූ සංග්‍රාමයන් වෙත සම්බන්ධවී ඇති ආකාරය යි. මේ අනුව ලාංකේය ඉතිහාසය එක් අතකින් සංග්‍රාම ඉතිහාසයක් ලෙසින් ද සැලකිය හැකිය. බෞද්ධ සදාචාරාත්මක පරිසරයක පෝෂණය වුව ද සිංහලයන් හට යුද්ධය යන්න නුහුරු නුපුරුදු අත්දැකීමක් නොවී ඇත. එසේම කාලීනව ඇතිවූ විවිධාකාරයේ අභියෝග හමුවේ එයට මුහුණ දීම පිණිස සාම්ප්‍රදායික අවි ආයුධ වැඩි දියුණු කරගැනීමට ද නව තාක්ෂණයෙන් යුත් විවිධ අවි ආයුධ නිෂ්පාදනය කර ගැනීම ද සමාජ පරිණාමය තුළ කාලීනව නිසැකවම සිදුවිය යුත්තක් ලෙසින් සැළකිය හැකිය.

පර්යේෂණ ගැටලුව, පර්යේෂණ අරමුණු

මහනුවර රාජධානී සමය වන විට දේශීය යුධ හේවායින් භාවිත කළ ප්‍රමුඛ අවි ආයුධ මොනවා ද? වර්තමානය වනවිට එම අවි ආයුධ නිශ්චිත ලෙසින් හඳුනාගත හැකි ද? යන්න මෙහි පර්යේෂණ ගැටලු ලෙසින් පෙන්වාදිය හැකි අතර මහනුවර රාජධානී සමයේ භාවිත කළ අවි ආයුධ හා එහි පරිණාමීය ලක්ෂණ හඳුනාගැනීම මෙම අධ්‍යයනයේ මුඛ්‍ය පරමාර්ථයයි. .

පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය සඳහා පශ්චාත් ප්‍රත්‍යක්ෂ මූලවාදී විධි ක්‍රමය යොදා ගැනෙන අතර එහි දී පර්යේෂණය සඳහා භාජනය වන කාල පරිච්ඡේදය තුළ ඇති සංස්කෘතික පරිසරය, එම පරිසරයේ ජීවත්වුණ ප්‍රජාවන් හා ඔවුන්ගේ සංස්කෘතිය කෙරෙහි ද අවධානය යොමුකරමින් ගුණාත්මක දත්ත එක් රැස්කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමුකරන ලදි. එහි දී ප්‍රධාන වශයෙන් දේශීය හා විදේශීය සාහිත්‍ය මූලාශ්‍රය තුළ ඇති කරුණු ද, ජනශ්‍රැතිගත කරුණු ද, මහනුවර සම්ප්‍රදායට අයත් දැනට ශේෂව ඇති බිතු සිතුවම් හා කැටයම් ආදී කලා කෘති ද, කොතුකාගාර තුළ ඇති පුරා කෘති ඇසුරින් රැස්කළ දත්ත විශ්ලේෂණය හා අර්ථ කථනය කරමින් යථෝක්ත පර්යේෂණ ගැටලු විසඳා ගැනීමට උත්සාහ කරන ලදි.

ප්‍රතිඵල සහ සාකච්ඡාව

මූලාශ්‍රය ගත තොරතුරු පිළිබඳව විමසීමේ දී මහනුවර රාජධානි සමයවන විට භාවිත කළ සාම්ප්‍රදායික අවි ආයුධ සැළකිය යුතු ප්‍රමාණයක නාමයන් හඳුනාගත හැකිය. ඒ අතරින් මූලික වශයෙන් භාවිතයට ගත් දෙතිස් (32) ආයුධයන් පිළිබඳව වෛජයන්තය නම් පැරණි පුස්තකයේ සඳහන්ව ඇත. එම දෙතිස් ආයුධ සියල්ල ම පාහේ සාම්ප්‍රදායිකව ජන සමාජයන් තුළ කාලාන්තරයක් තිස්සේ භාවිතයට ගත් අවි ලෙසින් සැළකෙන අතර, වෛජයන්තය අනුව ඒවා පහත පරිදි පෙන්වාදිය හැකිය. කඩුව, සිරිය, දුණු හී, කෙටේරිය, මුගුර, යගදාව, යමුගුර, කැති ආයුදේ, චක්‍රයුධය, පාරා වළල්ල, කොන්තය, තෝමරය, ත්‍රිශූලය, අඩයටිය, කුන්තය, ඉෂ්ඨි (ඊටියය), ශෛලායුධය, වජ්‍රය, දිග් වජ්‍රය, කඩිතලය, පටිය, නාරව කේලය, දෙමුණ කොළය, තෙබය නොහොත් තලි කොලේ ආදී වශයෙනි. මෙම දෙතිස් අවි වෛජයන්ත තුන්ත්‍ර අනුව යලි රාක්ෂ ගණ, දිව්‍ය ගණ හා මනුෂ්‍ය ගණ ලෙසින් තුන් වැදෑරුම් ලෙස බෙදා වෙන්කළ හැකි බවට සැළකේ. ඒ අනුව සමස්ත අවි අනූ දෙකක ප්‍රමාණයක් මෙම වර්ගීකරණයෙන් හඳුනාගත හැකිය. මේ ආකාරයෙන් විශාල අවි ප්‍රමාණයක් වෛජයන්ත තුන්ත්‍රයේ දක්වුව ද මහනුවර රාජධානි සමයවන විට ඉතා දියුණුවට පත්ව, මනා සංවිධානයක් ලෙසින් පැවති සුවිශේෂී සටන් කලාවක් වූ අංගම්පොර සටන් කලාවට අයත් ඉලංගං ශාස්ත්‍රයේ යෙදුන සාම්ප්‍රදායික සටන් ශිල්පීන් විසින් භාවිතයට ගෙන ඇත්තේ විශේෂිත අයුධ විසි එකක් (21) වැනි ප්‍රමාණයකි. එනම්, කඩුව, පළිහ, පතුරු කඩුව, එතුණු කඩුව, කිරිච්චිය, රිට, මුගුර, යගදාව, අංගන් කැත්ත, හෙල්ල, ත්‍රිශූලය, කුන්තය, තෝමරය, රණ පොරව, කෙටේරිය, අංකිඤ්ඤය, කලා කිරිඤ්ඤය, දුනු හී, නෙත්තිය, ඔම්මට්ට, මරුවැල ආදී ලෙසිනි. නමුත් අවි ආයුධ පිළිබඳව සිදුකළ මෙම අධ්‍යයනයේ දී පෙනීයන කරුණක් වන්නේ ඉහත සඳහන් පරිදි සාහිත්‍ය මූලාශ්‍රයවල විවිධ නාමයන්ගෙන් හා විවිධ හැඩයන්ගෙන් යුත් අවි ආයුධ විශාල ප්‍රමාණයක් දැක්වුව ද එම අවි ආයුධ සැළකිය යුතු ප්‍රමාණයක මූලික ස්වරූපය එක සමානවන බවයි. එම අවි ආයුධ විශාල ප්‍රමාණයක් අනුරාධපුර යුගයේ සිට ම භාවිතයේ පැවති සාම්ප්‍රදායික අවි ඇසුරින් විවිධ

වෙනස්කම් ඇතිකර ගනිමින් නිර්මාණය කරගෙන ඇති බව පෙනීයයි. මේ සඳහා එක් නිදසුනක් ලෙස ඉහත දෙතිස් අවි අතරට අයත්වුණ කොන්තය, ත්‍රිශූලය, කුන්තය, තෝමරය, අඩයටිය, වැනි අවි එකම ස්වරූපයෙන් පරිණාමය වී ඇති බවත්, විවිධ හැඩයන් හා ප්‍රමාණයන් අනුව එකිනෙකට වෙනස් අවි ලෙසින් භාවිතයට ගෙන ඇති බවත් පෙන්වාදිය හැකිය. මූලාශ්‍රයවල සඳහන් මෙම සියලු අවි ආයුධ වර්තමානය වන විට නිශ්චිතව හඳුනාගැනීම අසීරු අතර ප්‍රමාණාත්මකව සාක්ෂි සහිතව හඳුනාගත හැක්කේ ඉන් කිහිපයක් පමනි. ඒවා සාහිත්‍ය මූලාශ්‍රය, බිතුසිතුවම් (දඹුල්ල, දෙගල්දොරුව, හඟුරන්කෙත වැනි විහාර ආශ්‍රිතව), කැටයම් (ඇම්බැක්ක දේවාලය) හා කෞතුකාගාර නිදර්ශන ඇසුරින් තහවුරුකළ හැකි අතර එම අවි ආයුධ ලේඛනය පහත පරිදි ඉදිරිපත් කළ හැකිය.

වගු අංක 1. මහනුවර රාජධානියේ භාවිත කළ ප්‍රධන අවි ආයුධ හා එහි විවිධ ප්‍රභේදයන්.

අංකය	ප්‍රධානතම මුල් අවිය	ප්‍රධාන අවියෙන් නිර්මාණය වුණ විවිධ අවි ප්‍රභේද
01	හෙල්ල	තෝමරය, අඩයටිය, කුන්තය, පටිස්ථානය, ත්‍රිශූලය, අංකුසය
02	මුගුර	යගදාව, චන්ද්‍රවංකය
03	කඩුව	දිග් කඩුව, වක් කඩුව, කස්තානය, ඉලුක්කොලේ, යෂ්ටි කඩුව, දෙමුණු කොළය, නාරව කොළය, තැළි කොළය, ආදී කඩු ප්‍රභේද
04	රණ පොරව	අත් පොරව, කෙටේරිය, කොණ්ඩ කෙටේරිය
05	පිහිය	කිරිච්චිය, දුනු පිහිය, වක් පිහිය, කැති ආයුධය, දැකැත්ත.
06	චක්‍රායුධය	චක්‍රායුධය, පාරාවළල්ල
07	කිරිඤ්ඤු	අං කිරිඤ්ඤු, කලා කිරිඤ්ඤු
08	පළිහ	
09	දුනු හා ඊතල	
10	ගල් පටිය	
11	කතුරු	
12	ගිනි අවි	ගිනි තුවක්කු, බොන්ඩිකුල, අත් තුවක්කු, කොඩිතුවක්කු, කාල තුවක්කු

එසේම මෙම අවි ආයුධවල ක්‍රමික පරිණාමීය ලක්ෂණ ද පහසුවෙන් හඳුනා ගතහැකි බව පෙනීයයි. දීර්ඝ කාලයක් පුරාවට භාවිත කළ මෙම සාම්ප්‍රදායික අවි ක්‍රමානුකූලව සියුම් වෙනස්කම් රාශියකට මහනුවර යුගය වන විට පත්ව ඇති බව හඳුනාගත හැකිය. ඒ සෑම වෙනස්කමකින් ම අවසාන වශයෙන් සිදුකෙරී ඇත්තේ අවියේ භාවිතය පහසුකිරීමත්, සතුරාවෙත මාරාන්තික ප්‍රහාරයන් සිදුකළ හැකි ලෙසත් එහි කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම බව මෙහි දී පෙන්වා දිය හැකිය. ඒ සඳහා නිදර්ශණ ලෙසින් පොරව, ඊතලය, හෙල්ල, සිරිය, මුගුර, වැනි ප්‍රධාන අවි තුළ සිදුව ඇති ව්‍යුහාත්මක වෙනස්කම් මගින් පැහැදිළි කළ හැකිය. එසේම මෙම කාලයේ දී සංවිධානාත්මක ලෙසින් ගිනි අවි භාවිතය කෙරෙහි ද දේශීය යුධ සේනාවන් යොමුවීම විශේෂ ලක්ෂණයක් ලෙසින් හඳුනාගත හැකිය. එසේම දේශීය යුධ හේවායින් විසින් විෂ යෙදූ අවි භාවිත කළ බවට ප්‍රමාණාත්මක සාධක හඳුනාගත නොහැකිය.

නිගමන හා නිර්දේශ

මේ අනුව මහනුවර රාජධානී සමයවන විට ඉහත දක්වා ඇති අවි ආයුධ නිශ්චිත ලෙසින් භාවිතයේ පැවති බවට හඳුනාගත හැකිය. යුරෝපීය ආක්‍රමණිකයින් දීර්ඝ කාලයක් පුරා මහනුවර රාජධානිය යුධමය වශයෙන් යටත්කර ගැනීමට උත්සාහ කළ ද ඔවුනට එය කළ නොහැකි වූ හේතු සාධක අතරට මෙම යුධ සේනාවන් භාවිත කළ විවිධ ස්වරපයේ අවි ආයුධ ද ප්‍රධාන හේතුවක් වූ බව මේ අනුව නිගමනය කළ හැකිය.

ප්‍රමුඛ පද: *මහනුවර, රාජධානිය, හේවායින්, අවි, තුවක්කු*

ආශ්‍රිත ග්‍රන්ථ

අභයවර්ධන, එච්. ඒ. පී. (1978). *කඩඉම් පොත් විමර්ශනය.* සංස්කෘතික දෙපාර්තමේන්තුව.
ගෝවින්නගේ, එම්. (2015). *සන්-ට්සුගේ යුධ කලාව.* දර්ශන ප්‍රකාශන.
තෙන්නකෝන්, වී. (1962). *උඩරට මහ කැරැල්ල (2 කොටස).* ඇම්.ඩී.ගුණසේන සහ සමාගම.
මන්තආරච්චි, ඒ. (2013). *හෙලයේ හටන් රහස-අංගංපොර.* සෙරනිති ප්‍රකාශන නිවස.
මුදියන්සේ, එන්. (1983). *වෛජයන්ත තන්ත්‍රය.* කැලණිය විශ්වවිද්‍යාලය.

ලක්දිව ඓතිහාසික තොරතුරු අධ්‍යයනයෙහිලා සංස්කෘත ශිලාලේඛනවල උපයෝගිතාව පිළිබඳ විමසුමක්

උෆමෑලේ විමලධම්ම හිමි
භාෂා, සංස්කෘතික අධ්‍යයන හා ප්‍රාසංගික කලා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
wimalaumele@gmail.com

හැඳින්වීම

පුරාවිද්‍යාත්මක හා සාහිත්‍යාත්මක වශයෙන් ඉතිහාසය අධ්‍යයනය කිරීම සඳහා මූලාශ්‍රය මාර්ගයන් දෙකකි. අභිලේඛන, කාසි, නටබුන්, චිත්‍ර / මූර්ති / පුරාවස්තු ආදී මාර්ගයන් පුරාවිද්‍යාත්මක සාධක තහවුරු කරගැනීමෙහිලා උපකාරී වෙයි. මෙයිනුදු ශිලා ලේඛන ප්‍රමුඛ වන අතර ගිරි ලිපි, ලෙන් ලිපි, ටැම් ලිපි, පුවරු ලිපි හා ආසන/ පදර ලිපි වශයෙන් ඒවා ප්‍රභේද වේ. ක්‍රිස්තු පූර්ව යුගයේ පටන් ලක්දිව සෙල්ලිපි රචනා වී ඇති බවට හමුවන සාධක බොහෝ ය. ප්‍රාථමික යුගයේ ලියැවුණු ශිලා ලේඛනයන්හි සිද්ධම්, ස්වස්ති ආදී වශයෙන් වචන මාත්‍රයෙන් පමණක් සංස්කෘත භාෂාව යෙදී තිබෙණු දැකිය හැකි වුව ද මහායානික අදහස් පැතිරයාමත් සමග ශිලාලේඛනාගත භාෂාව, සංස්කෘත භාෂාවෙන් පෝෂණය වී තිබේ. එහි ඵලය වූයේ සංස්කෘත සාහිත්‍යයෙහි ප්‍රකට ගද්‍ය, පද්‍ය හා මිශ්‍ර යන ප්‍රභේදයන් හා සමගාමී වූ සෙල්ලිපි ප්‍රභේදයන් ද ලක්දිව බිහිවීමයි.

පර්යේෂණ ගැටලුව, පර්යේෂණ අරමුණු

සංස්කෘත ශිලාලේඛනවලින් හෙළිවන ලක්දිව ඓතිහාසික තොරතුරු කවරේදැ'යි අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයෙහි පර්යේෂණ ගැටලුවයි. ලක්දිව ඓතිහාසික තොරතුරු විමර්ශනය සඳහා සංස්කෘත ශිලාලේඛන උපයෝගී වන බව තහවුරු කිරීම මෙම විමර්ශනයේ මුඛ්‍ය අරමුණයි.

පර්යේෂණ ක්‍රමවේදය

ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය භාවිත කරමින් මෙම පර්යේෂණය සිදු කළ අතර ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය ඇසුරෙන් දත්ත රැස් කිරීම හා විශ්ලේෂණය කෙරිණි.

ප්‍රතිඵල හා සාකච්ඡාව

මෙතෙක් සොයා ගෙන ඇති ලාංකේය ශිලාලේඛන නාමාවලියෙහි සංස්කෘත භාෂාව සඳහා කැපී පෙනෙන ස්ථානයක් ලැබී තිබේ. සංස්කෘත භාෂාව අන්තර්ගත සෙල්ලිපි වර්ග කිහිපයක් හඳුනා ගත හැකි ය. සංස්කෘත ගද්‍යයෙන් පමණක් රචිත ලිපි, පද්‍යයෙන් පමණක් රචිත හා සිංහල හෝ දෙමළ භාෂාවන් සමග මිශ්‍ර සංස්කෘතයෙන් රචනා වී ඇති ලිපි ආදී වශයෙනි. අභයගිරි හෙවත් ජේතවනාරාම සෙල්ලිපිය මෙතෙක් ලියැවී ඇති සංස්කෘත ගද්‍ය ලිපි අතර දීර්ඝතම ලිපිය වෙයි. අභයගිරි විහාරයේ පාලන තන්ත්‍රය සඳහා පිහිටුවා තිබූ විවිධ තනතුරු, ඔවුනට ලබා දුන් දීමනා පිළිබඳවත්, පනවන ලද විවිධ නියමයන්, එකල භාවිත වූ විවිධ ද්‍රව්‍යයන් හා විහාරයට අයත් ග්‍රාම නාමයන් පිළිබඳ ඓතිහාසික තොරතුරු ද මෙම ලිපියෙන් හමුවෙයි. විහාරය පිළිබඳ සියලු පරිපාලන ක්‍රියාදාමයන්හි ප්‍රධානත්වය දරන ලද්දේ භික්ෂුව වීමත්, යම් ගැටලුවක් හටගත් කල එය පසිඳලන ලද්දේ 'පඤ්ජකා' නම් වූ අය-වැය ලියා තබන භික්ෂුව විසින් බවට නියමයක් තිබීමත් සුවිශේෂී ය. සිවුමහා නිකායෙන් විසිපස් නමක් බැගින් වාසය කරවිය යුත-ු බව සඳහන් වුව ද මව්පියන් නොවන ස්ත්‍රීන් පෝෂණය කරන භික්ෂුව මෙන් ම අවි හා මුගුරු දරන්නවුන් ද නොවිසිය යුතු බව සඳහන් ව ඇත.

මිහින්තලේ, කුච්චවේලි හා තිරියාය යන ශිලාලේඛනයන් සංස්කෘත ශ්ලෝකයන්ගෙන් රචනා වී තිබේ. මහායානිකයන්ගේ මූලික සංකල්පයන් විවරිත මහායාන සූත්‍රාලංකාරය, ලංකාවතාර සූත්‍රය, සද්ධර්මපුණ්ඩරික හා මහා ප්‍රඥාපාරමිතා ආදියෙහි දැක්වෙන නිර්මාණකාය, සම්භෝගකාය, ධර්මකාය යන ත්‍රිකාය සංකල්පය පිළිබඳව මිහින්තලා ලිපියෙනුත්, මහායානික බෝසත්වරුන් වන අවලෝකිතේශ්වර හා මඤ්ජු ශ්‍රී යන බෝසත්වරුන්ගේ වාසභූමියක් සේ සලකන ලද ගිරිකණ්ඩක නම් චෛත්‍යය තුපුෂ්‍යක හා වල්ලික වෙළෙඳ සමූහයා විසින් කරවන ලද බව තිරියාය ලිපියෙනුත් හමු වේ. මහාවග්ගපාළිය, මහාවංසය, විසුද්ධිමග්ගය හා පූජාවලියේ ද සඳහන් තොරතුරු මේ හා සම වේ. බෝධිචර්යාවතාරයෙහි දැක්වෙන පරිදි තමන් විසින් කරන ලද පුණ්‍ය බලයෙන් පීඩිත ලෝකයා මුදවා ගැනීම තම අභිමතය බව කුච්චවේලි ලිපියෙහි රචකයා පවසයි.

සංඝනන්දි නම් භික්ෂුවක විසින් කපාරාරාමයෙහි සියලු ජනයාගේ පිපාසය සංසිඳුවීම පිණිස ජල ටංක දෙසීයක් පූජා කළ බව කපාරාරාම සංස්කෘත සෙල්ලිපියෙහි සඳහන් වේ. සාහසමල්ලගේ පුවරු ලිපියේ මුල හා අවසන තිබෙන්නේ ශාර්දූලවික්‍රීඩිත වෘත්තයෙන් රචිත ශ්ලෝකද්වයකි. සාහසමල්ල යනු විරුද නාමයකි. සිරිසඟබෝ කාලිංග විජයබාහු නම් වූ මොහු නිශ්ශංකමල්ලගේ සොහොයුරා වූ අතර අභිෂේක වී ඇත්තේ බුද්ධ වර්ෂ 1743 බිනර මස 27වන බුද දින බව ලිපියෙහි සඳහනි. පොළොන්නරුවේ වේලෙයික්කාරයින්ගේ පුවරු ලිපිය ඇරඹෙන්නේ ශාර්දූලවික්‍රීඩිත වෘත්තයෙන් රචිත ශ්ලෝකයකිනි. දෙමළ භාෂාවෙන් ඉතිරි කොටස දැක්වෙන අතර දළදා මන්දිරයේ ආරක්ෂාව කුලී හමුදාවක් වෙත පවරන ලද බව මෙහි එයි. පොළොන්නරු උතුරු දොරටුවේ ඇති ලිපියෙහි ද මුලින් හා අගින් ශ්ලෝකද්වයකි. නිශ්ශංකමල්ලගේ ගුණ වර්ණිත මෙහි විශේෂය වන්නේ අනාගතයේ ලක්දිව රාජ්‍යත්වය සඳහා කාලිංග වංශිකයකු පමණක් තෝරා ගත යුතු බවත් ගොවි කුලයේ හෝ චෝල, කේරළ ආදී අබෞද්ධයකු තෝරා නොගත යුතු බවටත් දැක්වීමයි. සෙසු සංස්කෘත ශිලාලේඛනයන් ද ලක්දිව ඓතිහාසික තොරතුරු රාශියක් දක්වන බව පෙනී යයි.

නිගමන සහ නිර්දේශ

ලක්දිව ආගමික, සමාජීය, ආර්ථික හා දේශපාලනික පසුබිම පිළිබඳව සියවස් ගණනාවක තොරතුරු උක්ත සංස්කෘත ශිලාලේඛනවලින් තහවුරු කෙරෙන බව මෙම විමර්ශනයේ දී නිගමනයක් වශයෙන් දැක්විය හැකි ය. එබැවින් වංශකතා, දේශාටන වාර්තා, සාහිත්‍යයික කෘතීන් හා වෙනත් සෙල්ලිපි මගින් ද තහවුරු කර ඇති ලක්දිව ඓතිහාසික තොරතුරු තවදුරටත් සනාථ කරලනු පිණිස සංස්කෘත ශිලාලේඛනයන් ද ප්‍රාමාණික සාධක වශයෙන් ගත හැකි බවට නිර්දේශ කළ හැකි ය.

ප්‍රමුඛ පද: *බුදුදහම, ලක්දිව ඉතිහාසය, ශිලාලේඛන, සංස්කෘත භාෂාව, සංස්කෘතිය*

ආශ්‍රිත ග්‍රන්ථ

විමලකීර්ති හිමි, එම්. (1954). *ශිලා ලේඛන සංග්‍රහය.* ඩී.පී. දොඩන්ගොඩ සහ සමාගම.
Paranavitana, S. (1943). *Epigraphia Zeylanica I',* Amen House, Oxford University Press.
Wickremasinghe, D.M.De Zilva. (1912). *Epigraphia Zeylanica I,* Amen House, Oxford University Press.
Wickremasinghe, D.M.De Zilva. (1928), *Epigraphia Zeylanica II,* Amen House, Oxford University Press.
Wickremasinghe, D.M.De Zilva. (1933), *Epigraphia Zeylanica III,* Amen House, Oxford University Press.

නූතන නාගරීකරණය හමුවේ අස්පර්ශිත සංස්කෘතික උරුම හා මානව ක්‍රියාකාරකම් (ගාල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සමාජීය පුරුදු, ඇදහිලි විශ්වාස සහ උත්සව ආශ්‍රිත අධ්‍යයනයක්)

එළමල්දෙණියේ සාරානන්ද හිමි* සහ කේ. වී. ඩී. ඒ. අයි. විජේසිංහ
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
esarananda@sjp.ac.lk

හැඳින්වීම

අන්තර් පුද්ගල සම්බන්ධතාවන්ගෙන් ඇතිවන සංකලනයක් ලෙස වරනැගෙන "සමාජය" ගතික ප්‍රපංචයක් වශයෙන් හඳුනා ගැනේ. සමාජයකට කාලාන්තරයක් පුරා පැවැත්මට අවශ්‍ය කරුණු කිහිපයක් බලපායි. පාරිසරික අභියෝගවලට අනුරූපී වෙමින් තම පැවැත්ම රැක ගැනීමට ඇති හැකියාව, ප්‍රජනන ක්‍රියාවලිය, සංස්කෘතිය, දේශපාලන ස්වාධීනත්වය වැනි කරුණු එයින් කිහිපයකි. සංස්කෘතියේ කාර්යභාරය වනුයේ සමාජයක දැනුම් පද්ධතීන් ආරක්ෂා කර ගනිමින් එය මිනිසා තුළ පරපුරෙන් පරපුරට, හුරුපුරුදු ලෙස දායාද කිරීමයි. නූතන ලෝකය ඉහත කරුණු අභිභවා යමින් අධි සංවර්ධිත ඉලක්ක කරා ගමන් කරයි. තවමත් සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යයක් වශයෙන් ශ්‍රී ලංකාව ගෝලීය සංවර්ධනය තුළ ජාත්‍යන්තර අලෙවිකරණය, වෙළඳපොළ හා ඒවායේ ප්‍රබල හස්තයන්ට නතු වී හමාර ය. එහි බලපෑම මෙරට තුළ විවිධ පැතිකඩ ඔස්සේ වර්ධනය වෙමින් පවතී. ජන සන්නිවේදනයේ ඇති තාක්ෂණික, ප්‍රයෝගාත්මක, ප්‍රවෘත්තිමය හා අලෙවිකරණ ප්‍රවණතාවන් ද, ගෝලීය ආනයන අපනයන හා බැඳි ආර්ථික තත්ත්වයන් මත පදනම් වූ ප්‍රවණතා ද කලාපීය වෙළෙඳ අධිරාජ්‍යවාදය හා සබැඳි දේශපාලන ප්‍රවණතාවන් ද මේ අතුරින් සුලබ ව හඳුනාගත හැකි ය. ආහාර, නිවාස, සෞඛ්‍ය, කලාව, අධ්‍යාපනය, වෙළඳාම, ආගම, නිදහස, නීතිය, සමාජ සම්බන්ධතාවන් ආදි සියලු සංස්කෘතික ලක්ෂණ ඉහත සඳහන් කරන ලද ප්‍රවණතා සමග බද්ධ ව පවතී. ගෝලීයකරණයේ හෙවනැල්ල තුන්වන ලෝකයේ රාජ්‍යවල නාගරීකරණය කෙරෙහි ද බලපෑම් කිරීම ඉතාමත් පහසුවෙන් සිදුවන කාර්යයකි. මෙම ගෝලීය ප්‍රවණතාවන් දියුණු වෙමින් පවතින රාජ්‍ය වෙත ණය, සහනාධාර, පුහුණුවීම්, ගිවිසුම් ආදි විවිධ මුහුණුවරවලින් පැමිණීම සිදු වන අතර මූලික සංස්කෘතික ලක්ෂණ සමග ඒවා ක්‍රමයෙන් විකාශය වේ.

රාජ්‍යයක දේශපාලනික, ආර්ථික තීන්දු සෘජුව ම හෝ වක්‍ර ව ජන ජීවිතයට හා ජන මනසට බලපාන අතර ජනතාවගේ අර්ථ ක්‍රමවල වෙනස් වීම කෙරෙහි එය වඩාත් ප්‍රබල ව බලපායි. ඒ අනුව ජන සංස්කෘතීන් සැකසෙන්නේ ජනතාවගේ අර්ථ ක්‍රමය හා ආකල්ප මත ය. අතීත අර්ථ ක්‍රමය මත මිනිසා නිර්මාණය කරගත් ධර්මතාවයන් හා මනෝභාවයන් තුළ ප්‍රධාන වශයෙන් පැවතියේ ආගම හා කෘෂිකර්මාන්තය ප්‍රමුඛ වූ සංස්කෘතියකි. නමුත් ගෝලීය අරමුණු හා සංවර්ධන ඉලක්ක නිසා නූතන අර්ථ ක්‍රමය එම ගෝලීය ආර්ථික රටාවට ගැළපෙන අයුරින් සකස් වී ඇති බව පෙනී යයි. ආගමික පසුබිමක් ගත් පැරණි සංස්කෘතිය මෙම තත්ත්වය සමග නූතනයේ කුමන ආකාරයකට පරිවර්තනය වී ඇත් ද යන්න පිළිබඳ වන මෙම පර්යේෂණය ගාල්ල ප්‍රදේශය කේන්ද්‍ර කරගනිමින් සිදු කරන ලදි.

මෙහිදී දිගු ඉතිහාසයක් සහිත ගාල්ල ප්‍රදේශය නාගරීකරණය වෙත යොමු වන ආකාරය පිළිබඳව ද අධ්‍යයනය කරනු ලැබේ ය. යුනෙස්කෝවේ ප්‍රකාශිත ලෝක උරුමයක් වීමත් ජාතික හා ජාත්‍යන්තර සංචාරකයන්ගේ පාරාදීසයක් වීමත් අස්පෘශ්‍ය උරුමයන්ගේ පාරාදීසයක් වූ දක්ෂිණ ලංකාවේ අගනගරය වීමත් ලංකා රාජ්‍ය පාලනයේ දේශීය හා විදේශීය බලයන්ට නතු වූ ප්‍රධාන ස්ථානයක් වීමත් පරිපාලන කේන්ද්‍රස්ථානයක් වශයෙන් පැවතීමත් යුනෙස්කෝවේ අස්පෘශ්‍ය උරුම නිර්ණායක සියල්ල සඳහා උචිත පරිසරයක පිහිටා තිබීමත් වර්තමානය වන විට සංචාරක කර්මාන්තයේ ප්‍රධානතම ස්ථානයක් වීම නිසා විවිධ සංවර්ධන කටයුතු සිදු වී ඇති නිසාත් ගාල්ල ප්‍රදේශය මෙම පර්යේෂණය සඳහා තෝරා ගැනුණි.

පර්යේෂණ ගැටලුව, පර්යේෂණ අරමුණු

අස්පර්ශිත සංස්කෘතික උරුමයන් පස් ආකාරයක වර්ගීකරණයකින් යුතු වේ. එනම්, වාචික සම්ප්‍රදායට අයත් අස්පර්ශණීය සංස්කෘතික උරුමයන්, රංග කලාවන්ට අයත් අස්පර්ශණීය සංස්කෘතික උරුමයන්, සමාජ ක්‍රියාකරකම්, පුද පූජා හා උත්සව, ස්වභාව ධර්මය හා විශ්වය පිළිබඳ දැනුම හා ක්‍රියාකාරකම් සහ සාම්ප්‍රදායික අත්කම් ශිල්පයට අයත් අස්පර්ශණීය සංස්කෘතික උරුමයන් යනාදි වශයෙනි. මෙම පර්යේෂණයේ දී නාගරීකරණය නිසාවෙන් ගාල්ල ප්‍රදේශයේ අස්පෘශ්‍ය නිර්ණායකයන්හි තුන්වැන්න වන සමාජීය පුරුදු, ඇදහිලි විශ්වාස සහ උත්සවයන්ට යම් අහිතකර හෝ හිතකර බලපෑමක් එල්ල වී ඇත්තේ ද? යන්න ප්‍රධාන ගැටලුව විය.

දේශීය හා විදේශීය අමුත්තන්ගේ නොමද ආකර්ෂණය දිනාගන්නා මෙම ප්‍රදේශයේ අස්පර්ශිත උරුමයන් එදා සහ අද කෙබඳු තත්ත්වයක් ගනී ද යන්න පිළිබඳව මෙම පර්යේෂණය තුළින් අධ්‍යයනය කිරීම අරමුණ විය. සෙසු අරමුණු ලෙස,

- ලාංකික නාගරීකරණයේ ප්‍රධාන මධ්‍යස්ථානයක් වන ගාල්ල තුළ සංස්කෘතික උරුමයන් සංරක්ෂණය වීමක් හෝ විනාශ වී යාමක් සිදු වී ඇද්ද යන්න අධ්‍යයනය කිරීම.
- යුනෙස්කෝවේ අස්පර්ශිත උරුම පිළිබඳ නිර්ණායකයන්ට අනුකූලව ජාත්‍යන්තර වටිනාකමකින් යුක්තව මෙම අධ්‍යයනය කිරීම.
- ගාල්ල ප්‍රදේශයේ ආදි සමාජ පුරුදු හා උත්සව පිළිබඳ අනාවරණයක් හා නූතන සමාජය තුළ ඒවා ඇති ස්ථානය පිළිබඳ ඇගයීමක් කිරීම.
- වර්තමානයේ පැරණි ඇදහිලි හා විශ්වාස පිළිබඳ ඇති වටිනාකම් ඇගයීම.
- පැරණි සංස්කෘතික අස්පර්ශිත උරුම අද වන විට ආදේශකවලට යටත් වී තිබේ ද යන්න පිළිබඳ අධ්‍යයනය කිරීම.

– වත්මන් ජනතාව තුළ මෙම උරුමයන් පිළිබඳ ඇති හැඟීම් ඇගයීම.

පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණයේ දී පුරාණ සංස්කෘතික උරුමයන් හඳුනාගැනීම උදෙසා සාහිත්‍යමය කෘති අධ්‍යයනය කරමින් දත්ත රැස් කිරීමට සිදු වූ අතර එය අන්තර්ගත විශ්ලේෂණය යටතේ විශ්ලේෂණය කරනු ලැබී ය. එහි වත්මන් තත්ත්වය පිළිබඳව අධ්‍යයනය කිරීමේ දී සම්මුඛ සාකච්ඡා සහ ප්‍රශ්නාවලී යොදා ගනිමින් දත්ත එක්රැස් කිරීමට සිදු විය. එහිදී ගාල්ල දිස්ත්‍රික්කයේ කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 96 එච් - මිනුවන්ගොඩ ග්‍රාම නිලධාරී වසමේ අහඹු ලෙස තෝරාගත් පවුල් 30කට ප්‍රශ්නාවලියක් ලබාදීම මගින් සහ ප්‍රදේශයේ උගත් වැඩිහිටි පුද්ගලයන් 10 දෙනෙකු සමග සහ ප්‍රදේශවාසීන් 05 දෙනෙකු සමග සම්මුඛ සාකච්ඡා පැවැත්වීම මගින් දත්ත ලබා ගන්නා ලද අතර ගුණාත්මක හා ප්‍රමාණාත්මක ක්‍රමවේදයන් යොදා ගනිමින් දත්ත විශ්ලේෂණය සිදු කරන ලදි.

ප්‍රතිඵල හා සාකච්ඡාව

මෙම පර්යේෂණය ඔස්සේ පර්යේෂණයට අදාළ භූගෝලීය පිහිටීමේ පැතිර පවතින අස්පර්ශිත සංස්කෘතික උරුම පිළිබඳ මනා අවබෝධයක් ලබාගැනීමට හැකි විය. අතීත සිරිත් විරිත්, චාරිත්‍ර වාරිත්‍ර තුළින් පුද්ගල අන්තර් සබඳතාව දියුණු වූ අතර සමාජය තුළ මෙන් ම පවුල තුළ එකිනෙකා පිළිබඳව විශාල හැඟීමක් විශාල බැඳීමක් ඇති වන්නට ද එය මහත් රුකුලක් වී ඇත. අතීත සංස්කෘතික රටාව වර්තමානය දක්වා පැවත එන ආකාරය පිළිබඳ ව අවධානය යොමු කිරීමේ දී පොදුවේ දරු උපත, මල්වරය, විවාහ මංගල්‍යය සහ අවමංගල්‍යය යන අවස්ථාවන්හි දී පැවැති ඇදහිලි විශ්වාස සහ චාරිත්‍ර වාරිත්‍ර කිසිවක් අතීතයේ සිදු වූ අයුරින් ම සිදුවන බවට සඳහන් කළ නොහැකි ය. නමුත් පුද්ගල විශ්වාසයන් මත පදනම්ව ඒවා විවිධ අයුරින් ක්‍රියාත්මක වන බවට සඳහන් කළ හැකි ය. අතීතයේ පැවති සමාජ රටාවත්, ආර්ථික රටාවත් වර්තමානය වන විට විශාල වෙනසකට ලක් ව ඇති බැවින් මෙම සංස්කෘතිකාංග ද වෙනසකට ලක් වී ඇති බව හඳුනාගත හැකි ය.

නිගමන සහ නිර්දේශ

මෙම අධ්‍යයනයට අනුව මනාව හඳුනාගත හැකි වූයේ අතීත ජීවන රටාව තුළ පැවති අස්පෘශ්‍ය සංස්කෘතිකාංග කාලයත්, ආර්ථික, සමාජීය හා තාක්ෂණික දියුණුවත් මුල් කරගනිමින් සිදු වූ නාගරීකරණ ක්‍රියාවලිය ඔස්සේ විකාශනය වෙමින් වර්තමාන සමාජ ආර්ථික රටාවට ගැළපෙන ආකාරයෙන් වෙනසකට ලක් වී ඇති බවයි. ඒ ඔස්සේ අතීතයේ පැවති සමහර සිරිත් විරිත්, චාරිත්‍ර වාරිත්‍රයන් මුළුමනින් ම වියැකී ඇති බවත්, සමහර චාරිත්‍ර වාරිත්‍රයන්හි ක්‍රමවේදයන් වෙනස් ව ඇති බවත්, තවත් සමහර චාරිත්‍ර වාරිත්‍රයන් නවාංගයන් සමග මුහුව වෙනම ම මුහුණුවරක් ගෙන ඇති බවත් මෙම පර්යේෂණය මගින් හඳුනාගත හැකි විය.

ප්‍රමුඛ පද: *අස්පෘශ්‍ය සංස්කෘතිකාංග, නාගරීකරණය, සංස්කෘතිය, සමාජය*

ආශ්‍රිත ග්‍රන්ථ

අභයවර්ධන ඒ. පී. (2001). *රුහුණු ප්‍රවේණිය*. ශ්‍රී ලංකා මහ බැංකු මුද්‍රණාලය.
පරණවිතාන කේ. ඩී. (1991). *ගාලු පුරාණය*. ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
වඩුගේ, ඒ. (2003). *ගම ගාල්ලෙ*. අර්නස්ට් වඩුගේ ප්‍රකාශන.
Bechert Heinz. (1960). *Culture of Ceylon in mediaeval times*. Wiesbaden in Germany.
Roberts Norah. (1993). *Galle as quiet as asleep*. Vijitha Yapa Publications.

දහඅට සන්නියේ වෙස්මුහුණුවලින් හෙළිවන දෘශ්‍ය සන්නිවේදනාත්මක ලක්ෂණ පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ටී. එස්. මාටින්
කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය, ශ්‍රී ලංකාව
thushanimartin47@gmail.com

හැඳින්වීම

වෙස්මුහුණු කලාව කවදා කෙසේ ආරම්භ වූවා දැයි අපැහැදිලි ය. ලංකාවේ වෙස්මුහුණු භාවිත කෙරෙන අවස්ථාවන් ඉතා බහුල ය. වෙස්මුහුණු පැළඳ සිදුකරන ශාන්තිකර්ම අතර ප්‍රමුඛ ස්ථානයෙහි ලා සැලකෙනුයේ සන්නියකුම හෙවත් දහඅට සන්නි නමින් හඳුන්වන ශාන්තිකර්මය යි. මෙම දහඅට සන්නි සමයමෙහි උපත ලිච්ඡවී රජ පෙළපත හා බැඳේ (අමරසේකර, 2002, පි.01-02). මහාකෝල පුරාවෘත්තය අනුව දහඅට සන්නි යක්ෂයන්, දොළොස්පාලි ප්‍රධාන යක්ෂයන් සහ අනෙකුත් අමනුෂ්‍ය චරිත, වෙස්මුහුණු මගින් ප්‍රතිනිර්මාණය කිරීමෙන් අලංකාර වෙස්මුහුණු රාශියක් නිර්මාණය කිරීමට මාතර, බෙන්තර හා රයිගම ගුරුකුලයන්හි ශිල්පීන් සමත්වීය. ඒ අනුව මෙම ශාන්තිකර්මය වඩාත් ව්‍යාප්ත ව පවතින්නේ පහතරට සම්ප්‍රදායයේ ය. වෙස්මුහුණු ප්‍රබල සන්නිවේදනාත්මක මෙවලමකි. මේ අනුව දේශීය වෙස්මුහුණු පුද්ගල සංජානනයට බලපෑ ප්‍රබල සංකේතාත්මක ප්‍රකාශනයකි. ඒවා මිනිසාගේ අභ්‍යන්තර චිත්තවේග සමඟ සන්නිවේදනය කෙරෙන බව දක්නට ලැබේ. විශේෂයෙන් ලංකාවේ දහඅට සන්නි වෙස්මුහුණු ඉතා සුක්ෂම සන්නිවේදන ක්‍රමෝපායක් හා සංකීර්ණ සම්බන්ධතා සමුදායක් ද ගැබ්වූ ප්‍රකාශන ක්‍රමයක් වන අතර එහි දෘශ්‍ය සන්නිවේදය පිළිබඳ විමර්ශනාත්මකව අධ්‍යයනය කිරීම කාලෝචිත මෙහෙවරකි.

පර්යේෂණ ගැටලුව, පර්යේෂණ අරමුණු

මෙහිලා පර්යේෂණ ගැටලුව දහඅට සන්නියේ වෙස්මුහුණුවල සැරසිලිකරණය, එහි දෘශ්‍ය සන්නිවේදනාත්මක ප්‍රකාශනය කෙරෙහි සිදුකරන බලපෑම කෙබඳු ද යන්න විමසා බැලීම ය. එහිදී මේ වන විට ව්‍යාප්ත ගුරු කුළ අතර ප්‍රචලිත වෙස්මුහුණුවල යම් බඳු වෙනසක් දක්නට ඇතත් අදාළ රෝග කාරක ලක්ෂණ ඉන් පිළිබිඹු කරන බව හඳුනාගත හැකි ය. ඒ අනුව වෙස්මුහුණු නිර්මාණය කිරීමේ දී එහි අන්තර්ගතය හා ඉන් හෙළිවන දෘශ්‍ය සන්නිවේදනාත්මක ලක්ෂණ, අලංකරණ කටයුතු සඳහා භාවිත වන උපයෝගීතාව, උපක්‍රම හා තේරුම් ගැනීම් ආදිය අධ්‍යයනය කිරීම අරමුණු ය.

පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය සිදු කිරීමේදී භාවිත පළමු ක්‍රමවේදය වූයේ සාහිත්‍ය විමර්ශන ක්‍රමවේදය යටතේ අන්තර්ගතවන පුස්තකාලය සමීක්ෂණයයි. එහිදී සාහිත්‍ය කෘති, විචාරශීලී ග්‍රන්ථ, ලිපිලේඛන, අන්තර්ජාල තොරතුරු, දෘශ්‍ය සන්නිවේදන ලක්ෂණ ඇතුළත් තත් විෂයයේ වැදගත් සංකල්ප හා විෂය ක්ෂේත්‍රය සම්බන්ධ ග්‍රන්ථ මෙන්ම ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ තැන්පත් පෞරාණික හා කාලීන ලේඛන ද අධ්‍යයන කෙරිණි. එසේ ම දෙවනුව ක්ෂේත්‍ර පර්යේෂණ ක්‍රමවේදය යටතේ තෙමාසික ක්ෂේත්‍ර පර්යේෂණයක් මාතර, බෙන්තර හා රයිගම ගුරුකුලයට අයත් නර්ථන ශාන්තිකර්ම ශිල්පීන් ඇසුරින් සිදු කළ අතර එහිදී තෝරාගත් ඉලක්කගත පුද්ගලයන් හා කණ්ඩායම් ආශ්‍රිතව, සහභාගීත්ව ක්‍රමවේදය යටතේ කරුණු එක්රැස් කරන ලදි.

ප්‍රතිඵල හා සාකච්ඡාව



රූප සටහන 1. දහඅට සන්නි මුල් දින කවරය

පහතරට නර්ථන සම්ප්‍රදායයේ දහඅට සන්නි ශාන්තිකර්මය වඩාත් ප්‍රචලිත ව පවතින්නේ දකුණු පළාතේ ය. මෙම දහඅට සන්නි සමයම මාතර, බෙන්තර හා රයිගම යන ගුරුකුල සම්ප්‍රදායයන් අතර බහුල වශයෙන් දැකගත හැකි වේ. ඒ අනුව එම ගුරුකුල ආශ්‍රයෙන් එකිනෙකට වෙනස් දහඅට සන්නි වෙස්මුහුණු පිළිබඳව මූලික ව හඳුනා ගැනුණි. එමගින් විවිධ සම්ප්‍රදායයන් මිශ්‍රවීමෙන් සෑදුණු දහඅට සන්නි වෙස්මුහුණු මිනිසාට උපද්‍රව සිදු කරන ප්‍රධාන රෝගාබාධ 18ක් මුල්කොට පවතී. භූත, වාත, අභූත, පිස්සු, පිත්, ජල, බිහිරි, දේව, ගොළු සහ දෙමළ යනාදි සන්නි ඉන් කිහිපයකි. දහඅට සන්නි ශාන්තිකර්මයේ දී ආතුරයාට සිදු කරන පූජා විධි එකිනෙකට වෙනස් ස්වරූපයක් ගනේ. රංගන විලාශයන් අතර මාතර ගුරුකුලය ගත් කළ ඔවුන් සන්නි සමයමෙහි සංවාද සඳහා තම බස් වහර, මුබරි සංවාද මෙන්ම ආවේණික රංගන ශෛලීන් ද යොදා ගත්තේ ය. රයිගම ගුරුකුලයේ පූජාවිධි බෙන්තර ගුරුකුලයට සමාන බවක් දැක්වුවත් නර්තන විලාශය, සැරසිලි, ඇඳුම් ආයිත්තම් ආදිය ගම්මඩු යාගයට සමාන බව පෙනේ (අමරසේකර, 2002, පි.02). එපමණක් නොව වෙස්මුහුණුවල නම්, හැඩය, වර්ණ සංකලනය, ආකෘති ගොඩනගා ඇති ආකාරය, සංකේත භාවිතය, ඇඳුම් ආයිත්තම්, රේඛා භාවිතය හා ජ්‍යාමිතික මෝස්තර රටා මගින් අපේක්ෂිත දෘශ්‍ය සන්නිවේදනය පිළිබඳ අනාවරණය වේ. ඒ අනුව නම් වශයෙන් ගත් කළ බෙන්තර ගුරුකුලය විසින් භීත සන්නිය, භූත සන්නිය දෙකම එක සන්නියක් සේ ගෙන කෝල සන්නිය ඊට අලුතින් එකතු කළේ ය. තවද දේව සන්නිය, සුර සන්නිය ලෙසින් ද හැඳින්වේ (බෙන්තරගේ, 2018, පි.32-33). එපමණක් නොව හීතල සන්නිය, වෙව්ලන සන්නිය, ජල සන්නිය හා උදක සන්නිය යනු එකම සන්නියකි. නමුත් ඒවා හඳුන්වා දී ඇති නාමය පළාත් අනුව භාවිත වන ආකාරය වෙනස් වේ. මෙහිලා වර්ණ මගින් විවිධ පුද්ගල ස්වභාවයන් ඉස්මතු කරයි. ඒවා අතර පාරිශුද්ධත්වය, අධිමානසිකත්වය, මිත්‍යා දෘෂ්ටිය, ආක්‍රමණශීලීත්වය හා රාගික තත්ත්වයන් ද පිළිබිඹු කෙරේ. ජ්‍යාමිතික මෝස්තර රටා මගින් ද මෙහිලා අපේක්ෂිත දෘශ්‍ය සන්නිවේදනය අනාවරණය වේ. වෙස්මුහුණු භාවිතයෙන් සිදු කෙරෙනුයේ සමාරූපය කරවීමේ පහසුවයි. ඒ අනුව ලංකාවේ පහතරට ප්‍රදේශයේ ප්‍රචලිත කෝලම් නාටකවල දී වෙස්මුහුණු භාවිතය බහුලව පවතී. ඒ හැරුණු කොට සන්නියකුම යන ශාන්තිකර්මය සඳහා වෙස්මුහුණු රැසක් යොදා ගනේ. මෙම වෙස්මුහුණු පැළඳ සිදු කරන සංවාද හා චලන මගින් එම වෙස්මුහුණුවල පවතින භාව ප්‍රකාශන හැකියාව උද්දීපනය වේ. තවද වෙස්මුහුණෙහි සජීවීභාවය පිළිබිඹු වීම උදෙසා පන්දම් එළි යොදා ගනේ. "රෙගත දෙගත ගති ගද ගුන්දම් දෙගතම්" ආදි චලන, බෙර පදය සමඟ ඉදිරිපත් කිරීමේ දී පන්දම්වල ආලෝකයේ සෙවනැල්ල නරඹන්නන්ගේ ඇසට පතිතවීමෙන් මෙම සජීවීභාවය ලැබේ. තව දුරටත් මෙම දහඅට සන්නි ශාන්තිකර්මය පිළිබඳව කරුණු ගෙනහැර දක්වන්නේ නම්, යකදුරා හා වෙද මහතා යන පුද්ගලයන් අතර පවත්නා සමානතාවයන් මෙන්ම කාර්ය භාරය පිළිබඳව ද කරුණු ගෙනහැර දැක්විය හැකි ය (කෝට්ටගොඩ, 2009, පි.342-344). ඒ අනුව සමස්තයක් වශයෙන් සැලකූ විට ලංකාවේ වෙස්මුහුණු කලාවේ දහඅට සන්නි ශාන්තිකර්මය සුවිශේෂ කලාවක් බව සඳහන් කළ හැකි ය. මෙම සන්නියකුම මඟින් සමාජයේ පවතින ප්‍රශ්න පිළිබඳව යම් යම් කරුණු සාකච්ඡා කරනු ලබයි. එසේම මෙම සන්නි දහඅට, රෝග කාරක අවස්ථාවන් දහඅටක් සුව කරන්නට ගත් උත්සාහයක් ලෙස ද ප්‍රධාන වශයෙන් සඳහන් කළ හැකි ය.

නිගමන සහ නිර්දේශ

ලංකාවේ වෙස්මුහුණු කලාවේ දහඅට සන්නිය සුවිශේෂ කලාවක් බව සඳහන් කල හැකි ය. දහඅට සන්නි සමයමෙහි වෙස්මුහුණු විවිධ අවස්ථාවන්වලදී භාවිත වන ආකාරයෙහි යම් බඳු වෙනස්කම් පවතී. වත්මනෙහි ගුරුකුල අතර දක්නට ලැබෙන වෙස්මුහුණු විමසා බැලීමේ දී එමගින් දෘශ්‍ය සන්නිවේදනාත්මක ලක්ෂණ පිළිබිඹු කෙරෙන අතර ඒවාට ඇතුළත් රංගන විලාස මගින් ඒ බව තහවුරු කෙරේ. ඒ අනුව සමස්තයක් වශයෙන් සැලකූ විට මෙම වෙස්මුහුණු පද්ධතිය ජනගත වීම අත්‍යවශ්‍ය කරුණක් ලෙසින් පෙන්වා දිය හැකි ය.

ප්‍රමුඛ පද: *ගුරුකුල, දහඅට සන්නි සමයම, දෘශ්‍ය සන්නිවේදනය, වෙස්මුහුණු, සාම්ප්‍රදායයන්*

ආශ්‍රිත ග්‍රන්ථ

අමරසේකර, ටී. (2002). *දහඅට සන්නිය යාගවිධි විමර්ශනය.* එස්. ඇන්ඩ්. එස්. ප්‍රින්ටර්ස්.

කෝට්ටගොඩ, ජේ., බෙන්තරගේ, එල්., මුතුකුමාරණ, එන්., සහ සපුකොටන, වී. (සංස්.) (2009). *සන්නියකුම හෙවත් දහ අට සන්නිය.* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

බෙන්තරගේ, එල්. (2008). *18 සන්නි සංවාද.* කර්තෘ ප්‍රකාශනයකි.

මුද්දර නිවේදන අංක 945. (2018.08.08). *දහ අට සන්නිය.* කොළඹ 01000: මුද්දර කාර්යාංශය, තැපැල් දෙපාර්තමේන්තුව, තැපැල් මූලස්ථානය.

An Anthropological Study on the Role of Gender of Teen Video Gamers (Based on Kottawa/South Grama Niladhari Division)

L. D. I. Udari* and H. D. Y. D. Jayathilake
Department of Anthropology, University of Sri Jayewardenepura, Sri Lanka
**udariliyanage00@gmail.com*

Introduction

Many explanations have been introduced about feminism and masculinism. Most of the past philosophical perspectives have also been posited about the difference of gender, not only among humans but also among animals. Although the present scientific pieces of evidence have proved the existence of human life as well as animal life, there are negative as well as positive viewpoints regarding the so-called gender differences. In the present world, many discoveries have been invented to make daily tasks easier. Since there are both benefits as well as damages to human life, people have to adjust to the present changing world. Video gaming has been identified as one of the most popular features among present teenagers. The history of video gaming started in 1940 when Edward Condon designed a computer that could play a game called "Nim" with one player (History of Video Games - Four Decades of Video Entertainment, 2010). The first home video game, "Space Odyssey", was created in 1972 and in 1993, the release of "Mortal Combat" forced the US Government to start rating the games based on their violence level (History of Video Games - Four Decades of Video Entertainment, 2010). The first game with a female protagonist appeared in 1996 known as "Tomb Raider" and it became one of the most popular games in video game history. Afterwards, Will Wrights created a game called "The Sims" in 2000 which has been the most popular game among the female players of that era (Kondrat, 2015). This study focused on the role of gender of teen video gamers in the Kottawa/South Grama Niladhari Division. The intentions in playing video games by both male and female teen video gamers have been focused on basically here.

Research Problem/s, Objective/s

The foremost intention of this study is to investigate the influence and disparity between male and female teen video game players. Also, to identify the addiction to video games, popularity, their preferences basically according to gender, their personality differences and attitudes towards video gaming, etc.

Materials and Methods

In this study, only male and female teenagers who were between 13 – 19 years old were taken from the Kottawa/South Grama Niladhari Division (GND – 496). According to the statistics in 2012, the male population of this Grama Niladhari Division was 3450 while the female population was 3709 and the total population of Kottawa South Grama Niladhari Division was 7159 (Analytical Study, 2012). During the period the COVID-19 pandemic situation, the sample size had to be limited and through a purposive sampling method, fifteen male teenagers and fifteen female teenagers were selected through the snowball method. The study also illustrated how the variabilities can be seen among males and females in different aspects to take the outcome or to conclude the core point for the proving of the hypothesis using questionnaires and in-depth interviews.

Results and Discussion

When considering about the gender differences in video gaming, the investigation was on their screen time, Preferences in video gaming (gaming genres), academic achievements, and finally addiction to video gaming. Accordingly, 67% of female teenagers declared that their screen time for video gaming was less than an hour while 33% of female teenagers declared that their screen time for video gaming was an hour or more but less than two hours. When it comes to male teenagers, only 27% of them declared that their screen time for video gaming has to be limited to just less than an hour while 54% of them were playing video games for more than one hour but less than four hours and 19% of male teenagers were found to be playing more than four hours which can be identified as an addiction in the first place than female

teenagers. Their preferences o video gaming or the selection of video gaming genre can be identified as follows. 94% of male teenagers loved to play action games while only 14% of female teenagers declared that they have chosen action games to play. The rest of the sample was found to be playing offline stress-free puzzles and other casual games. 54% of male teen video gamers scored and acquired between the 1-10th positions at school while 87% of female teen video gamers were found to have acquired 1-10th positions at school which means the academic performance of female teen video gamers was better than male teen video gamers. 80% of male teenagers scored the highest marks for science subjects while 20% of them scored the highest marks for subjects. 60% of the female teen video gamers scored the highest marks for science subjects while 40% of them were good at arts subjects. However, both male and female teen video gamers were found to be more skilled in science subjects rather than the arts subjects. Moreover, their screen time can be identified as the main clue to identifying the most addictiveness to video gaming. Therefore, male teen video gamers can be indicated as the most addicted to video gaming than female teen video gamers. However, the whole sample of male and female teen video gamers declared that they got some back pains, eye defects, and headaches as a result of too much of video gaming and staying in front of a digital screen.

Conclusions and Recommendations

Limiting games that build up violence and enhance aggression, playing some games related to Sri Lankan culture, and creating video games recreating Sri Lankan folk games in a digital-based platform as there are folk games like “Pancha Keliya” which can be installed via Google Play store which increase and develop the popularity of Sri Lankan cultural value as well as to make the Sri Lankan folk games popular around the world can be recommended instead of playing games which create aggression among teenagers. It also adds some knowledge at the same time relaxation for the hectic mind of teenagers. Following a correct posture when sitting before a digital screen and when using devices for gaming or academic purposes in an accurate way will accomplish a much more favorable state and stop getting physical discomfort like back pains, neck pains, vision defects, etc.

Acknowledgments

The researcher intends to convey their gratitude to the Grama Niladhari of the Kottawa/South (496) Grama Niladhari Division and the teenagers and their parents for their time and valuable thoughts, to my family, relatives, and especially my cousins for being constant sources of strength and inspiring me through the research.

***Keywords**: Gender differences, Teenagers in Sri Lanka, Role of gender, Video gamers, Video gaming*

References

Eskasnanda, D. P. (2017). Causes and Effects of Online Video Game Playing among Junior-Senior High School Students in Malang East Java. *UNNES Journals*, 191.

Kondrat, X. (2015). Gender and video games: How is the female gender generally represented in various genres of video games? *JOURNAL of Comparative Research in Anthropology and Sociology*, 171.

Population by GN and Sex 2012. (2012): www.stastics.gov.lk. https://www.statstics.gov.lk.

History of Video Games - Four Decades of Video Entertainment. (2010, November 24): Pediapress.com. http://code.pediapress.com.

Ethnographic Revisit to the Evolution of Sinhala Marriage Alliances through Socioeconomic Change: with Special Reference to Pul-Eliya; Sri Lanka

M. R. Gunarathna* and K. M. S. Samarasekara
Department of Anthropology, University of Sri Jayewardenepura, Sri Lanka
**malki.gunaratne@gmail.com*

Introduction

Marriage alliances have a direct link with the economic system from the early stages of civilization. Likewise, the Sri Lankan Sinhala marriage system and economy have shown considerable interdependency. From early times to the present, Sri Lanka's main economic activity has been subsistence agriculture. Therefore, the land and ownership of the land constitute higher status and prestige in rural Sri Lankan society. Caste and land have a direct connection with kinship and marriage patterns in rural society. Hence, Sri Lankan peasant society has been researched by both foreign and Sri Lankan scholars as Sri Lanka provides an excellent ground for such investigation since marriage has undergone far-reaching changes in recent years. These studies have focused on caste, kinship, marriage, land tenure, politics, and religion. Some of the studies had been conducted as micro studies which centered on small communities, particular villages, and their sociostructural patterns, as well as social change in Sri Lanka (Ryan 1953, Peiris 1956, Leach 1961, Yalman 1967, Obeysekere 1967). According to the remaining ethnographic evidence, Sinhalese society is growing and becoming more complex and stratified, and the nature and quality of life among families are becoming differentiated based on economies and the position of marriage and family within the economic system. This sociocultural change influences the traditional Sinhala marriage system. As a result, the traditional marriage system encounters several changes with less connection to the economy. Thus, the changing marriage practices impact the economic setting.

Research Problem/s, Objective/s

This study intends to investigate the impact of changing the socioeconomic system on modern Sinhala marriage alliances in Sri Lanka. The objective of this study is to identify extraneous drivers of change in the traditional peasant economic system and Sinhalese marriage alliance.

Materials and Methods

An analytical ethnographic research design was employed for the study, conducted in Pul-Eliya located in the Anuradhapura District; Sri Lanka, which was earlier explored to some extent by the foreign anthropologist E.R. Leach; in 1961. A sample of fifty households was randomly selected. Moreover, structured interviews were the key method of data collection, while using non-participant observation and genealogical methods as the subsidiary methods. Primary sources of the research include oral histories, accessed through interviews and ethnographies, and secondary sources include Grama Niladari reports and other publications. A mixed method was used for data analysis, comprising quantitative and qualitative approaches.

Results and Discussion

The kinship and marriage system in Pul-Eliya folks are two of the main research interests of E.R. Leach. Pul-eliya people regard themselves as members of a *variga*, a term that refers to an endogamous sub-caste of the *Goyigama* (farmer caste), whose members live in neighbouring villages. While the economy of the folks in Pul-Eliya is based on Agriculture, marriage alliances can be identified as a factor that determines the acquisition of land. According to the oldest informants, Pul-Eliya folks had undergone polygyny, due to outnumbered men in the 1960's, which provided them the advantage of preserving their agrarian lands among their families. Although most marriages were formally registered before a marriage registrar, the said practice commenced around the sixties, becoming widespread and nearly universal, subsequently. The desired form of post-marital residence among the Sinhalese is for a woman to be settled at her husband's residence (*Deega*), while it is considered demeaning for a male to come from

another village and reside with his wife's kin (*Binna*). According to the findings, *Deega* marriage had become the prominent (76%) among Pul-Eliya peasants, while *Binna* marriages at the 24%. Furthermore, 52% of marriages were *Awassa Gnathi Sahodara Vivaha* (Cross-cousin marrige) that allows reserving the land plots among the kindred. According to Leach, marriage alliances on the ground reflect the priority of economic and ecological realities pertaining to land over kinship ideology. Nevertheless, observations made during the field study discovered that the normative order is not without meaning of "economic" decisions; is subject to some degree of social sanctioning. In contrast, many women of Pul-Eliya have retained ownership of parental land by remaining in the village and marriying in-migrating males. But according to the dominant "male ideology" of the village, women do not attend to the cultivation meeting even today which still proves (*male-dominated society… it is the men who govern and who take the managerial decision*) Leach's findings in 1961.

Conclusions and Recommendations

The conclusion of the study was that several economic reasons affect the change of the modern practice from its previous Sinhalese traditional form. First, the number of children in a family declines through family planning strategies while the number of living generations increases in the household in the modern era. The concept of 'Punchi Paula Raththaran' which is used as an economic strategy to control the population growth in 1970s, transformed the extended Sinhalese family into a nuclear composition. As the second factor, the advancements in education, information technology, the influence of media and changing lifestyles have influenced the parental ambitions to provide best preferred education for their children in the competitive world. Marriage was postponed in order for young adults to receive an education and save up an amount of money. Further, the migration of younger generations has led to the disintegration of the Sinhalese marriage alliance. Thirdly, the disappearance of traditional land inheritance system including dowry in marriage alliance was established due to the economic independence of the modern society. Furthermore, the younger generation does not have any intention to continue their traditional livelihood; agriculture and their parents do not allow them too. Finally, the research recommendations suggest that the policy makers and planners should try to identify and replicate efficient, supportive networks in socio-economy in Sri Lanka and implement appropriate trainings among youth to use modern facilities and technologies within the traditional livelihoods.

Keywords: *Economy, Marriage, Pul-Eliya, Socio-economic Change*

References

Farmer, B.H. (1957). *Pioneer Peasant Colonization in Ceylon: a study in Asia agrarian*. Oxford University.

Goody, J. and Tambiah, S.J. (1973). *Bridewealth and Dowry*. Cambridge University Press.

Leach, E.R. (1961). *Pul Eliya: a village in Ceylon, a study of land tenure and kinship*. Cambridge University Press.

Leach, E.R. (1961). *Rethinking Anthropology*. The Athlone Press.

Tambiah, S.J. (2000). *Edmund Leach: An Anthropological Life*. Cambridge University Press.

Communication, Media and Society

Factors Influencing Brand Switching Behaviour in the Telecommunication Industry: A Study on Young Consumers in Sri Lanka

C. Weerasinghe and V. Sachitra*

Department of Commerce, Faculty of Management Studies and Commerce, University of Sri Jayewardenepura, Sri Lanka

**vilani@sjp.ac.lk*

Introduction

Market conditions have become very competitive and companies are trying to capture each other's share by various competitive strategies and tactics. Brand identity is distinct from brand image (Erdem, 2020) and helps to distinguish the relevant product from other products and services (color, design, and logo) that identify and distinguish the brand in the consumers' minds. Brand switching is known as brand jumping and refers to the processing which a customer change from buying one brand of a product (example: mobile phone) to buying another brand (Salman and Kalyan, 2018). The available statistics shows that there is a substantial competition between brands in the field of telecommunication in Sri Lanka, especially in mobile telecommunication service providers (Jayawickramarathna, 2014). In the face of stiff competition in the telecommunications sector, consumers can easily switch between brands. As consumers continue to switch between brand names, it poses a variety of threats to service providers. This poses a serious threat to the market share currently held by service providers in the telecommunications sector. The loss of long term loyal customers to service providers through such a brand switching is a major threat to service providers.

Research Problem/s, Objective/s

On these notes, the study aims to identify the factors influencing the younger consumers to move from one mobile networking brand to another in the telecommunication sector in Sri Lanka. The younger generation is used for this analysis because the mobile service delivery chain is spread over a higher percentage of the younger generation compared to the elders.

Materials and Methods

Based on the nature of the study, quantitative research was applied and the deductive approach was utilized. Explanatory research was used to test the hypotheses derived from predictive theories.

H1: Switching cost influences on the brand switching behaviour of younger consumers in the telecommunication sector in Sri Lanka.
H2: Telecommunication service influences on the brand switching behaviour of younger consumers in the telecommunication sector in Sri Lanka.
H3: The influence of sales promotional activities e on the brand switching behaviour of younger consumers in the telecommunication sector in Sri Lanka.

The target population of the study consisted of undergraduates in a State University in Sri Lanka. 1000 questionnaires were distributed using a Google form. A structured questionnaire was designed to collect the primary data. All the constructs in the desired model; switching costs, services and promotions were converted into measurable terms. The measurement scale ranged from 1 (strongly disagree) to 5 (strongly agree) with the neutral point of 3 (moderate). The questionnaire contained a total of 32 items. The study pre-tested the survey instrument with 22 undergraduates. Multiple regression analysis was used to analyze the relationship between a dependent variable and independent variables.

Results and Discussion

Of the 1000 participants, 250 responded (100 - male and 150 - female), indicating a 25% response rate. Interestingly, 78% indicated that they have changed their mobile networking brand during the last year. As shown in Table 1, the Kaiser-Meyer-Oklin (KMO) value of the measurement items were greater than

0.50. Further, the average variance explained of the measurement items were greater than 50%, indicating the appropriateness of the total variation in the items of respective factors. Further, the Cronbach's alpha values were above the cut-off values (0.70), suggesting adequate reliability.

Table 1: Goodness of Measurements

Variable	KMO Value	Factor Loading	Bartlett's Test of Sphericity Chi-Square	Average Variance Explained	Cronbach's Alpha
Switching cost (SC)	.737	SC3 - .768 SC4 - .784 SC5 - .673 Sc6 - .686	170.74 (.000)	0.531	.744
Service (Se)		Se1 - .737 Se3 - .724 Se5 - .722 Se6 - .730	164.23 (.000)	0.534	.787
Promotion (PR)		PR1 - .730 PR3 - .727 PR5 - .732 PR6 - .727	165.53 (.000)	0.532	.779
Brand switching behaviour (BS)		BS1 - .763 BS3 - .714 BS5 - .756 BS6 - .724	185.05 (.000)	0.547	.754

The results of the multiple regression analysis indicated that 0.821 percent of the variance in the brand switching can be significantly explained by the factors of switching cost, services and promotions. Among the factors, promotion recorded the highest beta value (beta = .674) followed by services provided (beta = .484). It is also identifed that switching cost and brand switching behaviour has a negative relationship (beta = -.292).

Conclusions and Recommendations

Attractiveness of alternatives, price of services, failed service quality, and core service failures have a collectively significant impact on brand switching. Switching cost and brand switching behaviour show a negative impact; when switching cost is low, they will move to another new brand, perhaps the reason may be in order to experience the excellent service the competitor provides. As per the findings, the mobile network companies must be more conscious on the services they provide. The overall quality of the service, the affordable price of the package service, customer care services including service recoveries and value added services should be taken into consideration by companies in order to attract the younger generation. So, in a nutshell, it is of utmost need that the best possible services to be provided by the companies, and the primary objective should be delighting the customers. They can focus on cloud-based services to provide more sophisticated services.

Keywords: *Brand switching; Young consumers; Switching cost; Promotion; Services; Telecommunication*

References

Erdem, T., & Sun, B. (2020). An Empirical Investigation of the Spillover Effects of Advertising and Sales Promotions in Umbrella Branding. *Journal of Marketing Research*, 39(4): 408-420.

Jayawickramarathna, S. (2014). Corporate reputation and customer brand switching behavior in Sri Lankan telecommuniction industry. *Kelaniya Journal of Management*, 3(2): 68-84.

Salman, M., & Kalyan, N. B. (2018). A Study on Factors Influencing Brand Switching in. *International Journal of Latest Technology in Engineering, Management & Applied Science (IJLTEMAS)*, 9(7): 2278-2540.

සමරිසි පුද්ගලයන් අතර මත්ද්‍රව්‍ය භාවිත රටා සහ චර්යා

ජී. ජී. ඒ මධුහංසි*, එච්. ඩබ්ලිව්. තුෂාරී, එන්. පී. අමරබන්දු, බී. සේනානායක සහ ටී. ඒ. දර්ශන
අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, ශ්‍රී ලංකාව
**asankaganegama17@gmail.com*

හැඳින්වීම

ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය දුර්භාවිතය ආශ්‍රිත ප්‍රවණතා සහ භාවිත රටා මෙන්ම ඒ ආශ්‍රිත ව පුද්ගලයන්ගේ චර්යා කලින් කලට සන්දර්භයෙන් සන්දර්භයට වෙනස් වෙමින් පවතින බව විද්‍යාත්මක සාක්ෂි මත පදනම් වූ පර්යේෂණ මගින් තහවුරු කරයි. එබැවින් විවිධ ඉලක්ක කණ්ඩායම් අතුරින් සමරිසි පුරුෂයන් (Homosexual Men/Gay) මූලික කරගනිමින් ඔවුන් අතර අලුතින් උද්ගතවන මත්ද්‍රව්‍ය භාවිත රටා සහ චර්යා සම්බන්ධයෙන් මෙම අධ්‍යයනය සිදු කරන ලදි. ලිංගික සුළුතර ප්‍රජාව (Sexual Minority Groups - LGBTQ) ලෙස හඳුනාගන්නා පුද්ගලයන්, බොහෝවිට සමාජ අපකීර්තියට, වෙනස් කොට සැලකීමට සහ විෂමලිංගිකයන් (heterosexual) ලෙස හඳුනාගන්නා පුද්ගලයන් විසින් මුහුණ නොදෙන හිරිහැර හා ප්‍රචණ්ඩත්වයේ වැඩි අවදානමකට ද මුහුණ දෙයි. විශේෂයෙන් පර්යේෂකයන් සහ සායනික විශේෂඥයන් පෙන්වා දෙන පරිදි ලිංගික සුළුතර කණ්ඩායම් මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි යොමු වීමට බලපාන සමාජ සංස්කෘතික සාධක ලෙස, සමාජ පීඩනය (Social Pressure), ආගමික සහ පවුල්වල ගැටලු සහගත තත්ත්ව (Religious or Familial Turmoil), උප සංස්කෘතික වෙනස්කම්, (Sub-Cultural differences), ලිංගික සුළුතරයන් වීමෙන් මුහුණ දෙන සමාජ සංස්කෘතික ඇඟවීම් (Sociocultural implications of being a sexual minority) වැනි ලක්ෂණ පෙන්වා දී තිබේ (Green & Feinstein, 2012, p.8). මෙම අභියෝග සහ අනෙකුත් ආතතීන්ගේ ප්‍රතිඵලයක් වශයෙන්, ලිංගික සුළුතර ප්‍රජාවට (Sexual Minority Groups) විවිධ චර්යාත්මක සෞඛ්‍ය ගැටලු සඳහා වැඩි අවදානමක් ඇත. මේ අනුව ලිංගික සුළුතර ප්‍රජාව මත්ද්‍රව්‍ය අනිසි භාවිතය සහ මත්ද්‍රව්‍ය භාවිත අක්‍රමතා (SUD) ඉහළ මට්ටමක පවතින බව මෙතෙක් කරන ලද සමීක්ෂණවලින් අනාවරණය වී ඇත. මේ අනුව, සමරිසි පුරුෂයන් (Homosexual Men/Gay) මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත අවදානම් චර්යා සහිත කණ්ඩායමක් වශයෙන් හඳුනාගත හැකි වේ.

පර්යේෂණ ගැටලුව, පර්යේෂණ අරමුණු

පර්යේෂණ ගැටලුව - සමරිසි පුරුෂයන් අතර අලුතින් උද්ගතවන මත්ද්‍රව්‍ය භාවිත රටා සහ චර්යා මොනවා ද?

පර්යේෂණ අරමුණු -

1. සමරිසි පුරුෂයන් අතර මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වූ සුවිශේෂ හේතු සාධක හඳුනා ගැනීම
2. සමරිසි පුරුෂයන්ගේ චර්යා සහ මත්ද්‍රව්‍ය භාවිතය අතර සම්බන්ධතාවක් පවතින්නේ දැ යි හඳුනා ගැනීම.
3. සමරිසි පුරුෂයන් අලුතෙන් යොමු වී ඇති මත්ද්‍රව්‍ය වර්ග හඳුනා ගැනීම.
4. මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් සමරිසි පුරුෂයන් මුහුණපාන සමාජ හා සෞඛ්‍ය අභියෝග හඳුනා ගැනීම.

පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනය ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ විස්තරාත්මක පර්යේෂණයක් වශයෙන් හරස්කඩ අධ්‍යයන ආකෘතිය (Cross Sectional Study) යටතේ සිදු කරන ලද අතර අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස කොළඹ දිස්ත්‍රික්කය සහ තදාසන්න ප්‍රදේශ තෝරා ගන්නා ලදි. මෙම අධ්‍යයනයේ නියැදිය වශයෙන් හිමබෝල නියැදීම යටතේ මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වූ සමරිසි පුරුෂයන් 10 දෙනෙකු යොදා ගන්නා ලදි. දත්ත රැස්කිරීමේ ශිල්ප ක්‍රම ලෙස, ප්‍රශ්නාවලි, ගැඹුරු සම්මුඛ සාකච්ඡා ක්‍රමය, සිද්ධි අධ්‍යයනය යොදා ගෙන ඇත. ප්‍රමාණාත්මක දත්ත SPSS මෘදුකාංගය භාවිත කරමින් විශ්ලේෂණය කර ඇති අතර ගුණාත්මක දත්ත තේමාත්මක අන්තර්ගත විශ්ලේෂණය අනුව විශ්ලේෂණය කරන ලදි.

ප්‍රතිඵල හා සාකච්ඡාව

අධ්‍යයනයට ලක් කළ සමරිසි පුරුෂයන් සියලුදෙනා ම, ඔවුන්ගේ ලිංගික දිශානතිය හේතුවෙන් මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වීමේ හා ඇබ්බැහි වීමේ වැඩි අවදානමක් පවතින බව හඳුනාගන්නා ලදි. එසේම, මෙම ලිංගික දිශානතිය වෙනස් වීම මත තරුණ අවධියේ දී පුද්ගලයන් සමාජ අපකීර්තියට (Social Stigma) පත්වීම නිසා, ඔවුන් මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වීමට හේතු වූ ප්‍රධාන හේතුවක් ලෙස එය හඳුනාගන්නා ලදි. නියැදියට අයත් පුද්ගලයන්ගේ වර්තමාන මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳව අවධානය යොමු කිරීමේ දී පුද්ගලයන් 07 දෙනෙකු (88.9%) සිගරැට් භාවිත කරන අතර පුද්ගලයන් 08 දෙනෙකු (77.8%) මද්‍යසාර භාවිත කරයි. එසේම, හෙරොයින් භාවිත කරන පුද්ගලයන් 04 (44.4%) දෙනෙකු සහ ගංජා භාවිත කරන පුද්ගලයන් 07 (77.8%) දෙනෙකු නියැදිය තුළ නියෝජනය වේ. නියැදිය තුළ අයිස් හෙවත් මෙතැම්පිටමයින් භාවිත කරන පුද්ගලයන් 05 (55.6%) දෙනෙකු වේ. මෙම සමරිසි පුරුෂ කණ්ඩායම අතර භාවිත වන මත්ද්‍රව්‍ය වර්ග අතුරින්, මෙතැම්පිටමයින් (අයිස්), ඇල්කොහොල්, දුම්වැටි, ගංජා යනාදිය ප්‍රමුඛ මත්ද්‍රව්‍ය ලෙස හඳුනාගත හැකි අතර මෙම කණ්ඩායමට අයත් වුවන් බහුවිධ මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් (Poly Drug Users) වේ. මෙම සමරිසි පුද්ගල කණ්ඩායම තුළ සිටින පුද්ගලයන්ගේ සුවිශේෂ චර්යා රටාවක් ලෙස, මෙතම්පිටමයින් (අයිස්) භාවිත කර ලිංගික චර්යාවල නිරත වීමේ වැඩි ප්‍රවණතාවක් ඇත. විශේෂයෙන් අයිස් භාවිත

කළ විට ලිංගික හැඟීම් උද්දීපනය වීමක් හා වැඩි වේලාවක් තම ලිංගික සහකරු සමඟ සිටීමට හැකිය යන විශ්වාසයක් මෙම සමරිසි පුද්ගලයන් කෙරෙහි ඇත.

එසේ ම, මෙම සමරිසි පුරුෂයන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය හා සම්බන්ධ සුවිශේෂ හැසිරීම් පිළිබඳ ව අවධානය යොමු කිරීමේ දී, මොවුන් කණ්ඩායම් වශයෙන් මෙන්ම තනිවම සහ ඔවුන්ගේ සහකරුවන් සමඟ මත්ද්‍රව්‍ය භාවිත කිරීම ද සිදු කරයි. විශේෂයෙන් මෙම සමරිසි පුරුෂයන් මත්ද්‍රව්‍ය භාවිත කිරීමේ ආශාව හේතුවෙන් ලිංගික ක්‍රියාකාරකම්වල නිරත වීමේ තත්ත්වයක් ඇත. මත්ද්‍රව්‍ය සපයන්නේ නම්, නිත්‍ය සහකරුවන් (Regular Partners) හෝ අනියම් සහකරුවන් (Casual Partners) සමඟ ලිංගික චර්යාවල ඔවුන් නිරත වේ. ඒ සඳහා ආගන්තුක සහකරුවන් සම්බන්ධ කරගැනීමට විවිධ Dating Apps භාවිත කරයි. එම Dating Apps කිහිපයක් ලෙස, ග්‍රින්ඩර් (Grinder) , ටින්ඩර් (Tinder) සහ ෆෙස් බුක් (Face Book) සමාජ මාධ්‍ය ජාලය ද භාවිත කරනු ලබයි. එසේ ම, මෙම පුද්ගලයන් ලිංගික චර්යාවල නිරත වීමේ අවශ්‍යතාව නිසා ම, මත්ද්‍රව්‍ය භාවිත සිදු කරන බව ද අනාවරණය විය. ඒ අනුව, මෙම සමරිසි පුද්ගලයන් සමූහ ලිංගික චර්යාවල (Group Sex) නිරත වීමට පෙර මත්ද්‍රව්‍ය භාවිත කිරීම මගින්, රාත්‍රී කාලය පුරාවට නිදිවර්ජිත ව සිටීමට, ලිංගික හැඟීම් උද්දීපනය කිරීමට (Sexual Feeling) සහ වෙනත් කරුණු ද හේතු වී ඇත. මෙම සමරිසි පුරුෂයන් සමාජ මාධ්‍ය මගින් සංවිධානය කරන සාද සහ වෙරළ සාද, රාත්‍රී සමාජශාලා, Gay Party වලට සහභාගී වන අතර ඒවායෙහි දී හමුවන තම ලිංගික දිශානතියට සමාන පුද්ගලයන් සමඟ ඇති කරගන්නා මිතුරු සම්බන්ධතා මත ඔවුන් ලිංගික චර්යාවලට පෙලඹේ. එම සාදවල දී ඇල්කොහොල්, සිගරැට්, එල්. එස්. ඩී, අයිස්, එක්ස්ටසි, මැන්ඩි වැනි මත්ද්‍රව්‍ය භාවිත කිරීමේ ප්‍රවණතාවක් මෙන් ම, එම සාද අවසන් වීමෙන් පසු ඔවුන් room දැමීම නමින් හඳුන්වන ක්‍රියාවලියක නිරත වේ. එහි දී සමූහ වශයෙන් සමසිරි පුද්ගලයන් ලිංගික චර්යා සිදු කිරීමට (Group Sex/ Chemsex) සහ මත්ද්‍රව්‍ය භාවිත කිරීම සිදු කරනු ලබයි.

මෙම සමරිසි පුද්ගලයන්, සමාජයේ විවිධ තරාතිරමේ රැකියාවල නිරත වන සමාජ පිළිගැනීමක් ඇති අය ලෙස කටයුතු කළ ද, ඔවුන්ගේ ලිංගික දිශානතියේ බලපෑම මත ඔවුන් මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් සහ මත්ද්‍රව්‍ය භාවිත කර ලිංගික චර්යාවල නිරත වීම සම්බන්ධයෙන් අවදානම් හැසිරීම් සඳහා යොමු වී ඇති බව පැහැදිලි වේ. මෙම සමරිසි පුද්ගල කණ්ඩායම තුළ සිටින පුද්ගලයන් සහ ඔවුන් සමඟ මිතුරු සබඳතා පවත්වන මෙවැනි ම වූ ලිංගික දිශානතියක් සහිත පුද්ගලයන් රාශියක් සාමාන්‍ය සමාජයේ ජීවත් වන අතර ඔවුන්ගේ මෙම චර්යා රටා, මත්ද්‍රව්‍ය භාවිත අක්‍රමතා, ඇබ්බැහිවීම, සහ ලිංගික රෝග ව්‍යාප්තිය සඳහා ද ප්‍රවණතාවක් සහිත බව මෙම අධ්‍යයනයෙන් අනාවරණය විය.

නිගමන සහ නිර්දේශ

මෙම අධ්‍යයනයේ අනාවරණ අනුව, සමරිසි පුරුෂයන් තුළ ලිංගික දිශානතිය හේතුවෙන් මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වීමේ හා ඇබ්බැහි වීමේ ප්‍රවණතාවක් පවති. එසේ ම, සමරිසි පුරුෂ කණ්ඩායම අතර භාවිත වන මත්ද්‍රව්‍ය වර්ග අතුරින්, **මෙතැම්පිටමයින් (අයිස්), ඇල්කොහොල්, එල්. එස්. ඩී, දුම්වැටි, ගංජා** යනාදිය ප්‍රමුඛ මත්ද්‍රව්‍ය ලෙස හඳුනාගත හැකි ය. විශේෂයෙන් මෙම සමරිසි පුරුෂයන් මත්ද්‍රව්‍ය භාවිත කිරීමේ ආශාව හේතුවෙන් ලිංගික ක්‍රියාකාරකම්වල නිරත වීමේ තත්ත්වයක් සහ ලිංගික චර්යාවල නිරත වීමේ අවශ්‍යතාව නිසා ම, මත්ද්‍රව්‍ය භාවිතයක් සිදු කරයි. එසේම, මත්ද්‍රව්‍ය භාවිතා කර විවිධ පුද්ගලයන් සමඟ අනාරක්ෂිත ලිංගික චාර්යාවල නිරත වීම එච්. අයි. වී ඒඩ්ස් හෝ වෙනත් ලිංගාශ්‍රිත රෝග වැළඳීම සඳහා ඇති අවදානම වැඩි කරයි.

මෙම අධ්‍යයනයේ අනාවරණ සහ නිගමන අනුව, සමරිසි පුද්ගලයන් ආවේක්ෂණය කරමින් ඔවුන්ගේ අවදානම් හැසිරීම් සම්බන්ධයෙන් (මත්ද්‍රව්‍ය භාවිතය හා ලිංගික චර්යා) කටයුතු කිරීම සඳහා රජය මට්ටමින් විධිමත් වැඩපිළිවෙළක් සකස් කළ යුතු වීම කාලීන අවශ්‍යතාවකි. එසේ ම, මත්ද්‍රව්‍ය ඇබ්බැහිවීම හෝ ලිංගික කටයුතු සම්බන්ධයෙන් උපදේශනය සඳහා යොමු කිරීමට ප්‍රථමයෙන්, ජෛව විද්‍යාත්මක ව ඔවුන් තුළ ඇති වන ලිංගික දිශානතියත් සමඟ එම ඇති වන තත්ත්ව කළමනාකරණය කර ගැනීම පිළිබඳ ව උපදේශනයක් ලබා දිය යුතු ය.

ප්‍රමුඛ පද: *සමරිසි පුරුෂයන්, මත්ද්‍රව්‍ය ඇබ්බැහිය, ලිංගික සුළුතර ප්‍රජාව, කෙම් සෙක්ස්(Chemsex)*

ආශ්‍රිත ග්‍රන්ථ

McKirnan, D. J. & Peterson PL. (1989). Alcohol and drug use among homosexual men and women: epidemiology and population characteristics. *Addictive Behaviors*. 14(5), 545-53. doi: 10.1016/0306-4603(89)90075-0. PMID: 2589133.

Munasinghe, T. (2021). *Preliminary Report on the STI/HIV Risk Associated with Sexualized Drug Use.* The Family Planning Association of Sri Lanka.

කුටුම්බ ඒකකය තුළ වැඩිහිටියන් මුහුණ දෙන සමාජ-ආර්ථික ගැටලු හා අභියෝග: තිරසාර වැඩිහිටි දිවියකට සිදු කෙරෙන බලපෑම

පි. සි. හෙට්ටිආරච්චි*[1] සහ ජී. එම්. කේ. අමරතුංග [2]

[1]ජාතික සමාජ සංවර්ධන ආයතනය, ශ්‍රී ලංකාව, [2]කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

**priyanchandana@yahoo.com*

හැඳින්වීම

වයස්ගතවීම කාලානුරූපී ක්‍රියාවලියකි. කාල නිර්ණය ව ජීවිතයට වයස එකතුවීම වයස්ගතවීමයි. වයස්ගතවීම (Ageing) යන්න ජීව විද්‍යාත්මක වශයෙන් පමණක් නොව සමාජ, ආර්ථික, සංස්කෘතික හා මනෝවිද්‍යාත්මක වශයෙන් සාධක රැසක බලපෑමට නතු වූ බහුමානීය සමාජ සංසිද්ධියක් වශයෙන් ද හඳුනාගත හැකි ය. Myers (1985) අනුව වැඩිහිටියන්ගේ වයස නිර්වචනය කිරීමේ විවිධත්වයක් දැකිය හැකි ය. සංවර්ධිත රටවල වයස අවුරුදු 65 සහ ඊට වැඩි අයත්, සංවර්ධනය වෙමින් පවත්නා රටවල වයස අවුරුදු 60 සහ ඊට වැඩි පිරිසත් වයස්ගත ජනගහනය වශයෙන් හඳුනාගෙන තිබේ. Siddisena (2004) අනුව ලාංකේය සමාජයේ අනිවාර්ය විශ්‍රාමික වයස් සීමාව සලකා බලමින් වයස අවුරුදු 60 සහ ඊට ඉහළ පිරිස වැඩිහිටි ජනගහනය වශයෙන් හඳුනාගෙන ඇත. ආසියානු කලාපයේ වේගවත් වියපත්වීමක් සහිත ජනසංඛ්‍යාවක් ඇති සමාජයක් වශයෙන් ශ්‍රී ලංකාව හඳුනාගත හැකි අතර, 2030 දී වයස අවුරුදු 60ට වැඩි මුළු ජනගහනය 22%ක් වන බවට ප්‍රක්ෂේපණය කර ඇත. දකුණු ආසියානු කලාපය හා සැසඳීමේ දී ලාංකේය සමාජයේ වැඩිහිටි ජනගහනය වර්ධනයවීම වර්තමානයත්, අනාගතයත් යන උභය කාල පරිච්ඡේදය තුළ දී සුවිශේෂ වී තිබේ. සාම්ප්‍රදායික සමාජයේ කුටුම්බ සංස්ථාව තුළින් වැඩිහිටියාට අවැසි රැකවරණය ලැබුණු අතර, සමාජ-ආර්ථිකමය වශයෙන් ගැටලු අවම විය. සිල්වා (2001) දක්වා ඇති පරිදි වැඩිහිටියාට රැකවරණය හා සහයෝගය සපයන ප්‍රධාන සාධකය පවුල හා ඥාතීත්වය සබැඳි පරම්පරා හා අන්තර් පරම්පරානුගත සහයෝගිතා රටාව බවයි. නමුත්, සමාජ වෙනස්වීමට (Social Change) සාපේක්ෂ ව පවුල් සංස්ථාව කෘත්‍යාත්මක හා සමාජ-ආර්ථිකමය වශයෙන් සංක්‍රාන්තියකට ලක්වීමේ ප්‍රතිඵලයක් වී ඇත්තේ අනේකවිධ සමාජ-ආර්ථික ගැටලු රැසකින් පීඩා විඳීමට වත්මන් වැඩිහිටි ප්‍රජාවට සිදු වී තිබීම ය. ගෝලීය සන්දර්භය තුළ හඳුනාගත හැකි මෙම සංකීර්ණත්වය, ලාංකේය සමාජ සන්දර්භය තුළ ද බොහෝ සමාජ-ආර්ථික ගම්‍යවීම් (Socio-Economic Implications) සහිත අවධානය දිය යුතු ගැටලුවක් බවට පත් වී තිබේ.

පර්යේෂණ ගැටලුව, පර්යේෂණ අරමුණු

මෙහි පර්යේෂණ ගැටලුව වන්නේ ගෘහ කුටුම්බ ඒකකය තුළ වැඩිහිටියන් මුහුණ දෙන සමාජ-ආර්ථික ගැටලු හා අභියෝග මොනවාද යන්න ගවේෂණය කර ගැනීමයි. මෙහි මුඛ්‍ය අරමුණ වන්නේ ගෘහ කුටුම්බ ඒකකය තුළ වැඩිහිටියන් මුහුණ දෙන සමාජ-ආර්ථික ගැටලු ගවේෂණය කර ගනිමින්, වැඩිහිටි දිවියේ තිරසාරත්වය කෙරෙහි ගලපාගත හැකි නව ක්‍රමෝපායන් හඳුනාගැනීමයි. මෙම පර්යේෂණයේ සෙසු අරමුණු වශයෙන් වැඩිහිටියන් මුහුණ දෙන සමාජ-ආර්ථික ගැටලු සඳහා හේතු අනාවරණය කරගැනීමත්, වැඩිහිටියන්ගේ සමාජ-ආර්ථික විභවයන් හඳුනාගැනීමත් අරමුණු කෙරිණි.

පර්යේෂණ ක්‍රමවේදය

මෙහි පර්යේෂණය ක්‍රමවේදය මිශ්‍ර ක්‍රමවේදයයි. ප්‍රමාණාත්මක දත්ත රැස්කිරීම සඳහා සමීක්ෂණ ක්‍රමය (Survey method) භාවිතයට ගෙන තිබේ. නියැදිය වශයෙන් වයස අවු: 60 වැඩි වැඩිහිටියන් තිස් දෙනෙකු (30) වයස් ව්‍යුහ අනුව ස්තෘත නියදිය යටතේ සමානුපාතව කඹුරුපිටිය ග්‍රාම නිලධාරී වසම ඇසුරෙන් තෝරා ගන්නා ලදි. ප්‍රමාණාත්මක දත්ත රැස්කිරීමේ ශිල්ප ක්‍රම වශයෙන් ප්‍රශ්නාවලිය භාවිතයට ගෙන ඇති අතර, ගුණාත්මක දත්ත රැස්කිරීම සඳහා ගැඹුරු සම්මුඛ සාකච්ඡා, කණ්ඩායම් සම්මුඛ සාකච්ඡා, ප්‍රත්‍යක්ෂ අධ්‍යයන හා නිරීක්ෂණය ශිල්ප ක්‍රමය භාවිත විය. එමෙන්ම මෙහි දී උක්ත ගැටලුව සම්බන්ධයෙන් ලිය වී ඇති ද්විතීයික මූලාශ්‍ර (Secondary sources) ඔස්සේ දත්ත රැස් කරනු ලැබූ අතර දත්ත ප්‍රමාණාත්මක ව හා ගුණාත්මක ව විශ්ලේෂණය සිදුකර තිබේ.

ප්‍රතිඵල හා සාකච්ඡාව

අධ්‍යයන අනාවරණයන්ට අනුව පැහැදිලි වන්නේ සමාජ වෙනස්වීමත් සමඟ ගෘහ කුටුම්බය තුළ ව්‍යුහාත්මක හා කෘත්‍යාත්මක වශයෙන් සිදු වී ඇති වෙනසියාවන්, වැඩිහිටි බහුතරයකගේ ජීවිකාවේ තිරසාරත්වය කෙරෙහි බලපෑමක් සිදු කර තිබෙන බවයි. විස්තෘත පවුල ක්‍රමය (Extended family) සංකෝචනය වෙමින් න්‍යෂ්ටික පවුල (Nulclear family) ප්‍රධාන පවුල් ක්‍රමය බවට පත්වීමත්, නව්‍ය කුටුම්බ සංස්ථාවේ (Mordern family) පවුලේ සාමාජිකයන් ප්‍රමාණය අඩු වීම, දරුවන්ගේ රැකියා ස්වභාවයන්ගේ සංකීර්ණත්වයත්, ශ්‍රම සංචලතාව, වැඩිහිටි දෙමාපියන් හා දූ දරුවන් එක් ගෘහ කුටුම්පයක ජීවත්වීමේ ප්‍රවණතාව අවම වීම යනාදි කාරණා රැසක බලපෑම තුළ වැඩිහිටියන් බහුතරයක් සමාජ-ආර්ථික වශයෙන් ගැටලුවලට මුහුණ දී සිටී.

පවුලේ රැකවරණය අවැසි වැඩිහිටියන්ට, දරුවන්ගේ සංවේදීතාව ක්‍රමයෙන් අඩු වෙමින් පවත්නා තත්ත්වයක් තුළ විශේෂයෙන් වයස අවුරුදු 80ට වැඩි මහලුතම වැඩිහිටියන්ගේ ජීවන සුරක්ෂිතතාව හා රැකවරණය විෂයයෙහි

අභියෝග මතුකර තිබුණි. ඇතැම් ගෘහ කුටුම්බ තුළ දරුවන් හා වැඩිහිටියන් අතර වූ දේපළ සම්බන්ධ ආරවුල් හේතුවෙන්, වැඩිහිටියන්ට දරුවන්ගේ සැළකිල්ල අවම ව ලැබීමටත්, පරම්පරානුගත අන්තර් සහයෝගීතා රටාව හා පවුලේ සහයක පද්ධතිය විෂයයෙහිත් (Family support system) එය බලපෑමක් ඇතිකර ඇත. කුටුම්බ ඒකකය තුළ වැඩිහිටියාට තීන්දු තීරණ ගැනීම, පවුල හා සබැඳුණු සමාජ-සංස්කෘතික කටයුතු තුළ දී සහභාගීත්වය, නායකත්වය දීම, උපදෙස් හා අනුශාසනා ලබා දීම වැනි සමාජ අවස්ථා ද මඟහැරී යෑම හේතුවෙන් හුදෙකලාභාවයට ද (loneliness) පත් වී සිටී. නියදිය තුළ වූ වැඩිහිටියන් (86%) නිදන්ගත රෝගී තත්ත්වයන් මෙන්ම කායික ක්‍රියාකාරීත්වයේ දුබලතා, තවදුරටත් ඔවුන්ගේ ජීවිකාවේ තිරසාරත්වය කෙරෙහි අභියෝගයක් වී තිබුණි. නියැදිය තුළ වැඩිහිටියන් (76%) අවිධිමත් ක්ෂේත්‍රයේ රැකියා කළ අයවලුන් වීමත්, දරුවන්ට දේපළ පවරාදීම තුළ ආර්ථික වත්කම් (Financial capital) සඳහා වූ ප්‍රවේශයන් අවහිර වීමත්, වත්මන් කුටුම්බ සංස්ථාවේ ආර්ථික සහයෝගීතාව (Economic cooperation) බිඳවැටීම යනාදි කාරණා වැඩිහිටියන් බහුතරයකගේ ආර්ථික ගැටලු සඳහා හේතු වී තිබුණි. ගෘහ කුටුම්බය තුළ වැඩිහිටි පුරුෂයන්ට සාපේක්ෂව වැන්දඹු වැඩිහිටි ස්ත්‍රීන් වැඩි වශයෙන් ආර්ථික දුෂ්කරතාවයන්ට මුහුණ දී සිටී. නිවාස හා නිවාස තුළ පවත්නා භෞතික පහසුකම් හිඟතාව, වයස්ගතවීයේ කායික ආබාධ මෙන්ම ජීවන ගැටලු තවත් තීව්‍ර කිරීමට තවදුරටත් හේතුවක් වී තිබෙනු අනාවරණය කරගත හැකිවිණ.

නිගමන සහ නිර්දේශ

වැඩිහිටියන් මුහුණදෙන සමාජ-ආර්ථික ගැටලු හා අභියෝගයන්ට ගෘහ කුටුම්බය තුළ සිදු වී ඇති ව්‍යුහාත්මක හා සමාජ-ආර්ථික, සංස්කෘතික වෙනසියාවන් හේතු වී තිබේ. සමාජ ගැටලු හා සාපේක්ෂ ව ආර්ථික ගැටලු රැසකින් වැඩිහිටියන් පීඩා විඳියි. වැඩිහිටියන්ගේ කායික ආබාධ තත්ත්වයන් ජීවන ගැටලු වර්ධනය වීමට හේතු වී තිබෙන බැවින්, වැඩිහිටියන්ගේ රැකවරණය සහතික වන අයුරින්, කුටුම්බය තුළ ජීවත්වන වැඩිහිටියාට අවැසි භෞතික පහසුකම් ප්‍රමාණාත්මක ව සැපයීමට කටයුතු කිරීම වැදගත් ය. වැඩිහිටියන් කාර්යාත්මක හැකියාවක් නොමැති හෝ යැපෙන්නන් වශයෙන් ස්තරගත නොකොට ගෘහ කුටුම්බයේ ආර්ථික සහයෝගීතාවට බද්ධ කර ගැනීමට කටයුතු කළ හැකි ය. එය වැඩිහිටි ජීවිකාව තුළ බොහෝ ආර්ථික දුෂ්කරතා මඟහරවා ගැනීමට ධනාත්මක විසඳුමක් කරගත හැකිය. ශීඝ්‍ර සමාජ-ආර්ථික පරිවර්තනයන් හමුවේ නව තාක්ෂණයට අනුගතවීමට වැඩිහිටියන්ට අපහසුවීමත්, තාක්ෂණ මෙවලම් භාවිතයේ ඇති නොදැනුම්වත් බව යනාදි කාරණා වැඩිහිටි දිවියට අභියෝගයක් වී ඇති පසුබිමෙක, නව තාක්ෂණික භාවිතාව පිළිබඳ පුහුණුව ඇතුළත් ගෘහ කුටුම්බ ඒකකයේ සහයක පද්ධතියක ක්‍රියාකාරීත්වය සක්‍රිය කිරීමට කටයුතු කිරීම තුළින් වැඩිහිටිවියේ ජීවිකාව තිරසාරකර ගැනීමට කටයුතු කළ හැකි ය.

ප්‍රමුඛ පද: *වයස්ගතවීම, කුටුම්බය, සමාජ-ආර්ථික ගැටලු, වත්කම්, තිරසාරත්වය*

ආශ්‍රිත ග්‍රන්ථ

ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය. (2014). *නිරෝගිමත් වැඩිහිටි දිවියක්.* ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය.

විතානගේ, පි. (2006). *ශ්‍රී ලංකාවේ වයස්ගත ජන සංඛ්‍යාවේ වර්ධනය හා ඔවුනගේ සමාජ ආරක්ෂණය.* රුහුණ විශ්ව විද්‍යාලය: මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා සඟරාව.

සිද්ධිසේන, කේ. ඒ. පි. (2001). *ශ්‍රී ලංකාවේ ප්‍රජා විද්‍යානුකූල වයස්ගතවීම. ශ්‍රී ලංකාවේ වයස්ගතවීමේ ජනගහනය (ගැටලු සහ අනාගත අපේක්ෂාවන්).* එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල.

සිල්වා, කේ.ටී (2014). *පවුල, වයස්ගත ජනගහනය සහ පරම්පරා අතර අනෝන්‍ය සහයෝගය. ශ්‍රී ලංකාවේ වයස්ගතවීමේ ජනගහනය (ගැටලු සහ අනාගත අපේක්ෂාවන්).* එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල.

Myers, G.C. (1985). Ageing and wordwide population change, in Binstocck R.H & Shanas, E. (eds). *Handbook of Aging and Social Sciences*. Van Nostrand Reinhold.

මත්ද්‍රව්‍ය ප්‍රතිකාර හා පුනරුත්ථාපනයෙන් පසු පුද්ගලයන් නැවත මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි යොමු වීමට බලපාන මනෝ සමාජීය සාධක

ඒ. නිලානි රේණුකා*, එස්. ඩබ්. පී. කුමාර, බී. සේනානායක, ඒ. ටී. දර්ශන, ජේ. සී. රණසිංහ, සහ කේ. ඩී. ඒ. රණසිංහ

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, ශ්‍රී ලංකාව

**nilanirenuka@gmail.com*

හැඳින්වීම

මත්ද්‍රව්‍ය දුර්භාවිතය පිළිබඳ ජාතික ආයතනය (NIDA) පෙන්වා දෙන ආකාරයට මත්ද්‍රව්‍ය භාවිතය යනු ඇබ්බැහිකාරී (Addictive) හා නිදන්ගත (Chronic) රෝගී තත්ත්වයක් ලෙස අර්ථකථනය කර තිබෙන අතර පුද්ගලයෙක් මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වීමට සහ එය අඛණ්ඩ ව පවත්වා ගෙන යාම සඳහා බලපාන විවිධ සාධක පවතින අතර ඒ අතුරින් ජානමය, මානසික, සමාජයීය හා පාරිසරික සාධක බලපා තිබෙන බවට ද පෙන්වා දී ඇත. 2020 ලෝක මත්ද්‍රව්‍ය වාර්තාවේ සඳහන් කර ඇති පරිදි ලෝකයේ පුද්ගලයන් අතුරින් වයස අවුරුදු 15 - 64 වයස් කාණ්ඩයේ පසුවන පුද්ගලයන් මිලියන 275 ක් එක් වරක් හෝ මත්ද්‍රව්‍ය ශරීරගත කරගෙන ඇති බවට වාර්තා වන බවත්, මිලියන 35 මත්ද්‍රව්‍ය භාවිත අක්‍රමිකතා හේතුවෙන් පීඩාවට පත් වී ඇති බවත් වාර්තා කර ඇත. (World Drug Report, 2019).

මත්ද්‍රව්‍ය භාවිත අක්‍රමිකතාවලට යොමු වූ පුද්ගලයන් සඳහා ප්‍රතිකාරාත්මක ක්‍රම ක්‍රියාත්මක වන අතර එම ක්‍රමන ප්‍රතිකාර ක්‍රමයක් තුළින් පුනරුත්ථානපයට පත් වූ පුද්ගලයකු වුවද ප්‍රතිකාර ක්‍රියාවලියෙන් පසුව නැවත කිසියම් කාලසීමාවක් තුළ මත්ද්‍රව්‍ය භාවිතයට නැවත යොමු වීමේ ප්‍රවණතාවක් පවතින බව සමාජ පර්යේෂකයන් විසින් අධ්‍යයන මගින් තහවුරු කරගෙන ඇත. Hammerbacher & Lyvers (2006) ට අනුව මත්ද්‍රව්‍ය භාවිත අක්‍රමිකතා සඳහා ප්‍රතිකාර ලැබූ පුද්ගලයන් නැවත මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීම සඳහා මානසිකමය කරුණු බලපා ඇති බව තහවුරු කර තිබෙන අතර ආශාව, ධනාත්මක මෙන්ම ඍණාත්මක සිතුවිලි, විශාදය, කාංසාව, සමාජ පීඩනය, වැනි මනෝවිද්‍යාත්මක කරුණු සහ මානසිකමය අක්‍රමිකතා හේතු වී තිබෙන බව එමගින් තහවුරු කර ඇත (Hammerbacher & Lyvers, 2006).

පර්යේෂණ ගැටලුව, පර්යේෂණ අරමුණු

පර්යේෂණ ගැටලුව - මත්ද්‍රව්‍ය භාවිතකරන්නන් ප්‍රතිකාර හා පුනරුත්ථාපන ක්‍රියාවලියෙන් පසු නැවත මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වීම සඳහා බලපාන මනෝ සමාජීය සාධක මොනවාද?

පර්යේෂණ අරමුණු - සේවාලාභීන් ප්‍රතිකාර ලබා ගැනීමෙන් පසු නැවත මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි යොමු වීමට බලපා ඇති මනෝවිද්‍යාත්මක, සමාජයීය හා පාරිසරික සාධක හඳුනා ගැනීම.

ප්‍රතිකාරයට යොමු වීමට බලපෑ මත්ද්‍රව්‍ය වර්ග හඳුනා ගැනීම

පර්යේෂණ ක්‍රමවේදය

මිශ්‍ර පර්යේෂණ ක්‍රමය (Mixed Method) මත පදනම් ව සිදු කරනු ලබන පර්යේෂණයකි. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ ප්‍රතිකාර මධ්‍යස්ථාන 04 න් 2017 සහ 2018 වර්ෂයේ දී ප්‍රතිකාර ලබාගත් සේවාලාභීන්ගෙන් නියැදිය සඳහා තෝරාගත් සේවාලාභීන් ජීවත්වන ප්‍රදේශ වන කොළඹ, ගම්පහ, කලුතර, කුරුණෑගල, ගාල්ල, මාතර, මහනුවර, මාතලේ, අනුරාධපුර, පොළොන්නරුව, පුත්තලම වැනි දිස්ත්‍රික්කවලින් ස්තරායන නියැදි ක්‍රමය (Stratified Sampling Technique) යටතේ සේවාලාභීන් 170 දෙනෙක් තෝරා ගන්නා ලදි.

ප්‍රතිඵල හා සාකච්ඡාව

අධ්‍යයනයට ලක් කළ නියැදියේ පුද්ගලයන් 170 (100%) දෙනාම පුරුෂයන් වූ අතර ප්‍රතිකාර ලැබූ බහුතරයක් එනම්, සේවාලාභීන් 53 (31%) දෙනෙක් වයස අවුරුදු 21-30 අතර වයස් කාණ්ඩයට අයත් විය. සේවාලාභීන් 10 (6%) දෙනෙක් අවුරුදු 20 ට අඩු වයස් මට්ටම්වල පසු වූවන් ද සිටි බව අනාවරණය විය. මත්ද්‍රව්‍ය සඳහා ප්‍රතිකාර ලබාගත් සේවාලාභීන්ගෙන් 146 (86%) දෙනෙකු සිංහල ජාතිකයන් වූ අතර 133 (78%) දෙනෙකු බෞද්ධාගමිකයන් විය. සේවාලාභීන්ගෙන් 80 (47%) දෙනෙක විවාහකයෝ වූහ. 64 (38%) දෙනෙකු 6-10 වසර දක්වා අධ්‍යාපනයක් ලබා ගෙන ඇත. මත්ද්‍රව්‍ය භාවිත අක්‍රමිකතා සඳහා ප්‍රතිකාර ලබාගත් සේවාලාභීන් බහුතරයක් ද්විතීයික අධ්‍යාපන මට්ටම දක්වා අධ්‍යාපනය හදාරා ඇත.

මත්ද්‍රව්‍ය ප්‍රතිකාර සඳහා යොමු වූ සේවාලාභීන් 170 දෙනාගෙන් 161 (95%) දෙනෙකු හෙරොයින් භාවිතය සඳහා ප්‍රතිකාර ලබා ගෙන ඇත. 67 (39%) දෙනෙකු ගංජා භාවිත කර ඇත. ඒ අනුව බහුතරයක් හෙරොයින් සහ ගංජා සඳහා ප්‍රතිකාරවලට පැමිණ තිබේ. ඊට අමතර ව පුද්ගලයන්ගෙන් 98 (58%) දෙනෙකු සිගරැට් හා දුම්වැටි ද, 54 (32%) දෙනෙකු මද්‍යසාර ද භාවිත කර ඇත. මින් පැහැදිලි වූයේ සේවාලාභීන් බහුවිධ මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් (Poly drug users) වූ බවයි.

පුද්ගලයන්ගේ නැවත මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වීමට බලපෑ සාධක අතර මනෝවිද්‍යාත්මක සාධක සඳහා ප්‍රධාන ස්ථානයක් හිමි වී තිබේ. මනෝවිද්‍යාත්මක සාධක පිළිබඳ ව විමර්ශනය කිරීමේදී පුද්ගලයන් 123 දෙනාට ප්‍රතිශතයක් ලෙස 69 (56%) දෙනෙකු සඳහා "ස්වයං බලපෑමද", 15 (12%) දෙනෙකු සඳහා "හුදෙකලා බව" ද, 9 (7%) දෙනෙකු සඳහා "බලාපොරොත්තු බිඳ වැටීම්" ද, 8 (7%) දෙනෙකු සඳහා "සෘණාත්මක හැඟීම්" සහ "මානසික ව්‍යාකුල බව" වැනි මානසික කරුණුවල වැඩි බලපෑමක් සිදු වී තිබෙන බව සඳහන් කළ හැකි ය. නැවත මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වීම සඳහා බලපාන ලද සමාජ පාරිසරික සාධක පිළිබඳ විමසා බැලීමේ දී පුද්ගලයන් 123 ට ප්‍රතිශතයක් ලෙස 50 (41%) දෙනෙකු සඳහා "මිතුරන්ගේ බලපෑම" සිදු වී තිබෙන බවත්, 40 (33%) දෙනෙකු සඳහා තමන් ජීවත් වන ප්‍රදේශයේ මත්ද්‍රව්‍යවලට පවතින "සුලභතාව" නමැති සාධකය ද බලපා තිබෙන බවත් අනාවරණය වී තිබේ. ඊට අමතර ව පුද්ගලයන් 38 (31%) දෙනෙකු සඳහා මත්ද්‍රව්‍ය ප්‍රතිකාර හා පුනරුත්ථාපන ක්‍රියාවලියෙන් පසුව නැවතත් එම පරිසරයට ම එම සේවාලාභීන්ට යාමට සිදුවීම නමැති සාධකය ද වඩා වැඩි බලපෑමක් සිදු කර ඇත.

නිගමන සහ නිර්දේශ

සියලු ම සේවාලාභීන් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ ප්‍රතිකාර හා පුනරුත්ථාපනය ලබාගෙන තිබෙන අතර හෙරොයින් සහ ගංජා මත්ද්‍රව්‍ය සඳහා ප්‍රතිකාර හා පුනරුත්ථාපනයට යොමු වී ඇත. එසේ ම පුද්ගලයන් භාවිතයෙන් නිදහස් වීම සඳහා බහුවිධ ප්‍රතිකාර ක්‍රම අනුගමනය කර ඇත. මත්ද්‍රව්‍ය ප්‍රතිකාර හා පුනරුත්ථාපනයෙන් පසුව සේවාලාභීන්ගේ නැවත භාවිතය සඳහා ස්වයං බලපෑම, හුදෙකලා බව, බලාපොරොත්තු බිඳ වැටීම වැනි මනෝවිද්‍යාත්මක සාධක ද මිතුරු බලපෑම, ජීවත් වන ප්‍රදේශයේ මත්ද්‍රව්‍ය සුලභතාව වැනි සමාජ පාරිසරික සාධක බලපා තිබෙන බවට නිගමනය කළ හැකි ය.

මෙම පර්යේෂණය හරහා ඉදිරිපත් කළ හැකි නිර්දේශ මෙසේ දැක්විය හැකිය.

01. වඩා ඵලදායී මත්ද්‍රව්‍ය ප්‍රතිකාර හා පුනරුත්ථාපන ක්‍රමයක් සඳහා නවීන විද්‍යාත්මක ක්‍රමවේද ඇතුළත් කර ගැනීම.
02. සේවාලාභීන්ගේ හැකියාවන් සහ කුශලතා හඳුනා ගනිමින් නව වෘත්තියමය පුහුණුවීම් සඳහා වැඩි අවස්ථා ලබාදීම.
03. පුද්ගලයන් තුළ මත්ද්‍රව්‍ය ප්‍රතික්ෂේප කිරීමට අදාළ කුශලතා වර්ධනය කරවීමට අදාළ පුහුණුවීම් සිදු කරවීම.

ප්‍රමුඛ පද: *මත්ද්‍රව්‍ය, ප්‍රතිකාර හා පුනරුත්ථාපන ක්‍රම, නැවත භාවිතය, මනෝසමාජීය මැදිහත්වීම, මනෝ සමාජීය සාධක*

ආශ්‍රිත ග්‍රන්ථ

European Monitoring centre for drug Addiction.(2016). *The role of psychosocial interventions in drug treatment*, https://www.emcdda.europa.eu/publications/topics/pods/psychosocial-interventions_en.

European Monitoring centre for drug Addiction. (2012) *Social reintegration and employment: evidence and interventions for drug users in treatment*. Office of the European Union.

Hammerbacher. M., Lyvers.M.(2006). *Factors associated with relapse among clients in Australian substance disorder treatment facilities*. DOI:10.1080/14659890600708266. https://www.researchgate.net/publication/27827054_

National Institute on Drug Abuse. (2018). *Principles of Drug Addiction Treatment: A Research-Based Guide*. https://www.drugabuse.gov rd Edition.

The British Psychological Society and The Royal College of Psychiatrists.(2008). *Drug misuse psychosocial interventions*. National Collaborating Centre for Mental Health.

කාන්තා සවිබල ගැන්වීමේ දී ක්ෂුද්‍ර මූල්‍යකරණය ගෘහ ජීවිතයේ පැවැත්ම කෙරෙහි ඇති කරනු ලබන බලපෑම පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

ජී. එච්. කේතුමාලි*[1] සහ කේ. කේ. සී. රංගන[2]

[1]අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, ශ්‍රී ලංකාව, [2]දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කොළඹ, ශ්‍රී ලංකාව

hansikakethumali@gmail.com

හැඳින්වීම

ලොව පුරා, තිරසාර සංවර්ධනයක් ළඟා කර ගැනීමට සහ මිනිසුන්ගේ යහපැවැත්ම වැඩි දියුණු කිරීමට දරිද්‍රතාව බාධාවක් ලෙස පවතී. "ක්ෂුද්‍ර මූල්‍ය යනු විධිමත් ලෙස මූල්‍ය ආයතනයකට ප්‍රවේශයක් නොමැති, දුප්පත් පුද්ගලයන්ට පුළුල් පරාසයක මූල්‍ය සේවාවන් බෙදා හැරීමේ ක්‍රියාවලියයි" (Roy, 2003). එනම් රැකියා විරහිත හෝ අඩු ආදායම්ලාභී පුද්ගලයන්ට හෝ වෙනත් ආකාරයකින් මූල්‍ය සේවා සඳහා ප්‍රවේශයක් නොමැති කණ්ඩායම් සඳහා සපයනු ලබන බැංකු සේවාවකි. ක්ෂුද්‍ර මූල්‍ය මගින් මිනිසුන්ට සාධාරණ කුඩා ව්‍යාපාර ණය සුරක්ෂිත ව සහ සදාචාරාත්මක ණය දීමේ පිළිවෙත්වලට අනුකූල වන පරිදි ලබා ගැනීමට ඉඩ සලසයි. ක්ෂුද්‍ර මූල්‍ය ආයතනවලින් ණය ලබා ගැනීම සඳහා බොහෝ පුද්ගලයන් යොමු වී සිටී. වර්තමානයේ දී කාන්තාව ශ්‍රම බලකායට දැඩි දායකත්වයක් දක්වනු ලබයි. එබැවින් කාන්තාවන් සවිබල ගැන්වීම ලොව පුරා රටවල සංවර්ධන ක්‍රියාවලියේ කේන්ද්‍රීය අරමුණු වලින් එකකි. විවිධ ක්ෂුද්‍ර සහ සාර්ව මට්ටමේ උපාය මාර්ග ඒ සඳහා භාවිත වේ Asian Journal For Poverty Studies 3(2): p.175 – 183). "පැරණි ලක්දිව කාන්තාව හඳුන්වනු ලැබුවේ මවක, බිරියක, ගෘහනියක හෝ දුවක වශයෙන් වුවද, ඉතා විශේෂ අවස්ථාවන්හි දී රැජිනක, මෙහෙසියක සහ රාජ මාතාවක ලෙස ද ඇය ගරු බුහුමන් ලැබුවා ය" (බී.සේනානායක,2017). එනම් කාන්තාවකගේ විවිධ භූමිකා තුළ දී ඔවුන් වෙත පැවරී තිබූ කාර්ය භාරය ඉමහත් ය. මෙවන් පසුබිමක වෙනස් වෙමින් පවතින සමාජ රටාව තුළ කාන්තාව විසින් තමාගේ මෙන්ම තම පවුලේ අවශ්‍යතා සපුරා ගැනීම උදෙසා ක්ෂුද්‍ර මූල්‍ය ආයතන මගින් ණය ලබා ගැනීම සඳහා යොමු වී සිටී. එම ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබා ගැනීම මගින් පවුල තුළ ආර්ථික මට්ටම වර්ධනය කර ගැනීමට සාපේක්ෂ ව එදිනෙදා කටයුතු සම්පූර්ණ කර ගැනීමට අවශ්‍ය මුදල් සොයා ගැනීම ඔවුන්ගේ මූලික අරමුණ වී ඇත. එය ඔවුන්ගේ ගෘහ ජීවිතය කෙරෙහි ධනාත්මක ව හෝ සෘණාත්මක ව බලපෑම් කරනු ලබයි. එබැවින් කාන්තාව සවිබල ගැනීම සඳහා යොදා ගනු ලබන ක්ෂුද්‍ර මූල්‍යකරණය ගෘහ ජීවිතය කෙරෙහි බලපාන ආකාරය අධ්‍යයනය කිරීම මෙහිදී සිදු කරනු ලබයිග

පර්යේෂණ ගැටලුව, පර්යේෂණ අරමුණු

"ක්ෂුද්‍ර මූල්‍යකරණයෙන් ගෘහ ජීවිතයට ඇති වන බලපෑම" යන ගැටලුව කේන්ද්‍ර කර ගනිමින් මෙම අධ්‍යයනය සිදු කරනු ලැබුණි. මෙහි මූලික අරමුණ වනුයේ කාන්තාව ක්ෂුද්‍ර මූල්‍යකරණය සඳහා යොමු වීමට බලපාන හේතු හඳුනා ගැනීම හා ක්ෂුද්‍ර මූල්‍යකරණය ගෘහ ජීවිතයේ පැවැත්ම කෙරෙහි ඇති කරන බලපෑම හඳුනා ගැනීම අධ්‍යයනය කිරීමයි.


පර්යේෂණ ක්‍රමවේදය

මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය මත අසම්භාවිතමය නියැදි ක්‍රමය යොදා ගනු ලැබුණි. මෙම අධ්‍යයනය ගාල්ල දිස්ත්‍රික්කයේ, වැලිවිටි දිවිතුර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය මුල්කර ගනිමින් සිදු කරනු ලැබුණි. එහි හිමබෝල නියැදිය උපයෝගී කර ගනිමින් ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබා ගැනීමට යොමු වී සිටින කාන්තාවන් 50 දෙනෙකු නියැදිය ලෙස තෝරා ගන්නා ලද අතර ආකෘතිමය සම්මුඛ සාකච්ඡා හා ප්‍රශ්නාවලි යටතේ දත්ත රැස්කිරීම සිදු කරන ලදි. ප්‍රමාණාත්මක දත්ත SPSS මෘදුකාංගය මගින් ද, ගුණාත්මක දත්ත තේමාත්මක විශ්ලේෂණ ක්‍රමය මගින් ද විශ්ලේෂණය සිදුකරන ලදි.

ප්‍රතිඵල හා සාකච්ඡාව

ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබා ගැනීම සඳහා යොමු වී සිටින කාන්තාවන්ගේ සාමාන්‍ය වයස අවුරුදු 30 - 40 ත් වන බව අනාවරණය විය. අධ්‍යයනය කරන ලද නියැදියේ දී ණය ලබා ගැනීම සඳහා යොමු වී සිටින කාන්තාවන්ගේ අධ්‍යාපන මට්ටම අධ්‍යයනය කිරීමේ දී ඉන් වැඩි දෙනෙකු, එනම් 23 දෙනෙකුගේ, එනම් (46%) ක ප්‍රතිශතයකගේ අධ්‍යාපන මට්ටම 6 - 10 වසර දක්වා බව අනාවරණය විය.

තවද කාන්තාවන් ණය ලබා ගැනීම සඳහා යොමුවීමට බලපෑ ප්‍රධානතම හේතුව වශයෙන් අනාවරණය කර ගැනීමට හැකි වූයේ දරිද්‍රතාවයි. එමෙන්ම එම ආයතනවලින් ණය මුදල් ලබා ගැනීමේ දී ඉතා ඉක්මනින් හා පහසුවෙන් ලබා ගැනීමට හැකිවීම තවත් මූලික හේතුවක් ලෙස සඳහන් කරන ලදි. මෙලෙස ලබා ගන්නා ලද ණය මුදල් තම පවුලේ එදිනෙදා කටයුතු සඳහා යොදා ගන්නා බවත්, පවුල තුළ ආර්ථික තත්ත්වය වර්ධනය කිරීම සඳහා කිසිදු පියවරක් නොගන්නා බවත් අනාවරණය විය. තවද ණය මුදල් ගෙවීමේ දී පවතින ඉහළ පොලී අනුපාතය නිසා කාන්තාවන්ගේ පවුල් තුළ ගැටුම්කාරී තත්ත්ව නිර්මාණය වී ඇත. ප්‍රධාන වශයෙන් ස්වාමි පුරුෂයා සමඟ පවතින බැඳීම් බිඳ වැටී ගැටුම් ඇතිවීම සිදු වන අතර, එම තත්ත්වය, දරුවන්ගේ කායික හා මානසික වර්ධනය කෙරෙහි හානිදායක ලෙස බලපෑම් එල්ල වන බව සම්මුඛ සාකච්ඡාවල දී අනාවරණය විය. එමෙන්ම මූල්‍ය ආයතනවල නිලධාරීන්ගෙන් විවිධ තර්ජන පැවතීම, සිය දිවිනසා ගැනීම් සිදුවීම වැනි සෘණාත්මක තත්ත්ව පවතින බව ද අනාවරණය විය.



රූප සටහන 1. ණය මුදල් ලබා ගැනීමට යොමු වූ කාන්තාවන්ගේ අධ්‍යාපන මට්ටම

නිගමන හා නිර්දේශ

මෙම අධ්‍යයන අනාවරණවලට අනුව පැහැදිලි වනුයේ කාන්තාවන් ඉතා පහසු ක්‍රමවේදයක් පවතින නිසා ක්ෂුද්‍ර මූල්‍ය ආයතනවලින් ණය මුදල් ලබා ගැනීමට පෙලඹෙන බවත්, එම ආයතනවල පවතින ඉහළ පොලී අනුපාතය පිළිබඳ දැනුම්වත්භාවයක් නොපවතින බවත් ය. එලෙස ලබා ගන්නා මුදල් ආර්ථික මට්ටම නගා සිටුවා ගැනීමට යොදා නොගන්නා බවත් මෙම අධ්‍යයනය මගින් නිගමනය කළ හැකි විය. මෙම තත්ත්වය කාන්තාවන්ගේ ගෘහ ජීවිතය තුළ ගැටලුකාරී තත්ත්ව නිර්මාණය වීමට ප්‍රධාන වශයෙන් බලපාන බව නිගමනය කළ හැකි ය. මෙමගින් ඇතිවන පීඩනය දරාගත නොහැකි වූ කාන්තාවන්ගේ මානසික මට්ටම දුර්වල වීම නිසා සියදිවි නසා ගැනීමේ තත්ත්වයන් වර්ධනය වී ඇත. මෙවැනි සෘණාත්මක තත්ත්ව අවම කර ගැනීම සඳහා නිවැරදි නිර්දේශ මත සැලසුම් සකස් කිරීමේ අවශ්‍යතාවක් පවතී. ක්ෂුද්‍ර මූල්‍ය ආයතන නියාමනය හෝ අධීක්ෂණය කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කළ යුතු අතර ම කාන්තාවන් තුළ දැනුම්වත්භාවයක් ඇති කිරීම කාලෝචිත අවශ්‍යතාවක් බව ප්‍රධාන නිර්දේශයක් ලෙස සඳහන් කළ හැකි ය. තවද රාජ්‍ය මැදිහත්වීමෙන් දරිද්‍රතාව පිටුදැකීම සඳහා කෙටිකාලීන මෙන් ම දීර්ඝ කාලීන සැලසුම් සකස් කර ඒවා නිසි පරිදි ක්‍රියාවට නැංවීම සිදු කළ යුතුය.

ප්‍රමුඛ පද *- ක්ෂුද්‍ර මූල්‍ය ණය, කාන්තාව, පවුල, දරිද්‍රතාව, යහපැවැත්ම*

ආශ්‍රිත ග්‍රන්ථ

Awojobi, O., & Bein, M. A. (2011). *Micro financing for Poverty Reduction and Economic Development*; Nigeria.

Charitoneko, S., & D. de Silva. (2002).*Commercialization of Micro-finance - Sri Lanka. Manila*: Asian Development Bank.

Roy, M. A. (2003). *Microfinance as a Tool for Development*. Schulich School of Business.

සේනානායක, බී. (2017). *මත්ද්‍රව්‍ය භාවිතය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවීය වෙනස්කම් පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්*, පශ්චාත් උපාධි අධ්‍යයනය පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය.

ලියනගේ, ඩබ්ලිව්. (2006). *ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා ස්ත්‍රී වාදය*. ෆෙඩ්රික් ඊබට් පදනම.

තරුණයින් හා නව යොවුන්වියේ පුද්ගලයින්ගේ මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත මනෝ සමාජ ලක්ෂණ පිළිබඳ අධ්‍යයනය

කේ. ඩී. ඒ. රණසිංහ*, බී. සේනානායක, ඒ. ටී. දර්ශන, කේ. ඒ. ඩී. මධුශානි, පී. එන්. එස්. තිසේරා, බී. වී. එච්. ඩබ්ලිව්. චතුරංගි, එස්. ඩබ්ලිව්. පී. කුමාර, එච්. එම්. බී. කේ. හේරත් සහ ඒ. එන්. රේණුකා

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, ශ්‍රී ලංකාව

**arjunaranasinghe001@gmail.com*

හැඳින්වීම

තරුණයින් හා නව යොවුන්වියේ පුද්ගලයින් මත්ද්‍රව්‍ය භාවිතයට හා ජාවාරම් සඳහා යොමුවීම/යොමුකර ගැනීම හා අන්තර්ජාලය අනිසි ලෙස භාවිතය, රාත්‍රී සමාජ ශාලා වෙත පිවිසීම, සූදුව වැනි සමාජ අපගාමී චර්යාවන්වලට යොමුවීම තුළින් ඔවුන් ජීවත්වන පවුල් පරිසරය හා සමාජය තුළ උග්‍ර සමාජ ගැටලු නිර්මාණය වේ. මෙම ගැටලුවලට ගෝලීය හා ජාතික වශයෙන් විවිධ පර්යේෂණ සිදු කරමින් ගතයුතු විධිමත් පියවර හා සැලසුම් සකස් කරමින් සිටියි. වර්තමාන ශ්‍රී ලංකාව තුළ තරුණයින් හා නව යොවුන්වියේ පුද්ගලයින්ගේ කායික හා සමාජයීය යහපැවැත්ම බිඳවැටීම කෙරෙහි ඉහත සාධක බලපා ඇති බව පැහැදිලි වේ (Perera, Ostbye, & Lelwala, 2009). නව යොවුන්වියේ හා තරුණවියේ පසුවන ඇතැම් පුද්ගලයින් මත්ද්‍රව්‍ය භාවිතයත් සමඟ, ඔවුන්ගේ මනෝ සමාජ චර්යාවන් විවිධ වෙනස්කම් වලට යොමුව ඇති බව පැහැදිලි වේ. ඒ අනුව මෙම ගැටලුවලට හේතු වූ සාධක විමසා බැලීමටත්, මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත මනෝ සමාජ ලක්‍ෂණ හඳුනා ගැනීමේ අරමුණින් මෙම අධ්‍යයනය ක්‍රියාත්මක කර ඇත.

පර්යේෂණ ගැටලුව, පර්යේෂණ අරමුණු

පර්යේෂණ ගැටලුව - මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වූ තරුණයින් සහ නව යොවුන්වියේ පුදග්ලයින්ගේ මනෝ සමාජ සහ චර්යාත්මක රටාවන්වල වෙනස්කම් මොනවාද ?

පර්යේෂණ අරමුණු - මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වූ තරුණයින්ගේ සහ නව යොවුන්වියේ පුද්ගලයින්ගේ මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත මනෝ සමාජ ලක්ෂණ හඳුනා ගැනීම සහ මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වීමට බලපා ඇති හේතු, මත්ද්‍රව්‍ය භාවිත කිරීමේ නව ප්‍රවණතා හා ඔවුන්ගේ චර්යාත්මක රටාවන්වල පවතින වෙනස්කම් හඳුනා ගැනීම පර්යේෂණ අරමුණු විය.

පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනය මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය මත පදනම්ව සිදු කරන ලදි. සසම්භාවී නියදි ක්‍රමය යටතේ වයස අවුරුදු 14-24 ත් අතර පුද්ගලයින් 64 දෙනෙක්ගෙන් තොරතුරු ලබාගත් අතර සසම්භාවී නොවන නියදි ක්‍රමය යටතේ තෝරාගත් පුද්ගලයින් 10 දෙනෙකු අරමුණු සහගත නියැදි ක්‍රමය හරහා තෝරාගෙන නැවත දත්ත ලබාගැනීම සිදු කරන ලදි. දත්ත රැස් කිරීම සඳහා අර්ධ ව්‍යුහගත ප්‍රශ්නාවලිය සහ ගැඹුරු සම්මුඛ සාකච්ඡා ශිල්ප ක්‍රම භාවිත කරනු ලැබිණි. දත්ත ලබා ගැනීම සඳහා ලියාපදිංචි පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ ප්‍රතිකාර මධ්‍යස්ථාන සහ බන්ධනාගාර ප්‍රතිකාර මධ්‍යස්ථාන පර්යේෂණ ක්ෂේත්‍ර ලෙස යොදා ගැනිණ. දත්ත විශ්ලේෂණයේ දී, ප්‍රමාණාත්මක දත්ත SPSS මෘදුකාංගය භාවිත කරමින් විශ්ලේෂණය සිදු කළ අතර ගුණාත්මක දත්ත අන්තර්ගත විශ්ලේෂණ ක්‍රමය යටතේ විස්තරාත්මකව ඉදිරිපත් කරන ලදි.

ප්‍රතිඵල හා සාකච්ඡාව

අධ්‍යයනයට ලක් කරන ලද තරුණයින්ගේ මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත මනෝ සමාජ ලක්ෂණයන් පිළිබඳ අවධානය යොමු කිරීමේදී පුද්ගල මනෝ විද්‍යාත්මක සාධක, පවුල ආශ්‍රිත සාධක, පරිසරාත්මක සාධක සහ සමාජ සාධක ප්‍රධාන විය. අධ්‍යයන අනාවණවලට අනුව තරුණයින් හා නව යොවුන්වියේ පුද්ගලයින්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කුතුහලය, සෘණාත්මක හැඟීම්, හුදකලා බව, මානසික ව්‍යාකූලතාව, බලාපොරොත්තු බිඳවැටීම යන මනෝ විද්‍යාත්මක සාධක තරුණ හා නව යොවුන් වියේ පුද්ගලයින් මත්ද්‍රව්‍ය භාවිතය සඳහා යොමවීමට බලපෑ සාධක විය. කුතුහලය මත්ද්‍රව්‍ය භාවිතය සඳහා පුද්ගලයින් යොමුවීමේ වැඩි ප්‍රවණතාවයක් 60 (94%) පෙන්නුම් කරන ලදි. මත්ද්‍රව්‍ය අත්හදා බැලීමට ඇති කැමැත්ත මත්ද්‍රව්‍ය භාවිතය වෙත යොමුවීමට වැඩි වශයෙන් බලපා ඇත. තරුණයින්ගේ හා නව යොවුන් වියේ පුද්ගලයින්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි ජීවත්වන සමාජ පරිසරය ප්‍රබල බලපෑමක් සිදු කර තිබිණ. ඒ අනුව බාධාවකින් තොරව මත්ද්‍රව්‍ය භාවිත කළ හැකි ස්ථාන පැවැතීම 49 (76%), පීවත් වන ප්‍රදේශය තුළ මත්ද්‍රව්‍ය සුලභතාවය, පුද්ගල මත්ද්‍රව්‍ය භාවිතය 47 (73%) සහ කුඩාකළ සිටම මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් සමඟ සමීපව වාසය කිරීමට සිදුවීම 46 (72%) වැනි සාධක ප්‍රබල බලපෑමක් සිදු කර තිබිණ. නියැදියේ තොරතුරුවලට අනුව පවුලේ සාමාජිකයින් සමඟ පවතින ඌන සම්බන්ධතා, ඔවුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය පවුලේ සාමාජිකයන්ට ගැටලුවක් නොවීම, පවුලේ සමාජිකයන් සමඟ ආරවුල් ඇතිවීම සහ පවුලේ සාමාජිකයන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය ආදිය මත මොවුන් මත්ද්‍රව්‍ය භාවිතය සඳහා යොමු වී තිබිණ. නියැදියේ පුද්ගලයින්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි විවිධ සමාජ සාධක බලපා ඇති බව අධ්‍යයනය මගින් අනාවරණය විය. ඒ අනුව මිතුරු කණ්ඩායම්වල බලපෑම 59 (92%), මත්ද්‍රව්‍ය භාවිත කරන අසල්වැසියන්ගේ බලපෑම 34 (53%), මත්ද්‍රව්‍ය අලෙවිකරුවන්ගේ බලපෑම යන කාරණා හේතුවෙන් මත්ද්‍රව්‍ය භාවිතය සඳහා යොමුව ඇත. අනෙක් සාධකයන්ට සාපේක්ෂව මිතුරු කණ්ඩායම්වල බලපෑම 59 (92%), පුද්ගලයින් මත්ද්‍රව්‍ය කරා යොමු වීමට බලපා ඇති බව පැහැදිලි වේ. මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත වැරදි හේතුවෙන් නැවත නැවත අත්අඩංගුවට පත්වීම, බන්ධනාගාරය තුළ ලද අත්දැකීම් ආදිය මත ද 16 (25%) ක ප්‍රතිශතයක් මත්ද්‍රව්‍ය නැවත භාවිත කිරීමට පෙළඹී ඇති බව අනාවරණය වූ අතර බොහෝවිට මෙම

අත්දැකීම් විවිධ නව මත්ද්‍රව්‍යය ප්‍රභේද කරා තරුණයින් පෙළඹවීමේ ප්‍රවණතාවයකට මග පෑදිය හැකි අතර භාවිතය වර්ධනය වීමට හේතුවක් විය හැකිය.අධ්‍යයන නියැදියට සම්බන්ධ වූ තරුණයින් හා නව යොවුන් වියේ පුද්ගලයින් සමාජ මාධ්‍ය හරහා සංවිධානය කරන විවිධ සාද වලට සම්බන්ධ වී ඇත. එක්ස්ටසි, ඖෂධමය අරමුණු සඳහා භාවිත කරන පෙති වර්ග, එල්.එස්.ඩී, ඇම්පිටමින් උත්තේජක වර්ග, ගංජා, හෙරොයින්, කොකේන් යන මත්ද්‍රව්‍යය මොවුන් මෙම සාද වලදී භාවිත කර තිබුණි. මෙම තත්ත්වය ද තරුණයින් හා නව යොවුන් වියේ පුද්ගලයින් අතර මත්ද්‍රව්‍ය ව්‍යාප්තියේ නව ප්‍රවණතාවයක් ලෙස හඳුනා ගත හැකිය.

නිගමන සහ නිර්දේශ

තරුණයින් හා නව යොවුන්වියේ පුද්ගලයින්ගේ මත්ද්‍රව්‍ය භාවිතයේ ප්‍රථම අත්දැකීම තුළදී, බහුතර පිරිසක් මිතුරු කණ්ඩායම්වල ඇසුර නිසා මත්ද්‍රව්‍ය භාවිතය සඳහා යොමුව ඇත. අනෙකුත් සාධකයන්ට සාපේක්ෂව මනෝ විද්‍යාත්මක සාධක සහ පරිසරාත්මක සාධක තරුණයින් හා නව යොවුන්වියේ පුද්ගලයින්ගේ මත්ද්‍රව්‍ය භාවිතයට බලපෑම් කර ඇත. නියැදියේ දත්තවලට අනුව තරුණයින් හා නව යොවුන්වියේ පුද්ගලයින්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි පවුල ආශ්‍රිත සාධක අවම බලපෑමක් කර තිබුණි. තරුණයින් හා නව යොවුන්වියේ පුද්ගලයින්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි සමාජ මාධ්‍ය හරහා බලපෑමක් පවතින බව ආනාවරණය වේ.

තරුණයින් හා නව යොවුන්වියේ පුද්ගලයින් සඳහා ක්‍රියාත්මක කරන නිවාරණ වැඩසටහන් වලදි අවදානම් සාධක පිළිබඳ අවධානය යොමු කිරීම හා ඒවා ආමන්ත්‍රණය කිරීම. නිවාරණ වැඩසටහන්වල ජීවන කුසලතා වර්ධනයට ප්‍රමුඛ අවධානයක් යොමු කිරීම. දෙමාපියන් සඳහා ක්‍රියාත්මක කරනු ලබන නිවාරණ වැඩසටහන්වල දී අවදානම් පරිසර සාධක කළමනාකරණය පිළිබඳ ප්‍රායෝගික දැනුම ලබාදීම. සෘණාත්මක මනෝ සමාජ සාධකයන්ට මුහුණදීම සඳහා තරුණයින්හට ප්‍රායෝගික පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. පුද්ගලයින් නව යොවුන්වියට පත්වන අවධියේ සිටම ඔවුන්ගේ මානසික, කායික, ප්‍රජා සහ සමාජ සංවර්ධනය යන අංශයන් පිළිබඳව අවධානය යොමුකරමින් ධනාත්මක අභිප්‍රේරණ ඇති කිරීම සඳහා විවිධ ආයතනයන් සමඟ එක්ව තරුණයින්ගේ සෑම අංශයක්ම නියෝජනය වන පරිදි සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

ප්‍රමුඛ පද: *මනෝ සමාජ ලක්ෂණ, තාරුණ්‍යය හා නව යොවුන්විය, පරිසරාත්මක සාධක, සමාජ මාධ්‍ය*

ආශ්‍රිත ග්‍රන්ථ

National Dangerous Drugs Control Board. (2021). *Handbook of Drug Abuse Information in Sri Lanka*. National Dangerous Drugs Control Board, Research Division.

Perera, B., Ostbye, T., Ariyananda, A., & Lelwala, E. (2009). Prevalence and correlates of physical and emotional abuse among late adolescents. *Ceylon Medical Journal*.

United Nations office on Drug and Crime. (2021). *World Drug Report 2021.* https://www.unodc.org/unodc/en/data-and-analysis/wdr2021.html.

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය සමාජවල, කෘෂිකර්මාන්තය ආශ්‍රිත සාම්ප්‍රදායික සන්නිවේදන ක්‍රම

අසිත මල්ලවආරච්චි*[1], චාන්දනි ලියනගේ[2], තිළිණි අගම්පොඩි[3]

[1 3]ප්‍රජා වෛද්‍ය අධ්‍යයනාංශය, වෛද්‍ය පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව [2]සමාජ විද්‍යා අධ්‍යයන අංශය, කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

**asithaprabhath@gmail.com*

හැඳින්වීම

සන්නිවේදනය (Communication) යන්නෙහි ලතින් අර්ථය "හුවමාරු කර ගැනීමයි"(Dima et al., 2014). එය කථනය, අභිනය, ලිවීම, හැසිරීම, අදහස්, හැඟීම්, ආකල්ප, අපේක්ෂා, සංඥානන හෝ විධාන හුවමාරු කරගැනීමෙන් තොරතුරු සම්ප්‍රේෂණය වන ක්‍රියාකාරකමකි (Lasswell, 1948). ඇතැම්විට එය විද්‍යුත්, රසායනික හෝ භෞතික සංසිද්ධි වැනි වෙනත් ක්‍රම භාවිතයෙන් පාර්ශ්ව දෙකක් හෝ ඊට වැඩි ගණනක් අතර සිදුවන අර්ථවත් තොරතුරු හුවමාරුවක් (Dima et al., 2014) ද වේ. මානවයා කෘෂිකාර්මික ජීවියෙකු වන්නේ ගල් යුගයෙන් එඬේර යුගයට අවතීර්ණ වීමත් සමඟ ය (ලියනගේ, 2010). එය සත්ත්ව පාලනයේ පළමු අත්දැකීම වූ අතර එඬේර ජීවිතයට වඩා ස්ථාවර වෙමින් සිය ආහාර බෝග වගා කිරීම, මිනිසා විසින් ගොවි යුගයේ දී ආරම්භ කරන ලදි (ලියනගේ, 2010). එක් එක් ජන කණ්ඩායම් තම සංස්කෘතිය ගොඩනගා ගන්නා පරිසරය ඇසුරින් සන්නිවේදනයේ යෙදීම, සාම්ප්‍රදායික සන්නිවේදනය ලෙස නිර්වචනය කෙරේ (රාජපක්ෂ, 2018). සාම්ප්‍රදායික සන්නිවේදන මාධ්‍ය යනු, මානවයාගේ ආරම්භයේ සිට විවිධ ගෝලීය ප්‍රජා සහ සංස්කෘතීන් විසින් පිළිගත් සන්නිවේදන මාධ්‍ය වන අතර එය තොරතුරු සම්ප්‍රේෂණය කරනු ලබන ඵලදායී සංරචකයක් හෝ මෙවලමක් වේ (Bamigboye, 2017). සංස්කෘතියේ ම කොටසක් ලෙස සලකමින් එක් පරම්පරාවකින් තවත් පරම්පරාවකට සම්ප්‍රදායෙන් සම්ප්‍රේෂණය වන විද්‍යුත් නොවන මාධ්‍ය සාම්ප්‍රදායික සන්නිවේදන මාධ්‍ය වන අතර ඇඳුම් පැළඳුම්, ආචාර සමාචාර, සිරිත්විරිත්, ඇදහිලි, පූජාක්‍රම, නර්තන, ගායනා, පුරාණෝක්ති, ජනශ්‍රැතිය, සහ විවිධ කලාත්මක කාර්යයන් එහිදි බහුල ව යොදා ගනී (*රාජපක්ෂ, 2018*).

පර්යේෂණ ගැටලුව, පර්යේෂණ අරමුණු

ජන මාධ්‍ය හා නව මාධ්‍ය භාවිතය වඩාත් ප්‍රචලිත වී ඇති අවධියක ග්‍රාමීය සමාජවල තවමත් ප්‍රචලිත සාම්ප්‍රදායික සන්නිවේදන භාවිත මොනවාද? යන්න පර්යේෂණ ගැටලුව වන අතර තෝරා ගත් අධ්‍යයන ප්‍රදේශයක කෘෂිකර්මාන්තය ආශ්‍රිත ව පවතින සාම්ප්‍රදායික සන්නිවේදන භාවිත හඳුනා ගැනීම අරමුණු කරගෙන ඇත. නූතන සන්නිවේදන මාධ්‍යයන්ගේ දියුණුව හා භාවිතය වැඩිවීමත් සමඟ මිනිසුන් සාම්ප්‍රදායික සන්නිවේදන මාධ්‍ය භාවිතයෙන් දුරස් වී ඇත. නමුත් සාම්ප්‍රදායික කෘෂිකාර්මික සමාජවල නූතන සන්නිවේදන මාධ්‍ය භාවිතයට පවතින සාක්ෂරතාව හා එයට පවතින ප්‍රවේශ වීමේ තාක්ෂණික සම්පත් නොමැතිකම පැහැදිලි ව හඳුනාගත හැකි ය. එවැනි ග්‍රාමීය සමාජවල කෘෂිකාර්මාන්තය හා බැඳි පවතින සාම්ප්‍රදායික සන්නිවේදන භාවිත මොනවා දැයි අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනයේ දී සිදු වේ. ඒ තුළින් සංවර්ධන ක්‍රියාදාමයට ගැමියන් ප්‍රවේශ කරගැනීමට අවශ්‍ය එළැඹුම් මොනවා දැයි අධ්‍යයනය කළ හැකි ය.

පර්යේෂණ ක්‍රමවේදය

දේශීය කෘෂි සංස්කෘතික සන්දර්භය තුළ සංකීර්ණ තත්ත්ව විග්‍රහ කිරීමට, විද්‍යාත්මක මෙවලමක් ලෙස මානව වංශ විවරණය භාවිත කළ හැකි ය (Owusu-Daaku & Onzere, 2019). මෙහිදි මානවවංශ විවරණයක් තෝරාගනු ලැබුවේ කෘෂිකාර්මික උපසංස්කෘතික අනන්‍යතාව සවිස්තරාත්මක ව ගවේෂණය කරමින් මිනිසුන්ගේ සජීවී අත්දැකීම් ප්‍රකාශ කිරීමට යොදා ගන්නා සාම්ප්‍රදායික සන්නිවේදන භාවිත අවබෝධ කරගැනීම සඳහා ය. දත්ත රැස් කිරීමේ දී සහභාගීත්ව නිරීක්ෂණය හා ගැඹුරු සම්මුඛ සාකච්ඡා භාවිත කළ අතර සතියකට දින 03 බැගින් මාස 04 ක කාල සීමාවක් අදාළ ක්ෂේත්‍රයේ රුඳී සිටිමින් කරන ලද සියලු ම නිරීක්ෂණ, ක්ෂේත්‍ර සටහන් ලෙස පවත්වාගෙන යන ලදි. උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ, පදවිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මෙත්සිරිපුර ග්‍රාම නිලධාරී වසම අධ්‍යයන ප්‍රදේශය ලෙස තෝරාගත් අතර එය ගොවි ජනපද ව්‍යාපාරයක් මෙන්ම නැවත පිහිටුවන ලද ගම්මානයක් වීම හා විවිධ සංස්කෘතින්ට අයත් පුද්ගලයන්ගෙන් සමන්විත වීම තෝරා ගැනීමට විශේෂත්වය විය. සහභාගීත්ව නිරීක්ෂණයේ යෙදෙන අවස්ථාවන්හි හඳුනාගත් පුද්ගලයන් සමඟ ගැඹුරු සම්මුඛ සාකච්ඡා සිදු කර, එම සාකච්ඡා පිටපත් කර දත්ත විශ්ලේෂණය සඳහා යොදා ගෙන ඇත. අධ්‍යයනය පුරාවට ම දත්ත මත අඛණ්ඩ පරාවර්තනයන් පවත්වාගෙන යමින් විශ්ලේෂණාත්මක ප්‍රශ්න ඇසීම සහ මතක සටහන් නිර්ක්ෂණ ලිවීම ඇතුළත් ක්‍රියාවලියක් ලෙස මානවවංශ විවරණයක දත්ත විශ්ලේෂණය හඳුනාගත හැකි ය (Creswell, 2016). එකතු කරන ලද දත්ත ක්‍රෙස්වෙල් (Creswell, 2016) විසින් විස්තර කරන ලද නිශ්චිත පියවර 06 ක් භාවිතයෙන් තේමාත්මක විශ්ලේෂණයට කර ඇත. අධ්‍යයනය පුරාවට ම සෑම සහභාගීවන්නෙකුගේ ම ප්‍රතිචාර පටිගත කර ඇති අතර සියලු ම දත්ත ස්වාධීන ව සමාලෝචනය කර ඇත. අධ්‍යයනයේ විශ්වසනීයත්වය සහතික කිරීමට, අධ්‍යයනය ආරම්භ කිරීමට පෙර රජරට විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ පර්යේෂණ ආචාරධර්ම සමාලෝචන කමිටුවේ අනුමැතිය ලබා ගෙන ඇති අතර සියලු ම පුද්ගල හා ගම්වල නාම සඳහා අන්වර්ථ නාමයක් ලබා දී ඇත. අධ්‍යයනයට යොදාගන්නා ලද සියලු ම සම්පත්දායකයන්ගෙන් ලිඛිත අවසරය ලබාගන්නා ලදි. ඔවුන්ට ඕනෑ ම අවස්ථාවක අධ්‍යයනයෙන් ඉවත්වීමට හැකියාව පවතින අතර ඔවුන්ගේ රහස්‍යභාවය ආරක්ෂා කිරීම පිළිබඳ ව පර්යේෂකයා වගවනු ඇත.

ප්‍රතිඵල සහ සාකච්ඡාව

දත්ත විශ්ලේෂණය කිරීමේ දී ප්‍රධාන තේමා 04ක් හා උප තේමා 14ක් මතු කරගත හැකි විය. එහිදි, වර්ෂාව ලැබෙන කාලය නිශ්චිත ව ප්‍රකාශ කිරීම, නියඟය පිළිබඳ ව අනාවැකි කීම, බෝග වගා කළ යුතු කාලය පිළිබඳ අවබෝධය යන උප තේමා, කාලගුණ අනාවැකි කීම යන ප්‍රධාන තේමාවෙන් මතු කර ගත් අතර මොනරුන්ගෙන් වන හානි, පණු රෝගවලින් සිදුවන හානි, වල් පැළෑටිවලින් සිදුවන හානි, වල් අලින්ගෙන් සිදුවන හානි යන්න, වගා හානි යන ප්‍රධාන තේමාවෙන් මතු කරගන්නා ලදි. රාජ්‍ය හා වෙනත් අයතන සමඟ තොරතුරු හුවමාරුව යන ප්‍රධාන තේමාවට පදනම් ව සන්නිවේදන ජාලයක් පවත්වාගෙන යාම, කටකතා මාර්ගයෙන්, දැන්වීම් මාර්ගයෙන් තොරතුරු හුවමාරු කරගන්නා ආකාරය උපතේමා ලෙස නිරීක්ෂණය විය. මෙහිදි සංවර්ධනය කරගෙන ඇති සන්නිවේදන ජාලය කෘෂිකාර්මික කටයුතුවල දී පමණක් නොව අනෙකුත් සියලු රාජ්‍ය ආයතනික කටයුතුවල දී තොරතුරු හුවමාරුව සඳහා භාවිත කරනු ලබන සක්‍රිය ජාලයක් ලෙස හඳුනාගත හැකි ය. එමෙන්ම ජන කවි, යාතුකර්ම, ශාන්තිකර්ම, වත්පිළිවෙත් යන්න ජනශ්‍රැතිකාංග ලෙස හඳුනා ගන්නා ලදි. අධ්‍යයනය කරන ලද දත්ත අනුව විශේෂයෙන්ම පරිසරයේ සිදුවන වෙනස්කම් අනුව කාලගුණය පිළිබඳව අනාවැකි ප්‍රකාශ කරන අතර ඔවුන්ගේ කෘෂිකාර්මික චර්යා ඒ අනුව පදනම් වේ. අධ්‍යයන ප්‍රදේශයට බරපතල ව පවතින ගැටලුකාරී තත්ත්වයක් ලෙස වල් අලි තර්ජන හඳුනාගත හැකි අතර වගාව ආරක්ෂා කර ගැනීම සඳහා විවිධ සාම්ප්‍රදායික සන්නිවේදන ක්‍රම භාවිතයට ගනු ලබයි. නමුත් ඒවා තාවකාලික පිළියම් වන නමුත් එයට රාජතාන්ත්‍රික මට්ටමේ සහය ඔවුන් බලාපොරොත්තු වේ. එමෙන්ම සාම්ප්‍රදායික ක්‍රමවේද මත බෝග ආරක්ෂා කර ගැනීමේ දී වර්ණ, ගන්ධ, රසායනික ද්‍රව්‍යවලින් යුක්ත දෑ භාවිත කරන අතර ඒ තුළින් රසායනික ද්‍රව්‍ය භාවිතයෙන් ශරීරයට වන හානිය අවම වන බව ඔවුන්ගේ විශ්වාසයයි. විශේෂයෙන් ම වකුගඩු රෝග බහුලව පවතින ප්‍රදේශයක් වන බැවින් ඔවුන් මේ පිළිබඳව වැඩි අවධානයක් යොමු කරනු ලැබේ. තොරතුරු හුවමාරුව සන්නිවේදන ජාලයක් පවත්වාගෙන යමින් ආගමික, සංස්කෘතික රාජ්‍ය මෙන්ම පෞද්ගලික හා සුභ සාධක තොරතුරු වඩාත් ඉක්මනින් විශ්වසනීයත්වයෙන් යුක්තව හුවමාරු කරගනි. තම කෘෂි ජීවිතයේ දී තමන්ට සිදුවන සියලු ම ලාභ, අලාභ, දුක, වේදනා, සතුට වැනි මනෝ භාව සියල්ල ම ග්‍රාමීය මට්ටමින් සංවිධාන වන ජනශ්‍රැතිකාංග කිහිපයක් (කිරි ඉතිරීම, පුල්ලෙයාර් වන්දනා, විෂ්ණු පූජාව, අලුත් සහල් මංගල්ල්‍ය, මුට්ටි නැමීම) මත බද්ධ ව ඇත.

නිගමන සහ නිර්දේශ

තාක්ෂණික අතින් තවමත් නොදියුණු ග්‍රාමීය ප්‍රදේශයක් වන මෙම අධ්‍යයන ප්‍රදේශය තවමත් සාම්ප්‍රදායික සන්නිවේදන ක්‍රමවේද මත යැපෙමින් තම අවශ්‍යතා ඉටු කරගනි. විශේෂයෙන් ම කාලගුණ අනාවැකි කීම, වගා හානි සිදුවන අවස්ථාවල දී රාජ්‍ය හා වෙනත් ආයතන සමඟ තොරතුරු හුවමාරු කර ගැනීමේ දී, හා ජනශ්‍රැතිකාංග භාවිතයෙන් සාම්ප්‍රදායික සන්නිවේදනයෙහි යෙදෙන බව නිගමනය කළ හැකි ය. නමුත් ජනමාධ්‍ය භාවිතයේ දී පවතින ඇතැම් දියුණු භාවිත වන සැටලයිට් භාවිතය පැවතියත්, නව මාධ්‍ය භාවිතයට ගැමියන් තවමත් ආගන්තුක ය. ඔවුන්ගේ කෘෂි අවශ්‍යතාතෘප්තිමත් කර ගැනීමට ඔවුන් තවමත් සාම්ප්‍රදායික සන්නිවේදන භාවිතයන් විශ්වාස කරනු ලබන අතර ඔවුන් ඒ අනුව තම කෘෂි සංස්කෘතියේ අවස්ථා සැලසුම් කර ගනි. ගැමියන් අතර පවතින අන්‍යෝන්‍ය සුහදතාව හා විශ්වාසය හේතුවෙන් ව්‍යාජ තොරතුරු හුවමාරුවට පවතින ඉඩප්‍රස්තාව අඩු වන අතර තොරතුරු විශ්වසනීයත්වය හා නිරවද්‍යතාව ඒ මත පදනම් වී ඇත. එය පුද්ගලානුබද්ධ ව ග්‍රාමීය මට්ටමෙන් ගොඩනැගී ඇති අතර ඔවුන් මත පදනම් ව සන්නිවේදන ජාලයක් පවත්වාගෙන යනු ලබයි. එය ඉතාමත් සක්‍රිය ව ක්‍රියාත්මක වන අතර කෘෂි කර්මාන්තයේ දී පමණක් නොව විවිධ අවස්ථාවන්හී දී මෙම ජාලය සක්‍රිය ව කටයුතු කරනු ලැබේ.

ප්‍රමුඛ පද: *සන්නිවේදනය, සාම්ප්‍රදායික සන්නිවේදනය, කෘෂිකාර්මික, ග්‍රාමීය සමාජය, ජනශ්‍රැතිය*

ආශ්‍රිත ග්‍රන්ථ

Bamigboye, F. B. (2017). The Effectiveness of Traditional Media as a Tool for Communication in Rural Development in Arigbajo Town, IFO Local Government, Ogun State Nigeria. *Journal of Communication*, 08(02), 128–135. https://doi.org/10.31901/24566586.2017/08.02.225

Creswell, J. W. (2009). (2016). Creswell J.W.: Research design: Qualitative, quantitative, and mixed methods approaches, *Politeia* 6, 891(12), 191. Sage publications.

Dima, I. C., Teodorescu, M., & Gîfu, D. (2014). New Communication Approaches vs. Traditional Communication. *International Letters of Social and Humanistic Sciences*, 31(September), 46–55. https://doi.org/10.18052/www.scipress.com/ilshs.31.46

රාජපක්ෂ, එච්. (2018). ආසියානු රටවල සාම්ප්‍රදායික සන්නිවේදන ක්‍රම. *පියසර* මහාචාර්ය රෝහණ ලක්ෂ්මන් පියදාස ආශීර්වාද උපහාර ශාස්ත්‍රීය සංග්‍රහය, ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, 01-08.

ලියනගේ, එච්. (2010). *කෘෂිකාර්මික සංවර්ධනය හා ප්‍රාදේශීය ගුවන්විදුලිය*. සඳකඩපහණ ප්‍රකාශන

මහා සමයම වේදිකා නාට්‍යය නිර්මාණය සඳහා ජනශ්‍රැතිය යොදා ගෙන ඇති ආකාරය පිළිබඳ අධ්‍යයනයක්

ආර්. ජේ. එස්. යූ. රත්නායක
සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
udanisandunika@sjp.ac.lk

හැඳින්වීම

සබරගමුව සහ පහතරට පළාත් වල යකුන් මුල් කරගෙන සිදුකරනු ලබන තොවිල් කර්ම අතර මහසොහොන් යාගයට විශේෂ ස්ථානයක් හිමිවේ. මහාසොහොන් යාගය පවත්වන්නේ මහා සමයේදී ය. මහා සමය යනු සැඳෑ සමය සහ අලුයම් සමය අතර කාලය යි. ඒ කාල සීමාව ඇතුලත මහසොහොන් යක්ෂයාගෙන් සිදුවන කරදර, හිරිහැර, ලෙඩදුක් නිවාරණය කර ගැනීම සඳහා මෙම යාගය පවත්වනු ලබයි. මහාචාර්ය ඇතුගලයන්ගේ මහා සමයම වේදිකා නාට්‍යයට පසුබිම් වී ඇත්තේ ද මහසොහොන් යක්ෂයා අළලා සිදුකරනු ලබන මෙම මහසොහොන් යාගයයි. මෙය සිදුකිරීමෙන් මිනිසුන්ගේ අපේක්ෂිතාර්ථ ඉටුකරන ආකාරයෙන් ම නව්‍ය සංකල්ප, ක්‍රමෝපායන් භාවිතා කොට නවීන වේදිකා පසුතල , නව්‍ය සංගීතයන් කැටි කොට ගනිමින් නාට්‍ය නිෂ්පාදකවරයා මහා සමයම වර්ණ ගන්වා ඇත. ඔපෙරා සංගීතය යොදා ගනිමින් සාම්ප්‍රදායික වේදිකා නාට්‍ය වල ඇති හැඩය වෙනස් කිරීමට උත්සාහ කර ඇත. අනුෂාංගික කලා නිර්මාණයක් බිහි කිරීම උදෙසා නිෂ්පාදකවරයා උත්සහ දරා ඇත.

පර්යේෂණ ගැටලුව, පර්යේෂණයේ අරමුණු

මහා සමයම වේදිකා නාට්‍ය මගින් මහා සමය යාගයේ ඇති ජනශ්‍රැතිය වේදිකා නාට්‍ය තුළ ප්‍රතිනිර්මාණය කර තිබේද යන්න මෙහි ඇති පර්යේෂණ ගැටලුවයි. ප්‍රශස්ත මට්ටමේ වේදිකා නාට්‍ය නිර්මාණය කිරීමේදී වේදිකා නාට්‍ය තේමා සඳහා පාදක කරගනු ලබන ජනශ්‍රැතිකාංගයන් විකෘති කිරීමකින් තොරව භාවිතා කර අනුශාංගික කලා නිර්මාණයක් බිහි කළ හැකිද යන්න අධ්‍යයනය කිරීම මෙහි අරමුණයි. එමගින් අනාගත වේදිකා නාට්‍ය නිර්මාණයන් වඩාත් සාර්ථක කර ගැනීමට අවශ්‍ය අවබෝධය ලබා ගැනීමට හැකිවෙනු ඇත.

පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය සිදුකිරීම සඳහා ප්‍රාථමික මූලාශ්‍ර ලෙස මහාචාර්ය ආරියරත්න ඇතුගලයන්ගේ මහා සමයම වේදිකා නාට්‍යය යොදා ගන්නා ලදී. වේදිකා නාට්‍ය ප්‍රදර්ශනය කිරීමට පෙර සහ පසුව සිදුවී ඇති සම්මුඛ සාකච්ඡා වලදී ප්‍රකාශ කර ඇති තොරතුරු සහිත වීඩියෝ පට, පුවත් පත් විශේෂාංග ආදිය මෙහි ද්විතියික මූලාශ්‍ර ලෙස භාවිතා කරන ලදී.

ප්‍රතිඵල හා සාකච්ඡාව

ප්‍රේක්ෂකයාගේ රසවින්දනය උදෙසා සිය නිර්මාණය වඩාත් හොඳින් ගොඩනැඟීම සඳහා පුරාණෝක්ති භාවිතා කිරීම සාමාන්‍යයෙන් වේදිකා නාට්‍ය නිර්මාණ වල කැපී පෙනෙන ලක්ෂණයකි. මහාචාර්ය ආරියරත්න ඇතුගලයන් ද මහා සමයම වේදිකා නාට්‍ය නිර්මාණය කිරීම සඳහා යොදා ගන්නේ ද පුරාණෝක්තියකි. බස්මා අසුරයන්ගේ අලු මතින් බිහි වෙන මහා සොහොන් යක්ෂයා ගේ කතා පුවත ඊට පාදක කර ගෙන තිබේ. ඊශ්වර දෙවියන් සතු වූ ඉසුරු දැහැන සොරා ගන්නා බස්මා අසුරයා එම දැහැනෙන් ඊශ්වර දෙවියන් ව විනාශ කරන්නට යයි. ඒ බව වටහා ගත් විෂ්ණු දෙවියන් බස්මා අසුරයා රවටා ඔහු පුලුස්සා දමයි. ඔහුගේ අලු මතින් මහාසොහොන් යක්ෂයා ඉපිද මිනිසුන් ට විණ කරමින් සිටින බව කියැවෙන පුරාණෝක්තිය පදනම් කර ගනිමින් ඇතුගලයන් මහා සමයම ගොඩනඟයි.

මහා සොහොන් යක්ෂයාගේ උත්පත්ති කතා පුවත දේශීය සංස්කෘතියෙහි වහර කරනු ලබන ආකාරයත්, භාරත වේද දර්ශණයෙහි එන උප්පත්ති කතාවත් යන ද්විත්වයම පදනම් කරගනිමින් මෙම වේදිකා නාට්‍ය සකස් කර ඇත. ඒ සඳහා බෞද්ධ දර්ශනය පදනම් කරගනිමින් එහි කියවෙන ඉපදීම, පීවත් වීම සහ මරණය යන ත්‍රිවිධ අවස්ථා බ්‍රහ්ම, විෂ්ණු සහ ඊශ්වරගෙන් ප්‍රකට කර තිබේ. එමගින් ඔහු පූරාණෝක්තියෙන් නව ජනශ්‍රැතික අවබෝධයක් ගොඩනඟා ඇති බව අවබෝධ කරගත හැකිය. බලය මත පදනම් වූ සමාජය ද අනිත්‍යයට ගොදුරු වන බව කියවෙන සමාජ විද්‍යාත්මක දෘෂ්ටිකෝණයක් ඔහු මේ තුළින් විෂද කරන්නට උත්සාහ කර තිබේ.

දේශීය ජනශ්‍රැතිය සහ භාරත සම්ප්‍රදාය යන ද්විත්වයේ සංකලනයක් ලෙසින් නිර්මාණය වන මහා සමයම තුළ දේව සංකල්පය ඉතා ප්‍රබල ලෙස කැපී පෙනෙන අවස්ථා දැකගත හැකිය. ඒවා හුදු භාරතීය සම්ප්‍රදායට පමණක් ගැති නොවී නිර්මාණය කරන ලද දෙමුහුන් ස්වභාවය නිසා දේශීය සංස්කෘතික අනන්‍යතාවයන් ආරක්ෂා වී ඇතිවා සේම ඊට නව ප්‍රාණවත් බවක් ද කැටි වී ඇත. විශේෂයෙන් වෙස් මුහුණු යොදා ගැනීම මගින් ප්‍රබල සන්නිවේදනාර්ථයන් ජනනය කර තිබේ. ඒවා ශාන්ති කර්ම වලදී භාවිතා කරන ස්වරූපයෙන් යුක්ත වීම නිසා ජනශ්‍රැතියේ අනන්‍යතාවය බිඳී ගොස් නොමැත.

වේදිකා නාට්‍යයේ එන නර්තනයන් පිළිබඳ ව අධ්‍යයනයේදී පැහැදිලි වන්නේ නර්තන විලාශයන් ත්‍රිත්වයක් මීට පාදක කරගෙන ඇති බවයි. සාමාන්‍යයෙන් වේදිකා නාට්‍ය වල එන නර්තනයන් එලෙස විවිධාකාර වීම ඉතා දුලබය. නමුත් නිෂ්පාදකවරයා සිතාමතාම මෙසේ රංගන විලාසයන් ත්‍රිත්වයක් භාවිතා කිරීම මගින් ජනශ්‍රැතික ආඛ්‍යාතයන් අපූර්වත්වයෙන් ඉදිරිපත් කර තිබෙන බව අවබෝධ වේ. විශේෂයෙන් එටික් රංගන විධික්‍රමය යොදා ගැනීම මගින් දේශීය අනන්‍යතාවය ආරක්ෂා කරමින් රංගනය නව්‍යකරණයට ලක් කිරීමට නිෂ්පාදකවරයා උත්සහ දරා ඇත. උත්තර භාරතීය සංගීතය සහ ජන සංගීතය එකට මුසු කළ නිර්මාණයන් මේ නිර්මාණයේ තවත් විශේෂ ලක්ෂණයකි.

ඔපෙරා ගී සම්ප්‍රදාය සහ බැලේ නර්තන සම්ප්‍රදාය ද මීට එක් කිරීම මගින් නව්‍යකරණයට පත් දේශීය සංස්කෘතික පුරාණෝක්තියක් ප්‍රේක්ෂකයා ඉදිරියේ දිගහැර තිබේ.

නිගමන හා නිර්දේශ

ස්වකීය කලා නිර්මාණ ඒකාකෘතිකරණ වේදිකා නාට්‍ය නිර්මාණ වලට වඩා ආකර්ෂණීය ආකාරයෙන් ඉදිරිපත් කිරීමට මහාචාර්ය ඇතුගලයන් නිරන්තර උත්සහ දරයි. මහා සමයම යනු එබඳු තවත් විශිෂ්ඨ නිර්මාණයකි. දේශීය ජනශ්‍රැතියේ එන මහා සොහොන් යක්ෂයාගේ උප්පත්ති කතාව අළලා ජනශ්‍රැතිය නිර්මාණය කළ මහා සමයම තොවිල් යාගය මීට ප්‍රස්තුතය වී තිබේ. ගතානුගතික වේදිකා නාට්‍ය සම්ප්‍රදායෙන් මිදී සමාජීය, දේශපාලනික සහ සංස්කෘතික අනන්‍යතාවයක් ද කැටි කොට මහා සමයම නිර්මාණය කිරීමට නිෂ්පාදකවරයා ගත් උත්සාහය සාර්ථක වී ඇති බව පෙනේ. ජනශ්‍රැතියේ එන චරිත, ස්වභාවයන්, පරිසරයන්ගේ ස්වභාවය දුර්මුඛ නොකොට වඩාත් රසාලිප්ත අයුරින් ප්‍රතිනිර්මාණය කිරීමට ඔහුට හැකි වී තිබේ. වේදිකා පසුතල නිර්මාණය. අංග රචනය, රංග භාණ්ඩ සහ රංගනය ආදී අනුෂාංගික අංග වලින් සමන්විත වූ වටිනා නිර්මාණයක් ලෙස මහා සමයම වේදිකා නාට්‍යය සැලකිය හැකිය.

ප්‍රමුඛ පද: *මහා සමයම, වේදිකා නාට්‍ය, ජනශ්‍රැතිය*

ආශ්‍රිත ග්‍රන්ථ

අමරසිංහ, ජී. (2007). *ලංකාවේ බලි ශාන්ති කර්ම*. ගොඩගේ සහ සහෝදරයෝ.
ආනන්ද, ඒ. (2021). *නාට්‍ය හා රංග කලා ප්‍රවේශය*. නලින් ප්‍රකාශකයෝ.
ඇතුගල, ඒ. (2021). *මහා සමයම හා එටික් නාට්‍යවේදය*. ෆාස්ට් පබ්ලිෂින්.
ධර්මකීර්ති, ආර්. (2020). *නාට්‍ය ප්‍රවේශය*, සබිල පොතක්.
සේනාරත්න, ජී.එම්. (2021). *සුරඟුරුගේ අදේව වාදය හෙවත් දෙවි දේවතා පෙරහැර*. සමන්ති ප්‍රකාශකයෝ.

Annihilating Disinformation; The National Security Menace

C. L. C. M. Patabendige
Institute of National Security Studies, Sri Lanka
charani.patabendige@gmail.com

Introduction

'Disinformation', is defined as the information, which is created to deceive, lie or support, either an individual's or a social or political group's agenda. At present, Sri Lanka is facing disinformation on a higher scale. May it be a tweet, Instagram or Facebook post, the impact is tremendous and its damage can be irremediable. Repercussions of disinformation have been seen in Sri Lanka, as those formulated and spread by LTTE and its international network as well as by extremists in every religion. Due to disinformation, countries have passed a plethora of legislatures including Canada's Tamil Genocide Education Week Act. Furthermore, this was seen in the aftermath of the Easter Sunday Attack in 2019. Disinformation creates social division by disrupting harmony, creates unnecessary fear among people, results in ethnic division and radicalizes the community leading to separatism. Due to such reasons, disinformation which is a menace to national security needs to be mitigated and prevented.

Research Problem/s, Objective/s

Research problem- To identify and explore the need to annihilate disinformation, the national security menace.

Research objectives

- To identify disinformation
- To identify the impact of disinformation on national security
- To provide recommendations to mitigate and prevent disinformation to annihilate the national security menace

Research questions

- What is disinformation?
- What is the impact of disinformation on national security?
- What are the recommendations to mitigate and prevent disinformation to annihilate the national security menace?

Materials and Methods

Research has utilized a qualitative perspective. It has used both primary as well as secondary sources. Secondary sources such as books, journal articles, proceedings and reports were used. Information from an online survey consisting of fifty random individuals were collected.

Results and Discussion

Social media is the biggest platform where disinformation ensues. Since the world can be accessed at our fingertips, the dissemination of disinformation is done without any impediment. There are diverse reasons why terrorists and extremists resort to social media. It is efficient, reaches a wide audience, it is simple, affordable and manipulative. When disinformation becomes 'viral', youth embrace it. Accordingly, disinformation sets a precedent. For instance, despite the Sri Lankan government defeating the military attempts of the LTTE, the LTTE international network is accusing Sri Lanka of the offence of 'genocide'.

Thus, it is important to recognize disinformation at its initial stages. For example, to find extremist or terrorist content on the Twitter platform is simply a matter of using hashtags. Social media uses community standards to recognize terrorist-related content. In view of that, if the content is extremist or terrorist-related, social media takes down the respective content on their own or if reported. Therefore,

ascertaining the identity of the perpetrators who share extremist content is not impossible, but it is strenuous. Anti-terror laws are not a novel phenomenon in the world. As per Dr Agnes Callamard, the "aftermath of 9/11 saw the adoption of anti-terrorism laws and policies throughout the world, many of which resulted in restrictions to freedom of expression. In 2015, the rise of Daesh, responsible for terrorist attacks in Iraq, Syria, France, Turkey and Tunisia to mention a few, has led governments to adopt additional measures, including the promulgation of a state of emergency, and new anti-terrorism and surveillance laws." Sri Lanka too has an array of laws including, the Sri Lankan Constitution 1978, Public Security Ordinance, Police Ordinance and Prevention of Terrorism Act together with its regulations.

The Sri Lankan Constitution 1978, in Article 14(1) (a) states that "Every citizen is entitled to the freedom of speech and expression, including publication". However, these rights are not absolute. Article 15(7) of the Constitution restricts the rights enumerated in Article 14 (1) (a) in light of national security. The precedence given to national security was also seen in the international context as well. The European Convention on Human Rights (ECHR) mentions the right to privacy. Article 8(1) mentions the right to respect for private and family life, his home and his correspondence. Nonetheless, 8(2) restricts the enjoyment of 8(1) in terms of national security. According to International Covenant on Civil and Political Rights (ICCPR), some human rights, defined under article 4 of the ICCPR can never be suspended, including during a state of emergency. Even so, freedom of expression may be restricted under the conditions defined by Article 19(3). During the online survey, it was identified that majority of the respondents use social media and admit it as a platform of falsehoods. Majority were ignorant on what is disinformation. Majority knew that falsehoods are circulated yet their knowledge was limited to false news relating to politics. Respondents were unaware of disinformation campaigns by LTTE and its international networks. Respondents agreed that the government monitor social media. Furthermore, respondents admitted that journalists violate rights of people when reporting news or commenting.

Conclusions and Recommendations

Banning terrorist content is obligatory. It is vital to create awareness of the gravity of disinformation, the reasons behind it, the need to dissuade its ramifications and the penalties of the crime. Therefore, threat patterns should be gauged by espousing a prospective study. It is pivotal to implement the laws as they are. Last but not least, it important to strike a balance between national security and freedom of expression.

Keywords: *Disinformation, Freedom Of Expression, National Security,* ***S****ocial Media, Sri Lanka's Post-War Allegations*

References

Atalayar. (2022). *Disinformation and national security*. [online]. <https://atalayar.com/en/blog/disinformation-and-national-security>

Cbsnews.com. (2022). *Tackling disinformation is a national security issue says former NSA general counsel*. [online] <https://www.cbsnews.com/news/tackling-disinformation-is-national-security-issue-says-former-nsa-general-counsel/>

Vasu, N., Ang, B., Teo, T., Jayakumar, S., Rahman, A.M. & Ahuja, J., (n.d.). *Fake News: National Security in the Post-Truth Era. Global Resilience Institute*. [online] Global Resilience Institute. <https://globalresilience.northeastern.edu/fake-news-national-security-in-the-post-truth-era/>

A Criminological Study on Impacts of Covid 19 Pandemic on Criminal Investigative Operational Continuation: With Special Reference to the Western Province, Sri Lanka

D. D. D. Imalka* and B. V. N. Wijewardhana
Department of Criminology and Criminal Justice, University of Sri Jayewardenepura, Sri Lanka
**dulariimalka19@gmail.com*

Introduction

The novel Corona virus Covid 19 has become a worldwide public health pandemic that has induced anomic conditions impacting daily routines. Covid 19 response measures as specifically alter regular schedules and both restrict and expand opportunities for various types of crime while presenting unprecedented challenges for the criminal justice system (Baldwin et al,2020). During the Covid 19 first lockdown period of March 2020 Sri Lanka law enforcement institution the police has implemented the pandemic preventive tasks collaborative with crime prevention and investigative tasks. The study further explained the manner in which criminal investigative process continued during the early lock down period 2020 in Western province.

Research Problem/s, Objective/s

The study was sought to answer the research problem "Did Covid 19 pandemic impact on criminal investigation process continuation during the lockdown period in early 2020, Sri Lanka? This study utilized the deductive research approach on reaching the general objective of the study "analyzing the impact of Covid 19 pandemic on criminal investigation operational continuation".

Materials and Methods

As a representation of existing number of police stations in 4 main police divisions in western province Sri Lanka 16 police stations were selected using the stratifies sampling for data collection. The primary data was collected from 64 police officers of above police stations Questionnaires, interviews, and focused group discussions were applied to data collection and crime statistics; other literature addressed as secondary data. Mixed analytical tools were utilized in analyzing the impacts of the Covid 19 pandemic on criminal investigation operational continuation.

Results and Discussion

The study elaborated that continuation of arrests and evidence collection related to crime investigations stated over 50% during the early lockdown period of March 2020. According to the study, the ordinary crime pattern in the Western province as drug related offenses and organized crimes has been dropped down and an extraordinary crime pattern has emerged as increasing in property crimes and sexual crimes by 17% than the year 2019 in 2020 early lockdown period. Police officers further argued that the continuation of criminal investigation processes was challenging during the Covid period due to infested conditions prevailing in the society and stressing between criminal investigation and pandemic preventive functions. The police dealt with serious crimes and grave crimes mainly during the curfew-imposed period March 2020- June 2020. The minor offences like property crimes below Rs 25,000 were not prioritized. There were delays of reaching to the crime scene and delay of investigation process could be seen due to pandemic and the health risks. Because of halting court proceedings, criminal investigation process affected negatively.

Conclusions and Recommendations

According to statistical data in first six months of 2020 there were 5742 grave crimes reported and only 1166 cases settled. 4576 cases are investigations pending cases. Unresolved cases are 79.6% of total reported cases which specifying that level of criminal investigation operation continuation during the lockdown period in Western province is low. The whole criminal investigative functions were weakened

by the pandemic as isolation measures, health risk and challenging multitasking between pandemic prevention and criminal investigation. The study implies applying technological approach to law enforcement machinery and establishing training and educational programs for police officers would be addressed in policy-making recommendations.

***Key Words**: Continuation, Covid Crime, Impact, Investigation, Operation*

Acknowledgment

This study is funded by the Multi-Disciplinary Research Center, Faculty of Humanities and Social Sciences, University of Sri Jayewardenepura Grant number [MRP/MDRCFHSS/2020/01/04] Author(s) would like to acknowledge the financial support for this study.

References

Baldwin, J. M., Eassey, J. M., & Brooke, E. J. (2020). Court operations during the COVID-19 pandemic. *American Journal of Criminal Justice*, 45(4), 743-758.

Cooper, R. D., Leatherman, H., General, C., Eckstrom, R., & White, H. (2007). Police: Crime is everywhere.

Farmer, A. K., & Copenhaver, A. (2021). Policing in a pandemic: how law enforcement communicates with the public. *Policing: An International Journal*, 45(1), 124-138.

Jennings, W. G., & Perez, N. M. (2020). The immediate impact of COVID-19 on law enforcement in the United States. *American journal of criminal justice*, 45(4), 690-701.

Mourtgos, S. M., & Adams, I. T. (2021). COVID-19 vaccine program eliminates law enforcement workforce infections: a Bayesian structural time series analysis. *Police Practice and Research*, 22(5), 1557-1565.

The Influence of Social Media on the Voting Behaviour of the Sri Lankan Youth of Generation Z

W. M. D. U. Weerasekara
Northwestern Provincial Council, Sri Lanka
dhara.weer@gmail.com

Introduction

From the earlier times of history, different modes of mass media were used for the purposes of distributing information to the public. Although the print media played a significant role in the past, along with the new inventions, the radio and television became more popular. The younger generation currently, however, spends more time on social media platforms especially the youth of generation z born between 1996-2010 and they are more social media oriented. In the Sri Lankan context, youth get the opportunity to exercise their voting right at the age of 18. Since deciding whether to vote or not and whom to vote for are crucial decisions for the youth, they need some channels of information to rely on when deciding their voting behaviour.

Research Problem/s, Objective/s

Sri Lanka has been experiencing universal franchise since 1931 but since then the voter behaviour has been very dynamic. Voting behaviour is very unpredictable and researchers have identified several factors which affect voting behaviour. According to previous studies, candidate image, family and peer pressure, demographic factors, personal beliefs and political ideologies were considered as factors influencing voting behaviour (Esha & Hashim, 2017). Facebook and Twitter played a vital role in the current upheaval and revolutions in Yemen, Tunisia, Libya, Syria, Egypt and Bahrain (Attia et al, 2012). Specially, the current political trends are driven by the Sri Lankan youth using social media such as Facebook, Twitter, Instagram, and YouTube. When roaming cyber space, the youth may get the view that by using their vote their problems can be solved (Baruah & Dowerah, 2012). However along with the advancement of mass media and technology, it is evident that the classical theories of voting behaviour are scarce. The studies focusing on the determinants of voting behaviour of generation z in Sri Lanka are limited too.

Currently there is a notion that social media has become an integral part of Sri Lankan society. The objective of this research is to discover the role of social media and the degree to which social media can influence in building up the voting behaviour of Sri Lankan youth.

Materials and Methods

This research is based on the positivist research paradigm which acknoweldges the importance of the facutual knowledge acquired through observation. Primary data is collected by distributing an online, self-administered close-ended questionnaire with a Likert scale of 5. A random sample of 300 youth voters belonging to generation Z were selected for the purpose of this survey. Microsoft Excel and SPSS version 16 were used for analysing the collected data.

Results and Discussion

According to the results of the study, it was the notion of the majority of the sample of young voters of generation z, that social media helps to learn about candidates. According to figure 1, 25% of the respondents strongly agreed, while 43.8% of the respondents agreed that they use social media to learn about candidates. 18.8% of the respondents stated that they use social media to know about politically important, current incidents and 59.4% of the respondents strongly agreed to that. Moreover 31.3% of the respondents agreed to the fact that social media helps to learn about election campaigns and events and 34.4% strongly agreed to this. This affirms the previous studies by revealing that generation Z is using social media as a popular mode of obtaining information connected to their voting (Baumgartner & Morris, 2010). Merely using social media for the purpose of obtaining information is not sufficient to conclude that it is a strong influencing factor for the voting behaviour of generation z. Based on the results of the study, it was revealed that 12.5% of the respondents strongly agreed that social media helps them

to decide who to vote for in the elections, while 28.1% agreed to this, . 18.8% of the respondents were neutral about this.




Figure 2 -Social Media Influence to learn about candidates

As per the results, 25% of the respondents have stated that they strongly disagree that social media helps them to decide whom to vote for. Also, when examining the influencing nature of social media for voting behaviour, it is important to investigate whether the youth rely on social media posts regarding the elections. When the respondents were questioned as to whether they rely on social media posts regarding elections,15.6% agreed, 46.9% were neutral, 6.3% disagreed and 31.3% strongly disagreed. This depicts that the young voters do not have a strong trust regarding the accuracy of social media posts. The study revealed that 65.7% of the respondents were not convinced by social media not to vote for a particular candidate. 5.4% of the respondents strongly agreed that social media was helpful as a first-time voter. 18.9% of the respondents agreed that social media is helpful as first-time voters. 37.8% of the respondents were however neutral on this above statement while 18.9% disagreed and 5.4% strongly disagreed.

Conclusions and Recommendations

These results depict that the generation z voters show a reluctance to accept that social media helps their voting behaviour although they accept social media merely as a mode to obtain information related to elections and candidates. Thus, it can be concluded that social media is a moderator for the candidate image but not a very strong influencing factor for the voting behaviour of generation z. If the political parties and candidates are planning on a social media campaign to attract the generation z voters, they should thoroughly focus on the reliability and the accuracy of the social media platforms which they use. Because according to the study results these youth voters do not rely on social media when taking their final decision with regard to voting. This study was limited to the first-time voters of generation z and it is recommended to extend this study to all the youth voters for gaining a better picture about social media influence on their voting behaviour.

Keywords: *Voter Behaviour, Social Media, Youth, Candidates*

References

Attia, A., Aziz, N., Friedman, B. & Elhusseiny, M. (2011). Commentary: the impact of social networking tools on political change in Egypt's 'Revolution 2.0'. *Electronic Commerce Research and Applications*, 2.

Baruah, T. & Dowerah. (2012). Effectiveness of social media as a tool of communication and its potential for technology enabled connection: A micro level Study. *International Journal of Scientific and Research Publications,* 2(5).

Baumgartner, J.C., & Morris, J.C. (2010). MyFaceTube politics, social networking web sites and political engagement of young adults. *Social Science Computer Review*, 28(1).

Esa N.B, Hashim R.B. (2017). Identifying the Influence Factors on the Intention to Vote among Youths in Rural Areas. *J Pol Sci Pub Aff,* 5(292), 30. doi:10.4172/2332-0761.1000292

විශ්වවිද්‍යාල සිසුන් අතර මත්ද්‍රව්‍ය භාවිතය සහ ඒ ආශ්‍රිත ප්‍රවණතා

පී. එන්. එස්. තිසේරා*, බී. සේනානායක, ඒ. ටී. දර්ශන, කේ. ඩී. ඒ. රණසිංහ, කේ. ඒ. ඩී. මධුශානි, බී. වී. එච්. ඩබ්ලිව්. චතුරංගි, එස්. ඩබ්ලිව්. පී. කුමාර, එච්. එම්. බී. කේ. හේරත් සහ ඒ. එන්. රේණුකා

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, ශ්‍රී ලංකාව

**nilupnstissera@gmail.com*

හැඳින්වීම

මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය සහ ඒ ආශ්‍රිත ප්‍රවණතා විශ්ලේෂණය කිරීමේදී, තරුණ සහ නව යොවුන්වියේ පසුවන පුද්ගලයින් එක් අවදානම් කණ්ඩායමක් ලෙස හඳුනාගෙන ඇත. ශ්‍රී ලංකාව තුළ විවිධ සමීක්ෂණ සිදු කර තිබුණ ද විශ්වවිද්‍යාල සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ සමීක්ෂණ සිදු කර ඇත්තේ අවම වශයෙනි. මත්පැන් හා මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය (ADIC) විසින් කොළඹ විශ්වවිද්‍යාලය, කැලණිය විශ්වවිද්‍යාලය, සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ආශ්‍රයෙන්, විශ්වවිද්‍යාල සිසුන්ගේ දුම්කොළ, මද්‍යසාර භාවිතය සහ දුම්කොළ, මද්‍යසාර පිළිබඳ දරන ආකල්ප පිළිබඳ සමීක්ෂණයක් 2015 වර්ෂයේදී සිදු කර ඇත. ඒ අනුව නියැදිය 703 ක් වූ අතර සමීක්ෂණයට සහභාගීවූවන්ගෙන් 23.8% ක් දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන භාවිත කර ඇති අතර, 42% ක් මද්‍යසාර භාවිත කර ඇති බව අනාවරණය වී තිබේ. ඒ අනුව ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් අතර මත්ද්‍රව්‍ය සහ මද්‍යසාර භාවිතය සම්බන්ධ යම් යම් සිද්ධීන් වාර්තා වී ඇති අතර එවැනි ප්‍රවණතා සම්බන්ධයෙන් විවිධ මූලාශ්‍ර හරහා තොරතුරු වාර්තා වී ඇත. ශ්‍රී ලංකාවේ තරුණ ප්‍රජාව මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීමේ ප්‍රවණතාවයක් ඇති බව අත්අඩංගුවට ගැනීම් පිළිබඳ දත්ත සහ ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානවල ප්‍රතිකාර ලබන්නන්ගේ වාර්තා අනුව හඳුනාගත හැක්කේ, 2019 වර්ෂයේදී මත්ද්‍රව්‍ය වැරදි සඳහා අත්අඩංගුවට ගනු ලැබූ වයස අවුරුදු 20-29 ත් අතර වයස් කාණ්ඩයට අයත් පුද්ගලයින් 15,696 ක් වාර්තා වී ඇත. 2019 වර්ෂයේ දී වයස අවුරුදු 20-29 ත් අතර පුද්ගලයින් 1,867 ක් ප්‍රතිකාර සේවාවන්ට ඇතුළත් වී ඇත (ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය දූර්භාවිත දත්ත කළමනාකරණ අත්පොත, 2020). විශේෂයෙන්ම මත්ද්‍රව්‍ය අත්හදා බැලීමට, තම කණ්ඩායම තුළ පිළිගැනීමක් ලබා ගැනීමට තරුණ කොටස් යොමු වීම ප්‍රබල ගැටලුවක් වේ. පාසල් සිසුන් අතර මෙන්ම විශ්වවිද්‍යාල සිසුන් අතර මත්ද්‍රව්‍ය භාවිතයෙහි ප්‍රවණතාවයක් ඇති බව තොරතුරු වලින් වාර්තා වී තිබීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ අධ්‍යයනයක අවශ්‍යතාවය මතු විය.

පර්යේෂණ ගැටලුව, පර්යේෂණයේ අරමුණු

පර්යේෂණ ගැටලුව - විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් අතර මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය සහ ඒ ආශ්‍රිත ප්‍රවණතා මොනවා ද? යන්න හඳුනා ගැනීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන ගැටලුව විය.

පර්යේෂණ අරමුණු

01. විද්‍යාර්ථීන් අතර මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය අධ්‍යයනය කිරීම.
02. විද්‍යාර්ථීන්ගේ මත්ද්‍රව්‍ය භාවිත රටාවන් සහ ඒ ආශ්‍රිත ප්‍රවණතා හඳුනා ගැනීම.
03. නිවාරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ ප්‍රතිපත්ති සම්පාදනය සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම.

පර්යේෂණ ක්‍රමවේදය

මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය යටතේ සමීක්ෂණ ක්‍රමය (Survey Method) මෙහිදී භාවිත කරන ලදි. ගුණාත්මක දත්ත සහ ප්‍රමාණාත්මක දත්ත ලබා ගැනීමේ අරමුණින් සසම්භාවී නියැදුම් ක්‍රමය (Random Sample Method) යටතේ ස්ථරායන නියැදි ක්‍රමය මගින් විශ්වවිද්‍යාල සිසුන්ගේ නියැදියක් තෝරාගෙන ඇත. ඊට අමතරව, මත්ද්‍රව්‍ය භාවිත රටාවන් පිළිබඳව ඉලක්කගත මූලික තොරතුරු සපයන්නන් ද නියැදියට ඇතුළත් කරගෙන ඇත. මත්ද්‍රව්‍ය භාවිතය සමාජ අවමානය සමග සම්බන්ධවන කාරණයක් වන බැවින් කොළඹ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයේ ආචාර ධර්ම කමිටුව මගින් ආචාර ධර්ම සම්බන්ධ අනුමැතිය ලබාගෙන ඇත.

මෙම සමීක්ෂණය ශ්‍රී ලංකාවේ සියලුම රාජ්‍ය විශ්වවිද්‍යාලවලට 2017 වර්ෂය සඳහා ප්‍රවේශය ලැබූ ශ්‍රී ලංකාවේ සියලුම විශ්වවිද්‍යාල තුළ පළමු වසරේ සිට සිව්වන වසර දක්වා අධ්‍යයන කටයුතුවල නිරත වී සිටින විද්‍යාර්ථීන් අතරින් 5.1% ක නියැදියක් සමානුපාතික විභේදනය යටතේ තෝරා ගනු ලැබිණි. ඒ අනුව මුළු විද්‍යාර්ථීන් 88,527 න් නියැදියේ සංගහනය වන විද්‍යාර්ථීන් 4,500 සියලුම අධ්‍යයන පීඨයන් නියෝජනය කරනු ලැබීය.

ප්‍රතිඵල හා සාකච්ඡාව

අධ්‍යයනයට ලක් කරන ලද විශ්වවිද්‍යාල සිසුන් අතර මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ අවධානය යොමු කිරීමේදී විද්‍යාර්ථීන්ගේ වර්තමාන මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ තොරතුරු, මත්ද්‍රව්‍ය භාවිතය සඳහා යොමුවීමට බලපාන ලද සාධක, මත්ද්‍රව්‍ය භාවිත කරන විද්‍යාර්ථීන්ට විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ උද්ගත වී ඇති ගැටලු සහ මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත නව චර්යා රටා ප්‍රධාන විය. නියැදියට ඇතුළත් වූ විද්‍යාර්ථීන්ගේ වර්තමාන මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳව අධ්‍යයනය කිරීමේදී, විද්‍යාර්ථීන් 1431 දෙනෙකුගෙන් යුත් නියැදියෙන් 478 දෙනෙක් කෙදිනක හෝ මත්ද්‍රව්‍ය භාවිත කර ඇති බවට ප්‍රතිචාර දක්වා ඇති අතර ඔවුන්ගෙන් 303 (63.4%) දෙනෙකු වර්තමානයේ කුමන හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කරන බවටත්, 175 (36.6%) දෙනෙකු මේ වන විට කිසිඳු මත්ද්‍රව්‍යක් භාවිත නොකරන බවටත් අනාවරණය වී

ඇත. ඒ අතුරින් බහුතර විද්‍යාර්ථීන් සංඛ්‍යාවක් එනම්, 271 (56.7) දෙනෙක් නීත්‍යානුකූල මද්‍යසාර භාවිත කරන බවට තොරතුරු අනාවරණය විය. 138 (28.9%) දෙනෙකු දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන ද, 72 (15.1%) දෙනෙක් ගංජා ද, 24 (5%)) දෙනෙක් නීතිවිරෝධී මද්‍යසාර ද, වර්තමානය වන විට භාවිත කරන බවට තොරතුරු අනාවරණය වූ අතර ඖෂධමය පෙති වර්ග 8 (1.7%) දෙනෙක් ද, හෙරොයින් 6 (1.3%) දෙනෙක් ද, මෙතැම්පිටමින් හා කොකේන් 5 (1%) දෙනෙක් ද, එල්. එස්. ඩී. 4 (0.8%) දෙනෙක් ද, එක්ස්ටසි දෙදෙනෙක් (0.4%) ද භාවිත කරන බවට ද තවදුරටත් තොරතුරු අනාවරණය විය. මත්ද්‍රව්‍ය භාවිත කරන සියලු විද්‍යාර්ථීන් බහුවිධ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් බව ද අනාවරණය විය.

විද්‍යාර්ථීන් ප්‍රථමවරට යම් මත්ද්‍රව්‍යක් භාවිතය සඳහා යොමු වීමට බලපාන ලද සාධක පිළිබඳව ද අධ්‍යයනය කරන ලදි. එහිදී කෙදිනක හෝ මත්ද්‍රව්‍ය භාවිත කළ විද්‍යාර්ථීන් 478 දෙනාගෙන් බහුතරයක් එනම්, 177 (37%) දෙනෙක් සතුට හා විනෝදය පිණිස ප්‍රථමවරට යම් මත්ද්‍රව්‍යයක් භාවිත කර තිබුණි. අත්හදා බැලීම ද විද්‍යාර්ථීන්ගේ ප්‍රථම මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි බලපා ඇති අතර, එම සංඛ්‍යාව 139 (29.1%) කි. සිසුන්ගෙන් 111 (23.2%) දෙනෙක් කුතුහලය නිසාත්, 80 (16.7%) දෙනෙක් මිතුරු බලපෑම නිසාත්, 60 (12.6%) දෙනෙක් මත්ද්‍රව්‍යයට ඇති ආශාව නිසාත් ප්‍රථමවරට යම් මත්ද්‍රව්‍යයක් භාවිත කර තිබුණි. අධ්‍යනයට ලක් කරන ලද නියැදියට ඇතුළත් කෙදිනක හෝ මත්ද්‍රව්‍ය භාවිත කළ විද්‍යාර්ථීන්ගෙන් 22 (4.6%) දෙනෙක් ගැටලුකාරී තත්ත්වයන් මඟහරවා ගැනීම සඳහාත්, විද්‍යාර්ථීන්ගෙන් 20 (4.2%) දෙනෙක් මතක ශක්තිය වැඩි කරගැනීම සඳහාත් ප්‍රථමවරට මත්ද්‍රව්‍ය භාවිත කර තිබුණි. ආතතියෙන් නිදහස්වීම සඳහාත්, විනෝදාත්මක කටයුතුවලදීත් විද්‍යාර්ථීන් 2 (0.4%) දෙනා බැගින් ප්‍රථමවරට යම් මත්ද්‍රව්‍යයක් භාවිත කර තිබූ බව අනාවරණය වී ඇත.

විශේෂයෙන්ම විද්‍යාර්ථීන් මත්ද්‍රව්‍ය භාවිතය නිසා ඔවුන්ගේ ජීවන රටාවට එකතු වී තිබෙන නව චර්යා රටාවන් ද මෙහි දී හඳුනා ගත හැකි විය. එහි දී විද්‍යාර්ථීන් 64 (4.5%) දෙනෙක් සමාජශාලා සඳහා ගොස් තිබෙන බවත්, එම විද්‍යාර්ථීන්ගෙන් 25 (34%) දෙනෙක් සමාජශාලා තුළ දී මත්ද්‍රව්‍ය භාවිත කරන බවත් තොරතුරු අනාවරණය විය. එම විද්‍යාර්ථීන්ගෙන් 18 (72%) දෙනෙක් නීත්‍යානුකූල මද්‍යසාර භාවිත කළ බවත්, 4 (16%) දෙනෙක් ගංජා භාවිත කළ බවත්, 3 (12%) දෙනෙක් සිගරට්/ බීඩි/ සුරුට්ටු දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන භාවිත කළ බවටත්, එක් අයෙක් (4%) කොකේන් භාවිත කළ බවටත් තොරතුරු අනාවරණය විය.

නිගමන සහ නිර්දේශ

පර්යේෂණය තුලින් එළැඹුණ නිගමන මෙසේය;

01. විද්‍යාර්ථීන් සතුට හා විනෝදය වැනි හේතූන් මත මත්ද්‍රව්‍ය භාවිතය සඳහා යොමු වී ඇත.
02. විශ්වවිද්‍යාල බාහිර පරිසරය තුළ සිසුන්ට මත්ද්‍රව්‍ය ලබාගැනීමට තරම් අවකාශයක් සහ සුලභතාවයක් පවතින අතර ඇතැම් අවස්ථාවල අභ්‍යන්තර පරිසරය තුළ මත්ද්‍රව්‍ය භාවිතය සඳහා අවකාශයක් ඇත.
03. විශ්වවිද්‍යාල ශිෂ්‍ය ප්‍රජාව තුළ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් ධනාත්මක ආකල්ප පිළිබඳ දුර්මත ව්‍යාප්තව පවතියි.
04. සිගරට් සහ මද්‍යසාර වැනි පාලනයට ලක්කර ඇති මත්ද්‍රව්‍ය වර්ග භාවිතය සම්බන්ධයෙන් ඉහළ ව්‍යාප්තියක් සහ ප්‍රවණතාවයක් හඳුනාගත හැති අතර ඊට සාපේක්ෂව අන්තරායකර ඖෂධ හෝ නීතිවිරෝධී මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් දැනට සිසුන් අතර අවම ව්‍යාප්තියක් හඳුනාගත හැකිය.

නිර්දේශ මෙසේ දැක්විය හැකිය;

01. විශ්වවිද්‍යාල සිසුන් ඉලක්ක කරගත් නිවාරණ වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සිදුකළ යුතුය.
02. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල වලට සිසුන් ඇතුළත් කර ගැනීමේ දී සියලුම පීඨයන්හි පවත්වනු ලබන ආරම්භක වැඩසටහන් සඳහා සිසුන්ට මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් පැවැත්වීම.
03. මත්ද්‍රව්‍ය භාවිත කර විවිධ ගැටලු ඇති කර ගන්නා විද්‍යාර්ථීන් වෙනුවෙන් උපදේශන වැඩසටහන් දියත් කිරීම හා දිනපතා මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වී සිටින විද්‍යාර්ථීන් එම ඇබ්බැහිකාරිත්වයෙන් මුදවා ගැනීම සඳහා ප්‍රතිකාරවලට යොමු කිරීමට කටයුතු කිරීම.
04. විශ්වවිද්‍යාල කළමනාකරණයන් විසින් විශ්වවිද්‍යාල පරිශ්‍ර මතින් නිදහස් කලාප බවට නම් කරමින් සිසුන් ඒ සඳහා ක්‍රියාත්මක වීමට අභිප්‍රේරණය කිරීම.

ප්‍රමුඛ පද: *විද්‍යාර්ථීන්, මත්ද්‍රව්‍ය දුර්භාවිතය, ඖෂධවලට ඇබ්බැහිවීම, නව චර්යා රටා*

ආශ්‍රිත ග්‍රන්ථ

National Dangerous Drugs Control Board. (2020). *Handbook of Drug Abuse Information in Sri Lanka*. National Dangerous Drugs Control Board, Research Division.

National Dangerous Drugs Control Board. (2020). *Drug Abuse Monitoring System (Annual Report)*, National Dangerous Drugs Control Board, Research Division.

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, මත්ද්‍රව්‍ය නිවාරණ ජනාධිපති කාර්ය සාධක බලකාය, ශ්‍රී ලංකා පොලිසිය. (2019). *මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය පිළිබඳ ජාතික සමීක්ෂණය.* අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය.

Satisfaction about the Company Service of Seafarers in Cargo Ships a Social, Economic and Health Perspective

A. W. C. S. Weerathunga
Department of Geography, University of Sri Jayewardenepura, Sri Lanka
chethaneesachiparamee@gmail.com

Introduction

In the world, 80% of freight depends on cargo ships. Today the world dry cargo fleet includes 6225 vessels with a deadweight of more than 10,000 tonnes and accounts for 40% of all vessels in terms of tonnage and 39.4% in terms of the number of vessels. The global shipping industry is a powerful industry in the modern world. The impact of the increasing global fleet is evident in the demand for ship officers and ratings increasing in 2000 from 420,000 ship officers to 637,000 in 2010 and 599,000 integrated ratings to 747,000 in 2010 respectively (Ghaderi et al., 2014). Moreover, specifying about the global shipping companies' company servise is a must.

Research Problem/s, Objective/s

According to Ghaderi and others (Ghaderi et al, 2014), the shortage of seafarers, especially of officers, is a continuing source of concern among key stakeholders in the global shipping industry. Therefore, cargo companies have to increase the efficiency and effectiveness of their service in order to minimize the turnover of seafarers. Seafarers need more facilities in order to be satisfied about their tasks. Seafarers carry out their tasks in a ship for four, six or nine months without coming back to their land. Nevertheless, the lack of company service has become a reason for the rise in seafarers' turnover. Therefore, the main objective of this research is to analyse the seafarers' satisfaction about the company services with a focus on the social, economic and health aspects. Currently the lack of company service has become a reason for the rise in seafarers' turnover. Therefore, the main objective of this research is to analyze the satisfaction about company services in relation to the social, economic and health aspects of the seafarers. Identifying the process of company service in the cargo shipping industry, analyzing the social and economic background of seafarers, identifying seafarers' issues in the work task of the cargo ships, Identifying the reasons to minimize or maximize satisfaction and proposing the best solutions for the issues are the specific objectives suggested for fulfilling the above research gap.

Materials and Methods

To find out seaferers' satisfaction, data was collected from 25 seafarers who graduated from the Cinec Maritime Campus, ther NDT Institute of technology, University of Moratuwa and ther Mercantile seamen training institute in Sri Lanka, currently working in cargo ships belonging to various cargo companies. In this research, due to the lack of acess in collecting data, the sample size was limited to the ramdomly selected 25 seafarers. Primary data and secondary data was mainly used in order to evaluate the satisfaction about company service of seafarers in cargo ships. By using a google questionnaire data about the bio-scientific, economic, sociological, health security and job task detail aspects were gathered . Additionally, the main focus was to collect the data about the satisfaction of the seafarers' in their job tasks. A focus on previous research, magazines, articles, newspapers, internet, books and policies which are related to the company service of cargo ships took place.

Results and Discussion

In the social aspect, most of the seafarers point out a medium satisfaction. These social activities are comprised of free time, fun events, Internet facilities and the relationship between crew members. 9% of seafarers have a very low satisfaction about social activities in their ships. Most eafarers are satisfied with the allocated free time by thir companies. According to the seafarers, they are not satisfied about the monthly internet facilities provided by their company. As a result of company service quality, a considerable number of seafarers are satisfied with the gap of free time, fun events, the relationship between crew members and also internet facilities (Table1). In the economic aspect, it can be identified that almost all seafarers have a

medium satisfaction about the company service. The fewest number of seafarers appeared to be very low in satisfaction about the economic facilities that their company provides. Furthermore, due to cargo companies being concerned about their employees, seafarers have few monthly costs within their job period. Seafarers do not seem to be very satisfied with the economic facilities. Out of the monthly salary, promotions, reward system and monthly cost, none of the seafarers have indicated negative satisfaction about monthly salary (Figure1). Also, none of the seafarers indicated any negative satisfaction regarding health care. This social security consists of health facilities, other health allowances and life security. Furthermore, most of seafarers highly satisfied about the compny health security (Figure2). Additionally, 64% percentage of seafarers have previous work experience with companies and 72% percentage of seafarers satisfy about that company service.

Table1. Satisfaction of seafarers about social activities

Satisfaction value	Free time	Funevents	Internet facilities	Relationship between crew	Total	Percentage
Very low	0	3	6	0	9	9%
low	1	5	5	0	11	11%
medium	17	9	7	11	44	44%
high	5	4	4	9	22	22%
Very high	2	4	3	5	14	14%




Figure1. Percentage of satisfaction about economic facilities of seafarers




Figure2. Percentage of satisfaction about health security of seafarers

Conclusions and Recommendations

It can be identified that seafarers are satisfied about their company service. Nevertheless, some seafarers have emphasized that they need insurance coverage during the job period, a salary increase, promotions and job vacancies. As solutions for this, companies should provide salary ranges and available job vacancies for seafarers. Companies must be aware to provide the required internet facilities for seafarers as a solution for the lack of internet facilities. As a result of a good quality of company service, seafarers are satisfied about the social, economic and health facilities.

Keywords: *Social Aspect, Economic Aspect, Health Aspect, Seafarers*

References

Carotenuto, A., Molio, L., Fasanaro, A. & Amenta, F., (2012). Psychological Stress in Seafareres: A review. *Int Marit Health*. 63(4):188-94.

Caschilli, S. & Medda, F., (2012). A review of the Maritime Container Shipping Industries as a complex adaptive system. *Interdisciplinary Description of Complex Systems.* 10(1), 1-15.

Galicia, P. R. B., (2021). *Problems encountered by newly-hired seafarers on board ship: The basis for a health intervention program. Maritime Technology and Research.* 3(1), 63-70.

Ghaderi, H., Thanh, T., Caesar, L. D. & Cahoon, S., (2014). *Current Challenges in the recruitment and Retention of seafarers: An Industry Perspective from Vietnam*. 30, 217-242.

ලාංකේය සිනමාවේ ප්‍රවර්ග (Genre) කෙරෙහි ප්‍රේක්ෂක රුචිකත්වය

ජේ. ඒ. ටී. මාධව
මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
madawaja@gmail.com

හැඳින්වීම

සිනමාවේ මූලික ප්‍රවර්ග (genre) කිහිපයකි. ක්‍රියා දාම, ත්‍රාසජනක, වික්‍රම, රහස් පරීක්ෂක, බටහිර, ප්‍රහසන, රෝමාන්තික, වීර කාව්‍ය, විද්‍යා ප්‍රබන්ධ ලෙස චිත්‍රපට වර්ගීකරණය කළ හැකි ය. ප්‍රවර්ග වෙනස්වන්නේ චිත්‍රපටයේ කතා තේමාව අනුව වන අතර බොහෝවිට ප්‍රේක්ෂකයාට තමාගේ රුචිකත්වයට ගැළපෙන චිත්‍රපටයක් තෝරා ගැනීමට ප්‍රවර්ග උපකාරී වේ.

පර්යේෂණ ගැටලුව, පර්යේෂණ අරමුණු

මෙම පර්යේෂණයේ අරමුණ වනුයේ ලංකාවේ සිනමා ප්‍රේක්ෂකයන්ගේ සිනමා ප්‍රවර්ග (genre) රුචිකත්වය පර්යේෂණාත්මකව සොයා බැලීමයි. ප්‍රවර්ග තෝරා ගැනීමට බලපාන කරුණු පිළිබඳ අධ්‍යයනය කිරීම ද මෙහි තවත් එක් අරමුණක් වේ.

පර්යේෂණ ක්‍රමවේදය

සිනමා ප්‍රේක්ෂකත්වය පිළිබඳ අධ්‍යයනය සඳහා ප්‍රශ්නාවලි ක්‍රමය භාවිත කළ අතර එය බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කය ආශ්‍රිත ව පුද්ගලයන්ගෙන් දත්ත ලබා ගැනීම හා එම ප්‍රාථමික දත්ත අධ්‍යයන හා විශ්ලේෂණය කිරීම මගින් සිදු කරන ලදි. මෙම විශ්ලේෂණයේ නියැදිය වශයෙන් පුද්ගලයන් 50 දෙනෙකු සහභාගී කර ගන්නා ලදි. ඔවුන් බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කය ආශ්‍රිතව විවිධ ප්‍රදේශ යටතේ විවිධ රැකියා කාණ්ඩවල හා වයස් කාණ්ඩ කිහිපයක් යටතේ තෝරා අධ්‍යයනය සිදුකරන ලදි. ප්‍රශ්නාවලියේ පොදු ප්‍රශ්න 10 ඉදිරිපත් කරන ලද අතර එම ප්‍රශ්න රැකියා ස්වභාවය, අධ්‍යාපනික පසුබිම, වයස් සීමාව, ස්ත්‍රී-පුරුෂභාවය, තාක්ෂණයත් සමග ගනුදෙනු කිරීමට ඇති හැකියාව යන කරුණු 05 ආශ්‍රයෙන් විමසන ලදි. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය මෙම දත්ත ලබා ගැනීම සඳහා භාවිත කරන ලද අතර දත්ත විශ්ලේෂණයේ දී තුලනාත්මක ක්‍රමවේදය භාවිත කරන ලදි.

ප්‍රතිඵල හා සාකච්ඡාව

දත්ත විශ්ලේෂණයෙන් අනාවරණය වූ කරුණු අනුව ලංකාවේ ප්‍රේක්ෂකයන්ගෙන් බහුතරයකට, ප්‍රවර්ග (genre) පිළිබඳ ව වැඩි අවබෝධයක් නොමැති අතර ඔවුන් චිත්‍රපට නැරඹීම සිදු කරන්නේ ප්‍රවර්ග තෝරා බේරා ගැනීමකින් තොර ව වේ. තරුණ වයසේ පසුවන, රැකියාවල නියුතු, ඉංග්‍රීසි දැනුමෙන් පරිපූර්ණ, අන්තර්ජාලය හා පරිගණක භාවිතය පිළිබඳ දැනුමක් ඇති සීමිත පිරිසක් පමණක් තමන්ගේ රුචිකත්වයට ගැළපෙන ප්‍රවර්ග ප්‍රභේදය තෝරා නරඹනු ලබයි. තමන් ප්‍රිය කරන ප්‍රවර්ග ප්‍රභේදය රූපවාහිනී මාධ්‍යවල විකාශනය නොවීම හේතුවෙන් අන්තර්ජාලය ආශ්‍රයෙන් එම ප්‍රභේද සොයා ගැනීමට මෙම පිරිස පෙලඹී ඇති අතර ඔවුන් අතර ප්‍රචලිත ප්‍රවර්ග ප්‍රභේද ලෙස ටෙලි සීරිස්, චිත්‍රපට සීරිස්, ක්‍රියාදාම චිත්‍රපට, කාටූන් චිත්‍රපට, ෆැන්ටසි හා රහස් පරීක්ෂක ප්‍රවර්ග දැක්විය හැකි ය.

රැකියාවල නිරත නොවන මැදවියට ආසන්න ප්‍රේක්ෂක පිරිස් ඉන්දියාවෙන් ආනයනය කරන ලද සිංහල හඬ කැවූ මෙගා නාට්‍ය සහ සිංහල මෙගා නාට්‍යවලට ඇබ්බැහි වීමේ ප්‍රවණතාවක් දක්නට ලැබේ.

නිගමන සහ නිර්දේශ

මෙම පර්යේෂණයට අනුව ශ්‍රී ලාංකේය ප්‍රේක්ෂකයන්ට ප්‍රවර්ග (Genre) පිළිබඳව ඇති දැනුම ඉතා සීමිත බව තහවුරු විය. ප්‍රවර්ග පිළිබඳ දැනුම වැඩිහිටි පරම්පරාව තුළ ඉතා අල්ප අතර තරුණ පරම්පරාව අතර ද ඉංග්‍රීසි භාවිත කරන සමාජ ආශ්‍රයක් ඇති, අන්තර්ජාලය ඇසුරු කරන සීමිත පිරිසක් පමණක් ප්‍රවර්ග ගැන අවධානය යොමු කරන බව පැහැදිලි විය. ලංකාව තුළ පටු වාණිජ අරමුණු මුල් කර විකාශනය වන දීර්ඝ ටෙලි නාට්‍ය හා ආනයනික ඉන්දියානු ටෙලි නාට්‍ය සිංහල ප්‍රේක්ෂකයන්ට ප්‍රවර්ග හඳුනා ගැනීමට ඇති ඉඩකඩ අහුරා ඇති බව මෙම පර්යේෂණයෙන් අනාවරණය විය.

ප්‍රමුඛ පද : *ලාංකේය සිනමාව, ප්‍රවර්ග (Genre), ප්‍රේක්ෂක රුචිකත්වය*

ආශ්‍රිත ග්‍රන්ථ

Dissanayake, W., Ratnavibushana. (2000). *Profiling Sri Lankan Cinema.* Sri Lankan Asian Film Centre.

Senevi, H.S. (2018). *Film Genres (Sinhala).* Sabaragamuwa University of Sri Lanka.

Shanaz, S.A., Fathima., Nimalachandra., & Chathurika, K.M.D. (2010). *Popular Film Genres in Sri Lanka.* FGS. University of Kelaniya.

Uyangoda, J. (1989). *Cinema in Cultural and Political Debates in Sri Lanka.* The Journal of Cinema and Media. Drake Stutesman.

මල්ලිකාරච්චි, ඩී. (2021). *ශ්‍රී ලාංකික සිනමා අධ්‍යක්ෂ ධර්මසේන පතිරාජ සමග සාකච්ඡාවක්.* සිනමාව සහ ශ්‍රව්‍ය-දෘශ්‍ය මාධ්‍යය සඟරාව.

උසස් පෙළ සිසුන්ගේ සමාජ ජාල මාධ්‍යයන් භාවිතයන් සහ අධ්‍යයන කාර්යසාධනය පිළිබඳ අධ්‍යයනය (ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය ඇසුරින්)

ඩී. ඩබ්. පතිරගේ* සහ බී. එච්. සෙනෙවිරත්න

සමාජ සංඛ්‍යාන විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

**dilanipathirage16@gmail.com*

හැඳින්වීම

තාක්ෂණික දියුණුවත් සමඟ සන්නිවේදන ක්ෂේත්‍රයට එක්වූ වේගවත්ම මාධ්‍යය ලෙස අන්තර්ජාලය හැඳින්විය හැකිය. අන්තර්ජාලය බිහිවී වසර 20කට පමණ පසු වෙබ් අඩවි බිහිවී ඇත. සමාජ ජාල මාධ්‍යය යනු වෙබ් අඩවියේ නව ප්‍රවණතාව ලෙස හඳුන්වා දිය හැකිය. තාක්ෂණික වෙනස්වීම් වලට පාත්‍ර වන වැදගත් සමාජ කණ්ඩායමක් වන්නේ පාසල් වයසේ පසුවන තරුණ පරම්පරාවයි. අධ්‍යාපනය ලබන වයසේ පසුවන තරුණ පරම්පරාව සමාජ ජාල මාධ්‍යය වෙත විශාල වශයෙන් අනුගත වීමත් සමඟ ඔවුන්ගේ අධ්‍යයන කාර්යසාධනය සඳහා බලපෑම් එල්ල කළ හැකි සාධකයක් ලෙස සමාජ ජාල මාධ්‍යය භාවිතය හඳුන්වා දිය හැකිය. රටක ආර්ථික හා සමාජීය සංවර්ධනය උදෙසා මෙන්ම විශිෂ්ට නායකයින් හා ශ්‍රම බලකායක් බිහි කිරීම සඳහා ශිෂ්‍ය අධ්‍යයන කාර්යසාධනය ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි. ශිෂ්‍ය අධ්‍යයන කාර්යසාධනය සඳහා සාධක ගණනාවක් බලපාන නමුත් ඒ අතරින් අධ්‍යයන කාර්යසාධනය මත සමාජ ජාල මාධ්‍යය යන සාධකයේ බලපෑම වර්තමානයේදී වැදගත් තැනක් ගනී. අධ්‍යාපනය හදාරන සිසු සිසුවියන් සමාජ ජාල මාධ්‍යයන් භාවිතා කිරීමෙන් සමාජ ජාල මාධ්‍යය හරහා දැනුම හුවමාරු කර ගනිමින් දැනුම වර්ධනය කර ගත හැකි වීමෙන් පාසල් ඇගයීම් හා වාර්තා හොඳින් කළ හැකි වීම, එකිනෙකා සතු දැනුම බෙදා ගැනීමෙන් සාර්ථක ඉගෙනුම් ප්‍රතිඵල ලබා ගත හැකි වීම වැනි අධ්‍යයන කාර්යාසාධනය සඳහා හිතකර අවස්ථාවන් මෙන්ම අධ්‍යයන කටයුතුවලට වඩා වැඩි කාලයක් සමාජ ජාලවල ගත කිරීම සඳහා යෙදවීම, කණ්ඩායම් ලෙස එක්වී අධ්‍යයන කටයුතු සඳහා වැදගත් නොවන වෙනත් බාහිර කටයුතු සිදු කිරීම වැනි අධ්‍යයන කාර්යාසාධනයට අයහපත් බලපෑමක් එල්ල කළ හැකි අවස්ථාවන් ද මෙහි පවතී.

සමාජ ජාල මාධ්‍යය භාවිතයෙන් සිසුන්ගේ අධ්‍යයන කාර්යසාධනයට සිදුවන බලපෑම සම්බන්ධයෙන් ලොව පුරා සිදුකර ඇති ආනුභවික පර්යේෂණ මගින් මිශ්‍ර ප්‍රතිඵලයන් ලැබී ඇත. හස්නෙන් සහ තවත් අය (Hasnain et al, 2015) විසින් පකිස්ථානයේ විශ්ව විද්‍යාල සිසුන් යොදාගනිමින් කරන ලද අධ්‍යයනයේදී සහසම්බන්ධතා සහ ප්‍රතිපායන සංගුණක සෘණ අගයක් ගැනීමෙන් සමාජ ජාල මාධ්‍යය භාවිතය හා අධ්‍යයන කාර්යසාධනය අතර ප්‍රතිලෝම සම්බන්ධතාවයක් පවතින බව හඳුනාගෙන ඇත. තවද මෙම සම්බන්ධතාවය දුබල අගයක් ගැනීමට ශිෂ්‍යයින්ගේ අරමුණු, විශ්ව විද්‍යාල ප්‍රතිපත්ති වැනි තවත් සාධක බලපෑ හැකි බව මෙහිදී අනාවරණය කරගෙන ඇත. බැඩවි සහ යස්මින් (Badawy and Yasmin, 2015) විසින් කයි වර්ග පරීක්ෂාවක් මගින් ඊජිප්තුවේ තරුණයින්ගේ අධ්‍යයන කාර්යසාධනය කෙරෙහි සමාජ ජාල මාධ්‍යය භාවිතයේ බලපෑම හඳුනා ගැනීමට පාසල් සිසුන් නියැදියක් යොදා ගනිමින් කළ අධ්‍යයනය මගින් අනාවරණය කරගෙන ඇත්තේ සිසුන් සමාජ ජාල මාධ්‍යයවල කාලය ගත කළත් ඔවුන්ට නිසි ලෙස කාලය කළමනාකරණය කරගැනීමට හැකිවීම තුළින් අධ්‍යයන කටයුතු සඳහා අවශ්‍ය කාලය වෙන්කර ගනිමින් ඉහල ශ්‍රේණි ලකුණු ලබාගැනීමට හැකියාව ලැබී ඇති බවයි.

පර්යේෂණ ගැටලුව, පර්යේෂණ අරමුණු

ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ 2016 ශ්‍රම බලකා සමීක්ෂණ වාර්ෂික වාර්තාවට අනුව ශ්‍රී ලංකාවේ අවුරුදු 5 දරුවාගේ පටන් අන්තර්ජාලය හා ප්‍රවේශ විය හැකි කුමන හෝ උපාංගයක් භාවිතා කරමින් කුඩා කළ සිට අන්තර්ජාලය භාවිතයට යොමුවන බව හඳුනා ගත හැකි වේ. උසස් පෙළ සිසුන් 15-19 යන වයස් කාණ්ඩය තුළ නිරූපණය වේ. 2014 වර්ෂයේ මෙම වයස් කාණ්ඩයට අයත් ළමුන්ගෙන් 17.7%ක් අන්තර්ජාලය භාවිතා කිරීමට යොමු වී ඇති අතර 2015 වර්ෂය වන විට 19.9%ක් ද, 2016 වර්ෂය වන විට 28.2%ක් ද වශයෙන් වාර්ෂිකව අන්තර්ජාල භාවිතයට එක්වන පාසල් යන වයසේ පසුවන ශිෂ්‍ය සංඛ්‍යාව ක්‍රමයෙන් ඉහල ගොස් ඇති බවත්, ඔවුන් වැඩි වශයෙන් ස්මාර්ට් දුරකතන භාවිතා කරන බවත් සඳහන් වේ. සමාජ ජාල මාධ්‍යයන් හුදෙක් තරුණ පරපුරට පමණක් ලඝු නොවන නිසා සමාජ ජාල මාධ්‍යය හරහා සිසුන් නිරත ක්‍රියාකාරකම් හා ඒවා සිසුන්ගේ අධ්‍යාපනයට බලපාන ආකාරය පිළිබඳ නිසි සොයා බැලීමක් කිරීම අත්‍යවශ්‍ය වේ. සිසුන් සමාජ ජාල මාධ්‍යය භාවිතා කරන්නේ කුමක් සඳහා ද, සැබැවින්ම එය කාලය නාස්ති කිරීමක්ද නැතහොත් අධ්‍යයන කටයුතු සාර්ථක කර ගැනීමට උපකාරී වන්නේද යන ගැටලුව පැන නගී. සමාජ ජාල මාධ්‍යය භාවිතයෙන් උසස් පෙළ සිසුන්ගේ අධ්‍යයන කාර්යසාධනයට බලපෑමක් සිදුවේ ද යන්න අනාවරණය කර ගැනීම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන අතර උසස් පෙළ හදාරන සිසුන්ගේ සමාජ ජාල මාධ්‍යය භාවිතයන් පිළිබඳ හඳුනා ගැනීම, ඔවුන්ගේ අධ්‍යයන කාර්යසාධන මට්ටම හඳුනා ගැනීම, සමාජ ජාල මාධ්‍යය භාවිතය හා ශිෂ්‍ය අධ්‍යයන කාර්යසාධනය අතර සබඳතාවක් පවතී දැයි හඳුනා ගැනීම සහ සමාජ ජාල මාධ්‍යයන් භාවිතය මගින් ඔවුන්ගේ අධ්‍යයන කාර්යසාධනයට සිදුවන බලපෑමේ ස්වභාවය හඳුනා ගැනීම අධ්‍යයනයේ උප අරමුණු වේ.

පර්යේෂණ ක්‍රමවේදය

ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපයේ තෝරා ගත් පාසල් ත්‍රිත්වයක් ඇසුරින් උසස් පෙළ කලා හා වාණිජ විෂය ධාරාවන් හදාරන ශිෂ්‍ය නියැදිය ලබා ගන්නා ලදී. නියැදිය තෝරා ගැනීම සඳහා අවශ්‍ය දත්ත ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවෙන් ලබා ගන්නා ලදී. විෂය ධාරාවන් අනුව ලබාගත යුතු නියැදි තරම තීරණය කිරීමේදී ස්තෘත

සසම්භාවී නියැදි සමානුපාත ක්‍රමයත්, පාසල් වලින් නියැදි තරම තෙක් ශිෂ්‍යයින් තෝරා ගැනීමේදී සරල සසම්භාවී නියැදීම් ක්‍රමයත් භාවිතා කර ඇත. නියැදීම් රාමුව වශයෙන් සිසුන්ගේ නාමලේඛන යොදා ගන්නා ලදී. සසම්භාවී අංක වගුවක් භාවිතයෙන් ශිෂ්‍ය නාමලේඛන වලින් නියැදි තරම තෙක් සසම්භාවී ව ශිෂ්‍ය නියැදිය තෝරා ගන්නා ලදී. ප්‍රශ්නාවලියක් හරහා ඒකරාශී කරගත් දත්ත විශ්ලේෂණය කිරීම සඳහා විස්තරාත්මක සංඛ්‍යානය, ද්විත්ව නියැදි මධ්‍යනාය පරීක්ෂාව, එක් අත් විචලතා විශ්ලේෂණය, කාල් පියර්සන්ගේ සහසම්බන්ධතා සංගුණකය හා බහුගුණ ප්‍රතිපායන විශ්ලේෂණය යොදා ගන්නා ලදී. ගුරුවරුන්ගේ භූමිකාව, පාසලේ පවතින සම්පත්, සිසුන්ගේ ආකල්ප, සිසුන්ගේ කාල කලමනාකරණය, දෙමව්පියන්ගේ කාර්යභාරය හා පවුල් පරිසරය යන විචල්‍යයන් සමඟ සිසුන්ගේ සමාජ ජාල මාධ්‍ය භාවිතය යන විචල්‍යය සඳහා ප්‍රශ්නාවලියේ ලබා දී ඇති ලිකර්ට් පරිමාණයේ ප්‍රකාශන යොදා ගනිමින් වෙන වෙනම සංයුක්ත දර්ශකාංකයන් කලා හා වාණිජ විෂය ධාරාවන් හදාරන සිසුන් සඳහා ගොඩ නගා ඇත. බහුගුණ ප්‍රතිපායන ආකෘතියක් හරහා සිසුන්ගේ අධ්‍යයන කාර්යසාධනයට සමාජ ජාල මාධ්‍ය භාවිතය මගින් බලපෑමක් සිදුවන්නේද යන්න අනාවරණය කර ගන්නා ලදී.

ප්‍රතිඵල හා සාකච්ඡාව

